Nikolai Nosov

ELEVEN STORIES FOR BOYS AND GIRLS

නිකොලායි නෝසව්

ගිම්හාන නිවාඩුව

පරිවර්තනය

අරුන්දි ජයසේකර



නිකොලායි නෝසව්

ගිම්හාන නිවාඩුව

Nikolai Nosov
ELEVEN STORIES FOR BOYS AND GIRLS

ගිම්හාන නිවාඩුව

© අරුන්දි ජයසේකර

ISBN 978-955-0230-12-9

ප්‍රථම මුද්‍රණය : 2013 අගෝස්තු

පිටු සැකැසුම
වාක්‍යා රූ
නො 42/8, මකුළුදූව, පිළියන්දල. දුරකථනය : 0112708377

මුද්‍රණය
විජේසූරිය එන්ටර්ප්‍රයිසස්
350/2, හිඟුටාන පාර, මුල්ලේරියාව.

ප්‍රකාශනය
අගහස් ප්‍රකාශකයෝ
717/2, මාදින්නාගොඩ, රාජගිරිය. දුරකථනය 0773985968

පිදුම

මා බාල කාලේ
ඇකයේ හිඳුවාගෙන
කතාන්දර කියාදුන්
වාලව් ලලිතා අමරසිංහ (සිරිසේන)
ආදරණීය සුදු අත්තම්මාට

පෙරවදන

මේ කෘතියෙහි ඉංග්‍රිසි පරිවර්තනය මට කියවීමට ලැබුණේ හත් වන ශ්‍රේණියෙහි ඉගෙනුම ලබමින් සිටියදීය. මෙහි එන 'කෝල්යාගේ' වයසේම දූරියක වූ මම, එය කියවීමෙන් ලැබූ සතුට කෙතරම්ද යත් නිරායාසයෙන්ම එය සිංහල භාෂාවට පරිවර්තනය කිරීමට පෙළඹුණෙමි. පරිවර්තනය කරගෙන යද්දී පවා එයට බාධකයෝ බොහෝ වූහ.

මා කුඩා බිළිඳියකව සිටි කාලයේ සිටම රසවත් කතන්දර කියා දී, පසුව මට කියැවීමේ උනන්දුව ඇති කළේ මගේ ආදරණීය අත්තම්මාය. දූන් ඇය අනූ තුන් හැවිරිදිය. වරක් හදිසියේ අසනීප වී රෝහල් ගතවුණු ඇය, ටික දවසකින් සනීප වී ගෙදර පැමිණ, 'අනේ පුතේ, ඔයාගේ පොත නොකියවා මැරෙන්නේ කොහොමද්දයි' කියූ හැටි මට කවදාවත් අමතක නොවේ. මේ පොත පළවීමේ පළමු ගෞරවය හිමි විය යුත්තේ ඇයටයි.

මා කෙමෙන් වැඩෙද්දී, ගැළපෙන පොත පත ගෙනවිත් දෙමින් ඉංග්‍රීසි බසින් කියැවීමට මා යොමු කළ අම්මාටත්, මෙම පොත පරිවර්තනය කිරීමට සියලුම පහසුකම් සලසා දුන් අප්පච්චීටත්, නිරතුරුව මා දිරිමත් කළ මගේ මිතුරියන්ටත්, නෝසච් ගැන ලිපිය පරිවර්තනය කර දුන් කත්‍යානා අමරසිංහ නැන්දාටත්, ඉංග්‍රිසි පොතත් මගේ පරිවර්තනයත් කියවා, අවසන් පිටපත සංස්කරණය කළ ලීනා ඉමල්කා නැන්දාටත්, පොත ප්‍රකාශනය කිරීමේ වගකීම කැමැත්තෙන්ම භාරගත් රංජිත් දිසානායක මාමාටත් මගේ ගෞරවණීය ස්තුතිය පළ කරමි. රජයේ පාසලක සෙවණ අහිමි වූ මා ආදරයෙන් පිළිගත් වජිර විදුහලට සහ තවමත් සෙවණ දෙන විදුර විදුහලටද ගෞරවයෙන් හිස නමමි.

මේ පොත කියවීමේ සතුට, පොත් පත් කියැවීමේ අවස්ථා විරල, දෙනෙත් නොපෙනෙන දරු දූරියන් සමඟද බෙදාගැනීමට මා කැමතිය. ඔවුන් සහ පොත් කියැවීමට අසීරු වයෝවෘද්ධ අය වෙනුවෙන් මෙහි 'හඬ පිටපතක්' නිර්මාණය කොට, අවශ්‍ය අයට එය නොමිලයේ ලබාදීමටද බලාපොරොත්තු වෙමි.

අරුන්දි ජයසේකර
arundijayasekara@gmail.com

2013 අගෝස්තු 01

පටුන

නිකොලායි නොසව් (1908-1976) 9

ගිම්හාන නිවාඩුව 15

පුංචි මාළුවා 24

අණ්ඩය 33

සාෂා 37

බොබීට බාබොස් හමුවීම 48

කතාකාරයෝ 58

මමත් දූත් උදව් කරනවා 66

පොටී 82

මීෂ්කගෙ කැඳ 89

ටෙලිෆෝනය 102

ප්‍රීතිමත් පවුල 117

නිකොලායි නොසව්

නිකොලායි නෝසව් (1908-1976)

සෝවියට් ළමා කතන්දරවලට ආසා කරන ළමයින්ට නිකොලායි නෝසව් යනු හාස්‍යය සහ විනෝදයේ රජ්ජුරුවන්ය. නෝසව්ගේ කෙටිකතා සහ නවකතාවල එන ප්‍රධාන චරිත සත්‍යගරුකය, චතුරය, සැහැල්ලු හදවතින් යුක්තය, හීන දකින්නන්ය, සමහරු කම්මැලියෝය. තවත් සමහරු ක්‍රියාශීලී උදවියය. අනාදිමත් කාලයක සිටම නෝසව්ගේ කතන්දරවලට ළමයින් ප්‍රිය කරන්නට එක් හේතුවක් වන්නේද ඔහු මවන චරිතවල මේ විචිත්‍ර බවයි.

යුක්රේනියානු නගරයක් වූ කියෙව්හිදී නෝසව් උපන්නේ 1908 වසරේදීය. ඔහුගේ පියා රංගන ශිල්පියකු විය. දුප්පත්කමින් හා අගහිඟ කම්වලින් පෙළුණු නෝසව්ගේ පියාට, ළමයින් සඳහා හොඳ අධ්‍යාපනයක් ලබාදීමට නොහැකි විය. නළුවකු වශයෙන් ඔහුට ලැබුණු දීමනාව ඒ සඳහා ප්‍රමාණවත් වූයේ නැත. ඉතින් තරුණ නිකොලායිට අවුරුදු දහ හතරේදී පාසල් ගමන නවතා රැකියාවක් සොයා යන්නට සිදු විය. එහෙත් ඔහු උත්සාහය අතහැර දැමුවේ නැත. තනිවම ඉගෙනගත් නිකොලායි, අවුරුදු 19දී කියෙව්හි කලා ආයතනයකට ඇතුළත් වීමේ විභාගයෙන් සමත් විය. තවත් වසර දෙකකට පසුව එවක අලුත් මාධ්‍යයක් ලෙස ජනතාව අතර ප්‍රචලිත් වෙමින් තිබූ සිනමාකරණයට ඔහු උනන්දුවක් දක්වන්නට පටන්ගත්තේය. මොස්කව්හි සිනමාකරණය පිළිබඳ රාජ්‍ය ආයතනයට ඔහු ඇතුළත් වන්නේ එහි ප්‍රතිපලයක් ලෙසය.

එහිදී නෝසව්ගේ ජීවිතය, සාම්ප්‍රදායික ශිෂ්‍ය ජීවිතයකට පෙරැළිණි. ඔහු ජීවත් වූයේ ශිෂ්‍ය දීමනාවකිනි. නවාතැන් ගත්තේ ශිෂ්‍ය නේවාසිකාගාරයකය. ශිෂ්‍යයන්ගේ ආපන ශාලාවෙන් කෑම ගනිමින්, දේශනවලට දිව යමින්, ශිෂ්‍යයන් අතර පැවැත්වුණු වාද විවාදවලට ඉතා උනන්දුවෙන් සහභාගී වෙමින් නෝසව්ගේ ජීවිතය ගලා යන්නට පටන්ගත්තේය.

සිනමාව, නෝසව්ගේ සිත් පැහැරගත්තේය. එහි නිර්මාණශීලී බව, අලුත් අලුත් දේවල් අත්හදා බැලීමේ සදාතනික ඇල්ම සහ මාධ්‍යයේ දක්නට ඇති මහා පරිමාණ සැලසුම් හා මෙහෙයුම්වල ප්‍රභාමත් බවත් ඔහුගේ සිත් ගත්තේය.

සිනමාව නෝසව්ගේ ජීවිතයෙන් අවුරුදු 20ක්ම පැහැර ගත්තේය. පරිකල්පන ශක්තියෙන් හා නිර්මාණශීලීත්වයෙන් අගතැන්පත් සිනමා අධ්‍යක්ෂවරයකු ලෙස ඔහු කාටූන් චිත්‍රපට විශාල ගණනක් නිපදවීය. බුද්ධිමත් සහ නැවුම් තේමා වලින් යුත් අදහස්වලින් ඔහුගේ චිත්‍රපට පෝෂණය විය. ඒවා බුද්ධිමත් ප්‍රේක්ෂකයන්ට ආමන්ත්‍රණය කළත්, හැම වෙලාවේම විනෝදාස්වාදයද සැපයුවේය. විද්‍යාත්මක සහ අධ්‍යාපනික චිත්‍රපට නිෂ්පාදනය කරමින් නෝසව් ඔහුගේ දක්ෂතාව පෙන්වන්නට සමත් විය.

දෙවන ලෝක යුද්ධය කාලයේදී නෝසව් ඔහුගේ සම්පූර්ණ ශක්තිය සහ අත්දැකීම යුද්ධය පිළිබඳ වාර්තා චිත්‍රපට නිපදවන්නට යෙදවූයේය. ඒවා සඳහා විචාරකයින්ගේ ප්‍රශංසාව නොඅඩුව ලැබුණු අතර 1943 වර්ෂයේදී සෝවියට් දේශයේදී සම්මානයෙන්ද පුද ලැබීය.

සිනමාව සඳහා නෝසව් කොතරම් තදින් ඇලී ගැලී සිටියාද කිවහොත්, සාහිත්‍යකරණය සඳහා ඔහුට සිත යෙදවීමට වෙලාවක් තිබුණේ නැති තරමය. එහෙත් සමහර විටෙක සමහරු එක් දෙයක් කරමින් සිට, හදිසියේම තමන්ගේ ආධ්‍යාත්මය පතුලේ සැඟවී ඇති වෙනත් දුවැන්ත හැකියාවක් පිළිබඳව හඳුනා ගනිති.

නෝසව් ගැනද කියන්නට ඇත්තේ ඒ ටිකය. මුලදී ඔහු තමන්ගේ කුඩා පුතු වෙනුවෙන් කුඩා කතන්දර, සුරංගනා කතා, ජන කතා නිර්මාණය කළේය. ඊළඟට ඔහු ඒවා පුවත්පතකට ලියන්නට පටන් ගත්තේය. පරිණත මිනිසෙකු වුවත්, තවමත් ආධුනික ලේඛකයකු වූ නෝසව් වරෙක මුර්සිල්කා (Murzilka) සඟරාවට "The jokers" (කවටයන්) ලෙස නම් යෙදූ ඔහුගේ කතාවක් භාර දුන්නේ හිතේ ඇවිළෙන චකිතයෙනි. එය සඟරාවේ පළ විය. ඒ, 1938 වසරය. එවක නෝසව් 30 හැවිරිදිය. එහෙත් නියම ලේඛකයකු බවට පත් වීමට නම් ඔහු තවත් බොහෝ දුර යා යුතුව තිබුණි.

ඔහුගේ ශෛලිය එක වරම පිළිගැනුණේ නැත. සාම්ප්‍රදායික කතන්දර කලාව කඩ කරන නෝසව්ගේ අමුතු කතන්දර කීමේ ශෛලිය සමහර

කතුවරුන් එක වරම පිළිගන්නට අදි මදි කළ අවස්ථා තිබුණි. එහෙත් ළමයි එය ඉතා ආදරයෙන් වැළඳගත්හ. නෝසව්ගේ කතා පළ වූ ළමා සඟරාවලට, ඔහුට ස්තුති කරමින් එවූ ලියුම් මහ ගොඩක් ලැබිණ. තව තවත් එවැනි කතා ලියන්නැයි බොහෝ ළමයි ඔහුගෙන් ඉල්ලා එවූහ. ඉතින් නෝසව්ගේ කතන්දර විවිධ මාදිලියේ ප්‍රකාශනවල පළ වෙන්නට පටන් ගත්තේය.

වර්ෂ 1945දී "ටොක්- ටොක්- ටොක්" නමින් නෝසව්ගේ කතන්දරවල කුඩා වෙළුමක් ප්‍රකාශයට පත් විය. එයින් පසුව එවැනි තවත් කුඩා පොත් කිහිපයක් පළ වූ අතර ඔහුගේ පළමු ළමා නවකතාව වන "Vithya Maleyev at home and at school" කතාව ප්‍රකාශයට පත් වන්නේ ඔය අතරවාරයේය. එය ළමයින් අතර අතිශයින් ජනප්‍රිය වූ අතර, ලේඛකයකු වශයෙන් ඔහු ප්‍රසිද්ධියට පත් වූයේද ඒ හරහාය. සෝවියට් දේශයේ රාජ්‍ය සාහිත්‍ය සම්මානයද ඊට හිමි විය.

නෝසව්ගේ ළමා ග්‍රන්ථකරණයේ කූටප්‍රාප්තිය ලෙස සැලකිය හැක්කේ "Dunno" නැමති කුඩා ළමයෙකු වටා ඔහු ගෙතූ කතා මාලාවය. (එය 'වැඩ බැරි දාස ගැන කතා' නමින් දූදිගම වි. රුද්‍රිගු විසින් සිංහලයට පෙරළන ලදී.) තුන් ඈඳුතු නවකතාවක් ලෙස නෝසව් ලියූ "the Adventures of Dunno and his friends", "Dunno in Sunshine city" සහ "Dunno on the Moon" යන කෘති තුනම රචනා වූයේ 'වැඩ බැරි දාස' ගේ චරිතය කේන්ද්‍ර කර ගනිමිනි. එය රුසියාවේ පමණක් නොව ලංකාවේද කුඩා ළමයින්ගේ සිට යෞවනයන් දක්වා විශාල පාඨක පිරිසක් අතර ජනප්‍රියත්වයට ලක් විය. මේ කතාව රුසියාවේ ගුවන්විදුලි නාටකයක් ලෙසද කාටූන් චිත්‍රපට හැටියටද නිෂ්පාදනය විය.

නිකොලායි නෝසව්ගේ සාහිත්‍යකරණයේ වපසරිය පුළුල්ය. පෙර පාසල් යන වයසේ දරුවන්ගේ සිට ප්‍රාථමික පන්තිවල ඉගෙනුම ලබන ළමයින් සඳහා කතන්දරත්, ජ්‍යෙෂ්ඨ පන්තිවල ඉගෙනුම ලබන ළමයින් සඳහා චිත්‍රපට තිර කතා, ප්‍රහසන සහ සාහිත්‍ය රචනා ආදියත් ඔහු අතින් ලියැවිණ. ඔහුගේ නිර්මාණවල දකින්නට ලැබෙන්නේ නෝසව්ගේ පුද්ගලික හැඟීම, අතීතාවර්ජන සහ ජීවිතය පිළිබඳ ඔහුගේ දෘෂ්ටියයි. වැදගත් සහ ඇතැම් විට බරපතළ ප්‍රශ්න ඔහු සිය ප්‍රියතම හාස්‍යජනක කතන්දර ශෛලියෙන් ළමා පාඨකයාට ඉදිරිපත් කරයි. චරිතවල දුර්වලකම් දෙස විනෝදයෙන්

බලයි. ඇත්තටම එහිදී ඔහු පාඨකයා හිනැස්සවීමට සමත් වෙයි. එහෙත් ඔහු ඒ විනෝදය ලබන්නේ දුෂ්ට චේතනාවකින් නොවේ. ඔහු රළු ගති ඇති ලේඛකයකුද නොවේ. ඔහු කරුණාවන්ත, විස්මයජනක ලේඛකයෙකි. එහෙත් ඔහුගේ කරුණ රසය, සීමාව ඉක්මවා යන්නේද නැත.

නිකොලායි නෝසව්, ළමයින් කිසිවක් නොදන්නා අඥාන පාඨකයින් පිරිසකිය යන්න තදින් බැහැර කළ ලේඛකයෙකි. ඔහු ගැඹුරු ගෞරවයකින් යුතුව, ළමයින් සම තත්ත්වයෙහි ලා සන්නිවේදනය කරන්නට නොපැකිළුණේය. ඇත්තටම ඔහු ළමයින්ගේ හදවත දිනාගත්තේ එහෙමය.

ළමයින්ගේ ලෝකය කුතුහලයෙන් සහ නානාවිධ දේවල්වලින් පිරුණකි. බොහෝ විට වැඩිහිටියන්ට එය තේරුම්ගැනීම අසීරුය. කුඩා ළමයින්ට ලියන හැම කෙනෙකුටම ළමයින්ගේ ලෝකයේ දොරගුළු විවර නොවන්නේ එබැවිනි. එහෙත් නෝසව් අති දක්ෂ ලෙස ළමයින්ගේ ලෝකය ග්‍රහණය කර ගනියි. ළමයින්ගේ පරිකල්පනය සහ හැඟීම් ග්‍රහණය කර ගැනීමට ඔහු දක්ෂය. ඔහු කිසිදා නොසන්සිඳෙනසුලු ආනන්දජනක බවින්, විනෝද රසය තුළින්, අවංක බව හා කරුණාවන්ත හදවතින් ළමයින්ගේ ලෝකය දිනාගත්තේය.

ළමයි ස්වභාවයෙන්ම කරුණා ගුණයෙන් යුතු වෙති. ඔවුහු නිරන්තරයෙන්ම උණුසුම් ලෙස ප්‍රතිචාර දක්වති. එහෙත් අනෙක් සෑම දෙයක් මෙන්ම ඔවුන්ගේ මේ යහ ගුණ දියුණු විය යුතුය. මේ කාරණයේදී යහළු මිත්‍රාදීන් හෝ අන් කවර හෝ කෙනෙකු සමඟ උණුසුම්, හෘදයාංගම සබඳතා පවත්වන හැටි කියා දෙන නෝසව්ගේ කෘති විශාල පිටිවහලක් වෙයි. නිකොලායි නෝසව් කතන්දරවලදී මවන බොහෝ චරිත අනුන්ට උදව් කිරීමට කැමැති වෙති. අනුන්ගේ දුකක්, කරදරයක් බෙදා හදාගැනීමට හා ඔවුන්ට පිහිට වීමට නොපැකිලව ඉදිරිපත් වෙති. ඔහු එවැනි දුක් කරදර හෝ ප්‍රශ්න විසඳාලන්නේ ළමයින්ටම ආවේණික වූ සරල, අහිංසක බවකිනි. ආයාසයෙන් යොදන සුන්දර වචන හෝ වැඩිමනත් ප්‍රහර්ෂයකින් තොරවය. "Story tellers" කතන්දරයේ එන මිෂ්යුත්කා සහ ස්ටසික් එයට උදාහරණයකි.

ඔවැනි කුඩා කතන්දරවලින් යුතු මේ පොත තරමක් දිගු කතන්දරයක් වූ "Jolly Family" යන කතාවෙන්ද යුක්තය. මේ කතාවේදී කෝල්යා සහ මිෂ්කා ගෙදර හැදූ ඉන්කියුබේටරයක දමා කුකුළු පැටවුන් බිහි කිරීමට

යනති. මෙහිදී කතුවරයා පාඨකයා කැඳවාගෙන යන්නේ තරමක් සංකීර්ණ විද්‍යාත්මක පරීක්ෂණයකටය. මුල සිටම තමන් මේ කරන්නට යන කටයුත්ත ගැන ඔවුන්ට හරිහැටි වැටහීමක් නැත. ඔවුන් එය කරන්නට පටන්ගත් පසුව උත්සාහය අත්හැර දැමීමට කැමති වන්නේද නැත. රෑ එළිවනතුරු නිදි වරමින් කුකුළු පැටවුන් එළියට එනතුරු බලා සිටියත් ඔවුන්ගේ උනන්දුව හීන වන්නේ නැත. ඔවුන්ගේ පාසල් මිතුරෝද මේ පර්යේෂණයට උදව් වීමට එති. හැම වර්ගයකම වික්‍රමයන් මෙහිදී කරළියට පැමිණේ. විශේෂයෙන්ම නියමිත දිනයේදී කුකුළු පැටවුන් එළියට නොඑන විට, මෙය දකින්නට ලැබේ. එහෙත් අන්තිමේදී ළමයින් දෙදෙනාට ඉතා ඉවසීමෙන් කටයුතු කොට කුකුළු පැටවුන් බිහි කරවාගැනීමට හැකි වෙයි.

නිකොලායි නෝසව් සහ ඔහුගේ නිර්මාණ පිළිබඳව තවත් බොහෝ දේ කිව හැකිය. මේ කෙටි හැඳින්වීමෙන් වත්, මේ පොත සම්පූර්ණයෙන් කියැවීමෙන් වත් ඔහුගේ නිර්මාණශීලීත්වය පිළිබඳ සම්පූර්ණ චිත්‍රයක් මැවීමට නැත් කිරීම බොහෝ දුෂ්කර කටයුත්තකි. මේ පොතේ හාස්‍ය රසයෙන් අනූන කතන්දර දහයක් සහ නව යොවනයන් වෙනුවෙන් ලියූ එක් දිගු කතාවක් අඩංගුය.

මේ හැම කතන්දරයක්ම රසවත්ය. ඒ හැම එකක්ම කතුවරයාගේ පහත දැක්වෙන දැක්ම විදහා දැක්වීමට සමත්ය.

"ළමයා සුන්දරය, පිරිසිදුය. ඔහු යහගුණය කෙරෙහි හැම විටම ප්‍රතිචාර දක්වයි. ඔහුට ඔහු ගැන ඇත්තේ විස්මය දනවන, බුද්ධිමත්, උණුසුම් සහ කාව්‍යමය හැඟීම් සමුදායකි. ඔහුට අවධානය, ආදරය සහ තේරුම් ගැනීම නිරන්තරයෙන්ම ඕනෑය."

නිකොලායී නෝසව්ගේ කතන්දර හැම එකක්ම නිර්මාණය වන්නේ ළමයින් පිළිබඳ උක්ත හැඟීම පාඨකයාට දැනවීම සඳහාය.

අයි. බොරොනෙන්ස්කි

අනුවාදය කත්‍යානා අමරසිංහ

ගිම්හාන නිවාඩුව

මමයි ෂරීකුයි ගිම්හානය ගත කළේ සීයලාගෙ ගෙදර. ෂරීක් මගේ මල්ලි. ඒ වේනකොට මට වයස අවුරුදු හතයි. මම ඉස්කෝලෙත් යනවා, හැබැයි එයා තවම නැහැ.

එයා මම කියන දේ අහන්නෙ නැහැ. ඒත් මම ඒක ගණන් ගන්නෙ නෑ. අපි එහේ ආපු දවසෙ ගබඩායි සොල්දරෙයි හැමතැනම අවුස්සලා බැලුවා. මට හම්බවුණා හිස් ජෑම් බෝතලේකුයි, සපත්තු පොලිෂ් පෙට්ටියකුයි. ෂරීක් සොයාගත්තෙ පරණ අගුළකුයි සපත්තුවකුයි. ඊට පස්සෙ අපි සොල්දරේ තිබුණු බිලී පිත්තකට රණ්ඩු වුණා. ඒක මුලින්ම දැකලා මම කෑගැහුවා, "ඒක මගේ!" කියලා. ඊට පස්සෙ තමයි ෂරීක් ඒක දැක්කෙ. "ඒක මගේ"

එයත් කැගැහුවා. මම ඒකෙ කෙළවරක් අල්ලගත්තා. එයා අනිත් කෙළවර ඩැහැගත්තා. ඊට පස්සෙ අපි ඒක දෙපැත්තට ඇදගත්තා. මට තරහ ගිහින් කොයිතරම් හයියෙන් ඒක ඇද්දද කියනවනම්, එයා පස්සට වීසි වුණා. ඊට පස්සෙ එයා මෙහෙම කිව්වා,

"කාටද ඔයාගෙ කබල් බිලීපිත්ත ඕනෙ? මට මගෙ සපත්තුව තියෙනවා."

"ඔයාට ඕනෙ නම් ඔයාගෙ සපත්තුව ඉඹින්න, හැබැයි මගෙ බිලීපිත්තට අත තිව්වොත් බලාගෙනයි!"

මම මඩුවෙ තිබුණු ඉස්කෝප්පෙකුත් අරන් ගියා ගැඩවිල්ලන් හාරන්න. ෂරික් ගියා අත්තම්මගෙන් ගිනිකූරු ඉල්ලන්න.

"ඔයාට මොනවටද ඒවා?" අත්තම්මා ඇහුවා.

"මට ඕන මිදුලෙ ගිනි ගොඩක් ගහලා සපත්තුව ඒකට දාන්න. දිය වුණාම ඒක රබර් වේවි."

"ඔයාට ඊළඟට මොනවා හිතේවිද! ඔයා ගෙටත් ගිනි තියාවි, මම ඇහැ ගහගෙන හිටියෙ නැත්නම්. නැහැ මගෙ පැටියෝ, මගෙන් ඒව ඉල්ලන්නවත් එපා. ළමයි ගිනිකූරුත් එක්ක සෙල්ලම් කරන්න හොඳ නැහැ. මෙහෙමත් දඟකාරකමක්!"

ඉතින් ෂරික් නූලක කෙළවර අගුළටත් අනිත් කෙළවර එයාගෙ සපත්තුවටත් ගැටගැහුවා. ඊට පස්සෙ එයා මිදුල පුරා ඇවිද්දා, සපත්තුවත් බිම දිගේ ඇදගෙන.

එයා මගේ ළඟට ඇවිත්, මම ගැඩවිල්ලො සොයනව දැකලා මෙහෙම කිව්වා.

"ඔයා බොරුවට කාලෙ නාස්ති කරනවා. ඔයාට කොහොමටවත් මොකෙක්වත් අල්ලගන්න හම්බවෙන්නෙ නැහැ."

"මොකද නැත්තෙ?"

"මම මාළුන්ට මන්තරයක් ජප කරනවා"

"මාව බය කරන්න හදන්න එපා. " මම කිව්වා.

මම ගැඩවිල්ලො කීපදෙනෙක් අල්ලගෙන, උන්ව පෙට්ටියකට දාගෙන පොකුණ ළඟට ගියා. පොකුණ තියෙන්නෙ ගෙදර පිටිපස්සෙ. ගොවිපොළ

පටන්ගත්තෙ එතනින්. මම බිලී කොක්කට ඇමක් දාලා, මාළුවෙක් ඇම ගිලිනකල් බලා හිටියා. ෂරීක් මෙහෙම කිය කියා බෙරිහන් දෙන්න පටන්ගත්තා.

"හිටියාවේ ඔහු - මැරුණාවේ ඔහු

අඹරන්නෙමි මම - ඔහුගේ ඇටකටු

හදාගන්න මගෙ පාන් රාත්තල!"

මම හිතාගත්තා මොකක්වත් නොකියා ඉන්න. මම මොනවහරි කිව්වොත් එයා තවත් බෙරිහන් දෙන බව මම දන්න නිසා. අන්තිමේදී එයාටම කෑගැහිල්ල එපා වුණා. එයා සපත්තුව පොකුණට දාලා, ඒක නූලෙන් යාත්‍රා කෙරෙව්වා. ඉන් පස්සෙ එයාට වෙනස් අදහසක් ආවා. එයා සපත්තුව වතුරට දාලා, ඒක ගිලෙනකල් ගල් ගහලා, ආයෙමත් උඩට උස්සලා ගත්තා. වතාවක් දෙකක් මම මොකුත් නොකියා හිටියා. ඊට පස්සෙ මම කෑගැහුවා,

"යනවා යන්න මෙතනින්! ඔයා මගේ මාළුන්ව බය කරනවා!"

"ඔයාට මොකෙක්වත් අහුවෙන්නෙ නෑ. මම උන්ට මන්තරයක් ජප කළා." එයත් බෙරිහන් දුන්නා. ඊට පස්සෙ එයා ආයෙමත් සපත්තුව වතුරට දැම්මා! මම උඩ පැනල කෝටුවක් කැඩුවා. ෂරීක් විකාර විදියට සපත්තුව නටවමින් දුවන්න ගත්තා. එයාගෙ වාසනාවට, මට එයාව අහුවුණේ නෑ.

මම ආපහු පොකුණ ළඟට ගිහින් මාළු බාන්න පටන්ගත්තා. ඉර මුදුන් වුණා. තවම එකෙක්වත් අහුවුණේ නෑ. මේ මාළුන්ට මොනව වෙලාද මන්දා. මට ෂරීක් එක්ක ගියපු තරහේ හැටියට, එයාගෙ ඔළුව පළන්න ඇහැකි. මම එයාගෙ මන්තරේ නම් විශ්වාස කරන්නෙ නෑ. ඒත් මම හිස් අතින් ගෙදර ගියොත් එයා මට හිනා වේවි. ඉතින් මම කරන්න තියෙන හැම දේම කරල බැලුවා. බිලී පිත්ත වතුරෙ තවත් ගැඹුරටම දැම්මා. ඒත් පලක් වුණේ නෑ. පස්සෙ බඩගින්නෙ බැරි තැන මම ගෙදර ගියා.

ගේට්ටුවට කව්දෝ තඩිබානවා. ඒ ෂරීක්. එයා ඇණ කීපෙකුත් අතේ තියාගෙන අර අගුළ ගේට්ටුවට සවි කරනවා.

"ඔයා ඇයි ඕක හයිකරන්නෙ?" මම ඇහුවා.

එයා මාව දැකල විරිත්තුවා.

"අහා! මාළුකාරයා ඇවිත්. කෝ ඉතින් මාළු?" එයා ඇහුවා.

"ඔයා මොකටද ඕක හයි කරන්නෙ? එතනට අගුළක් තියෙනවනෙ."

"ඉතින් මොකද? දැන් අගුළු දෙකයි. එකක් ගැළවුණත් කමක් නෑ."

එයා ඇණ ගහලා ඉවර වුණාම එක ඇණයක් ඉතිරි වුණා. මුලින් එයාට ඕන වුණේ ඒක නිකන්ම ගේට්ටුවට ගහල දාන්න. ඊට පස්සෙ එයාට කදිම අදහසක් ආවා. එයා සපත්තුවෙ අඩිය ගේට්ටුවට තියලා ඇණේ ගැහුවා.

"ඒක මොකටද?"

"නිකම්"

"මෝඩ වැඩක්"

එකකොට අපි දැක්කා සීය දවල් කෑමට ගෙදර එනවා. ෂරික් හොඳටම බය වෙලා, සපත්තුව ඇදල දාන්න හැදුවා. ඒත් ඒක හොඳටම තද වෙලයි තිබුණේ. ඊට පස්සෙ එයා ඒක වැහෙන විදියට ඉස්සරහින් හිටගත්තා. සීයා අපි ළඟට ඇවිත් මෙහෙම කිව්වා.

"නියමයි කොල්ලනේ. ඔයාල පළමුවෙනි දවසෙම වැඩට බැහැලා. කාගෙ අදහසක්ද ගේට්ටුවට තවත් අගුළක් දැම්ම එක?"

"ෂරික්ගෙ" මම කිව්වා.

සීයා උගුර පෑදුවා, " හොඳයි. දැන් අපිට අගුළු දෙකයි. එකක් ඉහළින්, අනික පහළින්. මිටි මිනිහෙක් ආවොත් එයාට පුළුවන් යට එක අදින්න." ඊළඟට එයා සපත්තුව දැක්කා.

"මේ මොකක්ද?"

ඒකත් ෂරික්ට බව දන්න නිසා මම නහය අකුළගත්තා. ෂරික් රතු වුණා. මොනව කියන්නද කියලා එයාට හිතාගන්න බැරි වුණා.

"මේ මොකක්ද? ලියුම් පෙට්ටියක්ද?" සීයා ආයෙම ඇහුවා. "ගෙදර කව්රුවත් නැති වෙලාවක ලියුම්කාරයා ආවොත් එයාට පුළුවන් සපත්තුවට ලියුම් දාන්න. නියම අදහසක් ඒක නම්"

"මම තමයි ඒකත් හිතල කළේ"

"හැබෑට?"

"ඔව්"

"අපූරුයි!"

දවාලට කෑම කන අතරෙදිත් සීය අත්තම්මට කිව්වෙ, ෂරික් කොච්චර හපනෙක්ද කියලා. "ඒක නම් හිතාගන්නත් බෑ. අපි ඒ ගැන නිකමටවත් හිතුවද? එයා ගේට්ටුවට සපත්තුවක් හයි කළා. අපි ලියුම් පෙට්ටියක් ඕන කිය කියා හිටියට ඒක කළේ නෑ."

"ඒක නම් වැදුණෙ මටයි. මං ලියුම් පෙට්ටියක් ගේන්නම්කො." අත්තම්මා කිව්වා. "එතකල් සපත්තුවෙන් වැඩක් ගන්න බැරියැ."

දවල් කෑමෙන් පස්සෙ ෂරික් ගියා පළතුරු වත්තට. සීයා මට මෙහෙම කිව්වා.

"ෂරික් අද හරියට මහන්සි වෙලා තියෙනවා. මම හිතනවා ඔයත් මොනවහරි කරන්න ඇති කියලා. කෝල්යා, ඔයාටත් පුළුවන් වෙයි ඔයාගෙ සීයව සතුටු කරන්න."

"මම මාළු බාන්න ගියා. ඒත් මොකෙක්වත් අහුවුණේ නැහැනෙ."

"කොහාටද ඔයා ගියේ?"

"පොකුණට."

"ඉතින් අහන්න දෙයක්යැ. ඒක මේ හැරුවා විතරයි. ඒකෙ තවම ගෙම්බොවත් නැතුව ඇති මයෙ හිතේ. මම ඔයාට කියන්නෙ, ඔයා ගඟට යන්න. පාලම යට වතුර පාර සැරයි. එතනින් මාළු බාන්න."

සීයා ආපහු වැඩට ගියා. මම බිලී පිත්ත අරගෙන ෂරික්ට කතා කළා.

"යමුද මාළු බාන්න ගඟට?"

"ඔයා මට වාටුව දාන්න හදන්නෙ, නේද?"

"ඒ මොකටද?"

"එතකොට මම ආයෙත් මාළුන්ට මන්තර ජප කරන්නෙ නැති නිසා."



"නෑ, එහෙම එකක් නෑ."

මම ගැඩවිල්ලො දාපු පෙට්ටියයි, හිස් ජෑම් බෝතලේකුයි අරගෙන පිටත් වුණා. ෂරික් මගේ පස්සෙන් වැටුණා. ගඟ ළඟට ආවාම මම හොඳ තැනක් හොයලා මාළු බාන්න පටන්ගත්තා. ෂරික් මගේ ළඟ ඉඳන් කොඳුරන්න ගත්තා.

"හිටියාවේ ඔහු - මැරුණාවේ ඔහු

අඹරන්නෙමි මම- ඔහුගේ ඇටකටු

හදාගන්න මගෙ පාන් රාත්තල!"

එයා මොහොතක් බලා ඉඳලා ආයෙම පටන්ගත්තා.

"හිටියාවේ ඔහු...."

එක පාරටම මාළුවෙක් ඇම ගිල්ලා. මම බිලීපිත්ත ඉස්සුවා. මාළුවා අහසෙ පා වෙලා ගිහින් ඉවුර අයිනෙම තිබුණ තණකොළ බිස්සට වැටුණා.

"ඌව අල්ලගන්න!" ෂරික් කෑගහගෙන එතනට පැන්නා. ඌ දඟල දඟලා ලිස්සල ගිහින් වතුරට වැටෙන්න හදන කොටම, ෂරික් ඌව අල්ලගත්තා. මම ජෑම් බෝතලේට වතුර පිරෙව්වම එයා මාළුවව ඇතුළට දැම්මා.

"ඒ පර්ච්* මාළුවෙක්." ෂරික් කිව්වා. "මට ඒක විශ්වාසයි. දැක්කනේ උගේ ඉරි ටික. ඌව මට දෙන්න පුළුවන්ද?"

"හරි. අපි තව ගොඩාක් අල්ලමු" අපි පැය ගාණක් තිස්සෙ මාළු බාලා, ඇල්లුවා, පර්ච් ලා හය දෙනෙකුයි, ගජින්**ලා හතර දෙනෙකුයි, එක රෆ්*** මාළුවෙකුයි. ගෙදර යද්දි ෂරික් තමයි බෝතලේ අරගෙන ගියේ. එයා මට ඒකට අත තියන්න වත් දුන්නෙ නෑ. එයා කොච්චර ආඩම්බර වුණාද කිව්වොත් එයාගෙ සපත්තුව එතනින් අයින් කරලා තිබුණ එක වත් එයා නෙවෙයි ගණනකට ගත්තෙ. නිල් පාට ලියුම් පෙට්ටියක් සපත්තුවෙ තැන අරන් තිබුණා.

* මිරිදිය මත්ස්‍යයෙක්.
** යුරෝපයේ වෙසෙන මිරිදිය මත්ස්‍යයෙක්.
*** යුරෝපයේ වෙසෙන මිරිදිය මත්ස්‍යයෙක් (පර්ච් වැනි)

"කව්ද ඕවා ගණන් ගන්නෙ? කොහොමත් මේ ලියුම් පෙට්ටිය වඩා ලස්සනයි."

ඊළඟට එයා දුවල ගිහිල්ල අත්තම්මට මාළුන්ව පෙන්නුවා. අත්තම්මා හරියට සතුටු වුණා. ටිකකට පස්සෙ මම ෂරික්ට මෙහෙම කිව්වා.

"බලන්න, ඔයාගෙ මන්තරේ වැඩ කළේ නැනෙ. ඉතිං ඒකෙ වැදගත්කමක් නැහැනෙ, නේද? මම ඒක විශ්වාස කරන්නෙ නෑ."

"මම විශ්වාස කරන්නෙත් නෑ. ඔය මැජික් විශ්වාස කරන්න නම්, නියම මෝඩයෙක් - නැත්නම් නාකියෙක් වෙන්න ඕන."

මේක ඇහිච්ච අත්තම්මට හරි හිනා. මොකද එයා කොච්චර නාකි වුණත් මැජික් විශ්වාස කරන්නෙ නැති නිසා.

පුංචි මාළුවා

විටැලික්ගෙ උම්මා එයාට පුංචි කාෆ් මාළුවෙකුයි ඌට ඉන්න පුංචි භාජනේකුයි තෑගි කළා. ඌ ලස්සන පුංචි මාළුවෙක්. විටැලික් මුලදී නම් ඌ ගැන හරි උනන්දුයි. එයා ඌට කන්න දීලා, භාජනේ වතුරත් හැමදාම මාරු කළා. ඒත් කල් යද්දී එයාට ඌ ගැන තිබුණ උනන්දුව නැති වෙලා, සමහර වෙලාවට ඌට කෑම දෙන්නත් අමතක වුණා. විටැලික්ට හිටියා 'මර්සික්' කියලා, කොළපාට ඇස් තියෙන අළුපාට බළල් පැටියෙක්. මර්සික් හරි කැමතියි මාළුවා උගේ භාජනේ පීනන හැටි බලන්න. ඌ පැය ගාණක් තිස්සෙ එතැන ඉඳගෙන, මාළුවා දිහා ඇහැ උරුක් කරගෙන බලා හිටියා.

"ඔයා මර්සික් ගැන ඇහැ ගහගෙන හිටියොත් හොඳයි." විටැලික්ගෙ අම්මා එයාට අවවාද කළා. "එයා දවසක ඔයාගෙ මාළුවාව කාවි."

"නෑ. එයා එහෙම කරන එකක් නෑ." විටැලික් කිව්වා.

දවසක් අම්මා ගෙදර නැති වෙලාවක, විටැලික්ගෙ යාළුවා 'සෙරියෝසා' එයාව බලන්න ආවා. එයා මාළුවා දැකල මෙහෙම කිව්වා.

"ඔයා ළඟ ඉන්නෙ අපූරු මාළුවෙක් නේ. ඔයා කැමති නම් මම ඌ වෙනුවට 'විසිල් එකක්' දෙන්නම්."

"මට මොකටද විසිල් එකක්?" විටැලික් කිව්වා. මම නම් හිතන්නෙ මාළුවෙක් ඊට වඩා හොඳයි."

"නෑ. ඒක එහෙම නෑ. ඔයාට පුළුවන් විසිල් එක පිඹින්න. ඒත් මාළුවෙකුගෙන් මොනවා කරන්නද?"

"ඔයාට පුළුවන් මාළුවා භාජනේ පීනන හැටි බලන්න. ඒක විසිල් ගහනවට වඩා විනෝදයි."

"අනෙක," සෙරියෝසා කිව්වා, "පූසා ඔයාගෙ මාළුවාව කාල දාවි. එතකොට ඔයාට විසිල් එකත් නෑ, මාළුවත් නෑ. ඒත් පූසට විසිල් එකක් කන්න බෑ, ඒක හදල තියෙන්නෙ යකඩ වලින් නිසා."

"අම්ම කැමති නෑ මම බඩු හුවමාරු කරනවට. මට විසිල් එකක් ඕන නම්, එයා මට එකක් අරන් දෙයි."

"එයාට මේ වගේ එකක් නම් ලැබෙන්නෙ නෑ." සෙරියෝසා කිව්වා. "ඔයාට මේවා සාප්පුවලින් ගන්න බෑ. මේක ඇත්තම පොලිස්කාරයෙක්ගෙ විසිල් එකක්. මම මේක පිඹිනකොට හැමෝම හිතන්නෙ ඒ පොලිසිය කියලා." සෙරියෝසා සාක්කුවෙන් විසිල් එකක් අරගෙන ඒක පිම්බා.

"මටත් පොඩ්ඩක් දෙන්න." විටැලික් ඉල්ලුවා. එයාත් විසිල් එක අරන් පිම්බා. ඒකෙන් පිටවුණේ තියුණු සද්දයක්. විටැලික් සතුටින් ඉපිලුණා. එයාට විසිල් එක අයිති කරගන්න හුඟක්ම ඕන කරල තිබුණෙ. ඒත් එයා මාළුවව දෙන්නත් කැමති වුණේ නැහැ.

"මම ඔයාට ඌව දුන්නොත්, ඔයා ඌ කොහෙද තියන්නෙ? ඔයා ළඟ ටැංකියකුත් නැනෙ."

"මම ඌව ජෑම් බෝතලේකට දාන්නම්. අපේ ගෙදර ලොකු එකක් තියෙනවා."

"හරි හරි, ඌව තියාගන්නකො." විටැලික් අන්තිමේදි කිව්වා.

මාළුව භාජනෙන් එළියට ගන්න එක නම් හරිම අමාරු වැඩක් වුණා. ඌ කොච්චරවත් ඒගොල්ලන්ගෙ අත්වලින් ලිස්සුවා. අන්තිමේදි බිම හැමතැනම වතුර ඉහිරවලා, වැලමිට ළඟටම අත තෙමාගෙන, සෙරියෝසා ඌව අල්ලගත්තා.

"මම ඌ අල්ලගත්තා" එයා කෑගැහුවා. "ඉක්මනට මට වතුර වීදුරුවක් ගේන්න"

විටැලික් වතුර කෝප්පයක් ගෙනාවම, සෙරියෝසා ඌව ඒකට දැම්මා. ඊළඟට යාළුවො දෙන්නම සෙරියෝසලාගෙ ගෙදර ගියා. ජෑම් බෝතලේ සෙරියෝස කිව්ව තරම් ලොකු නැහැ. මාළුවට උගෙ භාජනේ තිබුණු තරමට ඉඩක් ඒකෙ නෑ. කොල්ලො දෙන්න ඌ බූජමේ ඉස්සරහට පස්සට පීනන හැටි බලන් හිටියා. සෙරියෝසා නම් සතුටු වුණා. ඒත් විටැලික්ට නම් ටිකක් දුක හිතුණා, මාළුවව දීපු එක ගැන. ඇරත්, ඌ විසිල් එකකට මාරු කළ බව අම්මට කියන්න බය වුණා.

"සමහර විට එයා ඌ නැති බව දකින එකක් නෑ." විටැලික් ගෙදරට ඇවිදගෙන යන ගමන් හිතුවා.

ඒත් ගෙදරට ආපු හැටියෙම අම්ම එයාගෙන් මෙහෙම ඇහුවා.

"කෝ ඔයාගෙ මාළුවා?" විටැලික්ට මොනව කියන්නද කියල හිතාගන්නවත් බෑ.

"මර්සික් ඌව කෑවද?"

"මම දන්නෙ නෑ." විටැලික් කෙඳිරුවා.

"මම කිව්ව නේද?" අම්මා කිව්වා.

"ඌ ඔක්කොමලා යනකල් ඉඳලා, මාළුවව භාජනෙන් බාලා ගිලල දැම්මා. තක්කඩි බළලා! කෝ මෙකා? ඉක්මනට ඌව හොයාගෙන එන්න."

"මර්සික්, මර්සික්.." විටැලික් කතා කළා. ඒත් මර්සික් නම් පේන මානෙක හිටියෙ නෑ.

"ඌ ජනේලෙන් එළියට පනින්න ඇති." අම්ම කිව්වා. "එළියට ගිහින් බලන්න" විටැලික් කබාය දාගෙන එළියට බැස්සා. "දෙවියනේ දැන් මොකද

කරන්නෙ?" එයා දුක් වුණා. "දැන් මර්සික් මං නිසා ගුටි කාවි." විටැලික් ආපහු ගිහින් මර්සික් හොයාගන්න බෑ කියලා කියන්න හැදුවා විතරයි. මර්සික් ගුලකින් එළියට පැනලා දොර ළඟට දිව්වා.

"මර්සික් පැටියෝ, ගෙදර යන්න එපා. ඔයාට අම්මගෙන් ගුටියක් ලැබෙයි."

මර්සික් පුරු පුරු ගගා විටැලික්ගෙ කකුලෙ දූවටී දූවටී හෙමින් ඤාව් ගෑවා.

"ඔයාට තේරෙන්නෙ නැද්ද මෝඩ පූසො?" විටැලික් කිව්වා. "ඔයා යන්න එපා."

ඒත් මර්සික් ඇහුවෙ නෑ. ඌ විටැලික් දිහා ආදරෙන් බලලා, එයාගෙ කකුලෙ දූවටෙන්නයි, හෙමින් විටැලික්ව එයාගෙ ඔළුවෙන් තල්ලු කරන්නයි පටන්ගත්තා, ඉක්මනට දොර අරින්න කියනව වගේ. විටැලික් ඌ දොරෙන් අහකට ඇදල දාන්න හැදුවා. ඒත් මර්සික් ගියේ නෑ. විටැලික් ඉක්මනට දොර ඇරලා ඇතුළට ගිහින් මර්සික් එන්න කලින් දොර වැහුවා.

"ඤාව්" මර්සික් එහා පැත්තෙ ඉඳන් කෑගැහුවා. විටැලික් ආපහු එළියට ආවා. "කට වහපන් මැට්ටෝ, අම්මට ඇහුණොත් ගුටි!" එයා බළල් පැටියව ගෙට පහළින් තිබුණු බිම්ගෙට තල්ලු කරන්න ගත්තා. මර්සික් හතර අතේ දඟලුවා. බිම්ගෙට යන්න ඌට කිසිම ඕනෑ කමක් තිබුණෙ නෑ. "යනව මෝඩයෝ.." විටැලික් කෙඳිරුවා. "ඔතනට වෙලා ඉන්නවා." අන්තිමට එයාට බළල් පැටියව ගුළ ඇතුළට ඔබාගන්න පුළුවන් වුණා. උගේ වලිගෙ හැර. වලිගෙ ටික වෙලාවක් වැනි වැනි තිබිලා අතුරුදහන් වුණා. විටැලික්ට සතුටුයි. එයා හිතුවා මර්සික්ට බිම්ගෙයි ඉන්න ඕන බව තේරෙනවා ඇති කියලා. එත් ඊළඟ මොහොතෙම මර්සික් ගුළෙන් එළියට ඔළුව දැම්මා.

"ඔය කොහෙද යන්න හදන්නෙ මෝඩයෝ!" ගුළ අතින් වහගෙන විටැලික් බැන්නා. "මම කිව්වෙ නැද්ද දැන්ම ගෙදර යන්න බෑ කියලා."

"ඤාව්!" මර්සික් කෑගැහුවා.

"ඤැ! තමයි" විටැලික් කඩාපැන්නා. "දෙවියනේ මම දැන් ඔයාට මොනවා කරන්නද?" එයා ගුළ වහන්න මොකක් හරි හෙව්වා. ගුළ ළඟ බිම වැටිල තිබුණා ගඩොලක්. විටැලික් ඒක අරගෙන ගුළ ළඟ හිටෙව්වා.

"ඔන්න," එයා කිව්වා. "දැන් ඔයාට එළියට එන්න බෑ. ඔයා ටික වෙලාවක් ඔතන ඉන්න. හෙට අම්මට මාළුවාව අමතක වුණාම මම ඔයාව එළියට ගන්නම්." විටැලික් ගෙදර ගිහින් අම්මට කිව්වා මර්සික්ව හොයාගන්න බෑ කියලා.

"කමක් නෑ." අම්මා කිව්වා. "ඌ ආපහු එයි. මේකට නම් මගෙන් ඌට කිසිම සමාවක් නෑ."

රෑ කෑම වෙලාවෙදි විටැලික්ට හරියට දුක හිතුණා. එයාට කිසිම දෙයක් කන්න බැරි වුණා. "මම මෙහෙ කනවා," එයා හිතුවා. "අසරණ මර්සික් අර කළුවර බිම් ගෙයි ලැගලා ඉන්නවා."

අම්මා මේසෙන් නැගිටලා ගිය හැටියෙම විටැලික් එයාගෙ මස් පංගුව පිඟානෙන් අරගෙන, ඒක සාක්කුවෙ හංගගෙන බිම්ගේ ළඟට ගියා. ගඩොල පැත්තකට දාලා හෙමිහිට කතා කළා.

"මර්සික්! මර්සික්!"

ඒත් මර්සික්ගෙන් උත්තරයක් ලැබුණෙ නෑ. විටැලික් දෙකට නැමිලා ගුළට එබුණා. ඒත් මොනවත් පේන්නෙ නෑ කළුවරේ. "මර්සික්, මර්සික්!" විටැලික් කතා කළා. "මෙහෙ එන්නකො හොඳ පූස වගේ. මම ඔයාට රසම රස මස් කෑල්ලක් ගෙනාවා." ඒත් මර්සික් නෙමෙයි එළියට ආවෙ.

"ඔයා එන්නෙ නැද්ද? හරි ඔයාට ඔතන හාමතේ ඉන්න පුළුවන්." විටැලික් එහෙම කියාගෙන තරහෙන්ම යන්න ගියා.

ගෙදරදි එයාට මර්සික් නැතිව පාළුයි. අනෙක අම්මට බොරුවක් කරපු නිසා හිතටත් හරි නෑ. අම්ම දැක්ක එයා දුකෙන් ඉන්න බව.

"දුක් වෙන්න එපා," අම්මා කිව්වා. "මම ඔයාට වෙන මාළුවෙක් ගෙනත් දෙන්නම්."

"මට ඕනැති මාළුවෙක් නෑ." එයා කිව්වා. එයාට ඕන වුණා අම්මට ඇත්ත කියන්න. ඒත් එයාට එඩිතර කමක් තිබුණෙ නෑ. ඉතින් එයා මොනවත් නොකියා හිටියා. එතකොටම වගේ පුංචි පහුරුගෑමක් ඇහුණා, ලොකු 'ඤාව්' සද්දෙකුත් එක්ක. විටැලික් උඩ බැලුවම දැක්කා මර්සික් ජනෙල් ගැට්ට උඩ හිටගෙන ඉන්නවා. ඌ බිම්ගෙයින් කොහොම එළියට ආවද මන්දා?



"අහා!" විටැලික්ගෙ අම්ම කෑගැහුවා. "අර ඉන්නෙ පුංචි තක්කඩියා! මෙහෙ එනවා, නපුරු බළලා!"

අම්මා ජනේලෙ ඇරියම මර්සික් ඇතුළට ආවා. අම්මා ඌව අල්ලන්නයි හැදුවෙ. ඒත් මොකක් හරි අවුලක් වෙලා තියන බව තේරුණා වගේ ඌ මේසෙ යටට රිංගුවා.

"පුංචි කපටියා." විටැලික්ගෙ අම්මා කිව්වා. "ඌ දන්නව ඌ කරපු වැරැද්ද. විටැලික්, මට ඌව අල්ලගන්න උදව් කරන්න"

විටැලික් මේසෙ යටට රිංගුවා. මර්සික් එයාව දැකපු ගමන්ම රිංගුවා සෝපාව යටට. විටැලික්ට සතුටුයි. එයත් මර්සික් පස්සෙන් බඩගාන ගමන් පුළුවන් තරම් සද්ද දම්මා මර්සික්ට බේරෙන්න අවස්ථාව දෙන්න. මර්සික් සෝපාව යටින් පැනලා දිව්වා. විටැලික් ඌ කාමරේ වටේට එලවන්න පටන්ගත්තා.

"ඔච්චර සද්ද කරන්න එපා!" එයාගෙ අම්ම කිව්වා. "ඔහොම කළොත් නම් ඔයාට ඌ අල්ලගන්න වෙන්නෙ නෑ.

මර්සික් මාළු භාජනේ තිබිච්ච ජනෙල් පඩියට පැනල, ආපහු ජනේලෙන් පනින්න හැදුවත් පිම්ම වැරදිලා 'ජබොක්' ගාගෙන වැටුණා මාළු භාජනේට. ඊට පස්සෙ ඌ එළියට ආවෙ කේන්තියෙන් ඇඟ ගස ගසා. අම්මා උගේ බෙල්ලෙන්ම අල්ලගත්තා.

"දැන් මං ඔයාට උගන්නනවනම් හොඳ පාඩමක්."

"අම්මෙ! අනේ ඌට ගහන්න එපා!" විටැලික් කෑගහලා අඬන්න ගත්තා.

"දැන් ඌට අනුකම්පා කරන්න එපා. ඌ මාළුවට අනුකම්පා කළේ නෑ නේද?"

"එයා නෙමෙයි ඒක කළේ අම්මෙ."

"ඕ, එයා නෙවෙයිද? කව්ද කෑවෙ මාළුවාව එහෙනම්?"

"ඒ එයා නෙමෙයි"

"එහෙනම් කව්ද?"

"ඒ මං"

"මොනවා! ඔයා මාළුවාව කෑවා?"

"නෑ, මං එයාව කෑවෙ නෑ. මං ඌව විසිල් එකකට මාරු කළා"

"මොකකට?"

"මෙන්න මේකට" විටැලික් විසිල් එක සාක්කුවෙන් එළියට අරගෙන අම්මට පෙන්නුවා.

"නරක කොලුවා! ඔයා ඔයා ගැන ලැජ්ජා වෙන්න ඕන."

"මම හිතල කළේ නෑ අම්මෙ, සෙරියෝසා කිව්වා, 'මාරු කරගනිමු' කියලා. ඉතින් මමත් කළා."

"මම කිව්වෙ ඔයා ඇත්ත නොකිව්වට ලැජ්ජ වෙන්න ඕන කියලා. මම ඒක මර්සික් පිට පැටෙව්වා. අනුන්ට වැරැද්ද පටවන එක හොඳ වැඩක්ද?"

"මම බය වුණා, ඔයා මට බනීවි කියලා."

"ඇත්ත කියන්න බයවෙන්නෙ, බයගුල්ලො. මම මර්සික්ට ගැහුව නම් ඔයාට මොනවද හිතෙන්නෙ?"

"මං ආපහු එහෙම කරන්නෙ නෑ."

"හරි, කමක් නෑ. ඔයා වැරැද්ද පිළිගත්ත නිසා මං ඔයාට සමාව දෙනවා."

විටැලික් මර්සික්ව වඩාගෙන රේඩියේටරේ ළඟට ගෙනිච්චා වේළන්න. තෙත බේරෙන ලොම් නිසා ඌව පෙනුණෙ පූසකුට වඩා ඉත්තෑවෙක් වගේ. එයා කෙට්ටු වෙලත් පෙනුණා, සතියකින් කෑවෙ නෑ වගේ. විටැලික් මස් කැල්ල සාක්කුවෙන් එළියට අරන් මර්සික් ළඟින් තිබ්බා. මර්සික් ඉක්මනින් ඒක කාලා, විටැලික්ගෙ ඔඩොක්කුවට නැගලා පුරු පුරු ගාන්න ගත්තා, පුළුවන් තරම් හයියෙන්. ඌ පුරු පුරු ගානව ඇහුණම විටැලික්ට හරි සතුටුයි. ඒක පුරු පුරු සද්දෙ නෙවෙයි නම් වෙන මොකක්ද?

අණ්ඩය

බොබ්කා ළඟ තිබුණා අපූරු කලිසමක්. කාකි හරි මොකක් හරි අඳුරු පාටක. බොබ්කා ඒකට හරිම ආසයි. ඒ විතරක්ද? එයා ඒ ගැන හැම වෙලාවෙම කයිවාරු ගහන්නත් පුරුදු වෙලා හිටියා.

"ඒයි කොල්ලනේ, බලනවල මගේ කලිසම දිහා. නියම සෙබළු අඳින විධියෙ එකක්." ඉතින් එයාගෙ යාළුවො හැමෝම එයාට ඊර්ෂ්‍යා කළා. කාගෙ ළඟ වත් ඒ වගේ කාකි කලිසමක් තිබුණෙ නෑ.

දවසක් බොබ්කා වැටකින් බඩගාන්න ගිහින් ඇණේක පැටලිලා එයාගෙ වටිනා කලිසම ඉරාගත්තා. එයා තරහටම අඬ අඬා ගෙදර දුවලා අම්මට කිව්වා ඒක මහලා දෙන්න කියලා. අම්මට හරි තරහයි. "ඔයා වැටවල්

අස්සෙ බඩගාලා කලිසම් ඉරාගන්න තරමට මම එලලන්න ඕන කියලද හිතන්නෙ?"

"මම ආපහු කරන්නෙ නෑ" බොබික කිව්වා. "අනේ අම්මෙ.."

"ඔයාම මහගන්න" අම්මා කිව්වා.

"ඉතින් මම දන්නෙ නැනෙ." බොබික නෝක්කාඩු කිව්වා.

"ඔයා ඉරාගත්ත නම් ඔයාම මහගන්න" අම්මා කිව්වා.

"හරි, හරි එහෙනම්," බොබික කෑගැහුවා. "මම මෙහෙමම ඉන්නම්"

එයා ආපහු මිදුලට ගියා. යාළුවො එයාගෙ කලිසමේ හිල දැකල හිනාවෙන්න ගත්තා.

"ඔයා නම් අපූරු සොල්දාදුවෙක් තමයි." ඒගොල්ලො කෑගැහුවා. "කලිසමේ හිලකුත් එක්ක!"

බොබිකා ඒක පැහැදිලි කරන්න හැදුවා. "මම අම්මට කිව්ව ඒක මහල දෙන්න කියල. ඒත් එයා කළේ නෑ.

"අපි දනගෙන හිටියෙ නැනෙ සෙබළුන්ගෙ අම්මලට එයාලගෙ කලිසම් එලලන්න වෙනවයි කියලා!" කොල්ලො විහිළු කළා. "සොල්දාදුවෙක් වුණාම හැම දේම තනියම කරගන්න පුළුවන් වෙන්න ඕන. ඒ කියන්නෙ, බොත්තමක් අල්ලගන්න, නැත්නම් අණ්ඩයක් දාගන්න වුණත්."

බොබිකගෙ මූණ ටිකක් නරක් වුණා. එයා ගෙදර ගිහිල්ලා, අම්මගෙන් ඉඳිකටිටකුයි, නූලකුයි, කාකි රෙදි කෑල්ලකුයි ඉල්ලගත්තා. එයා කාකි රෙද්දෙන් පිපිඤ්ඤා ගෙඩියක් තරමෙ කෑල්ලක් කපලා, කලිසමට තියලා මහන්න ගත්තා. ඒක ලේසි පාසු වැඩක් නම් නෙවෙයි. බොබිකට ඕනෑවට වඩා හදිසියක් තිබ්බ්ව නිසා එයා ඇඟිල්ලත් විද්දගත්තා. "මොකද ඔයා මට ඇන්නෙ? මොට්ට ඉඳිකටුව!" එයා ඉඳිකටුවට බනින්න ගත්තා. එයා ඉඳිකටුවෙ කෙළවරෙන්ම අල්ලගත්තා ඒක ඇනෙන්නෙ නැති වෙන්න.

හුඟ වෙලාවකට පස්සෙ අණ්ඩ දැමිල්ල ඉවර වුණා. ඒක පෙනුණෙ, හරියට ඇකිළිච්ච හත්තක් වගේ. ඒක වටේට තිබුණ රෙද්ද ඇකිළිච්ච හින්දා එක කකුලක් අනෙක් කකුලට වඩා කොට වුණා.

"මේක නම් හරියන්නෙ නෑ." කලිසම දිහා බලන ගමන් බොබික කිව්වා. "මේක තිබුණටත් වඩා අන්තයි. මට මේක ආයෙමත් කරන්න වෙනවා." එයා පිහියක් අරගෙන මැහුම් ලිහන්න ගත්තා. ඊළඟට අණ්ඩෙ ගළවල ආයෙම වැඩ පටන්ගත්තා. මුලින්ම අණ්ඩය වටේට පැන්සලකින් ඉරක් ඇඳලා, මේ පාර එයා කලබල නොවී පරිස්සමෙන් මැහුවා. අණ්ඩෙට ඉරෙන් පනින්න දෙන්නෙ නැතුව.

එයාට ඒක කරන්න හුඟ වෙලාවක් ගත වුණා. එයා කෙඳිරිත් ගෑවා. ඒත් මහල ඉවර වුණාම නම් ඒක බලන්න ලස්සනයි. ගාණට තදට මැහිලා තිබුණා. දත්වලින් වත් ඉරන්න බැරිවෙන්න.

අන්තිමට බොබික කලිසම ඇඳගෙන මිදුලට ගියා. යාළුවො එයාව වට කරගත්තා. "ඒක නම් සුපර්!" ඒගොල්ලො කිව්වා. "පැච් එක වටේට පැන්සල් ඉරකුත් ඇඳලා. ඕන කෙනෙකුට තේරෙනවා ඔයා තනියම ඕක කරල තියෙන්නෙ කියලා. ඔයා නම් නියමයි!"

බොබිකා හැමෝටම පේන විදියට කිහිප සැරයක්ම හැරිල පෙන්නුව.

"මම බොත්තම් අල්ලන්නත් ඉගෙනගන්න ඕන." එයා හිතුවා. "අපරාදෙ එකක් ගැළවුණේ නැත්තෙ... කමක් නෑ. ළඟදිම හරි, පහුවෙලා හරි එකක් ගැළවෙයිනෙ. එතකොට මම ඒකත් තනියම මහගන්නවා! "

සාෂා

සාෂා අම්මගෙන් කැප් තුවක්කුවක් ඉල්ලුවා.

"ඔයාට මොකටද ඒකක්?" එයාගෙ අම්ම ඇහුවා. "ඒක භයානකයි"

"කොහොමද ඒක භයානක වෙන්නෙ?" සාෂා ඇහුවා. "ඔන්න මූනිස්සම් විදින එකකින් නම් එහෙම වෙන්න පුළුවන්. ඒත් 'කැප්ස්'* එහෙම නෙවෙයි. ඒවයින් කාවවත් මරන්න බෑ."

"ඔයා දන්නෙ නෑ, මොනව වෙව්ද කියල," අම්ම උත්තර දුන්නා. "කැප් එකක් එළියට ඇවිත් ඔයාගෙ ඇහැක එහෙම වැදුණොත්?"

---

* සෙල්ලම් තුවක්කු සඳහා භාවිත කරන, කඩදාසියක එකු වෙඩි බෙහෙත් අඩංගු උණ්ඩයකි.

"නෑ එහෙම වෙන්නෙ නෑ." සාෂ කිව්වා. "මම වෙඩි තියනකොට ඇස් වහගන්නම්"

"නෑ නෑ, ඔය තුවක්කු වලින් මොන ජරමරයක් වෙයිද කියලා කියන්න බෑ" එයා තුවක්කුවක් අරන් දුන්නෙම නෑ.

සාෂට හිටියා අක්කල දෙන්නෙක්. 'මැරීනා'යි, 'අයිරා'යි. එයා ඊළඟට ඒගොල්ල දිහාට හැරුණා.

"මට කැප් තුවක්කුවක් අරන් දෙන්නකො මගෙ හොඳ අක්කෙ.." එයා ඒගොල්ලන්ට බැගෑපත් වුණා. "මට එකක් ඕනෙමයි. මං ඔයාල කියන දෙයක් කරන්නම්, ඕන වෙලාවක"

"ඔයා නම් හරිම කට්ටයි සාෂා" මැරීනා කිව්වා. "ඔයාට මොනවහරි ඕන වුණාම 'හොඳ අක්කලා' කිය කියා අපට බටර් ගාන්න පටන්ගන්නවා. ඒත් අම්ම පොඩ්ඩක් එළියට ගිය ගමන්ම ඔයා තාලෙ වෙනස් කරනවා."

"නෑ මම එහෙම කරන්නෙ නෑ. මම හොඳට හැසිරෙනවා. බලන්නකො නැද්ද කියලා."

"හොඳයි" අයිරා කිව්වා. මමයි මැරීනයි ඒ ගැන හිතල බලන්නම්. ඔයා හොඳ ළමයෙක් වෙනවා කියල පොරොන්දු වුණොත්, අපි ඔයාට තුවක්කුවක් අරන් දෙන්නම්."

"මම පොරොන්දු වෙනවා." සාෂා කිව්වා. "ඔයාල මට තුවක්කුවක් අරන් දෙනවනම්..."

ඊළඟ දවසේ සාෂගෙ අක්කල දෙන්නා එයාට තුවක්කුවකුයි කැප්ස් පෙට්ටියකුයි තෑගි දුන්නා. තුවක්කුව අලුත්ම අලුත්, දිලිසෙන එකක්. ඒ වගේම 'කැප්ස්' ගොඩාරියකුත් එතන තිබුණා. පනහක් - නැත්නම් සීයක් විතර. දැන් එයාට පුළුවන් හිතේ හැටියට වෙඩි තියන්න. සාෂා කාමරේ වටේ සතුටින් නට නටා, තුවක්කුව බදාගෙන ඒක ඉඹින්න ගත්තා මෙහෙම කිය කියා.. "මගෙ හුරතල් තුවක්කුවේ, මම ඔයාට කොයිතරම් ආදරේද?"

ඊළඟට එයා තුවක්කුවෙ මිටේ එයාගෙ නම කෙටුවා. ඊට පස්සෙ වෙඩි තියන්න පටන් ගත්තා. මුළු කාමරේම වෙඩි බෙහෙත් ගඳගහන්න ගත්තා. පැය බාගයක් විතර යනකොට, දුම නිසා මුළු කාමරේම නිල්පාට වුණා.

"දැන් ඔය වෙඩි තිබ්බා ඇති." අන්තිමේදී අයිරා කිව්වා. "තුවක්කුව පත්තුවෙන වාරයක් ගානෙම මම උඩ ගිහින් බිම වැටෙනවා."

"බය ගුල්ලි! " සාෂා විහිළු කළා. "කෙල්ලො ඔක්කොම බයගුල්ලියො!"

"හරි මම පෙන්නන්නම්කො අපි මොන ජාතියෙ බයගුල්ලොද කියලා. මම ඔය තුවක්කුව ඔයාගෙන් උදුරගන්නම." මැරීනා කිව්වා.

"මම එහෙනම් වත්තට යනවා." සාෂා උත්තර දුන්නා. "එහේ ඉන්න ළමයින්ව බය කරන්න"

ඉතින් එයා එළියට ගියා. ඒත් පේන මානෙක ළමයෙක් හිටියෙ නෑ. එයා කෙළින්ම ගියා ගේට්ටුවෙන් එළියට. ඉතින් මෙතනදී තමයි කතාව ඇත්තටම පටන්ගන්නෙ! ඒ වෙලාවෙදීම වයසක ගෑනු කෙනෙක් පාර දිගේ ආවා. සාෂා එයා යනවා බලන් ඉඳලා, 'ඩෝං' ගාලා එයාගෙ පිටිපස්සෙන් තුවක්කුව පත්තු කළා. බයෙන් කෑගහගෙන ඒ ගෑනු කෙනා නැවතුණා. ආපහු හැරිලා එයා මෙහෙම කිව්වා. "අයියෝ ඔයා මාව බය කළා. ඔයා නේද අර වෙඩි තිබ්බෙ?"

"නෑ! " සාෂා තුවක්කුව එයාගෙ පිටිපස්සෙ හංගගෙන කිව්වා.

"ඔයා හිතන්නෙ, ඔයාගෙ අතේ තියෙන තුවක්කුව මට පේන්නෙ නැහැයි කියලද?" ඒ ආච්චි ඇහුවා. "ඔයා දැන් බොරුත් කියන්න හදනවා. ඔයා ඔයා ගැනම ලැජ්ජා වෙන්න ඕන. ඉන්නකො, මම දැන් කෙළින්ම යනවා පොලිසියට!" ඇඟිල්ල උරුක් කරලා, එයා පාර පැනලා අතුරු පාරක් දිගේ ගිහින් අතුරුදන් වුණා.

"දැන් මම අහුවෙයි ඒකට" සාෂා හිතුවා. "එයා ඇත්තටම පොලිසියට යයි වගේ." එයා පණ එපා කියලා ගෙදර දිව්වා.

"මොකද ඔච්චර බය වෙලා? හරියට වෘකයෙක් පස්සෙන් පන්නනව වගේ?" අයිරා ඇහුවා.

"මුකුත් නෑ" සාෂා කිව්වා.

"ඔයා ඇත්ත කිව්වොත් හොඳයි. ඔයාගෙ මූණෙන්ම පේනව මොකක් හරි තක්කඩිකමක් කරල තියෙන බව."

"මම එහෙම කළේ නෑ." සාෂා හති දැම්මා. "මම ආච්චි කෙනෙක්ව බය කරා විතරයි."

"මොන ආච්චිද?"

"මොන ආච්චිද අහන්නෙ?" සාෂා ඇහුවා. "නිකම් කොහෙද යන ආච්චි කෙනෙක්. මම එයාව දැකල වෙඩි තිව්වා."

"ඇයි ඔයා එහෙම කළේ?" එයාගෙ අක්ක ඇහුවා.

"මමත් දන්නෙ නෑ." සාෂා කිව්වා. එයා ඇවිදගෙන එනකොට මට හිතුණාඃ 'ගිහින් වෙඩිතියන්න' කියලා. ඉතින් මම එහෙම කළා."

"ඉතින් එයාට මොකද වුණේ?" අයිරා ඇහුවා.

"මුකුත් නෑ. එයා ගියා පොලිසියට- පැමිණිල්ලක් දාන්න! "

"ඔන්න බලන්න" අයිරා කිව්වා. "ඔයා හොඳට හැසිරෙන්න පොරොන්දු වුණා. දැන් බලන්න ඔයා කරල තියන දේ "

"ඒ නාකි ආච්චි ඔයතරම් බයගුල්ලියක් වෙච්ච එකට මං පළිද?" සාෂා ඇහුවා.

"දැන් පොලිස්කාරයෙක් ඇවිත් ඔයාට හොඳවයින් එකක් දෙයි!" අයිරා කියාගෙන ගියා. "එතකොට ඔයාට තේරෙයි මිනිස්සු බය කළාම මොකක්ද වෙන්නෙ කියලා."

"එයා කොහොමද මාව හොයාගන්නෙ?" සාෂා ඇහුවා. "එයා දන්නෑ මම ඉන්නෙ කොහේද කියලා. වෙන එකක් තියා, එයා මගේ නම වත් දන්නෙ නෑ."

"එයා කොහොම හරි හොයාගනීවි, ඔයා බය වෙන්න එපා." අයිරා කිව්වා. "පොලිස්කාරයො හැම දේම දන්නවා."

සාෂා පැයක් විතරම ගෙදරට වෙලා, බයෙන් ජනේලෙන් එබීගෙන හිටියා, පොලිස්කාරයෙක් එනවද කියල බල බලා. එත් ඔහෙ ආපු පොලිස්කාරයෙක් නෑ. ටිකකින් එයාගෙ බය නැති වුණා. එයා ධෛර්යයමත් වෙලා මෙහෙම කිව්වා.

"ඒ ආච්චිට ඕනැ වෙන්නැත්තෙ මට පාඩමක් උගන්නන්න, මාව පොඩ්ඩක් බය කරන්න."

ආපහු වෙඩි තියන්න හිතාගෙන, සාෂා සාක්කුවට අත දැම්මා. එයාට කැප් පෙට්ටිය නම් හම්බ වුණා. ඒත් තුවක්කුව තිබුණෙ නෑ. එයා අනිත්

සාක්කුවෙත් බැලුවා. ඒකත් හිස්. ඊළඟට එයා කාමරේ අස්සක් මුල්ලක් නෑරම ඒක හෙව්වා. මේස අස්සෙත් කට්ටිලිය අස්සෙත් හෙව්වා. පොළොව පැළිලා තුවක්කුව ගිලගත්ත වගේ. එයාගෙ ඇස්වලින් කඳුළු ගලන්න ගත්තා. "මට ඒකත් එක්ක හරියට සෙල්ලම් කරන්න ලැබුණෙත් නෑ. ඒක කොච්චර අපූරු එකක්ද?"

"ඒක මිදුලෙදි නැති වුණා වෙන්න පුළුවන්ද?" අයිරා ඇහුවා.

"වැටෙන්න ඇත්තෙ ගේට්ටුවෙන් පිටදි" එයාට හදිසියෙම හිතුණා. එයා දොර ඇරල මිදුල හරහා පාරට දිව්වා. ඒත් තුවක්කුවෙ ලකුණක් වත් තිබුණෙ නෑ. "කව්රු හරි ඒක අහුලගෙන යන්න ඇති." එයා දුක් වුණා. එතකොටම එයා දැක්ක පොලිස් රාලහාමි කෙනෙක් අතුරු පාරෙ ඉඳන් සාෂලාගෙ ගේ පැත්තට එනව.

"එයා හොයන්නෙ මාව" සාෂා හිතුවා. "අර නාකි ආච්චි කේලම කියන්න ඇති" එයා කකුල්වලට පුළුවන් තරම් වේගෙන් ගෙදර දිව්වා.

"ඉතින් හොයාගත්තද?" මැරීනයි අයිරායි ඇහුවා.

"ෂ්....! " සාෂා කෙඳිරුවා. "පොලිස්කාරයා මග එනව."

"කොහෙටද?"

"මෙහෙට, අපේ ගෙදරට!"

"කොහෙදිද ඔයා එයාව දැක්කෙ?"

"පාරෙදි"

මැරීනයි අයිරායි එයාට හිනාවෙන්න ගත්ත. එක පාරක් පොලිස්කාරයෙක් දැක්කම ඒ ඇති කලිසම හලාගෙන දුවන්න. ඒ මනුස්සයා වෙන කොහේ හරි යනව ඇති, මෙහෙ එන එකක් නෑ."

"එයාට මම බය නෑ" සාෂා බය මැඩගෙන කිව්වා. "අනිත් එක, පොලිස්කාරයෙකුට මොකටද මාව?" එතකොටම බර අඩි සද්දයක් එක්ක දොරේ සීනුව වැදුණා. මැරීනයි, ඉරායි දෙන්න දොර අරින්න දිව්වා. සාෂා සාලෙ ඉඳන් කෙඳිරුවා. "එයාව ඇතුළට ගන්න එපා!"

ඒත් එතකොට මැරීන දොර ඇරල ඉවරයි. එතන හිටියෙ, දිලිසෙන බොත්තම් තියන කබායක් ඇඳපු පොලිස් රාලහාමි කෙනෙක්. සාෂා හතර



ගාතෙන් ඇදගෙන වැටිලා, සෙටිය යටට රිංගුවා. "ඉතින් පුංචි නෝනලා, 'නොම්මර හයේ' ගෙදර කෝකද?" රාලහාමිගෙ කටහඬ ඇහුණා.

"ඒක මෙහෙ නෙමෙයි," අයිරා උත්තර දුන්නා. "මේක නොම්මර එක. නොම්මර හයට යන්න ඕන නම්, වත්තට ගියාම දකුණු පැත්තෙ පළවෙනි දොර."

"වත්තට ගියාම, දකුණු පැත්තෙ පළවෙනි දොර?" රාලහාමි ආපහු ඇහුවා. "ඔව්" අයිරා උත්තර දුන්නා.

සාෂා දන් දනගත්ත, පොලිස් රාලහාමි ආවෙ එයා හොයන්න නෙවෙයි කියල. එයා සෙටිය යටින් එළියට එන්න හදනකොටම වගේ, රාලහාමි මෙහෙම ඇහුවා. "මේ හරියෙ, ඔයාල දන්න 'සාෂා' කියල පොඩි පිරිමි ළමයෙක් නැතිව ඇති, නේද?"

"මෙහේ ඉන්නව" අයිරා කිව්ව.

"ආ, එයාව තමයි මට ඕනකරල තියෙන්නෙ! " රාලහාමි එහෙම කියාගෙන කාමරේ ඇතුළට ආවා. මැරීනයි අයිරායි එයත් එක්ක කාමරේට ආවම දැක්කා, සාෂා කොහාට හරි අන්තරස්දාන වෙලා කියල. මැරීන සෙටිය යටටත් එබුණා. සාෂා එයාව දැකලා, එයාට අත මිට මොළවල තර්ජනයක් දැම්මා. ඉතින් එයාට සාෂව පාවල දෙන්නත් බෑ.

"ඉතින් කෝ ඔයාලගෙ සාෂා?" පොලිස් රාලහාමි ඇහුවා. සාෂ ගැන බයවෙලා හිටපු ගෑනු ළමයි දෙන්නට මොනව කියන්නද කියල හිතාගන්න බෑ. අන්තිමේදි මැරීන මෙහෙම කිව්වා. "මෙකයි, මේ වෙලාවෙ එයා ගෙදර නෑ. මම හිතන්නෙ ඇවිදින්න යන්න ඇති."

"ඔයා මොනවද එයා ගැන දන්නෙ?" අයිරා ඇහුව.

"මම මොනවද එයා ගැන දන්නෙ?" රාලහාමි කිව්වා. "මම දන්නව එයාගෙ නම 'සාෂා' බව. තව, එයා ළඟ තිබිච්ච අලුත් තුවක්කුව දැන් එයා ළඟ නැති බවත් දන්නවා."

"එයා හැමදේම දන්නවනෙ" සාෂා හිතුවා. බයටම එයාගෙ නහයත් කසන්න ගත්තා. එක පාරටම එයාට කිඹුහුමක් ගියා. "හච්චිං! "

"ඒ කව්ද?" පොලිස් රාලහාමි පුදුමයෙන් ඇහුවා.

"ඒ අපේ... ඒ අපේ... බල්ලා." මැරීනා බොරුවක් කිව්වා. "එයා මොකක්ද සෙටිය අස්සට වෙලා කරන්නෙ?" ඒ ගමන රාලහාමි අහපි.

"එයා හැම තිස්සෙම සෙටිය අස්සට වෙලා නිදාගන්නවා." මැරීන ආපහු පව කියන්න ගත්තා.

"මොකක්ද උගේ නම?" රාලහාමි ඇහුවා.

"ම්ම්ම්... බොබී" මැරීන බීට් අලයක් වගේ රතු වීගෙන කිව්වා.

"බොබී, බොබී, මෙහෙ එන්න කොලුවෝ..." රාලහාමි කතා කළා. එයා බල්ලට උරුහම්බාන්න ගත්ත. "ඇයි ඌට එළියට එන්න ඕන නැත්තෙ? ඒයි කොල්ලො, ඒයි කොල්ලෝ.. නෑ වැඩක් නෑ. ඌ හොඳ බල්ලෙක්ද? උගෙ වරිගෙ මොකක්ද?"

"ම්ම්ම්.." මැරීන කිව්වෙ උත්තරයක් හිතන අතරෙම, ඒක පරක්කු කරන්න හිතාගෙන.

"ම්ම්ම්...!" එයාට හිතාගන්න බෑ, බලු වර්ගවලට තියෙන්නෙ මොන වගේ නම්ද කියලා. "මොකක්ද උගේ වර්ගෙ?" එයා ඇහුවා. "මොකක්ද අනේ ඒක? ඒක හොඳ වර්ගයක්, මම දන්නව.. ආ.. ඔව්, ඌ 'ෆොක්ස්ටෙරියර්'* කෙනෙක්."

"ඔහෝ! කොයි තරම් අපූරු බල්ලෙක්ද?" රාලහාමි සතුටින් කිව්වා. "මම උන්ව හොඳට දන්නවා. උන්ට තියෙන්නෙ ලොම් බේරෙන අපූරු නහයවල්." එයා දෙකට නැමිලා සෙටිය යටට එබුණා. බාගෙට මැරිල හිටපු සාෂා පොලිස් රාලහාමි දිහා ඇස් ලොකු කරල බැලුවා. රාලහාමි කොයිතරම් පුදුම වුණාද කිව්වොත් එයාට සිවුරුහන් බැවුණා.

"ඔහෝ, එහෙනම් මෙයයි ඔයාලගෙ ෆොක්ස්ටෙරියර්!" එයා කිව්වා. "ඔයා මොකක්ද සෙටිය යටට වෙලා කරන්නෙ ංආ? ඒයි ළමයො, එළියට එන්න මට ඔයාව අල්ලගන්න"

"මම එන්නෙ නෑ." සාෂා අඬන්න ගත්තා.

"ඇයි නැත්තෙ?"

---

*දිගු ලොම් ඇති කුඩා බලු වර්ගයක්.

"ඔයා මාව පොලිසියට ගෙනියාවි" සාෂා කිව්වා.

"ඒ මොන එහෙකටද?"

"අර ආච්චි නිසා"

"මොන ආච්චි නිසාද?"

"අර මම වෙඩි තිබ්බම බයවෙච්ච එක්කෙනා."

"මට තේරෙන්නෙ නෑ මොන ආච්චියෙක් ගැනද ඔයා ඔය කියවන්නෙ කියලා"

"සාෂා එයාගෙ තුවක්කුවත් එක්ක සෙල්ලම් කරන්න එළියට ගියා," අයිරා පැහැදිලි කළා. "එතකොට පාරෙ ගියපු වයසක ගෑනු කෙනෙක් බය වෙලා."

" ංආ, ඒකයි එහෙනම්." පොලිස් රාලහාමි කිව්වා. "එතකොට ඒක එයාගෙ තුවක්කුව?" එයා දිලිසෙන අලුත් තුවක්කුවක් සාක්කුවෙන් ගත්තා.

"ඒ ඒක තමයි... ඒ ඒක තමයි..." අයිරා කිව්වා. "මැරීනයි මායි එයාට ඔක අරන් දුන්නම එයා ඒක නැති කරගත්ත. කොහෙදිද ඔයා ඕක හොයාගත්තෙ?"

"මේ ළඟ මිදුලෙ. ඔයාලගෙ දොර ළඟදි" රාලහාමි සන්සුන්ව උත්තර දුන්නා. "හරි, දැන් මට ඇත්ත කියන්න, ඇයි ඔයා ඒ ගෑනු කෙනාව බය කළේ?"

"මම ඕනෑකමින් කළේ නෑ." සාෂා සෙටිය යට ඉඳන් කිව්වා.

"ඔයා බොරු කියන්නෙ," රාලහාමි කිව්වා. "ඒක ඔයාගෙ ඇස් දෙකෙන් පේනවා. මට ඇත්ත කියන්න, එතකොට මම ඔයාගෙ තුවක්කුව දෙන්නම්"

"මම ඇත්ත කිව්වොත් මට මොනවද වෙන්නෙ?" සාෂා ඇහුවා.

"මොනවත් නෑ. ඔයාට ආපහු තුවක්කුව ලැබෙයි, එච්චරයි."

"ඔයා මාව පොලිසි ගෙනියන්නෙ නැද්ද?"

"නෑ!"

"මට ඒ ආච්චිව බය කරන්න ඕන වුණේ නෑ," සාෂා කිව්වා. "මට ඕන වුණේ, එයා බය වෙනවද නැද්ද කියල බලන්න විතරයි."

"අන්න ඒක නම් හරි නෑ නේද මගෙ කොල්ලෝ?" ඒකට නම් ඔයාව ඇත්තටම පොලිසියට ගෙනියන්නයි වටින්නෙ. ඒත් මම වචනෙ දීපු නිසා දැන් ඒක මට කඩන්න බෑ. මම මේ සැරේ ඔයාව අල්ලගන්නෙ නෑ. ඒත් ඔයා පරිස්සම් වෙන්න. ඔයා ආපහු තක්කඩි වැඩක් කරල මට අහුවුණොතින් නම්, ඔයාට ලොකු පිම්මකට ලෑස්ති වෙන්න වෙයි! හරි, දැන් ඇවිත් ඔයාගෙ තුවක්කුව ගන්න."

"නෑ. මම පස්සෙ එළියට එන්නම්, ඔයා ගියාම." සාෂා කිව්වා.

"පිස්සු කොලුවෙක්!" රාලහාමි හිනා වුණා.

එයා තුවක්කුව සෙටිය උඩින් තියල යන්න ගියා. මැරීන ගියා එයාට නොම්මර 6 ගෙදර පෙන්නන්න. ඒ අතරෙ සාෂා සෙටිය යටින් එළියට ඇවිත්, තුවක්කුව දිහා බලල කෑගැහුවා.

"මේ තියෙන්නෙ ඒක. මගෙ අපූරු තුවක්කුව. ඒක ආපහු මගෙ ළඟ."

එයා ඒක උස්සල බදාගෙන, මෙහෙම කිව්ව. "මට තේරෙන්නෙ නැති දේ තමයි, ඒ පොලිස්කාරයා මගෙ නම දැනගත්තෙ කොහොමද කියන එක."

"ඉතින් ඔයාමනෙ ඒකෙ නම කෙටුවෙ." අයිරා කිව්වා.

ඒ මොහොතෙම මැර්තා ආපහු ඇවිත් එයාගෙ මල්ලියට හොඳට දෙහි කැපුව.

"මොන එපාකරපු විහිළුවක්ද ඒ!" එයා කෑගැහුව. "ඔයා නිසා මටත් ඒ පොලිස්කාරයට බොරු කියන්න වුණා. මට ඒ වෙලාවෙ ලජ්ජාවෙ පණ ගියා. ආපහු තක්කඩි වැඩක් කරල අහුවෙනවකො බලන්න, මං ඔයාව බේරගනීද කියල. මේ අන්තිම වතාව!"

"මම ආපහු එහෙම කරන්නෙ නෑ. මම පොරොන්දු වෙනවා." සාෂ කිව්වා. "මට දැන් තේරෙනව, මිනිස්සුන්ව බය කරන්න හොඳ නැති බව."

බොබීට බාබොස් හමුවීම

එකෝමත් එක කාලෙක හිටිය බල්ලෙක් 'බාබොස්' කියලා. ඌට යාළුවෙක් හිටිය පූසෙක්, 'වාස්ක' කියලා. ඒ දෙන්නම ජීවත් වුණේ සීය කෙනෙක් එක්ක. සීය වැඩට ගියාම, බාබොස් ගේ මුර කළා. වාස්ක මීයන් ඇල්ලුවා.

දවසක් සීය වැඩට ගියාම වාස්ක, බාබොස්ව ගෙදර දාල කොහෙදෝ ගියා. කරන්න දෙයක් නැතිව කම්මැලිකමේ ඒ නාකි බල්ල ජනේලෙට නැගලා, ජනේලෙන් එළියෙ හතර අතටම එබිල බැලුවා.

"සීයට නම් හොඳයි," බාබොස් හිතුවා. "එයා වැඩට යන නිසා එයාට කරන්න දෙයක් තියෙනව. වාස්කටත් හොඳට විනෝද වෙන්න පුළුවන්,

එයාට පුළුවන් වහලවල් දිගේ රෝන්දෙ යන්න. ඒත් මම ඔහේ වාඩිවෙලා ගෙදර මුර කරන්න ඕන."

එතකොටම බාබොස්ගෙ යාළුව බොබී පාර දිගේ දුවගෙන ආවා. ඒ දෙන්න කොච්චරවත් මිදුලෙදි එකට සෙල්ලම් කරල තියෙනවා. යාළුවා දැක්ක ගමන්ම බාබොස් සතුටු වුණා.

"ඒයි බොබී, ඔයා කොහෙද යන්නෙ?" එයා කෑගැහුවා.

"කොහෙවත් නෑ." බොබී කිව්වා. "මම මේ ඔහේ දුවනවා. ඉතින් ඔයා මොනවද ගෙදර වාඩිවෙලා කරන්නෙ? අපි ඇවිදින්න යමු"

"මට බෑ," බාබොස් උත්තර දුන්නා. "සීය මට කිව්වා ගෙදර මුර කරන්න කියලා. ඔයා එන්න මෙහේ"

"කව්රුවත් මාව පන්නලා දාන එකක් නැද්ද?" බොබී ඇහුවා.

"නෑ, සීයා වැඩට ගියා. ගෙදර කවුරුත් නෑ. ජනේලෙ දිගේ නගින්න."

බොබී ජනේලෙන් පැනල ඇතුළට ඇවිත්, පුදුමයෙන් වගේ වටපිට බැලුවා.

"ඔයා නම් ගතකරන්නෙ ඉස්තරම්ම ජීවිතයක්!" එයා බාබොස්ට කිව්වා. "ඔයා ඉන්නෙ ගේක, මං ඉන්නෙ බලු කූඩුවක. ඒකෙ වහලත් තෙමෙනවා, ඒ මදිවට මට හෙලවෙන්න වත් ඉඩක් නෑ. මහ එපාකරපු ජීවිතයක් ඒක නම්."

"ඔව්" බාබොස් කිව්වා. "අපිට තියනව ලස්සන ගෙයක්ඃ කාමර දෙකයි, කුස්සියයි, නව නාන කාමරේකුයි. ඔයා කැමති තැනක යන්න.

"මාව අයිති නෝන මට සාලෙටවත් එන්න දෙන්නෙ නෑ." බොබී කිව්වා. "එයා කියනව, මම මුර බල්ලෙක් නිසා කූඩුවක ඉන්න ඕනලු. දවසක් මම කාමරේකට ගියා. ඔයාට බලන්නයි තිබුණෙ ජරමරේ. එයාලා යටි ගිරියෙන් කෑගැහුවා. වෙන එකක් තියා, මට කෝටුවකිනුත් ගැහුවා." එයා එහෙම කියලා, කකුලෙන් කන කසන්න ගත්තා. ඊළඟට එයා දැක්කා, ලොකු බට්ටෙක් එක්ක බිත්තියෙ එල්ලල තිබ්බව ඔරලෝසුව.

"අර මොකක්ද අර බිත්තියෙ එල්ලල තියෙන්නෙ?" එයා ඇහුවා. "අර 'ටික් ටොක්-ටික් ටොක්' එක. අර වලිගෙකුත් එල්ලි එල්ලි තියෙන?"

"ඒ ඔරලෝසුවක්." බාබොස් කිව්වා. "ඔයා මීට කලින් ඔරලෝසුවක් වත් දැකලා නැද්ද?"

"නෑ. ඒක මොනවටද?"

බාබොසුත් හරියට දැනගෙන හිටියෙ නෑ, ඒත් එයා ඒක පැහැදිලි කරන්න හැදුවා. "මේකයි, ඒක මෙහෙම නේ.... ඔරලෝසුවක් ... ඒක යනවා."

"ඔයා කොහොමද ඒක යනවා කියන්නෙ?" බොබී පුදුමයෙන් ඇහුවා. "ඒකට කකුල් නැනෙ. නේද?"

"මං කිව්වෙ ඒකට කියන විදිය. ඒක ඇත්තටම කොහේවත් යන්නෙ නෑ, ටික් ටික් ගගා ගහනවා."

"ඔහෝ.., ඉතින් ඒක මිනිස්සුන්ට ගහන්න ගන්නවා? එහෙමද?" බොබී ඇහුවා.

"නෑ, නෑ, ඒක කොහොමද කාටවත් ගහන්නේ?"

"ඉතින් ඔයාමනේ කිව්වෙ, ඒක ගහනව කියලා!"

"මම කියන්න හැදුවෙ, ඒක ඝණ්ටාරයක් ගහනව කියලා... ටාං, ටාං.."

"ංආ ඒක එහෙම කියන්න තිබුණනෙ"

ඊළඟට එයා මේසෙ උඩ තිබ්බ්ච පනාව දැකල මෙහෙම ඇහුවා.

"මොන ජාතියෙ කියතක්ද අර තියෙන්නේ?"

"මොන කියතක්ද? ඒක පනාවක්"

"මොකටද ඒක?"

"ඔයා නම් මහ මැටි මෝලෙක්" බාබොස් කිව්වා. "ඕන කෙනෙකුට දැක්ක ගමන්ම තේරෙනවා, ඔයා කල්පයක් විතර කුඩුවක ඉඳපු බව. ඔයා දන්නෙ නැද්ද පනාවක් තියෙන්නෙ මොකටද කියලා? කොණ්ඩෙ පීරන්න!"

"ඒ කොහොමද කොණ්ඩෙ පීරන්නෙ?"

බාබොස් පනාව අරගෙන, එයාගෙ ඔළුව ඒකෙන් පීරන්න ගත්තා. "මේ බලන්න, මෙහෙමයි කොණ්ඩෙ පීරන්නෙ. කන්නාඩිය ඉස්සරහට ගිහින් ඔයාගෙ කොණ්ඩෙත් පීරගන්න"

බොබී පනාව අරගෙන කන්නාඩිය ළඟට ගිහින්, එයාගෙම ඡායාව දිහා රවල බැලුවා. "ඒයි මේ බලන්න" එයා කෑගැහුවා, කන්නාඩිය දිහාට ඇඟිල්ල දික් කරගෙන. "එතන තව බල්ලෙක් ඉන්නවා!"

"මැට්ටො, ඒ කන්නාඩියෙ ඉන්නෙ ඔයා!" බාබොස් හිනා වුණා.

"ඔයා කොහොමද ඒ මමයි කියල කියන්නෙ? මම මෙතන, ඒ බල්ලා අතන!"

ඒ ගමන බාබොස් කන්නාඩිය ළඟට ආවා. බොබී එයාගෙ ඡායාව දකල කෑගැහුවා, "අර බලන්න දූන් උන් දෙන්නයි"

"නෑ, නෑ," බාබොස් කිව්වා. "ඒ වෙන දෙන්නෙක් නෙවෙයි, ඒ අපි දෙන්නා. කන්නාඩියෙ ඉන්න උන්ට පණ නෑ."

"ඔයා කොහොමද පණ නෑ කියන්නෙ?" බොබී කෑගැහුවා. "උන් හෙලවෙනවා, බලන්න!"

"නෑ මැට්ටො," බාබොස් කිව්වා. "ඒ අපියි හෙලවෙන්නෙ. ඔයාට ජේන්නෙ නැද්ද උන්ගෙන් එකෙක් මං වගේ බව?"

"ඔව්, ඇත්ත." බොබී අන්දමන්ද වීගෙන කිව්වා. "ඒකා නම් ඇරපු අතක් නෑ, ඔයා වගේම තමයි."

"අනිත් එකා ඔයා වගේ."

"නෑ!" බොබී කිව්වා. "ඒ කකුල් බකල වෙච්ච, කැත, කවලමෙක් නේ!"

"ඒ ඔයාගෙ කකුල්ම තමයි."

"නෑ. ඔයා මාව ගොනාට අන්දනවා! ඔයා එතෙන්ට අමුතු බල්ලො දෙන්නෙක්ව දාලා. හිතන් ඉන්නෙ මං ඕව පිළිගනීවි කියලද ංආ?" බොබී කිව්වා. එයා කන්නාඩිය ඉස්සරහට වෙලා කොණ්ඩෙ පීරන්න අරගෙන, හිට් හැටියෙම හිනාවෙන්න පටන්ගත්තා. "අර බලන්න, අර කන්නාඩියෙ ඉන්න මැට්ටත් උගෙ කොණ්ඩෙ පීරනවා. නියම මැට් මෝලෙක්!"

බාබොස් කරබාගෙන පැත්තකට වුණා. බොබී කොණ්ඩෙ පීරල ඉවර වුණාට පස්සෙ, පනාව ආපහු තියල මෙහෙම කිව්වා,

"මේක නම් මහ විකාර තැනක්. අමුතුම ජාතියෙ ඔරලෝසුවක්, බල්ලො ඉන්න කන්නාඩියක්, ගැජට් කෑලි, පනා..."

අපට ටෙලිවිෂන් එකකුත් තියෙනව." ටෙලිවිෂන් එක දිහාට ඇඟිල්ල දික්කරගෙන බාබොස් කයිවාරු ගැහුවා.

"ඒක මොනවටද?" බොබී ඇහුවා.

"ඒක නම් නියම බඩුවක්. ඒකට ඕන දෙයක් පුළුවන්. සින්දු කියන්න, වාදනය කරන්න විතරක් නෙමෙයි, පින්තූර පෙන්නන්න වුණත්."

"මොනවා? අර කබල් පෙට්ටිය?"

"ඔව්."

"නෑ!"

"සත්තයි!"

"හරි, අපි එහෙම නම් ඒක සිංදු කියනව අහමු."

බාබොස් ටෙලිවිෂන් එක දැම්මා. ඒකෙන් සංගීතයක් ආවා. බල්ලො දෙන්න සතුටින් කාමරේ වටේ නටන්න ගත්තා. නැටුවා, නැටුවා, හති වැටෙනකල්.

"දැන් නම් මට බඩගිනියි." බොබී කිව්වා.

"ඔයා මේසෙන් වාඩිවෙලා මගේ අමුත්තා වෙන්න. බාබොස් කිව්වා. බොබී මේසෙන් ඉඳගන්න අතරෙ, බාබොස් කබඩ් එකේ යට තට්ටුවෙ තිබ්බච ජෙලි භාජනේකුයි උඩම තට්ටුවෙ තිබ්බච පස්තැලකුයි ගත්තා. එයා ජෙලි භාජනේ අරගෙන බිමින් තියලා, උඩම තට්ටුවට නැග්ගා පස්තැලෙ ගන්න. ඒක අරන් බිමට බහිද්දි, කකුල ජෙලි භාජනේට ගිහින් එයාත් භාජනේට වැටුණා. දැන් එයාගෙ පිට පුරාම රතු ජෙලි!

"බොබී, ඉක්මන් කරල මේ ජෙලි ටික කන්න." බාබොස් කෑගැහුවා.

"කොහේද ජෙලි?" බොබී ඇහුවා.

"මගේ පිටේ," බාබොස් කිව්වා. "ඒ ටික ලෙවකන්න!" ඒක නම් ආයෙ දෙපාරක් කියන්න ඕන වුණේ නෑ!

"මේව තමයි නියම ජෙලි!" බොබී කිව්වා. ඊළඟට දෙන්නත් එක්ක එකතුවෙලා, පස්තැලෙ මේසෙන් ගෙනිහින් තියලා, ඒකට තවත් ළංවෙන්න මේසෙ මැදින්ම වාඩි වෙලා, කන ගමන් කතා කරන්න ගත්තා.

"ඔයා නම් හොඳට ජීවත් වෙනවා," බොබී බාබොස්ට කිව්වා. "ඔයාට නැති දෙයක් නෑ."

"ඔව්," බාබොස් කිව්වා. "මම හොඳින් ඉන්නව තමයි. මට කැමති ඕන දෙයක් කරන්න පුළුවන්. මට කොණ්ඩෙ පීරන්න ඕන නම් මං එහෙම කරනව. ඕන නම් ටෙලිවිෂන් එකත් එක්ක විනෝද වෙන්න පුළුවන්. මට පුළුවන් කැමති දේවල් කන්න. වෙන එකක් තියා, ඕන නම් දවසෙම ඇඳේ වැටිල ඉන්නත් පුළුවන්."

"අර වයසක මනුස්සයා, ඔයා එයාගෙ ඇඳ අවුල් කරන එක ගැන මොනවත් හිතන්නෙ නැද්ද?"

"මොකක්? ඒක මගෙ ඇඳ! එයාගෙ නෙවෙයි."

"ඉතින් එයා නිදාගන්නෙ කොහේද?"

"අර මුල්ලෙ තියෙන පැදුරෙ."

ඉතින් ඔය විදියට පටන්ගත්තට පස්සෙ බාබොස්ට බොරු කියන එක නවත්තගන්න බැරි වුණා. "මේ ඔක්කොම මගේ." බාබොස් කයිවාරු ගැහුවා. "මේ මේසෙ මගේ, සේප්පුව මගේ, ඒකෙ තියන දේවලුත් මගේ."

"මට පොඩ්ඩකට ඔයාගෙ ඇඳේ හාන්සියක් දාන්න පුළුවන්ද?" බොබී ඇහුවා. "මම උපන් තේකට ඇඳක නිදාගෙන නෑ."

"එන්න එහෙනම්," බාබොස් කැමති වුණා. ඊට පස්සෙ දෙන්නම ඇඳේ හාන්සි වුණා. ඉතින් ඔහොම ඉන්නකොට බොබී දැක්කා, බිත්තියෙ එල්ලලා තිබ්බව හම් පටිය.

"මොකටද අර හම් පටියක් අතන එල්ලලා තියෙන්නෙ?" එයා ඇහුවා.

"හම් පටියද? ංආ ඒක අර නාකි සීයට. එයා හරියට හැසිරුණේ නැත්තොත්, මම එයාට ඒකෙ රහ බලන්න දෙනවා." බාබොස් කිව්වා.

"නියමයි" බොබිත් ඒක ඇත්තට අරගෙන කිව්වා.

එයාල එහෙම හාන්සිවෙලා ඉන්නකොට හොඳ සනීපෙට නින්ද ගියා. ඒගොල්ලන්ට සීය වැඩ ඇරිල ගෙදර එන සද්දෙ වත් ඇහුණෙ නෑ. ඉතින් එයා, එයාගෙ ඇඳේ බල්ලො දෙන්නෙක් ඉන්නව දැකලා, අර හම් පටිය අරගෙන වැනුව හයියෙන්! බොබී ජනේලෙන් පැනල එයාගෙ කූඩුවටම දිව්වා, පණ එපා කියල! බාබොස්, කොස්ස දාල වත් ගන්න බැරි විදියට ඇඳ යටට රිංගගත්තා. ඌ නෙමෙයි හවස් වෙනකල්ම එතනින් හෙලවුණේ.

වාස්ක හවස ගෙදර ඇවිල්ලා, ඇඳ යටට වෙලා ඉඳපු බාබොස්ව දැක්ක ගමන්ම වෙච්ච දේ ඌට තේරුම් ගියා.

"ඒයි වාස්ක," බාබොස් කතා කළා. "මම ආයෙත් ගුටි කෑවා. මට වත් තේරෙන්නෙ නෑ, ඇයි කියලා. මට ලිංගුස් කෑල්ලක් ගෙනත් දෙනවද සීයගෙන් ඉල්ලගන්න පුළුවන් නම්?"

වාස්ක හෙමිහිට සීය ළඟට ගිහින්, 'ඤාව්' ගගා එයාගෙ කකුලෙ දැවටුණා. සීය එයාට සොසේජ් කෑල්ලක් විසික්ක. වාස්ක ඒකෙන් බාගයක් කාල, ඉතුරු බාගෙ ඇඳ යට හිටපු අසරණ බාබොස්ට දුන්නා.

කතාකාරයෝ

මිෂුට්කයි ස්ටසිකුයි වත්තෙ බංකුවක වාඩිවෙලා කතා කර කර හිටියා. ඒත් ඒ සාමාන්‍යයෙන් පිරිමි ළමයි කතා කරන දේවල් නම් නෙවෙයි. ඒ දෙන්න ගල් පැලෙන බේගල් කිය කියා හිටියෙ හරියට හොඳම බොරුකාරයා තෝරන තරගයක් තිබ්බ වගේ.

"ඔයාගෙ වයස කීයද?" මිෂුට්ක ඇහුවා.

"අනූ පහයි. ඔයාගෙ වයස කීයද?"

"මට එකසිය හතළිහයි" මිෂුට්ක කිව්වා. "මම බොරිස් මාම තරමට ලොකුවට හිටියෙ, එත් මාව ආපහු පුංචි වුණා."

ස්ටසික් කිව්වා.

"මම පොඩියට හිටියෙ. ඊළඟට මම ලොකු වුණා. ඊට පස්සෙ මම ආයෙම පොඩි වුණා. ළඟදිම මාව ආපහු ලොකු වෙයි.

"මම ලොකු කාලෙ මට ගඟ හරහා පීනන්න පුළුවන්." මිෂුට්ක කිව්වා.

"හහ්! මට මුහුද හරහා පීනන්න පුළුවන්."

"ඉතින් මොකෝ! මට මහා සාගරය හරහා පීනන්න පුළුවන්."

"මම පියාඹන්නත් දැනගෙන හිටියා!"

"බලමුකො ඔයා ඒක කරන හැටි!"

"දැන් බෑ ඉතින්, මට අමතක වෙලා."

"දවසක් මම මූදෙ පීනද්දි," මිෂුට්ක කිව්වා. "මෝරෙක් කෙළින්ම මගෙ ළඟට ආවා. මං ඌට හොඳටම ගැහුවා. ඒත් ඌ මගෙ ඔළුව කඩල දැම්මා කොහොම හරි."

"ඒක ඇත්තක් නෙමෙයි"

"නෑ, එහෙම තමයි."

"ඇයි ඔයා මැරුණෙ නැත්තෙ?"

"ඒ මොන එහෙකටද? මම ආපහු ගොඩට පීනලා ගෙදර ගියා."

"ඔළුව නැතුව!"

"ඔව්. මට මොන එහෙකටද ඔළුවක්?"

"ඔයා කොහොමද යන පාර බලාගත්තෙ, ඔළුව නැතුව?"

"මං ඔහේ ඇවිදගෙන ගියා. ඔළුවක් නැතිව ඇවිදින එක අමාරු නෑනෙ."

"ඉතින් ඔයාට දැන් කොහොමද ඔළුවක් තියෙන්නෙ?"

"ංආ ඒක මේ මගේ බෙල්ල දිගේ වැව්ච්ච අලුත් එකක්"

"එයා නම් නියම කතාවක් හැදුවා." ස්ටසික් ඉරිසියාවෙන් හිතුවා. එයාට ඕන වුණා වඩා හොඳ එකක් හිතන්න. ඉතින් එයා මෙහෙම කිව්වා.

"ඕක මහ දෙයක් නෙවෙයි, අප්‍රිකාවෙ ඉඳිද්දි කිඹුලෙක් මාව ගිල්ලා."

"ඒ බොරු" මිෂුට්කා එහෙම කියල හිනා වුණා.

"නෑ, බොරු නෙමේ"

"එහෙනම් ඔයා කොහොමද තවම පණපිටින් ඉන්නෙ?"

"එයා මාව ආපහු එළියට දැම්මා."

මිෂුට්කා මොනවත් කිව්වෙ නෑ. එයාට ඕන වුණා ස්ටසික්ට වඩා හොඳ කතාවක් හිතන්න. මිනිත්තු කීපයක් කල්පනාකරල එයා කිව්වා, "දවසක් මම පාරෙ ඇවිද ඇවිද හිටියා. කාර්, බස්, ට්‍රොලි හැම තැනම"

"මං දන්නව, මං දන්නව." ස්ටසික් කෑගැහුවා. "ඔයා කියන්න හදන්නෙ ඔයාව යටවුණා කියලනේ. ඔයා ඒක කලිනුත් කිව්වා."

"ඒක නෙවෙයි මං කියන්න හදන්නෙ"

"හරි ඉතින් කියාගෙන යන්නකො."

"හරි, මම ඔහේ මගෙ පාඩුවෙ ඇවිදගෙන ගියා. එකපාරටම මම දැක්කා බස් එකක් මගෙ පැත්තට එනවා. මං ඒක හරි හැටි දැක්කෙ නෑ, මට පෑගෙනකල්. 'ක්‍රැක්!' මං ඒක කෑලිවලට කඩල දැම්මා."

"හෘ හහ් හා! ෂෝක් කතාව."

"ඒක තේ!"

"ඔයා කොහොමද බස් එකක් පොඩි කරන්නෙ?"

"ඒක හරි පොඩි එකක්. ඇත්තටම ඒක සෙල්ලම් එකක්. පොඩි කොල්ලෙක් ඒක නූලකින් ඇදගෙන ගියේ."

"ඕක මොකක්ද?" ස්ටසික් කිව්වා. "දවසක් මං හඳට ගියා."

"අනේ බොරු නොකිය ඉන්නවා!" මිෂුට්කා හිනාවුණා.

"ඔයාට මාව විශ්වාස නැද්ද? සත්තයි, මං එහෙ ගියා."

"ඔයා කොහොමද එහෙට ගියේ?"

"රොකට් එකෙන්. නැතුව වෙන මොකෙන්ද හඳට යන්නෙ? හරියට දන්නෙ නෑ වගෙ අහන්නෙ!"

"මොනවද ඔයා එහෙදි දැක්කෙ?"

"ඕ, අර..." ස්ටසික් ගොතගැහුවා. "මං මොනවද දැක්කෙ? මම මොනවත් දැක්කෙ නෑ."

"හඃ හහ් හා!" මිෂුට්ක හිනා වුණා. "ඒත් කියන්නෙ හඳට ගියා කියලා!"

"ඔව්. මං ගියා තමයි."

"එහෙනම් ඇයි ඔයා මොනවත් නොදැක්කෙ?"

"ඒ මොකද, එහේ කළුවර නිසා. මං එහෙ ගියේ රෑක, හීනෙන්! මං රොකට් එකකට නැගල අභ්‍යවකාශයට ගියා. ෂ්....! ඊළඟට ආපහු ආවා. දඩාං! ඊට පස්සෙ මට ඇහැරුණා."

"ඕ," මිෂුට්ක හෙමීට කිව්වා. "ඔයාට කියන්න තිබුණනෙ. මං දැනගෙන හිටියෙ නෑ ඔයා ගියේ හීනෙන් බව."

එතකොට 'අයිගර්' කියන අසල්වැසි ළමය ඇවිත් එයාල ළඟින් වාඩි වුණා. එයා ටික වෙලාවක් ඒගොල්ලන්ට ඇහුම්කන් දීලා, මෙහෙම කිව්වා.

"මොන පච ගොඩක්ද මේ? ඔයාලට ලැජ්ජා නැද්ද?"

"මොකටද? අපි කාවවත් 'අන්දවන්නෙ' නෑ." ස්ටසික් කිව්වා. "අපි නිකම් දේවල් හිතනවා. හරියට සුරංගනා කතා හදනව වගේ."

"සුරංගනා කතා!" අයිගර් නාහෙ අකුළගෙන කිව්වා. "මොන බබා සෙල්ලමක්ද ඒ?"

"ඔයා හිතන්නෙ කතා ගොතන එක ලේසි වැඩක් කියලද?"

"නැතුව"

"හරි! ඔයා මොකක් හරි හිතන්නකො."

"මට තත්පරයක් දෙන්නකො මං කරන්න." අයිගර් කිව්වා. මිෂුට්කයි ස්ටසිකුයි තව කෙනෙක් එකතුවෙච්ච එක ගැන සතුටින් බලාගෙන හිටියා.

"තත්පරයක් ඉන්න," අයිගර් ආපහු කිව්වා. "ආ... ම්.... උම්..."

"ඔයා 'ආං', 'ඌං' ගානව විතරනෙ!"

"මිනිත්තුවක් ඉන්න. මට හිතන්න දෙන්න."

"හරි හිතන්න."

"අහ්.." අයිගර් ආපහු එහෙම කියලා අහස දිහා බැලුවා. "ඉන්න, ම්.."

"ඉතින්? ඔයා කිව්වෙ ඒක ලේසියි කියලා. ඔයා කිව්වෙ ඒක බබාලගෙ සෙල්ලමක් කියලා."

"ඉන්න! ආහ්, මං දන්නවා! දවසක් මම බල්ලෙකුට විහිළු කරලා, ඌ මාව හැපුවා. මේ, තාමත් මගෙ කකුලෙ ඒකෙ කැලල තියෙනවා."

"ඒත් ඔයා මොකක්ද ඒ ගැන හැදුවෙ?"

"මුකුත් නෑ. මම ඔයගොල්ලන්ට කිව්වෙ, ඇත්තටම වුණ දෙයක්."

"ඒකට ඔයා කිව්වෙ නම්, ඔයා කතා ගොතන්න දන්නවා කියලා!"

"මං දන්නවා. ඒත් ඔයාල වගෙ නෙවෙයි. ඔයාල බොරු ගොඩක් ගෙතුවට ඒකෙ වැඩක් තියෙනවද? මම නං ඊයෙ බොරුවක් ගොතලා ජොලියෙ හිටියා."

"ඒ කොහොමද?"

"මෙකයි, ඊයෙ අම්මයි තාත්තයි ගමනක් ගියා. ටානියයි මමයි ගෙදර නැවතුණා. ටානිය නිදාගන්න ගියා. ඒත් මම කබඩ් එක ඇරල ජෑම් බෝතලෙන් බාගයක්ම කෑවා. පස්සෙ මං හිතුවා මට ගුටියක් ලැබෙයි කියලා. ඉතින් මං ටානියගෙ කට වටේ ජෑම් ටිකක් තැවරුවා. අම්මා ගෙදර ඇවිත් ඇහුවා, 'කව්ද ජෑම් කෑවෙ?' කියලා. ඉතින් මං කිව්වා, 'ටානිය' කියලා. අම්ම එයා ළඟට ගියාම, එයාගෙ කට වටේට ජෑම්. අද උදේ අම්ම එයාට දඬුවම් කළා. ඒත් මට තව ජෑම් දුන්නා. බලන්න, ඒක කොයිතරම් ජොලිද!"

"ඔයාගෙ නංගි ඔයා නිසා ගුටි කෑවා, ඔයා ජොලියෙ හිටියා!" මිෂුටික කිව්වා.

"ඉතින් මොකෝ?"

"මුකුත් නෑ. ඒත් ඔයා... මොකෙක්ද? නියම බෙගල් කාරයෙක්! අන්න එහෙම එකෙක් තමයි ඔයා!"

"ඔය දෙන්නත් බේගල්කාරයො ඩබලක්!"

"යනව යන්න!" අපිට ඔයා ළඟින් වාඩි වෙන්නවත් ඕන කමක් නෑ."

"ඉන්න කිව්වත් මම ඉන්නෙ නෑ."

අයිගර් නැගිටල යන්න ගියා. මිෂුට්කයි ස්ටසිකුයි දෙන්නත් හිතාගත්තා ගෙදර යන්න. අතරමගදි එයාල අයිස්ක්‍රීම් කඩයක් පහු කළා. ඒ දෙන්න නැවතිලා සාක්කු ඇවිස්සුවා සල්ලි තියෙනවද බලන්න. එස්කිමෝ එකකට විතරයි ඒ සල්ලි ඇති වුණේ. "අපි එකක් අරන් දෙකට බෙදාගනිමු." ස්ටසික් කිව්වා. කඩේ ගෑනු කෙනා ඒගොල්ලන්ට එස්කිමෝ එකක් දික්කළා.

"එන්න, අපි ගෙදර යමු," මිෂුට්ක කිව්වා. "එතකොට අපිට ඒක පිහියකින් කපලා දෙකට බෙදාගන්න පුළුවන්."

"අන්න හරි."

එයාලට පඩිපෙළේදි ටානියා හම්බවුණා. අඬපු නිසා එයාගෙ ඇස්, රතුවෙලා තිබුණෙ.

"මොනවටද ඔයා ඇඬුවෙ?" මිෂුට්ක ඇහුවා.

"අම්ම මට සෙල්ලම් කරන්න එළියට යන්න දෙන්නෙ නෑ."

"ඒ මොකද?"

"අර ජෑම් සිද්ධිය නිසා. ඒත් මම ඒව කෑවෙ නෑ. අයිගර් තමයි කිව්වෙ මං ඒක කළා කියලා. එයා තමයි ඒක කන්න ඇත්තෙ. ඒත් එයා අහුකළේ මාව."

"ආයෙ දෙකක් නෑ, එයා තමයි කෑවෙ. එයා ඒක ගැන කයිවාරුත් ගැහුවා. අඬන්න එපා. අපේ ගෙදර එන්නකො, මං ඔයාට මගේ අයිස්ක්‍රීම් බාගෙ දෙන්නම්."

"මාත් ඔයාට මගෙ බාගෙ දෙන්නම්. මං යන්තම් ලෙවකාලා ඒක ඔයාට දෙන්නම්. ස්ටසික් පොරොන්දු වුණා.

"ඔයාට ඒව ඕන නැද්ද?"

"නෑ. අපි දූනටම දහයක් ගාංනෙ කාල ඉන්නෙ." ස්ටසික් කිව්වා.

"අපි ඒක තුනකට කපමු" ටානියා කිව්වා.

"ඒක හරි," ස්ටසික් කිව්වා. "ඔයා මුළු අයිස්ක්‍රීම් එකම කෑවොත් ඔයාගෙ උගුර රිදෙන්න අල්ලයි."

ඉතින් එයාල මීෂුට්කගෙ ගෙදරට ගිහින් අයිස්ක්‍රීම් එක, සමාන කෑලි තුනකට කැපුවා.

"ම..!!! මම අයිස්ක්‍රීම්වලට හරි කැමතියි," මීෂුට්ක කිව්වා. "දන්නවද, දවසක් මම අයිස්ක්‍රීම් බාල්දියක්ම කෑවා."

"වෙන්න බෑ!" ටානිය එහෙම කියල හිනා වුණා. "කව්රුවත් ඔයාව විශ්වාස කරන එකක් නෑ."

"ඒත් ඒක හරි පොඩි බාල්දියක්. ඒක කඩදාසියකින් හදපු, කෝප්පෙක තරම් එකක්!"

මමත් දූන් උදව් කරනවා

ඔන්න එක පොඩි ගෑනු ළමයෙක් හිටියා, නිනොච්ක කියලා. එයාට වයස අවුරුදු පහයි. එයා ජීවත් වුණේ, තාත්තයි, අම්මයි, වයසක ආච්චියි එක්ක. නිනොච්කගෙ අම්ම හැමදාම වැඩට යනවා. ඉතින් පුංචි ගෑනු ළමය ආච්චිත් එක්කයි ගෙදර හිටියෙ. ඉතින් ආච්චි තමයි නිනොච්කට ඇඟ සෝදගෙන අඳුම් ඇඳගන්න, බොත්තම් දාගන්න, සපත්තුවෙ ලේස් ගැටගහගන්න, කොණ්ඩෙ ගොතන්න විතරක් නෙවෙයි, හෝඩියෙ අකුරු ලියන්න පවා ඉගැන්නුවෙ. නිනොච්ක උදෙයි හවසයි විතරයි අම්මව දැක්කෙ. දවසම ගත කළේ ආච්චිත් එක්ක. එයා තාත්තව දැක්කෙ නම් බොහොම කලාතුරකින්. එයා ගුවන් නියමුවෙක් හැටියට වැඩ කළේ උත්තරධ්‍රැවයෙ නිසා, ගෙදර ආවෙ නිවාඩු දවසට විතරයි.

සතියට වතාවක්, සමහර විට ඊටත් කලින්, නිනොච්කගෙ තාත්තගෙන් ලියුමක් එනවා. අම්ම වැඩ ඇරිල ගෙදර ආවම, එයා නිනොච්කටයි ආච්චිටයි ඇහෙන්න ඒක කියවනවා. ඊළඟට කට්ටියම එකතුවෙලා තාත්තට උත්තරයක් ලියනවා. ඊළඟ දවසෙ අම්ම වැඩට ගියාම, ආච්චියි නිනොච්කයි යනවා ඒක තැපැල් කරන්න.

දවසක් නිනොච්කයි ආච්චියි ගියා තාත්තට ලියපු ලියුම තැපැල් කරන්න. එදා ලස්සනට ඉර පායපු අපූරු දවසක්. නිනොච්කා ඇඳගෙන හිටියෙ ලස්සන නිල්පාට ගවුමකුයි, රතුපාට හාවෙක්ව මහපු සුදු ඒප්‍රන් එකකුයි. ලියුම තැපැල් කරලා ආපහු එනකොට, ආච්චි නිනොච්කව එක්කගෙන ගියේ මුඩු බිමක් හරහා වැටිච්ච කෙටි පාරකින්. ඉස්සර එතන පුංචි ලෑලි ගෙවල් කීපයක් තිබුණා. ඒත් දැන් ඒ මිනිස්සු ඔක්කොම ලොකු තට්ටු නිවාසෙකට මාරු වෙලා ගිහින්. මෙතන ගස් එහෙම හිටවල, පිට්ටනියක් හදන්නයි තීරණය කරල තියෙන්නෙ. එතැන දැනට නම් පිට්ටනියක් තිබුණෙ නෑ. කෙළවරක තිබුණා කම්කරුවන්ට අයින් කරන්න බැරිවෙච්ච යකඩ ගොඩක්. පරණ යකඩ බඩුවල කෑලියි, රේඩියේටරේක කෑලියි, පටලැවිච්ච යකඩ කම්බි ගොඩකුයි.

ආච්චි යකඩ ගොඩ ළඟදී ගමන නවත්තල මෙහෙම කිව්වා.

"අර පරණ යකඩ එකතු කරන කොල්ලො කෙල්ලො දන්නෙ නෑ කොහෙන් යකඩ හොයන්නද කියල. කව්රුහරි එයාලට මේ ගැන කියනවනම් හොඳයි."

"මොන එහෙකටද එයාලට යකඩ ඕන?"

"මෙහෙමනෙ, එයාල වතු පුරා දුවනව, පරණ යකඩ එකතු කර කර ප්‍රාන්ත ආණ්ඩුවට දෙන්න."

"ප්‍රාන්ත ආණ්ඩුවට මොකටද ඒව?"

"එතනින් ඒව කම්හලට යවනවා. කම්හලේදි ඒගොල්ල ඒව උණු කරල, මිනිස්සුන්ට ඕන කරන අලුත් දේවල් හදනවා."

"කව්ද එතකොට එයාලට යකඩ එකතු කරන්න කියල තියෙන්නෙ?" නිනොච්ක ඇහුවා.

"කව්රුවත් කියල නෙවෙයි. එයාලම හිතලයි කරන්නෙ. ඔක්කොටම වඩා, ළමයි වැඩිහිටියන්ට උදව් කරන්න ඕන නේ"

"එතකොට මගේ තාත්තත්, පොඩි කාලෙ ලොකු අයට උදව් කළාද?"

"එයා එහෙම කළා."

"එතකොට මම? ආච්චියේ, ඇයි මම ලොකු අයට උදව් කරන්නෙ නැත්තෙ?"

"ඔයාටත් පුළුවන්. ඔයා තව ඩිංගිත්තක් ලොකු වුණාම" ආච්චි හිනාවෙලා කිව්වා.

කීප දවසක් ගතවුණාම ආච්චිට සිද්ධවෙච්ච දේ සහමුලින්ම අමතක වුණා. ඒත් නිනොච්කට කිසිම දෙයක් අමතක වුණේ නෑ. දවසක් එයා වත්තෙ සෙල්ලම් කර කර හිටියා. ආච්චි එයාව තනියම එළියට යවලයි තිබුණෙ. ළමයි තාම ඉස්කොලෙ ඇරිල ඇවිත් හිටියෙ නැති නිසා, මිදුලෙ වෙන කව්රුවත් හිටියෙ නෑ. ඉතින් නිනොච්කට ටිකක් කම්මැලි හිතුණා.

එතකොට එයා දැක්ක නාඳුනන පිරිමි ළමයි දෙන්නෙක් මිදුලට දුවගෙන එනවා. එක්කෙනෙක් ඇඳල හිටියෙ තද නිල්පාට කමිසෙකුයි දිග කලිසමකුයි. අනිත් එක්කෙනා ඇඳල හිටියෙ කොට කලිසමකුයි දුඹුරු කමිසෙකුයි. එයාගෙ සපත්තු කළු පාටට වඩා මඩ පාටට හැරිල තිබුණෙ, එයාට ඒව පිරිසිදු කරන්න අමතක වෙන නිසා.

පිරිමි ළමයි දෙන්නගෙන් එක්කෙනෙක් වත් නිනොච්ක දිහා බැලුවෙ වත් නෑ. ඒගොල්ල වත්ත වටේටම දිව්ව, හැම අහුමුල්ලකටම එබි එබී. හරියට මොනවහරි හොයන්න වගේ. අන්තිමේදි එයාල වත්ත මැද්දෙ නැවතුණාම දිග කලිසමක් ඇඳල හිටපු එක්කෙනා මෙහෙම කිව්වා.

"ඔය, මං ඔයාට කිව්වෙ, මෙහෙ මුකුත් නෑ."

එතකොට මඩ ගෑවිච්ච සපත්තු දාගෙන හිටපු එක්කෙනා නහය පිහිදගෙන, තොප්පිය හරිගස්සගෙන මෙහෙම කිව්වා.

"අපි අනිත් වතුවලටත් යමු වලෙරික්. අපට කොහෙදි හරි පොඩ්ඩක් හම්බවෙයි."

"ඔයා නම් කියයි," වලෙරික් හීල්ලුවා. එයාල ආපහු ගේට්ටුව දිහාට හැරුණා.

"මේ, ළමයි!" නිනොච්කා එයාලට කතා කළා. කොල්ලො දෙන්න ගේට්ටුව ළඟදි නැවතුණා. "මොනවද ඔයාට ඕනෙ?"

"ඔයාල මොනවද හොයන්නෙ?"

"ඒක මොකටද ඔයාට?"

"ඔයාල පරණ යකඩද හොයන්නෙ?"

"ඉතින් ඒක එහෙම නම්, ඔයාට මොකටද?"

"මම දන්නවා යකඩ ගොඩක් තියෙන තැනක්."

"ඔයා කොහොමද දන්නෙ?"

"මම ඒක දන්නවා"

"ඔයා දන්න කෙහෙල්මලක් නෑ"

"නෑ, මං දන්නවා ඒක."

"හරි. එහෙම නම් අපට ඔයාගෙ යකඩ ටික තියෙන තැන පෙන්නන්න."

"ඒක මෙහෙ නෑ. ඔයාල පාරට යන්න ඕන. ඊළඟට අතනින් හැරෙන්න ඕන. ඊළඟට ආපහු අරහෙන් හැරෙන්න ඕන, ඊට පස්සෙ තව මිදුලකට යන්න ඕන. ඊළඟට.... ඊළඟට..."

"ඔය බෙගල් කියන්නෙ, මට පේනව ඒ බව" වලෙරික් කිව්වා.

"මම කවදාවත් බොරු කියන්නෙ නෑ. ඔයාල මගෙ පස්සෙන් එන්නකො." නිනොච්කා එහෙම කියාගෙන ගේට්ටුවෙන් එළියට ගියා. කොල්ලො දෙන්න මූණට මූණ බලාගෙන හිනා වුණා.

"අපි යමුද අන්ද්‍රෙයි?" වලෙරික් ඇහුවා.

"ගිහින් බලමු." අන්ද්‍රෙයි උරහිස අකුළගෙන කිව්වා.

පිරිමි ළමයි දෙන්න, නිනොච්කාට යන්න ඇරල එයා පස්සෙන් යන්න පටන් ගත්තා. එයාලට පෙන්නන්න ඕන වුණේ, එයාල නිනොච්කා එක්ක

යනව නෙවෙයි, තනියම යනව කියලා. එයාලගෙ මූණුවල තිබුණෙ විහිළුකාර පෙනුමක්.

"ලොකු එක්කෙනෙක් වගේ කඩිමුඩියෙ යන හැටි!" වලෙරික් කිව්වා.

"එයා පාර වරද්දගනීවි." අන්ද්‍රෙයි උත්තර දුන්නා. "එතකොට එයා හරිම වාතයක් වෙයි. අපිට ආපහු එයා ගෙදරටම ඇරලවන්නත් වෙයි."

නිනොච්ක පාර ඉවරවෙන තැනදි වමට හැරුණා. කොල්ලො දෙන්නත් සීකරුව එයාගෙ පස්සෙන් ආව. ඊළඟ කෙළවරේදි එයා මොහොතක් අවිශ්වාසෙන් වගේ නැවතිලා ඉඳල පාර පැන්නා. කොල්ලො දෙන්නත් නායකයගෙ පස්සෙන් යනව වගේ ආවා.

"මේ අහන්න," වලෙරික් නිනොච්කට කෑගැහුවා. "එහේ යකඩ ගොඩක් තියෙනවද? නැත්නම් කෑඩිච්ච යකඩ දණ්ඩක් විතරද?"

"එහේ තියෙනවා ගොඩක්," නිනොච්ක කිව්වා. "ඔය දෙන්නට ඒව තනියම ගෙනියන්නත් බැරි වෙයි."

"බොරු කාරි!" වලෙරික් කිව්වා. "අපි දෙන්නට ඕන තරමක් ගෙනියන්න පුළුවන්. අපිට හොඳට හයිය තියෙනවා."

ඒ වෙලාවෙ නිනොච්ක ගේට්ටුව ළඟින් නැවතුණා. ඒ දිහා හොඳට බලලා මිදුලට ගියා. පිරිමි ළමයි දෙන්නත් පස්සෙන් ආවා. එයාල වත්තෙ කෙළවරටම ගිහින්, ආපහු ගේට්ටුව පැත්තට හැරිලා පාරට ආවා.

"ඔයා කොහෙද යන්නෙ?" වලෙරික් සැකෙන් ඇහුවා.

"මේ ඒ මිදුල නෙවෙයි," නිනොච්ක කලබල ගතියෙන් කිව්වා. "මට වැරදිලා. අපි යන්න ඕන 'කොට පාරට'යි. මේ ඒක නෙවෙයි, ඊළඟ එක මං හිතන්නෙ."

එයාල අල්ලපු වත්තටත් ගියා, බැලුවාම ඒකත් නෙවෙයි. ඊළඟ වත්තෙදිත් ඒ දේම සිද්ධවෙන්න නියමිතව තිබුණා.

"දැන් අපි නගරෙ පුරාම තියෙන මිදුල්වල කරක් ගහන්නද හදන්නෙ?" අන්ද්‍රෙයි තරහින් ඇහුවා.

අන්තිමේදි හතරවෙනි වත්ත ඒගොල්ල හොයපු එක වගෙයි පෙනුණෙ. ළමයි ඒක හරහා පටු පාරකට ගිහින්, මහපාරට ඇවිල්ල, ඒක දිගේ පහළට

ආවා. වටරවුමක් පහු කළාට පස්සෙ, නිනොච්ක නැවතිලා වටපිට බලල මෙහෙම කිව්වා. "මං හිතන්නෙ අපි වැරදි පාරෙ ඇවිත් තියෙන්නෙ."

"එහෙනම් අනිත් පැත්තට යමු. ඉතින් ඒක නෙවෙයි නම් මෙතන ඉඳල ඇති වැඩක් නැනෙ." අන්ද්‍රෙයි මිමිනුවා.

එයාල අනිත් පැත්තට ගියා. අර පටු පාරත් පහුකරලා ආපහු වටරවුමක්ම ගියා.

දැන් කොහාටද? වමටද, නැත්නම් දකුණටද?" වලෙරික් ඇහුවා.

"දකුණට," නිනොච්ක උත්තර දුන්නා. "නැත්නම් වමට..."

"හෙහ්!" අන්ද්‍රෙයි කිව්වා. "ඔයාගෙන් නම් කිසිම පලක් නෑ, නැද්ද?"

නිනොච්ක අඬන්න ගත්තා.

"මං පාර වරද්දගෙන!"

"මෝඩ කෙල්ල!" වලෙරික් තරහෙන් කිව්වා. "හරි, මෙහෙ එනව, අපි ඔයාව ගෙදරට ඇරලවන්නම්. නැත්නම් ඔයා කියාවි, අපි ඔයාව කොහේවත් අරන් ගිහින් පාර මැද්දෙ තනි කළා කියල."

වලෙරික් නිනොච්කගෙ අතින් අල්ලගත්තම තුන්දෙනාම ආපහු හැරුණා. අන්ද්‍රෙයි මුනු මුනු ගගා පස්සෙන් ආවා. "කාලෙ එහෙමපිටින්ම නාස්ති වුණා, මේ මෝඩි නිසා. එයා නොහිටින්න අපිට යකඩ ගොඩක් හම්බවෙන්නත් තිබුණා."

එයාල එතකොට ඇවිත් තිබුණෙ, එයාල මුලින්ම ගිය වත්තට. වලෙරික් ගේට්ටුවෙන් එළියට යන්න හදනකොටම, නිනොච්ක එයාව නැවැත්තුවා.

"ඔහොම නවතින්න! මට දැන් මතකයි. අපි යන්න ඕන අර පැත්තෙන්."

"ඒපාර මොකක්ද 'අර පැත්තෙ'?" අන්ද්‍රෙයි අවලාද කියනව වගේ ඇහුවා.

"අරහෙන්, එහා පැත්තෙ මිදුලෙන්. මට දැන් මතකයි ආච්චියි මමයි වතු දෙකක් මැදින් ගියා. ඉස්සෙල්ල මේක, ඊළඟට අරක."

"ඔයා අපිට බොරු කරනව නෙවෙයි නේද?" වලෙරික් ඇහුවා.

"නෑ, මේ සැරේ නම් එහෙම වෙයි කියලා මම හිතන්නෙ නෑ."

"ඔයා ටිකක් පරිස්සම් වුණොත් හොඳයි. එතන යකඩ නැති වුණොත් අපි ඔයාව හම ගහනවා." අන්ද්‍රෙයි කිව්වා.

"මොකක්ද හමගහනව කියන්නෙ?" නිනොච්කා ඇහුවා.

"ඔයාට ඉක්මනින්ම ඒක දැනගන්න ලැබෙයි." එයා කිව්වා.

"මෙහෙ එන්න"

ළමයි පාරෙ අනිත් පැත්තට පැනලා, මිදුල හරහා ගිහින් මුඩු බිමට ආවා.

"මේ තියෙන්නෙ ඒක. මේ තියෙන්නෙ පරණ යකඩ!"

අන්ද්‍රෙයිනුයි වලෙරිකුයි දෙන්නම යකඩ ගොඩ ළඟට දුවගෙන ගියා. නිනොච්කා එයාලගෙ පස්සෙන් පැන පැන ගියා සතුටෙන් කෑගගහා.

"බලන්න.., බලන්න, මම ඔයාලට කිව්ව. මං ඇත්ත නේද කිව්වෙ, නැද්ද?"

"හොඳ ළමය. වලෙරික් කිව්වා. "ඔයා කිව්වෙ ඇත්ත. ඒක හරි. මොකක්ද ඔයාගෙ නම?"

"නිනොච්කා, ඔයාල?"

"මම වලෙරික්. මෙයා අන්ද්‍රෑකා."

"ඔයා කියන්න ඕන 'අන්ද්‍රෑකා' කියල නෙවෙයි. 'අන්ද්‍රෙයි' කියලා." නිනොච්කා එයාව හරිගැස්සුවා.

"ඕ, එයා ඒක ගණන් ගන්නෙ නෑ." වලෙරික් අත වනා වනා කිව්වා.

පිරිමි ළමයි දෙන්නා මලකඩ කාපු පයිප්පයි යකඩ රේඩියේටර් කෑලියි අතරින් ඇවිද්දා. පස්වලින් වැහිල තිබ්බිව නිසා, ඒව හාරන එක එච්චර ලේසි වැඩක් වුණේ නෑ.

"ඔයා හරි. මෙතන යකඩ ගොඩක් තියෙනවා," කොහොමද අපි මේ ඔක්කොම අරගෙන යන්නෙ?"

"අපි පයිප්ප දෙකක් වයර් එකකින් ඈඳල, මැස්සක් හදමු." අන්ද්‍රෙයි කිව්වා.

ඉතින් පිරිමි ළමයි දෙන්න මැස්ස හදන්න ගත්ත. අන්ද්‍රෙයි මහන්සිවෙලා වැඩ කරන අතරෙ එයාගෙ පිටිඅල්ලෙන් නහය පිහදාන්න ගත්තා.

"ඔයාගෙ නහය ඔය විදියට පිහදාන එක හොඳ නෑ අන්ද්‍රෙයි." නිනොච්ක පණ්ඩිත විදියට කිව්වා.

"ඉතින් මොකෝ? අනික, ඇයි හොඳ නැත්තෙ?"

"ආච්චි කියනව එපා කියල"

"හපෝයි, ඔයාගෙ ආච්චිඅම්ම දන්න දේවල්. "

"එයා ඒව දන්නෙ, එයා වයසකම එක්කෙනා නිසා. ංආ, ඒ වෙනුවට මේ ලේන්සුව ගන්න." නිනොච්ක එයාගෙ සාක්කුවෙන් ගත්ත, ලස්සනට නවපු හිම වගේ සුදුපාට ලේන්සුවක්. අන්ද්‍රෙයි ඒක අරන්, ටික වෙලාවක් මුකුත් නොකියා ඒක දිහා බලන් ඉඳල, ඒක ආපහු දික්කළා.

"ඒක ගන්න. නැත්නම් මගේ නාහෙ ඒක කිළිටි කරාවි."

එයා ගත්ත එයාගෙ සාක්කුවෙන් ලේන්සුවක්, නිනොච්කගෙ එක තරම් සුදු නැති එකක්. ඊළඟට එයා ඒකෙන් නහය පිහදාගත්තා.

"බලන්න, ඒක අරිට වඩා කොච්චර හොඳද කියල." නිනොච්ක කිව්වා.

"මොකක්ද ඒකෙ තියෙන හොඳේ?" අන්ද්‍රෙයි ඒක කියල මූණ හදපු විදියට නිනොච්කට හිනා නොවී ඉන්න බැරි වුණා.

මැස්ස හදල ඉවර වුණාට පස්සෙ, ළමයි යකඩ ගොඩ ඒකට පැටෙව්වා. ඒත් එක ඝන ඇඹරිච්ච පයිප්පයක් ඒකට හරිගියේ නෑ.

"කමක් නෑ. අපි එක්කො ඒක පස්සෙ අරගනිමු" වලෙරික් කිව්වා.

"ඇයි පස්සෙ?"නිනොච්ක ඇහුවා. "මමත් ඔයාලට උදව් කරන්නම්"

"අන්න හොඳයි," අන්ද්‍රෙයි එකඟ වුණා. "අපිත් එක්ක ඉස්කෝලෙට එන්නකො. වැඩි දුරක් නෑ. ඊට පස්සෙ අපි ඔයාව ගෙදර එක්කගෙන යන්නම්."

පිරිමි ළමයි දෙන්න මැස්ස උස්සගෙන ඉස්කෝලෙට යද්දි, නිනොච්කත් අර සනකම පයිප්පෙ කෑලේ තියාගෙන එයාලගෙ පස්සෙන් ගියා.

ආච්චි නිනොච්කව මිදුලට ඇරල පැයක්ම ගත වුණා.

"මම දන්නෑ මගෙ පොඩි බත්කූරු පැංචි මෙච්චර වෙලා මොනව කරනවාද කියලා මිදුලෙ ඉඳන්," එයා තමන්ටම කියාගත්තා, නිනොච්ක තවම ගෙදර ආවෙ නැති බව දැනගත්තට පස්සෙ. "මං හිතන්නෙ නෑ එයා මං නැතුව කොහේ හරි ගිහින් ඇති කියලා." ආච්චි උරහිස වැහෙන්න සාළුවක් දාගෙන මිදුලට ගියා. එතකොට මිදුල ළමයින්ගෙන් පිරිලයි තිබුණෙ. වැඩි දෙනෙක් කළේ ටැග් තියන* සෙල්ලම.

"ළමයිනේ ඔයාල මගේ නිනොච්ක හෙම දැක්කද?" එයා ඇහුවා.

ඒත් ළමයි සෙල්ලමේ සිහියෙන් හිටපු නිසා එයාලට අහපු ප්‍රශ්නෙ වත් හරියට ඇහුණෙ නෑ. එතකොටම වාස්‍ය කියලා පොඩි පිරිමි ළමයෙක් එතන පහුකරගෙන ගියා. එයා දිවිල්ලෙන්ම රතු වෙලයි හිටියෙ. එයාගෙ කොණ්ඩෙත් අවුල්වෙලයි තිබුණෙ.

"වාස්‍යා, ඔයා නිනොච්කව දැක්කෙ හෙම නැද්ද?"

"එයා මෙහෙ නෑ." වාස්‍ය කිව්වා.

"ඇයි, මෙහෙ නැත්තෙ?" ආච්චි පුදුමෙන් ඇහුවා. "එයා පැයකට කලින් මෙහාට ආවනෙ සෙල්ලම් කරන්න."

"ඒත් එයා මෙහෙ නෑ," පුංචි ගෑනු ළමයා, -ස්වෙට්ලනා කිව්වා. "අපි මෙතැනට සෙල්ලම් කරන්න ඇවිල්ල ගොඩක් වෙලා. ඒත් එයාව නම් අපි දැක්කෙ නෑ."

"ළමයිනේ," ආච්චි කෑගැහුවා. "නිනොච්ක අතුරුදන් වෙලා!"

හැමෝම සෙල්ලම නවත්තල ආච්චි ළඟට රොක් වුණා.

"එයා පාරට ගියාද දන්නෙ නෑ." වාස්‍ය කිව්වා. ළමයි දෙතුන් දෙනෙක් එහාට ගියපු ගමන්ම ආපහු හැරිල ආවා.

"එයා එහෙ නෑ." ඒගොල්ලො කිව්වා.

---

*ළමයින්ගේ ක්‍රීඩාවක්

"එයා අල්ලපු ගේකට යන්න ඇති" කච්දෝ කිව්වා. "ඔයා අල්ලපු ගෙවල්වල අයගෙනුත් අහල බලන්න අත්තම්මෙ."

ආච්චි අසල්වැසි ගෙවල්වලට ගියා, ළමයි රොත්තත් පස්සෙන් අරන්. ඉන් පස්සෙ එයාල මඩුවලයි, ඉනිමං නැගගෙන අට්ටාලවලයි හොයන්න ගත්තා. බිම්ගෙවල්වලටත් බැහැල බැලුවා. නිනොච්ක කොහෙවත් නෑ. ආච්චි එයාලගෙ පස්සෙන් ගියා තනියම කතා කර කර. "දෙවියන්ගෙ නාමෙට, නිනොච්ක! ඔයා තමයි මාව නැති කරන්නෙ. ඔහොම ඉන්නකො, මං ඔයාට හොඳවයින් එකක් දෙන්න ඔයාගෙ ආච්චිව මේ විදියට බය කළාට."

"ඔයා හිතනවද සමහර විට එයා වෙන වත්තකට යන්න ඇති කියලා?" ළමයි ඇහුවා. "අපි ගිහින් බලමු. ඔයා මෙහෙ ඉන්න අත්තම්මේ. අපිට එයාව හම්බවුණ ගමන්ම අපි ඔයාට පණිවිඩේ එවන්නම්. දැන් ගෙදර ගිහින් විවේක ගන්න.

"මං කොහොමද විවේක ගන්නෙ?" ආච්චි ඇහුව. එයා දුකෙන් හූල්ලල ගෙදර දිහාට හැරුණා. එයා දොර වහපු ගමන්ම අසල්වැසියෙක් ගෙට එබිල මෙහෙම ඇහුවා. "එයාල නිනොච්කව හොයාගෙනද?"

"නෑ."

"ඔයා පොලිසියට කිව්ව නම් හොඳයි මේ ගැන. එයා දැනටමත් එහෙ ඉන්නවද කියල කව්ද දන්නෙ?"

"ඔව්, ඔව්. ඔයා හරි," ආච්චි කිව්වා. "මං මොන තරම් මෝඩ නාකිච්චියෙක්ද, මෙතන නිකම් බලා ඉන්න!"

ඉතින් එයා යන්න පිටත් වුණා. එයා ගේට්ටුව ළඟට යනකොටම තමයි එයාට ළමයි රංචුව හම්බවුණේ.

"අපි පාරෙ මේ පැත්තෙ තියෙන හැම මිදුලකම හෙව්වා," එයාල කෑගැහුව. "දැන් අපි අනිත් පැත්තෙ හොයන්න යන්නෙ. ඔයා බයවෙන්න එපා, අපිට එයාව හම්බවේවි."

"දිගටම හොයාගෙන යන්න දරුවනේ. ඒ වගේම ස්තුතියි ඔයාලට," ආච්චි කිව්වා. "බොහොම ස්තුතියි ඔයාලට. අනේ දෙවියනේ, මං වගේ

නාකි මෝඩියක්. මම එයාට බනින්නෙ නෑ. මං එයාට වචනයක් වත් කියන්නෙ නෑ... එයාල කෙල්ල හොයාගත්තොත් ඒ ඇති."

"ඔයා කොහෙද අත්තම්මෙ යන්නෙ?" ළමයි ඇහුවා.

"පොලිසියට, ළමයිනේ පොලිසියට."

එයා හැම අහුමුල්ලකටම එබි එබි තමයි පාරෙ ගියේ. ඉතින් එයා පොලිස් කාර්යාලයට ගිහින් ළමයින්ගෙ කාමරේට එබුණා. පොලිස් නිලධාරියෙක් එයාගෙ ඉස්සරහම හිටගෙන හිටිය.

"පුතා, ඔයාල ළඟ මගේ පොඩි කෙල්ල හෙම නැද්ද?" එයා බලාපොරොත්තු සහගතව ඇහුවා. "මගේ මිනිබිරි අතුරුදහන් වෙලා."

"අද නම් අපට එක ළමයෙක් වත් හම්බවුණේ නෑ," පොලිස් නිලධාරිය කිව්වා. "ඒත් ඔයා බයවෙන්න එපා නෝනා. ඔයාගෙ දරුව ආපහු එයි."

එයා ආච්චිව වාඩි කරවල, මේසෙ උඩ තිබ්බ්ච ලොකු ඝනකම පොතක් ඇරියා.

"ඔයාගෙ දරුවගෙ වයස කීයද?" එයා එහෙම අහල ලියන්න පටන්ගත්තා. "එයාගෙ නම මොකක්ද? එයා ඉන්නෙ කොහේද?" එයා ඔක්කොම ලියාගත්තාඃ මුල් නම, වාසගම වගේම ලිපිනයත්. වෙන එකක් තියා, නිනොච්ක ඇඳන් හිටියෙ ලා නිල් ගවුමකුයි, රතු හාවෙක් මහපු සුදු ඒප්‍රන් එකකුයි කියලත් ලියාගත්තා. ඊළඟට, ගෙදර ටෙලිෆෝන් එකක් තියෙනවද කියල අහල ඒකෙ අංකෙත් ලියාගත්තා. "දැන් ඔක්කොම හරි නෝනා, දැන් ඔයා බය නැතුව ගෙදර යන්න. නිනොච්ක දැනටමත් ඔයා එනකල් ගෙදර බලා ඉන්නව ඇති, සමහර විට. ඒක එහෙම නොවුණත් අපට පුළුවන් එයාව ඉක්මනට සොයාගන්න."

ආච්චි ගෙදර යන්න පිටත් වෙනකොට එයා තරමක් සන්සුන් වෙලයි හිටියෙ. ඒත් ගෙදරට ළං වෙන්න වෙන්න ආපහු හිතේ තිබ්බ්ච බයත් එන්න එන්නම වැඩි වුණා. ගෙදර වැට ළඟදි එයා නැවතුණා. එනකොට වාස්ය දුවගෙන ආව. එයාගෙ කොණ්ඩෙ දාඩියෙන් තෙමිල, මූණෙනුත් දාඩිය ගලමිනුයි තිබුණෙ.

"නිනොච්කගෙ අම්ම ගෙදර." එයා බයෙන් වගේ කිව්වා.

"එතකොට නිනොච්කා?"

"තාම ඒගොල්ලන්ට එයාව හම්බවෙලා නෑ."

ආච්චි වැටට හේත්තු වුණා, එයාගෙ දණහිස් පණ නැතිව ගියා. එයාට හිතන්න බැරි වුණා නිනොච්කගෙ අම්මට මේ ගැන කොහොම කියන්නද කියලා. එයා වාස්යගෙන් තව මොකක්දෝ අහන්න හදනකොටම, එයා දැක්කා පදික වේදිකාව දිගේ පිරිමි ළමයි දෙන්නෙක් එනව. එයාලගෙ මැද්දෙන් ඉක්මනට අඩිය තිය තියා ආවෙ පුංචි ගෑනු ළමයෙක් ; පිරිමි ළමයි දෙන්නම එයාගෙ අත්දෙකෙන් අල්ලගෙනයි හිටියෙ. ඉතින් ඒ නිසා, එයාට ඕන වෙලාවක කකුල් පද්දලා අත්වලින් එල්ලෙන්නත් පුළුවන්. එයා හරිම විනෝදෙන් තමයි හිටියෙ. ඒ තුන්දෙනාම හිටියෙ හිනා වෙවී. එයාල හොඳටම ළං වුණාම, ආච්චි ළා නිල් ගවුමයි, රතු හාවෙක් මහපු සුදු ඒප්‍රන් එකයි අඳුනගත්ත.

"ඒ නිනොච්කා!" එයා කෑගැහුවා. "දෙවියන්ට ස්තුති වේවා!"

"ආච්චියේ!" නිනොච්ක කෑගහගෙන එයා ළඟට දුවගෙන ආවා. ආච්චි නිනොච්කව වඩාගෙන ඉඹින්න ගත්ත, වලෙරිකුයි අන්ද්‍රෙයි එයාල දිහා බලන් ඉඳිද්දි.

"ස්තුතියි ළමයිනේ, කොහේදිද ඔයාල එයාව හොයාගත්තෙ?" ආච්චි ඇහුවා.

"කව්ද?" වලෙරික් අන්දමන්ද වෙලා ඇහුවා.

"නිනොච්කා."

"ඕ, නිනොච්කා! මේ අහන්න අන්ද්‍රෙයි, ඔයාට මතකද අපි නිනොච්කා හොයාගත්තෙ කොහේදිදි කියල?"

අන්ද්‍රෙයි එයාගෙ පිටිඅල්ලෙන් නහය පිහදාල, වටපිට බලල මෙහෙම කිව්වා,

"කොහෙදිද ඉතින්, ඒ මෙහෙදිම නෙ, නැද්ද? මේ මිදුලෙදිමයි. අපි මෙහෙදිමයි එයාව හොයාගත්තෙ. අපි යකඩ හොයන්න යන්න කලින්."

"හොඳයි, ස්තුතියි කොල්ලනේ. ඇත්තටම බොහොම ස්තුතියි ඔයාලට." ආච්චි කිව්වා. එයා නිනොච්කව බිමින් තියල, එයාගෙ අත තදින් අල්ලගෙන

ගෙදරට එක්කරගෙන ගියා. කොරිඩෝව ළඟදි එයාලට හම්බවුණා, තොප්පිය ගැට ගගහ එන නිනොච්කගෙ අම්මව. එයාගෙ මූණෙ තිබුණෙ කලබලවෙච්ච පෙනුමක්.

"මොනවද දෙවියනේ මෙහෙ වෙන්නෙ?" එයා ඇහුවා. "පොලිසිය දැන් ටිකකට කලින් කතා කළා, නිනොච්ක ආවද නැද්ද කියල අහන්න. එයා කොහෙද ගිහින් තියෙන්නෙ?"

"කමක් නෑ, කමක් නෑ," ආච්චි සන්සුන් විදියට කිව්වා. "නිනොච්ක අතරමං වෙලා, පස්සෙ ආපහු හොයාගෙන."

"අපෝ නෑ ආච්චියේ, මං කොහෙමටවත් අතරමං වුණේ නෑ." නිනොච්ක කිව්වා. "මම ගියා අර පිරිමි ළමයින්ට යකඩ තියෙන තැන පෙන්නන්න."

"මොන යකඩ ගොඩක් ගැනද ඔයා මේ කියන්නෙ?" එතකොට නිනොච්කා එයාගෙ හපන්කම ගැන කියන්න ගත්ත. ආච්චි කතාව අහන අතරෙ හීල්ලුවා.

"අනේ මන්ද මේ ළමයි මොනව හිතනවද කියල." එයා කිව්වා. "එයාලට යකඩ ඕන මොනවටද කියල දෙවියො තමයි දන්නෙ."

"ඉතින් ආච්චියේ," නිනොච්ක කිව්වා. "ඔයාමයි කිව්වෙ ළමයි වැඩිහිටියන්ට උදව් කරන්න ඕනෙ කියල. තාත්තත් පොඩි කාලෙ උදව් කළා. ඉතින් මටත් ඕන උදව් කරන්න."

"ඔයා ඒගොල්ලන්ට උදව් කරපු එක හොඳ දෙයක්," නිනොච්කගෙ අම්ම කිව්වා. "ඒත් ඔයාට ඉස්සෙල්ල ආච්චිගෙන් අහන්න තිබුණ. ආච්චි බයවෙලා හොඳටම."

"ඔයාට ඔයාගෙ ආච්චි ගැන පොඩ්ඩක්වත් දුක නෑ." ආච්චි ඔළුව වන වනා කිව්වා.

"මට සමාවෙන්න ආච්චියේ," නිනොච්ක කිව්වා. "මං මීට පස්සෙ හැමතිස්සෙම අහන්නම්. අනිත් එක, ඔයාටයි මටයි තවත් යකඩ හම්බවෙයි නේද? පරණ යකඩ ගොඩාක්!"

එදා මුළු දවසෙම එයාලට අහන්න ලැබුණෙ පරණ යකඩ ගැනම තමයි.

එදා හවස තුන්දෙනාම මේසෙට වාඩි වුණා. ආච්චියි අම්මයි තාත්තට ලියුමක් ලිව්වා. නිනොාච්කා චිත්‍රයක් ඇන්දා. එයා ඇන්දා, ආක්ටික් දැවයෙ මිදුණු ගඟක් ළඟ තියෙන හිමෙන් වැහුණු පුංචි ගෙවල් කීපයක්. ඒවයෙ පදිංචිකාරයො කන්දක් උඩට වෙලා, අහසෙ ඈතින් පෙනෙන ප්ලේන් එකක් එනකම් බලාගෙන ඉන්නවා. ඒකෙන් මිනිස්සුන්ට ඕනකරන දේවල් ගේනවා. කෙනෙකුට සීනි, තව කෙනෙකුට පිටි, තව කෙනෙකුට බෙහෙත්. ඒ වගේම ළමයින්ට සෙල්ලම් බඩු. යටින්ම නිනොාච්ක, එයා ලොකු පයිප්පයක් අතේ තියන් ඉන්නව ඇඳලා, ඊට යටින් ලොකු අකුරින් මෙහෙම ලිව්වා.

"මමත් දූන් උදව් කරනවා"

"ඒක හරිම ලස්සනයි," ආච්චි සතුටින් කිව්වා. "අපි මේක තාත්තගෙ ලියුමත් එක්ක යවමු. එතකොට එයා දැනගනීවි, කොච්චර හොඳ පුංචි කෙල්ලෙක්ද එයාට ඉන්නෙ කියල."

පොටි

ජනෙල් වීදුරු සවිකරන මනුස්සය ආව, සීත කාලෙදි ජනෙල් රාමු වලට පොටි බදාමයක් දාන්න. කෝස්ත්යයි ෂරිකුයි එයා වැඩේ ඉවර කරන හැටි බලන් හිටියා. එයා ගියාම, ඒගොල්ලො ජනෙල් රාමුවෙන් පොටි හුරල අරගෙන, ඒවයෙන් සත්තු අඹන්න ගත්තා. සත්තු හරියට හැදුණෙ නැති එක තමයි ප්‍රශ්නෙකට තිබුණෙ. කෝස්ත්ය නයෙක් හදල, ෂරික්ට කිව්ව:

"බලන්න, මං මොකක්ද හදල තියෙන්නෙ?" කියල.

ෂරික් ළං වෙලා බලල, මෙහෙම කිව්වා. "පීකුදු සොසේජ් එකක්."

කෝස්ත්‍ය ඒකට හිත නරක් කරගෙන පොට් ගුලිය සාක්කුවෙ හංගගත්ත. ඊළඟට ඒ දෙන්න ගියා චිත්‍රපටියක් බලන්න. ෂරික් පොට් ගුලිය ගැන බයවෙලයි හිටියෙ.

"පොට් ගුලියට මොනව වෙලාද?" එයා නිතරම අහන්න ගත්තා.

අන්තිමේදි කෝස්ත්‍ය එයාට කිව්වා, "ඒක මගෙ සාක්කුවෙ. මොකෝ ඔයා හිතුවද මං ඒක කෑව කියල?"

එයාල සිනමා ශාලාවෙදි ටිකට් අරගෙන, විවේකයේදි කන්න පෙපර්මින්ට් බාර් දෙකකුත් ගත්තා. හිටි හැටියෙම බෙල්එක ගැහුවා. කෝස්ත්‍ය ගියා සීට් දෙකක් අල්ලගන්න. ෂරික් එතකොට සෙනග ගොඩේ හිරවුණා. කෝස්ත්‍ය හොඳ සීට් දෙකක් හොයාගෙන, එකක වාඩි වෙලා, අනිත් එක පොට් ගුලිය තියල වෙන් කරගත්තා. එතකොටම නාඳුනන මනුස්සයෙක් ඇවිත් පොට් ගුලිය උඩින් වාඩි වුණා. කෝස්ත්‍ය එයාට කිව්වා,

"මෙතන වෙන්කරල තියෙන්නෙ, ඒක ෂරික්ට"

"මොකාද ෂරික් කියන්නෙ? මමයි මෙතන ඉන්නෙ." ඒ මනුස්සය කිව්වා. එතකොටම ෂරික් දුවගෙන ඇවිත්, කෝස්ත්‍යගෙ අනිත් පැත්තෙ සීට් එකෙන් වාඩි වුණා.

"පොට් ටික කෝ?" එයා ඇහුවා.

"ස්...!" කෝස්ත්‍ය අර මනුස්සයගෙ පැත්තට ඉඟිමරල කෙඳිරුවා.

"ඒ කව්ද?" ෂරික් ඇහුවා.

"දන්නෙ නෑ!"

"ඔයා ඇයි එයාට බය?"

"එයා ඉන්නෙ පොට් එක උඩ."

"ඔයා මොකටද ඒක එයාට දුන්නෙ?"

"දුන්නෙ නෑ, එයාම වාඩි වුණා."

"එහෙනම් ඒක ගන්න."

එතකොටම ලයිට් නිවල චිත්‍රපටිය පටන්ගත්තා.

"සමාවෙන්න මහත්තය," කෝස්ත්ය කිව්වා. "මට මගේ පොටී එක දෙන්න."

"මොන පොටිද?"

"අපි ජනෙල් රාමුව හාරල ගත්ත පොටී."

"ජනෙල් රාමුව හාරල ගත්ත පොටි?"

"අන්න හරි! ඒක අපට ආපහු දෙන්න මහත්තය."

"ඒත් මම ඒක ගත්තෙ නෑ."

"අපි දන්නව ඔයා ඒක ගත්තෙ නෑ කියල. ඔයා ඉන්නෙ ඒක උඩ ඉඳගෙන."

"ඉඳගෙන?!"

"ඔව්."

මනුස්සය සීට් එකෙන් බිමට පැන්න.

"ඇයි එහෙනම් මට කලින් නොකීවෙ? මෝඩයෝ?!" එයා කෑගැහුවා.

"ඉතින් මං ඔයාට කිව්වෙ, සීට් එක වෙන් කළා කියල."

"කොයි වෙලාවෙද ඔයා මට කිව්වෙ? මම ඉඳගත්තටත් පස්සෙ!"

"මං කොහොමද දන්නෙ ඔයා මෙතන ඉඳගන්න හදනව කියල?"

මනුස්සය නැගිටල එයාගෙ සීට් එක අතගාන්න ගත්තා. "හරි, කොහෙද දූන් ඔය පොටිය, ගොන් නාම්බො?" එයා දත් අතරෙන් පිම්බා.

"ඔහොම ඉන්න. ඔය තියෙන්නෙ ඒක," කෝස්ත්ය කෑගැහුවා.

"කොහෙද?"

"ඔය, පුටුව පුරාම. බයවෙන්න එපා. අපි වක්ගාල ඒක සුද්ධකරල දෙන්නම්."

"එහෙම කළොත් හොඳයි, අමන පැටියා!" ඒ මනුස්සය බැන්නා.

"ඉඳගන්න!" එයාලගෙ පිටිපස්සෙන් කටහඬවල් කෑගැහුවා.

"මට බැහැ," මනුස්සය විස්තර කළා, "සීට් එකේ පොටී."

හුඟ වෙලාවකට පස්සෙ, ළමයි දෙන්න පොටි ඔක්කොම අයින් කරල ඉවර වුණා.

"දැන් ඒක හරි," එයාල කිව්වා. "ඉඳගන්න"

මනුස්සය ඉඳගත්තා.

ආපහු ඔක්කෝම සන්සුන් වුණා. කෝස්ත්යට ඕන වුණේ චිත්‍රපටියෙ ඉතුරු ටික නිවී සැනසිල්ලෙ බලන්න. ඒත් හිටි හැටියෙ එයාට ඇහුණා ෂරික් කොඳුරනවා.

"ඔයා ඔයාගෙ බාර් එක කෑවද?"

"තවම නෑ. ඔයා කෑවද?"

"නෑ, මමත් නෑ. දැන් ඒක කමු."

"ඔව්. ඒක හොඳයි."

දෙන්න හැපිල්ල පටන්ගත්තා. කෝස්ත්ය හදිසියෙම කෙළ ගහල, කහින්න ගත්තා.

"ෂරික්, ඔයාගෙ බාර් එක මොන වගේද?"

"ම.. ම....!"

"මගේ එක අන්තිමයි. ඒක දියාරුයි. සාක්කුවේදිම දියවෙලා."

"පොටි එක කෝ?"

"ඒක මෙහේ, මගෙ සාක්කුවෙ.... මිනිත්තුවක් ඉන්න... ඒ පොටි නෙවෙයි, ඒ පෙපර්මින්ට් එක. අහ්! මං කළුවරේ ඒ දෙක මාරු කරගන්න ඇති. ඊයියා! ඒකෙ රහ කොච්චර ජරායිද?"

කෝස්ත්ය අප්පිරියාවෙන් ඒක බිමට විසි කළා.

"ඇයි ඔයා ඒක විසි කළේ?" ෂරික් ඇහුවා.

"මට මොකටද ඒක?"

"ඔයාට ඕන නැතුව ඇති, ඒත් මට ඕන." ෂරික් බැනලා, පොටි ගුලිය සොයන්න සීට් එක යටට රිංගුවා.



"කෝ ඒක?" එයා තරහින් ඇහුවා. "මම කොහොමද මොකක්වත් හොයන්නෙ, මේ කළුවරේ?"

"හරි, මම ඒක හොයාගන්නම්." කෝස්ත්‍ය එහෙම කියාගෙන පුටු යටට රිංගන්න බිමට බැස්සා.

"ආව්!" හදිසියේම පහළින් සද්දයක් ආවා.

"අයියෝ, මහත්තයා, බහින්න!"

"කව්ද ඔය?"

"ඒ මම."

"මම කියන්නෙ කව්ද?"

"මම කෝස්ත්‍යා. මගෙ ඇඟෙන් බහින්න."

"ඒත් මං ඉන්නෙ ඔයා උඩ නෙවෙයි."

"නැත්තෙ මොකද? ඉන්නව තමයි. ඔයා මගේ අත පාගගෙන ඉන්නෙ!"

"හොඳ වැඩේ ඔයාට. පුටු යට රිංගනවට."

"මම හෙව්වෙ මගෙ පොඩි ගුලිය."

කෝස්ත්‍ය පුටුව යටට රිංගුවහම, එයාගෙ නහයට ගෑවෙන දුරින් ඉන්න ෂරික්ව දැක්කා.

"කව්ද ඔය?" එයා බයෙන් ඇහුවා.

"ඒ මම, ෂරික්."

"මේ මම, කෝස්ත්‍යා."

"ඒක හොයාගත්තද?"

"මට මොකවත් හම්බවුණේ නෑ."

"මටත් නෑ."

"අපි චිත්‍රපටියෙ ඉතුරු ටික බැලුවොත් හොඳයි. නැත්නම් අපි මෙතන ඉන්න මිනිස්සුන්ව බය කරාවි. එයාල හිතයි, බල්ලො එයාලගෙ කකුල් අස්සට නහය ඔබනව කියල."

කෝස්ත්‍යයි ෂරිකුයි සීට් යටින් රිංගල ඇවිත් ඒගොල්ලන්ගෙ සීට් වල වාඩි වුණා විතරයි. ඒ ගොල්ල දැක්ක 'සමාප්තයි' කියන වචනෙ තිරේ මතුවෙනවා.

ප්‍රේක්ෂකයො පිටවීමේ දොරටුව ළඟට දිව්ව. පිරිමි ළමයි දෙන්නත් එයාලගෙ පස්සෙන් පාරට ආවා.

"මොන ජාතියෙ චිත්‍රපටියක්ද අපි බැලුවෙ?" කෝස්ත්‍ය ඇහුවා. "මට ඒකෙ අගක් මුලක් වත් මතක නෑ."

"ඔයා හිතනවද මට ඒක තේරුණා කියල?" ෂරික් ඇහුව. "මොන කෙහෙල්මලක්ද ඒ? මොකට පෙන්නපු චිත්‍රපටියක්ද මන්ද!"

මීෂ්කගෙ කැඳ

පහුගිය ගිම්හානෙදි මම අම්මත් එක්ක ගමේ ඉඳිද්දි මීෂ්කත් අපිත් එක්ක නවතින්න ආවා. මම එයාව දකින්න හුගාක්ම ආසාවෙන් හිටියෙ. මොකද මම එයා නැතුව හරිම පාළුවෙන් හිටපු නිසා. අම්මත් එයා දැකල සතුටු වුණා.

"මට ඔයා ආපු එක ගැන සතුටුයි," අම්ම කිව්වා. "ඔය දෙන්නට, එකිනෙකාගෙ තනියට ඉන්න පුළුවන්. මට හෙට උදේ පාන්දරින්ම නගරෙට යන්න තියෙනවා. ඒත් මම දන්නෙ නෑ මට කොයි වෙලාවෙ ආපහු එන්න ලැබෙයිද කියලා. ඔයාලට දවස් දෙකක් මෙහෙ තනියම ඉන්න පුළුවන් ද?"

"ඔව්. අපිට පුළුවන්," මම කිව්වා. "අපි බබ්බු නෙවෙයිනෙ."

"ඔයාලට උදේ කෑම තනියම හදාගන්න වෙයි. ඔයාල දන්නවද කැඳ හදන්නෙ කොහොමද කියලා?"

"මම දන්නවා," මීෂ්ක කිව්වා. "ඒක හරි ලේසි වැඩක්."

"මීෂ්ක," මම ඇහුවා. "ඔයාට හොඳටම විශ්වාසද ඔයා දන්නව කියලා? ඔයා කවදද කැඳ හදල තියෙන්නෙ?"

"බයවෙන්න එපා. මම අම්ම ඒව හදනව දැකල තියෙනවා. ඔයා ඒක මට බාර දෙන්නකො. මම ඔයාව හාමතේ තියන්නෙ නෑ. මම ඔයා ජීවිතේට රහ බලපු හොඳම කැඳ හදල දෙන්නම්."

පස්සෙන්ද උදේ අම්ම අපිට තේ එක්ක කන්න පානුයි ජෑමුයි දීල, අපිට ඕට් ඇට තියෙන තැන පෙන්නුවා. එයා අපිට ඒව උයන විදියත් කිව්වා. ඒත් මම ඒක අහගන්න කරදර වුණේ නෑ. 'මම මොකටද අහගන්නෙ, මීෂ්ක ඔක්කොම දන්නව නම්' මම හිතුවා.

ඊළඟට අම්ම යන්න ගියාම, මීෂ්කයි මායි හිතුව මාළු බාන්න ගඟට යන්න. අපි මාළු බාන ආම්පන්න අරගෙන, ගැඩවිල්ලො ටික දෙනෙකුත් හාර ගත්තා.

"මිනිත්තුවක් ඉන්න," මම කිව්වා. "කවද කැඳ හදන්නෙ, අපි ගඟට ගියාම?"

"කාටද උයන එක ගැන කරදර වෙන්න ඕන?" මීෂ්ක කිව්වා. "ඒක මහ වදයක්. අපිට ඒ වෙනුවට පානුයි ජෑම්නුයි කන්න පුළුවන්. එතන පාන් ගොඩක් තියෙනවා. පස්සෙ බඩගිනි වුණාම අපි කැඳ හදමු."

අපි ජෑම් සැන්ඩ්විච් ගොඩක් හදාගෙන ගඟට ගියා. අපි පීනල, වැලි ඉවුරෙ හාන්සිවෙලා ඇඟ වේලන ගමන් සැන්ඩ්විච් කකා හිටියා. ඊළඟට අපි මාළු බෑව. අපි හුඟ වෙලාවක් ඉඳගෙන හිටියා. ඒත් මාළු ඇම ගිල්ලෙ නෑ. අපිට අහු වුණේ ගජන්ල* දූසිමක් විතරයි. උනුත් හරිම පුංචි එවුන්. එදා හවස අපි හොඳටෝම බඩගිනි වෙලා, ඉක්මනින් ගෙදර ගියා, මොනව හරි කන්න.

---

*යුරෝපයේ වෙසෙන මිරිදිය මත්ස්‍ය වර්ගයක්

"දැන් එහෙනම් මීෂ්කා," මම කිව්ව. "ඔයා තමයි විශේෂඥයා. ඉතින් අපි මොනවද හදන්නෙ? හැබැයි උයන්න වැඩිය වෙලා යන්නෙ නැති දෙයක්. මට යකෙක් කන්න බඩගිනියි."

"අපි කැඳ ටිකක් හදමු." මීෂ්ක කිව්වා. "ඒක තමයි ලේසිම එක."

"ඒක හොඳයි," මම කිව්වා.

අපි ළිප පත්තු කළා. මීෂ්ක ඕට් පිටියි, හැළියයි ගත්තා.

"ඔයා හදනකොට ගොඩාක් හදන්න බලන්න. මට දැන් අශ්වයෙක් වුනත් කන්න පුළුවන්."

එයා භාජනේ පිරෙන්නම ඕට් පිටි දාලා, කට ළඟටම වතුර පිරෙව්වා.

"ඔච්චර වතුර වැඩි නැද්ද?" මම ඇහුවා.

"නෑ. ඔය විදියට තමයි අම්මත් ඒව හදන්නෙ. ඔයා ළිප ගැන බලාගෙන, කැඳ හදන වැඩේ මට තියන්නකො."

ඉතින් මම ගින්දර නොනිවී තියාගත්ත, මීෂ්ක කැඳ හදන අතරේ. ඒ කියන්නෙ එයා ඉඳගෙන හැළිය බලාගත්ත, මොකද කැඳ හැදෙන්නෙ තනියම නෙ.

වැඩි වෙලාවක් යන්න කලින් කළුවර වැටුණා. ඉතින් අපි ලාම්පුව පත්තු කළා. ඒ අතරෙ කැඳ උණු වුණා. එකපාරටම මම උඩ බැලුවම, මම දැක්කා හැළියෙ පියන ඉස්සිලා කැඳ එක පැත්තකින් ඉහිරෙනවා.

"ඒයි, මීෂ්ක," මම කිව්වා. මොකක්ද කැඳවලට වෙලා තියෙන්නෙ?"

"ඇයි මොකක්ද ඒවයෙ තියෙන වැරැද්ද?"

"ඒව හැළියෙන් එළියට එනවා!"

මීෂ්ක හැන්දක් අරන් කැඳ ආපහු හැළියට තල්ලු කරන්න ගත්තා. එයා ඒව තල්ලු කළා, කළා, ඒත් ඒව දිගටම එළියට ගලන්න ගත්තා.

"මම දන්නෑ ඒවට මක් වෙලාද කියල. ඒව දැන් ලෑස්තියි වත්ද?"

මම හැන්දක් අරන් ටිකක් රහ බැලුව. ඒත් පිටි ටික තවම හයියට, වියළිවට තිබුණෙ.

"මෙමෙකෙ තිබුණ වතුර කොහෙ ගිහින්ද?"

"අනේ මං දන්නෑ," මීෂ්ක කිව්වා. "මං හුඟක් දැම්මා. මේ හැළියෙ හිලක් තියෙනවවත්ද?"

අපි හැළිය හැමතැනම බැලුවා. ඒත් හිලක ලකුණක්වත් තිබුණෙ නෑ.

"වාෂ්ප වෙන්න ඇති," මීෂ්ක කිව්වා. "අපිට තව ටිකක් දාන්න වෙයි."

එයා කැඳවලින් ටිකක් අරගෙන පිඟානකට දැම්මා, එයාට ටිකක් එළියට ගන්න වුණා වතුරට ඉඩ හදන්න. ඉන් පස්සෙ අපි හැළිය ආපහු ළිපෙන් තියල, ඒක තවත් ඉදෙන්න ඇරියා. ඒක ඉව්ගෙන ගිහින්, ටික වෙලාවකින් ආපහු උතුරන්න ගත්තා.

"ඒයි, මේ මොකක්ද!" මීෂ්ක කෑගැහුවා. "ඇයි ඒව හැළියෙ තියෙන්නෙ නැත්තෙ?"

එයා හැන්ද අරන්, තව කැඳ ටිකක් හලල, තවත් වතුර කෝප්පයක් දැම්මා.

"මේ බලන්න," එයා කිව්වා. "ඔයා හිතුවෙ වතුර වැඩි වෙයි කියල නේද?"

කැඳ හැදීගෙන ගියා. ඊළඟට ඔයාලට විශ්වාස කරන්න පුළුවන්ද, ටික වෙලාවක් යනකොට ඒක ආයෙත් පියන උස්සන් ආවෙ නෑනෑ!

මම කිව්වාඃ "ඔයා පිටි වැඩියෙන් දාන්න ඇති. ඒකයි හේතුව. ඒක උතුරනව, හැළියෙ ඒකට ඉඩ මදි හන්ද."

"ඔව්, ඒක වෙන්න ඕන," මීෂ්ක කිව්වා. "ඒක ඔයාගෙ වැරැද්ද. ඔයයි මට කිව්වෙ, ගොඩක් දාන්න කියල, ඔයාට බඩගිනි නිසා, මතකද?"

"මම කොහොමද දන්නෙ දාන්න ඕන තරම? ඔයා තමයි උයන්න දන්න එක්කෙනා."

"ඔව්, මම තමයි, මට ඒක මෙලහටත් හදන්න තිබුණ ඔයා ඇඟිලි ගැහුවෙ නැත්නම්."

"හරි එහෙනම් උයනවා, මම වචනයක් වත් කියන්නෙ නෑ."

මම අඩියට දෙකට එතනින් ගියා. මීෂ්ක දිගටම ඉව්වා.

ඒ කියන්නෙ, 'කැඳ අයින් කර කර වතුර දැමීම.' ඉක්මනටම, මුළු මේසෙම බාගෙට ඉදිච්ච කැඳ භාජනවලින් පිරුණා. අනික එයා හැමසැරේම වතුර දැම්මා. ඔන්න අන්තිමේදි මගේ ඉවසීමෙ සීමාව පැන්නා.

"ඔයා හරියට නෙවෙයි කරන්නෙ. මෙහෙම ගියොත් මේව හැදිල ඉවර වෙන එකක් නෑ, හෙට එළි වෙනතුරු."

"ඉතින්? එහෙම තමයි ලොකු හෝටල් වලදිත් කරන්නෙ. ඔයා ඒක දැනන් හිටියෙ නැද්ද? එයාල හැම තිස්සෙම රෑට කෑම උයනව, උදේට ඒව ලෑස්ති වෙන විදියට."

"හෝටල්වලට ප්‍රශ්නයක් නෑ. එයාලට හදිස්සි වෙන්න ඕන නෑ, එයාලට නව කෑම ඕන තරම් තියෙන නිසා."

"අපටත් හදිසි වෙන්න ඕනෑකමක් නෑ."

"ංඈ නැද්ද?! මට බඩගිනියි. අනික, දැන් නිදාගන්න වෙලාව. බලනව කොච්චර පරක්කුද කියලා."

"ඔයාට නිදාගන්න ඕනතරම් වෙලාව තියෙනව," එයා නව වතුර වීදුරුවක් හැළියට දාන ගමන් කිව්වා. එක පාරටම මට තේරුණා වැරැද්ද මොකක්ද කියලා.

"ඔයා සීතල වතුර දදා ගියොත් නම් ඕක හැදෙන එකක් නෑ," මම කිව්වා.

"ඔයා හිතන්නෙ, වතුර නැතුව කෑඳ හදන්න පුළුවන් කියලද?"

"නැහැ, මම හිතන්නෙ තාමත් හැළියෙ පිටි වැඩියි. මම හැළිය අරගෙන පිටිවලින් බාගයක්ම හළල, එයාට කිව්ව වතුර පුරවන්න කියලා.

එයා කෝප්පෙ අරන් බාල්දිය ළඟට ගියා. "අල්ලල දානව," එයා කිව්වා. "වතුර ඉවරයි"

"දැන් අපි මොනව කරන්නද? කට්ට කළුවරයි එළියෙ. අපිට ළිඳ හොයාග න්න ලැබෙන එකක් නෑ."

"මම ටක් ගාල, ටිකක් ගේන්නම්."

එයා ගිනි පෙට්ටියත් අරන්, පනිට්ටුවෙ කොක්කට ලණුවක් ගැටග හගෙන, ළිඳ ළඟට ගියා. මිනිත්තු දෙක තුනකින් එයා ආපහු ආවා.

"කෝ වතුර?" මම එයාගෙන් ඇහුවා.

"වතුර ළිඳේ!"

"නිකම් මෝඩයෙක් වෙන්න එපා. කෝ පනිට්ටුව?'

"පනිට්ටුව? ඒකත් ළිඳේ!"

"ළිඳේ?"

"අන්න හරි."

"ඔයා කියන්නෙ, ඔයා ඒක ළිඳට දැම්ම කියලද?"

"ඒක හරි."

"ඕ, ගොන් බූරුවා! අපි හාමතේ මැරෙයි මෙහෙම ගියොත්. අපි කොහොමද දැන් වතුර ගන්නෙ?"

"අපිට පුළුවන් කේතලේ පාවිච්චි කරන්න."

මම කේතලේ අතට ගත්තා.

"මට ලණුව දෙන්න."

"මගෙ ගාව ඒක නෑ."

"කොහෙද ඒක?"

"අරක ඇතුළෙ."

"මොකක් ඇතුළෙද?"

"ළිඳ ඇතුළෙ!"

"ඒ කියන්නෙ ඔයා ලණුවත් එක්කමද පනිට්ටුව වැට්ටුවෙ?"

"අන්න හරි."

අපි තව ලණුවක් හෙව්ව. ඒත් මොකක්වත් හම්බවුණේ නෑ.

"කමක් නෑ. මම අල්ලපු ගෙදරකින් අහන්නම්." මීෂ්ක කිව්වා.

"ඒක කරන්න බැහැ," මම කිව්වා. "බලනව වෙලාව කීයද කියලා. හැමෝම නිදාගන්න ගිහිල්ලත් ගොඩක් වෙලා."

අවාසනාවක මහත! අපි දෙන්නටම මැරෙන්න තිබහයි.

මීෂ්ක කිව්වා: "ඕක ඔහොමමම තමයි. වතුර නැති වෙනකොටම තමයි තිබහ දැනෙන්නෙ. ඒකයි මිනිස්සුන්ට කාන්තාරවලදි තිබහ වෙන්නෙ, එහේ වතුර නැති නිසා."

"කාන්තාර යකාට ගියාවෙ," මම කිව්වා. "ගිහින් ලණුවක් හොයාගෙන එනවා."

"මං ඒව තව කොහෙන් හොයන්නද? මම හැමතැනම හෙව්වා. අපි බිලී පිත්තෙ තංගුස් පට ගනිමු."

"ඒක හයිය ඇති වෙයිද?"

"ඔව්, මම හිතන්නෙ."

"හයිය නැත්නම්? "

"නැත්නම් ඒක කැඩෙයි."

අපි තංගුස්පට ලිහලා, ඒක කේතලේට ගැටගහගෙන, ළිඳ ළඟට ගියා. මම කේතලේ ළිඳට පහත්කරල වතුර පිරෙව්වා. ඒක රවිකිඤ්ඤෙක තතක් වගේ හීනියි.

"ඒක කැඩෙන්නයි යන්නෙ," මම කිව්වා. "ඔන්න බලන්න"

"සමහර විට ඒක නොකැඩී තියේවි, අපි ඒක හොඳටෝම පරිස්සමෙන් ඉස්සුවොත්," මීෂ්ක කිව්වා. මට පුළුවන් තරම් පරිස්සමටයි ඉස්සුවෙ. මම ඒක වතුරෙන් යන්තම් උඩට ගත්ත විතරයි, වතුරෙන් 'ජබොක්' සද්දයක් ආවා, කේතලෙත් ගියා!

"ඒක කැඩුණද?" මීෂ්ක ඇහුවා.

"දෙයියන්පල්ල, ඒක කැඩුණ තමයි. දැන් කොහොමද ඉතින් අපි වතුර ගන්නෙ?"

"සැමොවාරෙ අරගෙන බලමුද?" මීෂ්ක ඇහුවා.

"නෑ, අපි සැමොවාරෙත් කෙළින්ම ළිඳට යවාවි. ඇරත්, අපි ළඟ තව ලණු නැහැ."

"හරි. එහෙනම් මුට්ටියක් ගන්න."

"අපිට මුට්ටි ගොඩක් නෑ, විසිකරන්න තරම්."

"ඉතින්, එහෙනම් වීදුරුවක් ගන්න."

"ඔයාට රෑ තිස්සෙම වීදුරුවෙන් වතුර ඉහින්නද ඕන?"

"ඒත් අපි මොකද ඉතිං කරන්නෙ? අපිට කැඳ හදන්නත් තියෙනවා. ඇරත්, මට මැරෙන්න තිබහයි."

"අපි බෙලෙක් කෝප්පෙ ගනිමු." මම කිව්වා.

"කොහොම වුණත් ඒක වීදුරුවකට වඩා ලොකුයිනේ."

අපි ගෙට ගිහින්, කෝප්පෙ පෙරළෙන්නෙ නැති වෙන්න තංගුස්පට ඒකෙ ගැටගහල, ආපහු ළිඳ ළඟට ගියා. අපි ඇතිවෙන්න වතුර බිව්වම මීෂ්ක මෙහෙම කිව්වා :

"ඕක ඔහොමම තමයි, ඔයාට තිබහ වුණාම හිතෙන්නෙ මුළු මුහුදෙම වතුර වුණත් බොන්න පුළුවන් කියල. ඒත් බොන්න ගත්තම තේරෙනව එක කෝප්පයක් ඇතියි කියල. ඒ, මිනිස්සු කෑදර හින්ද."

"කට මැත දෙඩවිල්ල නවත්තල, ගේනව මුට්ටිය. අපිට ඒකත් මෙහෙමම පුරවගන්න පුළුවන්. එතකොට ආයෙ සිය පාරක් විතර ළිඳට දුවන්න වෙන්නෙ නෑ."

මීෂ්ක මුට්ටිය අරන් ළිඳේ ගැට්ටෙන් තිව්වා. තව පොඩ්ඩෙන් ඒක මගේ වැලමිටේ වැදිල බිම වැටෙනව. "ගොන් බූරුව," මම කිව්වා. "මොන එහෙකටද මුට්ටිය ළිඳේ ගැට්ට උඩින් තියන්නෙ? ඒක අරන් පුළුවන් තරම් ඈතින් ඉන්නව. නැත්නම් ඔයා ඒකත් වතුරට වට්ටවාවි."

මීෂ්ක මුට්ටියත් අරන් ළිඳ ළඟින් ඈත් වුණා. මම ඒක පිරෙව්වට පස්සෙ අපි දෙන්න ආපහු ගෙට ගියා. අපි ගෙදරට යනකොට අපේ කැඳ හොඳටම සීතල වෙලා, ළිපත් නිව්ලයි තිබුණෙ. අපි ඒක ආයෙ පත්තුකරලා, කැඳ එක තිව්ව ඉදෙන්න. හුඟ වෙලාවකට පස්සෙ ඒක තැම්බිලා, ටිකක් ඝන වෙලා, බුබුළු දාන සද්දෙ ඇහුණා.

"ඇහුණද ඒක?" මීෂ්ක කිව්වා. "අපිට ඉක්මනට, රසම රස කැඳ ටිකක් ලැබේවි."

මම හැන්දක් අරන් ටිකක් කාල බැලුවා. ඒක අන්තිමයි! ඒකට තිබුණෙ ජරා තිත්ත කර රහක්. ඒ මදිවට අපට ඒකට ලුණු දාන්නත් අමතක වෙලා. මීෂ්කත් ඒක කටට අරන් ආපහු එළියට දැම්මා.

"නෑ," එයා කිව්වා. "මට බඩගින්නෙ මැරෙන එක සැපයි, මේ දහජරාව කනවට වඩා."



"ඔයා නිච්චියටම මැරෙයි ඒව කෑවොත්." මම කිව්වා.

"ඒත් අපි මොකක්ද කරන්නෙ?"

"මන්දා."

"බූරුවො!" මීෂ්ක කෑගැහුවා. "අපිට මාළුන්ව අමතක වෙලා."

"අපට මේ මහ රෑ මාළුත් එක්ක කරදර වෙන්න බෑ. දැන් එළි වෙන්නත් ළඟයි."

"අපි ඒව තම්බනව නෙවෙයි, බදිනව. ඔන්න බලන්නකො. මිනිත්තුවෙන් ලෑස්ති කරන්නම්. "

"ආ, ඕන එකක් එහෙනම්," මම කිව්ව. ඒත් ඒකත් කෑඳ වගේ හැදෙන්න ගොඩ වෙලාවක් ගන්නව නම්, මාව ලැයිස්තුවෙන් කපල දාන්න."

"මිනිත්තු පහෙන් ලෑස්තියි. බලන්නකො."

මීෂ්ක මාළුන්ව පිරිසිදු කරලා, එයාලව සාස්පානට දැම්මා. සාස්පාන රත් වෙලා මාළු පතුලටම ඇලුණා. එයා උන්ව ගලවගන්න ගිහින් එතන එකම ජරමරයක් කළා.

මම කිව්වා : "මොකාද බටර් නැතුව මාළු බදින්න හදන්නෙ?"

මීෂ්ක එළවළු තෙල් ටිකක් සාස්පානට හලලා, ඒක ගිනි අඟුරු අතරින්ම තිව්ව තවත් ඉක්මනට බැදෙන්න. තෙල් හදිසියෙම උඩ විසි වෙලා, පිපිරිලා එක පාරටම ගිනිගත්තා. මීෂ්ක සාස්පාන ඩැහැගත්තම, මට ඕන වුණා ඒකට වතුර දාන්න. ඒත් ගෙදර වතුර බින්දුවක් වත් තිබුණෙ නැහැ. ඉතින් ඒක තෙල් ටික ඉවර වෙනකල්ම පිච්චුණා. කාමරේ දුමෙන් පිරුණා. මාළුන්ගෙන් ඉතිරි වුණේ, කරවෙච්ච අඟුරු කෑලි ගොඩක් විතරයි.

"ඉතින්," මීෂ්ක කිව්වා. "අපි දැන් මොනවද බදින්නෙ?"

"ඔය බැද්ද තරම හොඳටෝම ඇති. හොඳ කෑම නාස්ති කරනව මදිවට, ඔයා ගෙටත් ගිනි තියයි. ඔයා දවසකටම ඇති වෙන්න උයලයි තියෙන්නෙ!"

"ඒත් අපි මොනවද කන්නෙ?"

අපි අමු පිටි කන්න බැලුවා, ඒත් ඒකෙ වැඩි ගතියක් නෑ. අපි ලූනු ගෙඩියක් කන්න බැලුවා, ඒත් ඒක තිත්තයි. අපි එළවළු තෙල් බොන්න

හදල තව පොඩ්ඩෙන් ලෙඩන් වෙනවා. අන්තිමේදි අපි ජෑම් බුජම හොයාගෙන, ඒක ඉවර වෙන්නම ලෙවකාල ඇඳට ගියා. එනකොටත් හොඳටෝම පරක්කුයි.

අපි උදේ නැගිට්ටෙ, හාමත්වෙච්ච වෘකයො දෙන්නෙක් වගේ. මීෂ්කට ඕන වුණා කෑඳ ටිකක් හදන්න. ඒත් එයා පිටි ටිකක් ගන්නව දැක්ක ගමන් මාව සීතල වෙලා ගියා. "හිතන්නවත් එපා," මම කිව්වා. "මම යන්නම් අපේ ගේ අයිති නතාෂ නැන්ද ළඟට, එයාට කියන්නම් අපිට කෑඳ හදල දෙන්න කියලා."

අපි නතාෂ නැන්ද ළඟට ගිහින් මුළු විස්තරේම කියලා, එයා අපිට කෑඳ හදල දුන්නොත් එයාගෙ වත්ත සුද්ධකරල දෙන්න පොරොන්දු වුණා. එයා අපිට අනුකම්පා කරලා, කෑඳ හැදෙනකම් කන්න කිරියි, ගෝව පස්තෑලෙකුයි දුන්නා. අපි කාගෙන කාගෙන ගියා, කවදාවත් නවත්තග න්න බැරිවෙයි වගේ. නැන්දගෙ පොඩි පුතා වොව්ක, අපි දිහා ඇස් ලොකු කරගෙන බලා හිටියා.

අන්තිමට අපේ බඩවල් පිරුණා. නතාෂ නැන්දා අපිට කොක්කකුයි ලණුවකුයි දුන්නම අපි ළිඳට ගියා, පනිට්ටුවයි කේතලෙයි බාගන්න. අපිට ඒවා උඩට ගන්න හුඟ වෙලාවක් ගතවුණා. ඒත් වාසනාවකට කිසි දෙයක් නැති වුණේ නැහැ. ඉන් පස්සෙ, මීෂ්කයි, මමයි පුංචි වොව්කයි නතාෂා නැන්දගෙ වත්ත සුද්ධ කළා.

මීෂ්ක කිව්වා : "වත්ත සුද්ධකරන එක සුළු දෙයක්. ඕන කෙනෙකුට ඒක කරන්න පුළුවන්. ඒක ලේසියි... කෑඳ හැදිල්ලට වඩා නම් හුඟක්ම ලේසියි!"

ටෙලිෆෝනය

දවසක් මීෂ්කයි මායි අපූරු සෙල්ලම්බඩුවක් දැක්කා සාප්පුවකදි. ඒක ඇත්ත එකක් විදියටම වැඩ කරන ටෙලිෆෝන් සෙට් එකක්. ටෙලිෆෝන් දෙකකුයි, වයර් දඟරෙකුයි ලොකු පෙට්ටියක අහුරලා. සාප්පු සේවිකාවක් අපිට කිව්වා, ඒක එකම තට්ටු නිවාසෙක ගෙවල් දෙකක් අතරෙ පාවිච්චි කරන්න පුළුවන් කියල. "ඔයාලට තියෙන්නෙ, එක ෆෝන් එකක් එක ගෙදරකින් තියල, අනිත් එක අල්ලපු ගෙදරින් තියල. ඒ දෙක වයර්එකෙන් සම්බන්ධ කරන එකයි."

මීෂ්කයි මායි ඉන්නෙත් එකම තට්ටු නිවාසෙක. මගේ ගේ තියෙන්නෙ එයාගෙ ගෙට එක තට්ටුවක් උඩින්. ඇරත් අපි හිතුවා, අපිට ඕන වෙලාවක කතාකරන්න ලැබෙන එක ලොකු විනෝදයක් කියලා.

"ඇරත්," මීෂ්ක කිව්වා, ඒක කැඩිල විසි කරන්න වෙන විදියෙ සාමාන්‍ය සෙල්ලම් බඩුවකුත් නෙවෙයි. ඒක වැඩකට ඇති දෙයක්."

"ඔව්," මම කිව්වා. හුගක් ප්‍රයෝජනවත්. කෙනෙකුට තමන්ගෙ අසල්වැසියත් එක්ක කතා කරන්න පුළුවන් කොහෙවත් යන්නෙ නැතුව."

"නියමයි," මීෂ්ක ලොකු උනන්දුවකින් කිව්වා. "ගෙදර ඉඳගෙන හිතේ හැටියට කතා කරන්න පුළුවන්."

අපි හිතාගත්ත ටෙලිෆෝන් දෙක ගන්න සල්ලි ඉතුරු කරගන්න. සති දෙකක් පුරාම අයිස්ක්‍රීම් කෑවෙත් නැතිව, චිත්‍රපටි බලන්නෙත් නැතිව හිටියා. ඉතින් සති දෙකකින් පස්සෙ, අපිට ඒකට සෑහෙන්න සල්ලි ඉතුරු වුණා.

අපි සාප්පුවෙ ඉඳන් පෙට්ටිය අරන් ගෙදර ඇවිත්, එක ටෙලිෆෝන් එකක් අපේ ගෙදරිනුයි, අනිත් එක මීෂ්කගෙ ගෙදරිනුයි තියලා, මගේ ජනේලෙ හරහා මීෂ්කගෙ කාමරේට වයර් එක යැව්වා.

"ඔන්න එහෙනම්," මීෂ්ක කිව්ව. "අපි ඒක කරල බලමු. ඔයා උඩ තට්ටුවට දුවලා, මගෙන් කෝල් එකක් එනකම් ඉන්න."

මම මගේ ගෙදරට දුවගෙන ගිහින් රිසීවරේ අතට ගන්නකොටත්, මීෂ්කගෙ කටහඬ කෑගහනවා :

"හලෝ ! හලෝ"

"හලෝ" කියල මමත් යටිගිරියෙන්ම කෑගැහුවා.

"ඔයාට මාව ඇහෙනවද?" මීෂ්ක කෑගැහුවා.

"ඔව්. මට ඔයාව ඇහෙනවා, ඔයාට මාව ඇහෙනවද?"

"ඔව්. මටත් ඔයාව ඇහෙනවා. ඒක නම් මාරයි! ඔයාට මාව හොඳට ඇහෙනවද?"

"නියමයි, ඔයාට?"

"මටත්. හහ්! හා! ඔයාට මම හිනාවෙනව ඇහෙනවද?"

"ඔව්, ඇත්තටම. හහ්! හා! ඔයාට ඒක ඇහුණද?"

"ඔව්. මේ අහන්න, මම දැන්ම ඔයා ළඟට එනව."

එයා දුවගෙන මගේ ගෙදරට ආපු හැටියෙම, අපි දෙන්න සතුටින් එකිනෙකාව බදාගත්තා.

"ඔයාට සතුටු නැද්ද අපට ෆෝන් එකක් තියෙන එක ගැන? ඒක මාරයි නේද?"

"ඔව්." මම කිව්වා.

"දැන් මම ආපහු ගිහින් ඔයාට කෝල් එකක් දෙන්නම්."

එයා ආපහු දිව්වා. ෆෝන් එක සද්ද වුණා. මම රිසීවර් එක ගත්තා.

"හලෝ!"

"හලෝ!"

"ඔයාට මාව ඇහෙනවද?"

"මට ඔයාව ගාණට ඇහෙනවා."

"ඔයාට ඇහෙනවද?"

"ඔව්, මට ඇහෙනවා."

"මටත් එහෙමයි. අපි දැන් පුංචි කතාවක් දාමු."

"ඔව්, කරමු. මොනව ගැනද අපි කතා කරන්නෙ?"

"ඕ.. ඕනම විදියක දේවල්. අපි ටෙලිෆෝන් එකක් ගත්ත එක ගැන ඔයාට සතුටුද?"

"හරි සතුටුයි."

"ඒක අපි ගත්තෙ නැත්නම් හරිම අපරාදෙ නේද?"

"කියල වැඩක් නෑ."

"ඉතින්?"

"ඉතින් මොකක්ද?"

"ඇයි ඔයා මුකුත් කියන්නෙ නැත්තෙ?"

"ඔයාම මොනව හරි කියන්න."

"මම දන්නෙ නෑ, මොනව කියන්නද කියල."

මීෂ්ක කිව්වා : "ඕක ඔහොමමයි. කතා කරන්න ඕන වෙලාවට මොනව කියන්නද කියල හිතාගන්න බෑ, ඒත් කතා කරන්න ඕන නැති වෙලාවට කට නවත්තගන්න බෑ."

මම කිව්වා : "මම කියන්නම් වැඩක්. මම ටික වෙලාවක් හිතන්නම්. මට මොනව හරි කල්පනා වුණාම ඔයාට කෝල් කරන්නම්."

"හා, හොඳයි."

මම හිතන්න ගත්තා. එක පාරටම ෆෝන් එක වැදුණා. මම රිසීවරේ ගත්තා.

"ඉතින්, ඔයා මොනව හරි හිතුවද?"

"තාම නෑ, ඔයා හිතුවද?"

"නෑ, මම හිතුවෙත් නෑ."

"එහෙනම් ඇයි ඔයා කතා කළේ?"

"මම හිතුවා ඔයා මොකක් හරි හිතන්න ඇති කියල."

"එහෙම වුණා නම් මම කෝල් කරනවනෙ."

"මම හිතුවා ඔයා ඒ ගැන හිතල නැතුව ඇති කියල."

"හිතුවෙ මම බූරුවෙක්, නැත්නම් මොකෙක් කියලද?"

"මම දූන් ඔයා බූරුවෙක් කියල කිව්වද?"

"ඔයා මොකක්ද එහෙනම් කිව්වෙ?"

"මුකුත් නෑ, මම කිව්වෙ ඔයා බූරුවෙක් නෙවෙයි කියල."

"ආ, හරි. එහෙමනම් බූරුවො ගැන කතා කළා ඇති. අපි දැන් අපේ ගෙදර වැඩ කළොත් හොඳයි.

"ඔව්. ඒක ඇත්ත."

මම ෆෝන් එක තියලා, පාඩම් වැඩ කරන්න ඉඳගත්තා. මම පොත ඇරියා විතරයි ෆෝන් එක වැදුණා.

"අහන්න, මම ෆෝන් එක ළඟින් ඉඳන්, පියානෝව වාදනය කර කර සිංදුවක් කියන්නයි යන්නෙ."

"හරි, කරන්නකො."

මට ඇහුණා සර සර සද්දෙකුයි, ඊළඟට පියානෝව වාදනය කරන සද්දෙකුයි, ඊට පස්සෙ පොඩ්ඩක් වත් මීෂ්කගෙ වගේ නැති කටහඬකුයි:

"කොතැන නුඹ සැඟැවුණිද

මගෙ සොඳුරු තුරුණු විය ...?"

මේ මොන එකක්ද? මම කල්පනා කළා. මීෂ්ක මොන ලෝකෙකින් මේ වගේ සින්දු කියන්න ඉගෙනගත්තද මන්දා.

එතකොටම මීෂ්ක, කන්දෙක ළඟටම විරිත්තගෙන ආවා.

"ඔයා හිතුවෙ ඒ සින්දු කියන්නෙ මම කියලනෙ? ඒ ග්‍රැමෆෝන් එක! කෝ මටත් අහන්න දෙන්න."

මම රිසීවරේ එයාගෙ අතට දුන්නා. එයා ටික වෙලාවක් අහගෙන ඉඳලා, හදිසියේ, රිසීවරේ බිම දාලා, යට තට්ටුවට දිව්වා. මම රිසීවරේ කනට තියාගත්තම ඇහුණා 'හ්ම්...... ස්..... ස්....' සද්දයක්. රෙකෝඩ් එක ඉවරයි වෙන්න ඇති. මම ආපහු ගෙදර වැඩ කරන්න ඉඳගත්ත විතරයි, ආයෙම ටෙලිෆෝන් එක වැදුණා. මම රිසීවරේ ගත්තා.

"බව් වව්!" සද්දයක් ඇහුණා.

"ඔයා බුරන්නෙ අහවල් දේකටද?"

"ඒ මම නෙවෙයි, ඒ ලැඩී. ඔයාට එයා රිසීවරේ හපන සද්දෙ ඇහෙනවද?"

"ඔව්."

"මම රිසීවරේ එයාගෙ නහයට තද කරගෙන ඉන්නෙ. ඉතින් එයා ඒක හපනවා."

"එයා ඔයාගෙ ටෙලිෆෝන් එක හප කරල දාවි, ඔයා පරෙස්සම් කළේ නැත්නම්."

"අයියෝ ඒකට මුකුත් වෙන්නෙ නෑ. ඒක යකඩ වලින් නෙ හදල තියෙන්නෙ.. ඌයි! නරක බල්ල, බහිනව බිමට! ඔයා කොහොමද මාව විකන්න හිතුවෙ? ගන්නව මෙක! (බව් වව්!) ඌ මාව විකුවා. ඔයාට ඇහුණද?"

"ඔව්, මට ඇහුණා."

මම ආපහු ගෙදර වැඩ කරන්න ඉඳගත්තා. එත් ඊළඟ මොහොතෙම ආපහු ෆෝන් එක වැදුණා. මේ පාර රිසීවරෙන් ආවෙ ගුමු ගුමු සද්දයක්.

"ඒ මොකෙක්ද?"

"මැස්සෙක්."

"ඌ කොහේද ඉන්නෙ?"

"මම ඌ රිසීවරේට ළං කරලා අල්ලගෙන ඉන්නෙ. ඉතින් එයා ගුමු ගුමු ගගා තටු ගහනවා."

මීෂ්කයි මමයි දෙන්නම මුළු දවසෙම එකිනෙකාට කතා කළා. අපි එක එක පිස්සු වැඩ කළා ; සින්දු කිව්වා, කෑගැහුවා, ගෙරෙව්වා,

ඤාව් ගැවා, රහස් කියාගත්තා - පුළුවන් හැම දේම කළා. මම පාඩම් වැඩ ටික ඉවර කරනකොටත් හොඳටම පරක්කුයි. මම හිතුව නිදාගන්න කලින් මීෂ්කට කෝල් එකක් දෙන්න. මම කෝල් එකක් ගත්ත, ඒත් උත්තරයක් ලැබුණෙ නෑ.

"මේ මොකද වෙලා තියෙන්නෙ?" මම හිතුවා. "එයාගෙ ෆෝන් එක දූනටම කැඩිලවත්ද?"

මම ආපහු කෝල් කළා. ඒත් උත්තරයක් නෑ. මම පහළ තට්ටුවට දිව්වා. එතකොට, ඔයාල විශ්වාස කරයිද මන්ද, එතන මීෂ්ක එයාගෙ ටෙලිෆෝන් එක කඩ කඩා හිටිය! එයා බැටරියත් එළියට ඇදල, බෙල් එක ගළවල, ඊළඟට රිසීවරෙත් ගළවන්න පටන්ගෙනයි තිබුණෙ.

"ඒයි!" මම කෑගැහුවා. "අහවල් දේකටද ඔය ෆෝන් එක කුඩුපට්ටම් කරන්නෙ?"

"අපෝ නෑ, මම ඒක හදල තියෙන විදිය බලන්න ගළවනව විතරයි. මම ඒක ආපහු හයි කරනවා."

"ඔයාට බැරි වේවි. ඔයා ඒක කරන්න දන්නෙ නැහැනෙ"

"කව්ද කියන්නෙ මට බෑ කියල? ඒක හරි ලේසියි."

එයා රිසීවරේ ඉස්කුරුප්පු ඇණ ටික ගලවලා, ලෝහ කෑලි ටිකක් එළියට අරගෙන, ඇතුළෙ තිබ්බව ලෝහ තැටියක් අරින්න හැදුවා. තැටිය එළියට විසි වෙලා, කළු පාට කුඩු වගයක් එළියට හැලුණා. මීෂ්ක බයවෙලා ආපහු ඒ ටික ඇතුළට දැම්මා.

"බලන්න ඔයා කළ වැඩේ!" මම කිව්වා.

"ඕක මහ දෙයක් නෙවෙයි, මම ටක් ගාල ඒක හදන්නම්."

එයා වැඩ කරගෙන කරගෙන ගියා. ඒත් ඒක එයා හිතපු තරම්ම ලේසි වැඩක් නෙවෙයි, ඉස්කුරුප්පු ඇණ හුඟක් පොඩි නිසා, ඒවා නියම තැනින් තියන්න ගොඩක් අමාරු වුණා. අන්තිමට එයා ඔක්කොම හයි කළා, පොඩි ලෝහ කෑල්ලකුයි, ඉස්කුරුප්පු ඇණ දෙකකුයි හැර.

"අරව මොකටද?" මම එයාගෙන් ඇහුවා.

"දෙවියනේ, මට ඒක හයිකරන්න අමතක වෙලා," මීෂ්ක කිව්වා. "මං වගේ මැටි මෝලෙක්! ඒක ඇතුළටයි හයි කරන්න ඕන. මට ආපහු ඒක ගළවන්න වෙනවා."

"හරි එහෙනම්," මම කිව්වා. "මම ගෙදර යනවා. ඔයාගෙ වැඩ ඉවර වුණාම මට කෝල් කරන්න."

මම ගෙදර ගිහින් බලාගෙන හිටියා හිටියා, ඒත් කෝල් එකක් ආවෙ නෑ. ඉතින් මම ඇඳට ගියා.

ඊළඟ දවසෙ ටෙලිෆෝන් එක කොච්චර හයියෙන් වැදුණද කියතොත්, මම හිතුව ගේ ගිනිඅරගෙන කියල. මම ඇඳෙන් බිමට පැනලා, රිසීවරේ උස්සල බෙරිහන් දුන්නා :

"හලෝ!"

"ඇයි ඔයා ඔහොම 'ගොර ගොර' ගාන්නෙ?" මීෂ්ක ඇහුවා.

"මම ගොර ගොර ගාන්නෙ නෑ."

"ගොර ගොර ගාන එක නවත්තල හරියට කතා කරන්නකෝ!" මීෂ්ක බෙරිහන් දුන්නා.

"ඒත් මම හරියට තමයි කතා කරන්නෙ. මම ගොර ගොර ගාන්නෙ අහවල් දේකටද?"

"කවටයෙක් වෙන්න එපා. මම කොහොමටවත් හිතන්නෙ නෑ ඔතන ඌරෙක් ඉන්නව කියලා."

"මෙහෙ ඇති ඌරෙක් නෑ කියලයි මිනිහො මමත් කියන්නෙ!" මමත් ටිකක් කේන්ති අරන් බෙරිහන් දුන්න. මීෂ්ක මුකුත්ම කිව්වෙ නෑ.

මිනිත්තුවකට විතර පස්සෙ, එයා මගේ කාමරේට කඩාවැදුණා.

"මොන නාඩගමක්ද ඔයා නැටුවෙ, ෆෝන් එකට ඌරු සද්ද දදා?"

"මම එහෙම දෙයක් කළේ නෑ."

"මට ඔයාව හොඳට ඇහුණා."

"මම මොනවටද ඌරු සද්ද දාන්නෙ?"

"මම කොහොමද දන්නෙ? මට ඇහුණෙ කවුරුහරි මගෙ කනට කරල 'ගොර ගොර' ගානව විතරයි. ඔයත් යට තට්ටුවට ගිහින් අහල බලන්න."

මම එයාලගෙ ගෙදරට ගිහින් එයාට අරගෙන කෑගැහුව :

"හලෝ !"

"ගොර ගොර ගොර ගොර!" මට උත්තරයක් කියල ඇහුණෙ එච්චරයි. මම වෙච්ච දේ තේරුම් අරන්, ආපහු දිච්චා මීෂ්කට කියන්න.

"මේ ඔක්කොම ඔයා හන්ද!" මම කිච්චා. "ඔයා තමයි ටෙලිෆෝන් එක කඩල දැම්මෙ."

"ඒ කොහොමද?"

"ඔයා රිසීවරේ මොකක් හරි තරක් කරන්න ඇති ඒක ගලවනකොට."

"මම වැරදියටයි හයිකරන්න ඇත්තෙ," මීෂ්ක කිච්චා. "ඒක ආපහු හරිගස්සන්න වෙනවා."

"කොහොමද ඔයා ඒක හරිගස්සන්නෙ?"

"මම ඔයාගෙ එක ගළවල බලන්නම් ඒක හදල තියෙන විදිය."

"අපෝ බෑ, ඔයාට දෙන්න බෑ! මම ඔයාට මගේ ටෙලිෆෝන් එකත් කාබාසිනියා කරන්න ඉඩ දෙන්නෙ නෑ!"

"ඔයාට බයවෙන්න කාරියක් නෑ. මම ඒක සීරුවට කරන්නම්. මම ඒක හැදුවෙ නැත්නම්, අපට ඒක පාවිච්චි කරන්න වෙන්නෙම නැහැ."

මට ඉතින් යටත් වෙන්න වුණා. එයා ඉක්මනින්ම වැඩේට බැස්සා. එයා හුඟ වෙලාවක් තිස්සෙ ඒක අලුත්වැඩියා කරල ඉවර වුණාම, ඒක කොහෙත්ම වැඩ කළේ නෑ. කොටින්ම ඒක 'ගොර ගොර' ගෑවෙ වත් නෑ.

"දැන් අපි මොකද කරන්නෙ?" මම එයාගෙන් ඇහුවා.

"මම කියන්නම් ඔයාට වැඩක්" මීෂ්ක කිව්වා. අපි සාප්පුවෙ අයට කියමු මේක හදල දෙන්න කියලා."

අපි සාප්පුවට ගියා. ඒත් ඒගොල්ල කිව්වා, එයාල ටෙලිෆෝන් හදන්නෙත් නැහැ, අපේ එක හදාගන්න පුළුවන් තැනක් ගැන දන්නෙත් නැහැ කියලා. අපිට එදා හරියට දුක හිතුණා. එතකොට මීෂ්කට අදහසක් ආවා.

"අපි නම් බූරුවො! අපිට ඒකෙන් ටෙලිග්‍රාප්ස් යවාගන්න පුළුවන්."

"ඒ කොහොමද?"

"ඔයා දන්නවනෙ තිත් සහ රේඛා. සීනුව තවම වැඩ කරනවනෙ. අපට ඒක පාවිච්චි කරන්න පුළුවන්. කොට බෙල් එකක් තිතක්. එතකොට දිග එකක් රේඛාවක්. අපිට පුළුවන් මෝස් සංඥා ක්‍රමය ඉගෙනගෙන පණිවිඩ හුවමාරු කරගන්න."

අපි මෝස් සංඥා ක්‍රමය ඉගෙනගන්න පටන්ගත්තා. 'ඒ' අකුරට තිතකුයි, ඉරකුයි. 'බී' අකුරට ඉරකුයි තිත් දෙකකුයි. 'සී' අකුරට තිතකුයි ඉරි දෙකකුයි. අනිත් ඒවත් ඔය වගේ. අපි ඉක්මනට සම්පූර්ණ හෝඩියම ඉගෙනගෙන පණිවිඩ යවන්න ගත්තා. මුලදී නම් ඒක වුණේ හරි හෙමින්. ඒත් ටිකක් කරගෙන යද්දි, අපි ටක් ටක් ගාල සීනුවට තට්ටු කරන්න ගත්තා ඇත්තටම ටෙලිග්‍රාප්ස් යවන අය වගේ. ඒකට නම් ටෙලිෆෝන් එකකටත් වඩා ආස හිතෙනව.

ඒත් ඒකත් වැඩි කාලයක් තිබුණෙ නෑ. දවසක් මම මීෂ්කට කෝල් එකක් ගත්තා, උත්තරයක් නෑ. එයා තාම නිදි ඇති කියල හිතලා, ටිකකට පස්සෙ කතා කළා. ඒත් උත්තරයක් නෑ. මම එයාගෙ ගේ ළඟට ඇවිත් දොරට තට්ටු කළා. මීෂ්ක ඇවිත් දොර ඇරියා.

"දැන් තට්ටු කරන්න ඕන නෑ. ඔයාට පුළුවන් සීනුව ගහන්න." එයා ඇඟිල්ල දික් කරල දොරේ තිබ්බච බොත්තමක් පෙන්නුවා.

"මොකක්ද ඒ?"

"සීනුවක්"

"කියාගෙන යන්නකො.."

"ඔව්, විදුලි සීනුවක්."

"කොහෙන්ද ඔයා ඒක ගත්තෙ?"

"මමයි ඒක හැදුවෙ."

" ඒ කොහොමද?"

"මම ඒක හැදුවෙ ටෙලිෆෝන් එකෙන්."

"මොකක්?"

"ඔව්. මම ටෙලිෆෝන් එකේ බෙල් එක ගැලෙව්වා. බොත්තමත් ගත්තා. මම බැටරියත් එළියට ගත්තා. සෙල්ලම් බඩුවකට වඩා ප්‍රයෝජනවත් දෙයක් හැදුවා."

"ඒත් ඔයාට කිසිම අයිතියක් නෑ, ෆෝන් එක කඩන්න." මම කිව්වා.

"මොකෝ නැත්තෙ? මම කැඩුවෙ මගේ එක, ඔයාගෙ එක නෙවෙයි."

"ඔව්. ඒත් ටෙලිෆෝන් එක අයිති අපි දෙන්නටම. ඔයා ඒක කුඩු කරනව කියල දැනන් හිටිය නම්, මම ඔයත් එක්ක සල්ලි දාල ඒක ගන්නෙ නෑ. වැඩ කරන්නෙ නැති ටෙලිෆෝන් එකකින් මට වැඩක් නෑ."

"කොහොමටත් අපට ටෙලිෆෝන් එකක් ඕන නැහැනෙ. අපි ඉන්නෙ ලොකු ඈතකින් නෙවෙයිනෙ. ඔයාට මට කතා කරන්න ඕන නම් යට තට්ටුවට එන්න."

"මම මීට පස්සෙ ඔයා එක්ක කතා කරන්නෙ නෑ!" මම එහෙම කියාගෙන එළියට ගියා.

මම එයත් එක්ක කොච්චර තරහ වුණාද කිව්වොත්, එයත් එක්ක කතා කළේ නෑ දවස් තුනක්ම යනකල්. ඒත් මට තනියම ඉඳල හරියට පාළු වුණා. ඉතින් මමත් ෆෝන් එක අරගෙන සීනුවක් හැදුවා. ඒත් මීක්ක වගේ නෙවෙයි, මම ඒක හරියට හැදුවා. දොර

ළඟ තියෙන රාක්කෙන් බැටරිය තියලා, බිත්තිය දිගේ, දොරේ තියන බොත්තම ළඟට වයර් එකක් ඇද්දා. ඔබන බොත්තම හරියට තද කළා, මීෂ්කගෙ එක වගේ එක ඇඟෙන් එල්ලෙන්නෙ නැති වෙන්න. අම්මයි තාත්තයි මාව අගය කළා, එච්චර පිළිවෙළට වැඩ කරපු එක ගැන.

මම පහළට ගියා මීෂ්කට මගෙ බෙල් එක ගැන කියන්න. මම එයාගෙ දොරේ තිබිච්ච බොත්තම එබුවා, කව්රුවත් උත්තර දුන්නෙ නෑ. මම ඒක කීප වතාවක්ම එබුවත් බෙල් සද්දයක් නම් ඇහුණෙ නෑ. ඉතින් මම දොරට තට්ටු කළා. මීෂ්ක දොර ඇරියා.

"මොකක්ද ඔයාගෙ බෙල් එකට වෙලා තියෙන්නෙ? ඒක වැඩ කරන්නෙ නැද්ද?"

"නෑ. ඒක කැඩිලා."

"මොකක්ද ප්‍රශ්නෙ?"

"මම බැටරිය කැඩුවා."

"ඔයා.. මොකක්?"

"ඔව්, මට ඕන වුණා ඒක හදල තියෙන්නෙ මොනවයින්ද කියල බලන්න."

"හරි, දැන් මොකක්ද ඔයා ටෙලිෆෝන් එකයි, බෙල් එකයි නැතුව කරන්න යන්නෙ?"

"අයියෝ ඒක මම බලාගන්නම්." එයා හූල්ලගෙන කිව්වා.

මම ගෙදර ගියේ ඔළුවත් නරක් කරගෙන. මොකක් නිසාද එයා ඒ වගේ දේවල් කරන්නෙ? ඇයි එයා හැම දේම කඩල දාන්නෙ? මට එයා ගැන දුකක් හිතුණා.

එදා රෑ මට නින්ද ගියෙත් නැහැ, හුඟ වෙලාවක් යනකල්. මම හිත හිතා හිටියෙ අපේ ටෙලිෆෝන් එක ගැනයි, අපි ඒකෙන් හදපු බෙල් එක ගැනයි. ඊළඟට මම හිතන්න ගත්ත, විදුලි බලය ගැනයි බැටරිවලින් විදුලිබලය එන විදිය ගැනයි.

හැමෝම සැප නින්දෙ. ඒත් මම ඇහැරලා මේව ගැන කල්පනා කර කර හිටියා. ටිකකින් මම ඇඳෙන් බැස්සා. ලයිට් දැම්මා, රාක්කෙ උඩ තිබ්බ්ච බැටරිය අරගෙන කඩල බැලුවා. ඒකෙ දියරයකට රෙද්දකින් ඔතපු කළුපාට කූරක් ඔබල තිබුණ. එහෙනම් ඒකයි හොරේ! විදුලිය බලය එන්නෙ අර දියරෙන්. මම ආපහු ඇඳේ වැටිල නිදියගත්ත.

ප්‍රීතිමත් පවුල

වැදගත් තීරණය

මේක සිද්ධ වුණේ, මමයි මීෂ්කයි ටින් කෑන් එකකින් හදපු වාෂ්ප එන්ජිම කැඩුණට පස්සෙ. මීෂ්ක කෑන් එකේ තිබ්බ්ච වතුර ඕනෑවට වඩා උණුවෙන්න ඇරලා. ඒක පිපිරිලා ඒකෙ හුමාලෙට එයාගෙ අත පිච්චුණා. වාසනාවට අම්ම එවෙලෙම එයාගෙ අතේ 'නැප්ත තෙලෙ' ටිකක් ගෑවා. ඒක නම් අපූරු ප්‍රතිකර්මයක්. ඔයාලත් ඕන නම් ඒක කරල බලන්න, මාව විශ්වාස නැත්නම්. ඒත් ඔයාල පුච්චගත්ත හැටියෙම තෙල් අතුල්ලගන්න, ඕන. නැත්නම් එතන හම යාවි.

ඉතින් අපේ වාෂ්ප එන්ජිම කැඩුණට පස්සෙ, මිෂ්කගෙ අම්ම අපට ඒකත් එක්ක සෙල්ලම් කරන්න නොදී, ඒක කුණු කූඩෙට දැම්මා. හුඟ දවසක් යනකල් අපට කරන්න දෙයක් තිබුණෙත් නෑ. ඉතින් අපි හරි කම්මැලිකමේ තමයි හිටියෙ.

වසන්තෙ උදාවීගෙන එනවා. හැම තැනකම හිම දියවෙනවා. කාණුවලින් පුංචි දියපාරවල් ගලාගෙන ගියා. වසන්තයේ දීප්තිමත් හිරු එළිය ජනෙල්වලින් ඇතුළට ආවා. ඒත් මිෂ්කයි මමයි හිටියෙ බුම්මගෙන. අපි දෙන්න විකාර විදියෙ ජෝඩුවක්- අපිට කරන්න වැඩක් නැතුව කිසි සතුටක් නෑ. ඉතින් අපිට කරන්න දෙයක් නැත්නම් අපි කරන්නෙ වැඩක් හම්බවෙනකල් ඉඳගෙන කෙඳිරිගාන එක.

දවසක් මම එයාගෙ ගෙදරට ගියාම දැක්කා, එයා ඔළුව අත් දෙකේ ගහගෙන පොතකට නැමිගෙන ඉන්නවා. එයා කොච්චර පොත කියවන සිහියෙන්ද හිටියෙ කිව්වොත් එයාට මම එන සද්දෙවත් ඇහුණෙ නෑ. එයාගෙ ඔළුව උස්සවන්න, මට දොරට තඩිබාන්නත් සිද්ධ වුණා.

"ඔහෝ, මේ ඔයානෙ නිකොලාද්සේ." එයා විරිත්තල කිව්වා. මිෂ්ක කවදාවත් මට මගේ ඇත්ත නමින් කතා කරන්නෙ නෑ. අනික් අය වගේ මට 'කෝල්ය' කියල කතා කරනව වෙනුවට, එයා මට විකාර විදිහෙ නම් හදනවා. නිකොල, මිකොල, මිකුල සෙල්යානිනොවිච් නැතිනම් මික්ලුකෝ මක්ලායි වගේ. වෙන එකක් නියා එයා මට දවසක් 'නිකොලාකි' කියලත් කිව්වා. හැමදාම ඉතින් මට අලුත් නමකට උත්තර දෙන්න වෙනවා. ඒත් මිෂ්ක ඒකට කැමති තාක් කල් මම ඒක ගණන් ගන්නෙ නෑ.

"ඔව්," මම කිව්වා. "ඒ මම. මොකක්ද ඔයාගෙ ඔය පොත?"

"හරි ආස හිතෙන පොතක්," මිෂ්ක කිව්වා. "මම අද උදේ පත්තර විකුණන තැනකින් මේක ගත්තෙ."

මම ඒකට එබිල බැලුවා. ඒකෙ නම 'පක්ෂි පාලනය.' කුකුළෙකුයි කිකිළියෙකුයි ඉන්න පින්තූරයක් පිටකවරෙ තිබුණා. හැම පිටුවෙම කුකුළ් කූඩුවල රූප සටහනුයි, චිත්‍රයි, පින්තූරයි තිබුණා.

"මොකක්ද ඒකෙ ආස හිතෙන්නෙ?" මම එයාගෙන් ඇහුවා.

"මට නම් පේන්නෙ, මොකක් හරි විද්‍යා පොතක් වගේ."

"ඒ නිසාම තමයි ඒක ආස හිතෙන එකක් වෙන්නෙ. මේක ඔයාගෙ ඔය මෝඩ සුරංගනා කතාවක් වගේ නෙවෙයි. මේකෙ තියන හැම දෙයක්ම ඇත්ත. පලක් ඇති පොතක්, ආන්න ඒකයි."

මීෂ්ක වැඩකට ඇති හැම දේකටම කැමති හාදයෙක්. එයාට යන්තම් තුට්ටු දෙකක් ලැබුණ ගමන්ම එයා ගිහින් මේ පොත වගේ පලක් ඇති දෙයක් ගන්නවා. එක වතාවක් එයා වෙබිෂෙව්ගෙ 'ප්‍රතිලෝමීය ත්‍රිකෝණමිතික ශ්‍රිත සහ බහුපාද' කියල පොතක් ගෙනාවා. එයාට ඒකෙ වචනයක් වත් තේරුණේ නෑ, සහතිකයි! ඉතින් එයා හිතුවා, එයාට ඒක කියවන්න මොළේ පැදෙනතුරු අරන් තියන්න. ඒක තාමත් පොත් රාක්කෙ බලා ඉන්නවා, මීෂ්කට මොළේ පැදෙනකල්.

එයා කියව කියවා හිටපු පිටුව ලකුණු කරල පොත වැහුවා.

"මේ පොතෙන් ඕන දෙයක් දැනගන්න පුළුවන්," එයා කිව්වා. "කුකුළො, තාරාවො, පාත්තයො, කළුකුම්මු වගේ ඕන එකෙක් ඇතිකරන විදිය."

"ඔයා කළුකුමෙක්ව හදන්න හිතල නැහැනෙ?"

"නෑ. ඒත් මට ඒක කියවන්න තියෙන කැමැත්ත ඒකෙන් නැති වෙන්නෙ නෑ. ඒකෙ කියනව, අපට 'ඉන්කියුබේටරේ' කියල කිකිළියෙක් නැතුව බිත්තර රකින මැසිමක් හදන්න පුළුවන්ලු."

"හහ්!" මම කිව්වා. "ඕනම කෙනෙක් ඕක දන්නව. වෙන එකක් තියා, ගිය අවුරුද්දෙ මම එකක් දැක්කා අම්මත් එක්ක ගොවිපොළකට ගියාම. ඒකෙන් දවසකට පන්සීයක් නැත්නම් දාහක් බිත්තරවලින් පැටව් එළියට එනව. එයාලට ලන්ව එළියට ගන්නවත් වෙලාවක් නැහැ."

"ඇත්තට!" මීෂ්ක අදහගන්නවත් බැරිව ඇහුවා. "මම ඒ බව දැනන් හිටියෙ නෑ. මම හිතාගෙන හිටියෙ බිත්තර රකින්න පුළුවන් කිකිළියන්ට විතරයි කියලා. මම බිත්තර රකින කිකිළියො ගොඩාරියක් දැකල තියෙනව ගමෙ ඉඳිද්දි."

"අයියෝ, මාත් උන් ඕන තරම් දැකල තියෙනවා," මම කිව්වා. "ඒත් ඉන්කියුබේටරෙන් ඊට වඩා වාසියි. කිකිළියෙක් වතාවකදි බිත්තර දුසිමක් විතර රකිනකොට, ඉන්කියුබේටරේට පුළුවන් දාහක් වුණත් රකින්න."

"මම දන්නවා," මීෂ්ක කිව්වා. "ඒක තමයි පොතෙනුත් කියවෙන්නෙ. තව එකක් තියෙනවා, කිකිළියෙක් බිත්තර දාන්නෙ නෑ, එයා බිත්තර රැකල පැටව් හදාවඩාගන්නකොට. ඒත් බිත්තර රකින්න ඉන්කියුබේටරයක් තියෙනව නම්, කිකිළිට දිගටම බිත්තර දාන්න පුළුවන්."

අපි වැඩට බැහැල ගණන් හදල බැලුවා, කොච්චර බිත්තර ගාණක් වැඩිපුර ලැබෙව්ද, කිකිළි බිත්තර රකින්නෙ නැතුව දිගටම බිත්තර දදා ගියොත් කියලා. එයා පැටව් බලාගන්න ගතකරන කාලයත් එක්ක බැලුවොත්, එයාට ආපහු බිත්තර දාන්න මාස තුනක් වත් යනවා.

"මාස තුනක්, ඒ කියන්නෙ දවස් අනූවක්." මීෂ්ක කිව්වා. උෟ බිත්තර රකින වැඩේ නොකර නම්, එයා දවසකට එකක් වෙන්න දැම්මොත් වැඩිපුර බිත්තර අනූවක් ගන්න පුළුවන්. කිකිළියො දහයක් විතර ඉන්න පොඩි ගොවිපොළකින් අවුරුද්දකට බිත්තර නවසීයක් ගන්න පුළුවන්. එතකොට කිකිළියො දාහක් විතර ඉන්න ලොකු ගොවිපොළක් ගැන බැලුවොත් බිත්තර අනූදාහක් ගන්න පුළුවන්. ටිකක් හිතන්න! බිත්තර අනූදාහක්!"

අපි හුඟක් වෙලා කතා කර කර හිටියෙ ඉන්කියුබේටරයෙ ප්‍රයෝජනවත්කම ගැන.

ඊළඟට මීෂ්ක කිව්වා : "මම කියන්නම් වැඩක්. අපිත් අපේම කියල පුංචි ඉන්කියුබේටරයක් හදලා, බිත්තර දෙක තුනක් රක්කවමු."

"කොහොමද අපි ඒක කරන්නෙ?" මම ඇහුවා. "ඔට්ටුයි, ඒක හදන්න ලේසි දෙයක් නම් නෙවෙයි."

"මම නම් හිතන්නෙ නෑ ඒක අමාරුයි කියල," මීෂ්ක කිව්වා. "පොතේ ඔය හැම දේම තියනවා. ප්‍රධානම දේ තමයි, බිත්තර ටික දවස් විසි එකක් යනකල් උණුහුමට තියන එක. එතකොට පැටව් ටික තනියම එළියට එයි."

ඉතින්, අපටම කියල කුකුළු පැටව් ඇතිකරන අදහසට මම හුඟක්ම කැමති වුණා. මම හැම ජාතියෙම කුරුල්ලන්ටයි සත්තුන්ටයි හරි ආදරෙයි. මීෂ්කයි මමයි පහුගිය සරත් කාලෙදි ඉස්කෝලෙ තරුණ පරිසරවේදීන්ගෙ සංගමයට බැඳිලා, අපේ හුරතල් සත්තුත් එක්ක ටිකක් වැඩ කළා. එත් ඉන් පස්සෙ මීෂ්කට වාෂ්ප එන්ජිමක් හදන අදහස ආවම, අපි ඒකට යන එක නැවැත්තුවා. වීත්ය ස්මිර්නොව්- සංගමයෙ නායකයා, අපට කිව්ව

සාමාජිකයන්ගෙ ලැයිස්තුවෙන් අපේ නම් කපල දානව කියලා, අපි වැඩ නොකළොත්. එත් අපි එයාට බැගෑපත් වුණා, අපට තව අවස්ථාවක් දෙන්න කියලා.

මීෂ්ක හිතින් මවාගන්න හැදුවා, කුකුළු පැටව් ඉපදුණාම කොච්චර අපූරුවට තියේවිද කියලා.

"උන් හරි හුරතල් එවුන් වෙයි," එයා කිව්වා. "අපිට කූඩ්සියේ මුල්ලක් උන්ට වෙන්කරලා, උන්ට කන්න දීලා බලාගන්න පුළුවන්."

"ඔව්, ඒත් අපට කරන්න වැඩ ගොඩක් තියෙනවා. අමතක කරන්න එපා ඒකට සති තුනක් යන බව!" මම කිව්වා.

"ඒක මොකක්ද? අපට තියෙන්නෙ ඉන්කියුබේටරේ හදන්න විතරයි. පැටව් එන්නෙ තනියම."

මම ටිකක් ඒ ගැන හිතල බැලුවා. මීෂ්ක මගෙ දිහා නොඉවසිල්ලෙන් බලා හිටියා. එයා වැඩට බහිනකම් ඉවසිලි නැතිවයි ඉන්නෙ කියල මට තේරුණා.

"හරි එහෙනම්," මම කිව්වා. "අපට වෙන කරන්න දෙයකුත් නැහැනෙ. අපි දැන්ම වැඩට බහිමු."

"මං දැනගෙන හිටියා ඔයා කැමති වෙයි කියලා!" මීෂ්ක සතුටින් කෑගැහුවා. "මට තනියම වුණත් හදන්න පුළුවන්, ඒත් එතකොට ඔයත් එක්ක කරනවයින් බාගයකවත් විනෝදයක් නෑ."

අනපේක්ෂිත බාධාව

"එක්කො අපි ඉන්කියුබේටර් එකක් හදන්න ඕනත් නෑ. නිකම් බිත්තර ටික සාස්පානක දාල, උඳුනෙන් තියමු." මම යෝජනා කළා.

"හපොයි ඒක නම් හරියන වැඩක් නෙවෙයි," මීෂ්ක කෑගැහුවා. "ගින්න නිවිල බිත්තර නරක් වෙන්න පුළුවන්. ඉන්කියුබේටරේක ප්‍රධානම දේ තමයි, උෂ්ණත්වය තියෙන්න ඕන හැමදාම අංශක 102 ට."

"ඇයි 102ක්?"

"මොකද ඒක තමයි බිත්තර රකින කිකිළියක්, බිත්තර උඩ ඉන්නකොට උගේ උෂ්ණත්වය."

"ඔයා කියන්න හදන්නෙ කිකිළියන්ටත් ශරීර උෂ්ණත්වයක් තියෙනව කියලද? මම හිතුවෙ උෂ්ණත්වයක් තියෙන්නෙ මිනිස්සුන්ට විතරයි කියලා, එයාල ලෙඩ වුණාම"

"හැමෝටම ශරීර උෂ්ණත්වයක් තියෙනව මැට්ටො, එයාල ලෙඩ වුණත් නැතත්. ලෙඩ වුණාම ඒක වැඩිවෙනව විතරයි."

මීෂ්ක පොත ඇරලා, ඒකෙ පින්තූරෙකට අත දික් කළා.

"බලන්න, ඉන්කියුබේටරේ මෙන්න මේ වගේ. මේ වතුර දාන්න ටැංකියක්. එතකොට මේ පොඩි බටේ ටැංකියෙ ඉඳල බිත්තර තියෙන පෙට්ටියට යනවා. ටැංකිය යටින් රත් කරනවා. උණු වතුර බටේ දිගේ ගිහින් බිත්තර උණුසුම් කරනවා. බලන්න, මෙතන උෂ්ණත්වමානෙකුත් තියෙනවා. ඒකෙන් උෂ්ණත්වය දැනගන්න පුළුවන්. "

"අපි කොහෙන්ද ටැංකියක් ගන්නෙ?"

"අපට ටැංකියක් ඕන නෑ. අපට හිස් ටින් එකක් තිබුණාම ඇති. අපි පුංචිම පුංචි ඉන්කියුබේටරයක්නෙ හදන්න යන්නෙ."

"අපි කොහොමද ඒක රත් කරන්නෙ?" මම ඇහුවා.

"පැරෆින් ලාම්පුවකින්. පරණ එකක් මඩුවෙ කොතැන හරි ඇති."

අපි මඩුවට ගිහින් මුල්ලක තිබ්බ්ච අබලි ගොඩ අවුස්සන්න ගත්තා. එතන පරණ බූට් සපත්තු, කැඩිච්ච කුඩයක්, හොඳ තඹ බටයක්, තව පරණ බෝතලුයි ටිනුයි ගොඩාක් තිබුණා. අපි මුළු අබලි ගොඩම ඇවිස්සුවට පස්සෙ තමයි මම හිටි හැටියෙම දැක්කෙ, ලාම්පුව රාක්කයක් උඩ තියෙනවා. මීෂ්ක උඩට නැගල, ඒක පහළට ගත්තා. ඒක දූවිල්ලෙන් වැහිලයි තිබුණෙ. එත් සම්පූර්ණ වීදුරුවම තිබුණ විතරක් නෙවෙයි, අපේ වාසනාවට ඒකෙ පහන් තිරයක් පවා තිබුණා. අපි ලාම්පුවයි, තඹ බටයයි, ගැළපෙන තරමෙ ටින් එකකුයි අරගෙන, ඒ ඔක්කොම කුස්සියට අරන් ගියා.

ඉස්සෙල්ලම මීෂ්ක ලාම්පුව පිරිසිදු කරලා, ඒක පැරෆින් වලින් පුරවලා, පත්තු කළා, ඒක වැඩකරන විදිය බලන්න. ඒක හොඳට වැඩ කළා. අනික

ඒකෙ තිරේ උස් පහත් කරල දල්ල අඩු වැඩි කරන්නත් පුළුවන්. අපි ලාම්පුව නිවලා වැඩට බැස්සා. ඉස්සරවෙලාම බිත්තර පහළොවකට ඉඩ තියෙන ලොකු පෙට්ටියක් හැදුවා, තුනී ලෑලිවලින්. අපි පෙට්ටිය පතුළට කපු පුළුන් දාල, බිත්තර හොඳට උණුසුම් වෙන්න ඊට උඩින් ෆෙල්ට් රෙදි දැම්මා. ඊළඟට අපි පෙට්ටියෙ පියන හදලා, ඒකෙ විවරයක් හැදුවා උෂ්ණත්වමානෙට, අපට උෂ්ණත්වෙ දැනගන්න පුළුවන් වෙන්න. ඊළඟ වැඩේ තමයි හීටරයක් හදන එක. අපි ටින් එක අරගෙන ඒකෙ රවුම් හිල් දෙකක් විද්දා, එකක් උඩිනුයි එකක් යටිනුයි. ඊළඟට පයිප්පෙ උඩ හිලට දාලා, ඉන්කියුබේටරේ පැත්තකින් හිලක් හදලා ටියුබ් එක ඇතුළට දැම්මා. ඊළඟට ඒක යට හිලෙන් එළියට එන විදියට නැව්වා. ඒ නැව්ව්ච පයිප්පෙ පෙට්ටිය ඇතුළෙදි එක්තරා විධියක රේඩියේටරයක් වුණා.

දැන් ටින් එක රත්කරන්න ලාම්පුව තියෙන්න ඕන. මීෂ්ක ලෑලි පෙට්ටියක් ගෙනාවා. අපි ඒක කෙළින් කරලා මුදුනෙන් හිලක් කපලා, ඒක උඩින් ඉන්කියුබේටරේ තිව්වා, ටින් එක ඒකෙ මුදුනට එන විදිහට. ලාම්පුව ගියා පහළට.

අන්තිමේදි හැමදේම ලෑස්ති වුණා. අපි ටින් එකට වතුර පුරවල ලාම්පුව පත්තු කළා. ටින් එකේ වතුර රත්වෙන්න ගත්තා. වැඩිවෙලාවක් යන්න කලින් උෂ්ණත්වමානෙ රසදියර අංශක 102ට ළං වුණා. ඒක තවත් වැඩි වෙන්න තිබුණා, මීෂකගෙ අම්ම එතනට කඩාවැදුණෙ නැත්නම්.

"මොකක්ද ඒපාර දෙන්නත් එක්ක නටන නාඩගම? මුළු පළාතම පැරෆින් ගඳයි."

"ඒ ඉන්කියුබේටරේ!"

"මොන ඉන්කියුබේටරයක්ද?"

"ඔයා දන්නවනේ, අර කුකුළු පැටව් රක්කවන එක."

"කුකුල්ලු? මොනවද ඔයා මේ කියවන්නෙ?"

"බලන්න, අම්මෙ, මම ඔයාට ඒක කරන විදිහ පෙන්වන්නම්. අපි බිත්තර මෙතනිනුයි, ලාම්පුව මෙතනිනුයි තියෙනව."

"මොකටද ලාම්පුවක්?"


1.
5.
4.
2.
6.
3.
1 2 3 4 5 6 7 8 9 10 11 12 13 14 15 16 17 18 19 20 21 !
1.
2.
3.

"ඒක තියෙන්නෙ රත් කරන්න. ලාම්පුවක් තියෙන්නම ඕන. නැත්නම් ඒක වැඩකරන්නෙ නැහැ."

"විකාර, මම ඔයාලට පැරෆින් ලාම්පු එක්ක සෙල්ලම් කරන්න දෙන්නෙ නෑ. ඔයාල ඒක වැට්ටුවොත් පැරෆින් ගිනි ගනීවි. නෑ නෑ, මට ඒක තියාගන්න දෙන්න බෑ!"

"අනේ අම්මා, අපි පරිස්සම් වෙන්නම්."

"නැහැ. මම ඔයාලට පත්තුකරපු ලාම්පු එක්ක සෙල්ලම් කරන්න දෙන්නෙ නෑ. ඊළඟට මොකක්ද! ඉස්සෙල්ල ඔයාල ඇඟපත පුච්චගන්නා. දූන් හදනවා ගෙදරත් ගිනි තියන්න!"

මීෂ්ක අම්මට කන්නලව් කළා කළා. ඒත් පලක් වුණේ නෑ. මීෂ්ක හොඳටම දුක් වුණා. "මදෑ කොළා! එයා කිව්වා.

අපේ අලුත් උපක්‍රමය

එදා රෑ මට ගොඩක් වෙලා යනකල් නින්ද ගියේ නෑ. මම අපේ ඉන්කියුබේටරේ ගැන පැයක් පුරාවටම හිත හිතා හිටියා. ඉස්සෙල්ලම මම හිතුවෙ අපේ අම්මගෙන් පැරෆින් ලාම්පුව පාවිච්චි කරන්න අවසර ගන්න. ඒත් ටිකකින් මට තේරුණා, එයා ගින්දරට තියෙන බයට ගිනිකූරුත් මගෙන් හංගන එකේ, ඒකෙන් පලක් නැති බව. ඇරත් මීෂ්කගෙ අම්ම ලාම්පුව අපෙන් අරගත්ත එයාත්, ආයෙ කීයටවත් දෙන්නෙ නැති වෙයි. ගෙදර හැමෝම් සැප නින්දෙ. ඒත් මම ඇහැරලා මගෙ මොළේ මහන්සි කර කර හිටියා. ඔන්න හිටි හැටියෙම අපූරු අදහසක් මගෙ ඔළුවට ආවා: ඇයි විදුලි ලාම්පුවකින් වතුර උණුකරන්න බැරි?

මම සද්ද නැතිව ඇඳෙන් නැගිටල මේස ලාම්පුව පත්තුකරල මගෙ ඇඟිල්ල තියල බැලුවා, ඒක රත් වෙනවද කියල. ඒක ඉක්මනින්ම ඇඟිල්ල තියන්න බැරි තරමටම රත් වුණා. මම බිත්තියෙ එල්ලල තිබුණු උෂ්ණත්වමානෙ අරගෙන, ඒක ලාම්පුවෙ ගෑව්ව. රසදිය ඉහළටම නැග්ග. ඒකෙ ආයෙ දෙකක් නෑ, විදුලි ලාම්පුවෙන් ලොකු රස්නයක් දෙනවා. ටිකක් සැනසිල්ලෙන්, උෂ්ණත්වමානය ආපහු බිත්තියේ එල්ලල, මම ආයෙත්

ඇඳට ගියා. ඒත් අර උෂ්ණත්වමානය, ඒ රැයින් පස්සෙ ආපහු කවදාවත් හරියට වැඩ කළේ නෑ. අපි පස්සෙ තමයි ඒක දැනගත්තෙ. කාමරේ හුගක්ම සීතල වෙලාවටත් අංශක 104ක් පෙන්නනව. එතකොට තව ටිකක් රස්නෙ වුණාම, ඒක මුදුනටම නැගල, හොලවනකල් එහෙමම තියෙනව. ඒක ඉන් පස්සෙ කවදාවත් අංශක 86ට අඩුවෙන් පෙන්නුවෙ නෑ. ඉතින් ඒකෙ විදියට නම්, අපට සීත කාලෙදී වත් උඳුන පත්තුකරන්න ඕනෙ නෑ. මම ඒක ලාම්පුවෙ ගාවලා මොනව හරි නරක් කළා වෙන්න ඕන.

ඊළඟ දවසෙ මම මීෂ්කට මගෙ අදහස ගැන කිව්වා. අපි තීරණය කළා කෙළින්ම ඒක අත්හදා බලන්න.

අපි ඉස්කෝලෙ ඇදලා ගෙදර ආවම මම, කාලයක් තිස්සෙ අල්මාරියෙ තිබුණ පරණ මේස ලාම්පුවක් අම්මගෙන් ඉල්ලගත්තා. ඊට පස්සෙ අපි ඒක පෙට්ටියෙ පැරෆින් ලාම්පුව තිබුණ තැනින් තිව්වා. මීෂ්ක ලාම්පුවට යටින් පොත් ටිකක් තිව්වා බල්බ් එක තව ටිකක් ටැංකියට ළං වෙන විදියට. ඊළඟට මම ඒකෙ ස්විච් එක දැම්මා. ඉන් පස්සෙ මීෂක ගෙදරින් ගෙනා උෂ්ණත්වමානෙ දිහා බලන් ඉන්න ගත්තා.

හුඟ වෙලාවක් යනකල් කිසිම දෙයක් වුණේ නෑ. රසදියර මට්ටම එතනම තිබුණා. අපි බය වුණා, අපේ පරීක්ෂණේ සාර්ථක නැති වෙයිද කියලා. ඒත් ටිකෙන් ටික වතුර රත් වෙලා රසදියර මට්ටම ඉහළ නගින්න ගත්තා. පැය බාගෙකින් ඒක අංශක 102කට නැගල තිබුණා. මීෂ්ක සතුටින් අත්පුඩි ගහගහ කෑගැහුවා. "හුරේ, ඔය තමයි කුකුළ් පැටවුන්ට ඕන කරන උෂ්ණත්වය. බලාගෙන යනකොට විදුලි බලයත් පැරෆින් තරමටම හොඳයි."

"ඔව්, ඇත්තටම," මම කිව්වා. "එක අතකින් ඊටත් වඩා හොඳයි. මොකද පැරෆින් ගිනිගන්න පුළුවන්. ඒත් විදුලිබලය ඊට වඩා පරිස්සම්."

එතකොටම අපි දැක්කා රසදිය මට්ටම තවත් නැගලා, අංශක 104 ළඟට ගිහින් තියෙන බව.

"ඒයි," මීෂ්ක කෑගැහුවා. "බලනව අර දිහා. ඒක තවත් නැගලා."

"අපි කොහොමහරි ඒක නවත්තගන්න ඕන," මම කිව්වා.

"ඔව්, ඒත් කොහොමද? පැරෆින් ලාම්පුවක් වුණා නම්, තිරේ පහත් කරන්න තිබුණා."

"විදුලියට තිර ඇත්තෙ නැහැ."

"මට ඔයාගෙ විදුලිබලෙන් ඇති වැඩක් නැහැ!" මීෂ්ක තරහෙන් කිව්වා.

මටත් නැග්ගා. "මගේ විදුලිබලය? කොහොමද ඒක 'මගේ' වෙන්නෙ?"

"ඉතින්, විදුලි ලාම්පුවක් පාවිච්චි කරන එක ඔයාගෙ අදහසක් නෙවෙයිද? බලනවා, දැන් ඒක 108ටම නැගලා! මේක මෙහෙම ගියොත් බිත්තර තැම්බිලා එක කුකුළු පැටියෙක් වත් ඉතුරු වෙන එකක් නෑ."

මිනිත්තුවක් ඉන්න," මම කිව්වා. "ලාම්පුව පහත් කරලා බලමු. එතකොට ඒක ඔච්චර ඉක්මනට රත් වෙන්නෙ නැතුව, රස්නෙ බහීවි."

අපි මහතම පොත ලාම්පුව යටින් අයින් කරලා, බලා හිටිය මොනව වෙයිද කියලා. රසදිය 102ට ළං වෙනකල් හෙමිහිට පහත බැස්සා. අපි සැනසුම් සුසුම් හෙළුවා.

"දැන් ඔක්කොම හරි," මීෂ්ක කිව්වා. "අපට දැම්මම බිත්තර රැකිල්ල පටන්ගන්න පුළුවන්. මම අම්මගෙන් සල්ලි කීයක් හරි ඉල්ලගන්නම්. ඔයත් ගිහින් ඔයාගෙ අම්මගෙන් සල්ලි ටිකක් ඉල්ලගන්න. ඉන් පස්සෙ අපි ඒවයෙන් බිත්තර දුසිමක් ගනිමු."

මම ගෙදරට දුවල ගිහින් අම්මගෙන් සල්ලි ඉල්ලුව බිත්තර ගන්න. අම්මට තේරුණේ නැහැ, මට මොන එහෙකටද බිත්තර ඕන වෙලා තියෙන්නෙ කියලා. අපේ ඉන්කියුබේටරේට ඒව ඕන වෙන බව එයාට, විස්තර කරන්නත් ටික වෙලාවක් ගියා.

"මොකෙක්වත් ඒකෙන් එන එකක් නෑ," අම්ම කිව්වා. "කිකිළියෙක් නැතිව බිත්තර රකින එක ලේසි වැඩක් නෙවෙයි, ඔයාලගෙ කාලෙ නාස්ති වෙන එක විතරයි ඒකෙන් වෙන්නෙ."

ඒත් මම එයා එකඟ වෙනකල්ම කරදර කළා.

"හරි," එයා අන්තිමේදි කිව්වා. "ඒත් කොහෙන්ද ඔයාල බිත්තර ගන්නෙ?"

"කඩෙන් තමයි," මම කිව්වා. "නැතිව වෙන කොහෙන්ද?"

"නෑ නෑ, ඒක හරියන්නෙ නෑ," අම්ම කිව්වා. "ඒ වැඩේට අලුත දාපු බිත්තර ඕන, නැත්නම් පැටව් හදන්න බෑ."

මම මීෂ්ක ළඟට දුවගෙන ගිහින් එයාට කාරණේ කිව්වා.

"මං වගේ බූරුවෙක්," මීෂ්ක කිව්වා. "ඇත්ත තේන්නම්, එහෙම තමයි පොතෙත් තියෙන්නෙ. මට අමතක වුණා."

අපි තීරණය කළා, නගරෙට කිට්ටුව තියෙන, අපි පහුගිය ගිම්හානෙ ගතකරපු ගමට යන්න. නතාෂ නැන්දා, -ගෙවල් අයිතිකාරි- කිකිළියො ඇති කරන නිසා අපිට එහෙන් අලුත් බිත්තර ගන්න පුළුවන් බව සහතිකයි.

ඊළඟ දවස

ජීවිතේ හරි පුදුමයි! අපි කොහේවත් යන්න හිතලවත් තිබුණෙ නෑ. ඒත් දැන් අපි නතාෂ නැන්දලාගෙ ගම පැත්තට යන කෝච්චියෙ. අපට ඉක්මනට බිත්තර ඕන වුණා, ඒව රකින්න පටන්ගන්න. ඒත් මේ කෙහෙල්මල් කෝච්චිය ඕනෑ කමින්ම ගාටන්න ගත්තා. ඉතින් ගමනට හුඟ වෙලාවක් ගතවුණා. ඕක ඔහොමමයි, මට දැනිල තියෙනවා හදිසි වෙලාවට හැම දෙයක්ම වෙන්නෙ හෙමින්. ඇරත්, මීෂ්කයි මමයි බය වුණා නතාෂ නැන්දා අපි එනකොට ගෙදර නොඉඳීද කියල. එහෙම වුණොත් අපි මොකද කරන්නෙ?

ඒත් හැම දේම හරිගියා. නතාෂ නැන්දා ගෙදර හිටියා. එයා අපිව දැකල සතුටු වුණා. එයා හිතුවෙ, අපි ආවෙ එයා එක්ක නවතින්න කියලා.

"අපි කැමතියි, ඒත් අපට බැහැ," මීෂ්ක කිව්වා. "නිවාඩුවට කලින් බැහැ."

"අපි ආවෙ වැඩකට," මම කිව්වා. "අපට බිත්තර ටිකක් ඕන."

"මොකක්ද ප්‍රශ්නෙ? ටවුම පැත්තෙ බිත්තර නැද්ද?" නතාෂ නැන්දා ඇහුවා.

"නෑ, තියෙනව," මීෂ්ක කිව්වා. "ඒත්, ඔයා දන්නවද, අපට ඕන අලුත් බිත්තර."

"ඉතින් ඔයාලට අලුත් බිත්තර ගන්න බැරිද කඩවලින්?"

"කිකිළියො බිත්තර දැම්මම, ඒව කෙළින්ම කඩවලට යන්නෙ නැහැනෙ, නේද?"

"ඇත්ත, දාපු ගමන්ම නෙවෙයි."

"ඔය, මම කිව්වෙ," මීෂ්ක කෑගැහුවා. "බිත්තර එකතු කරනව ඒව ගොඩක් වෙනකල්. එතකොට සතියක්, නැත්නම් දෙකක් යාවි."

"ඉතින්, මොකද?" නතාෂ නැන්දා ඇහුවා. "බිත්තර සති දෙකෙන් නරක් වෙන්නෙ නෑ."

"ආ, නරක් වෙන්නෙ නැද්ද? අපේ පොතේ තියෙනව, දවස් දහයකට වඩා පරණ බිත්තර වලින් පැටව් හැදෙන්නෙ නෑ කියල."

"ආ.. පැටව්! ඒක වෙනම කතාවක්," නතාෂ නැන්දා කිව්වා. ඇත්තටම ඒකට නම් අලුත්ම බිත්තර ඕන. ඒත් කෑමට ගන්න බිත්තර මාසයක් දෙකක් වුණත් නරක් නොවී තියන්න පුළුවන්. ඔයාල කුකුළු පැටව් හදන්න යනවා නෙවෙයිනෙ?"

"ඔව්. ඒකයි අපි මෙහේ ආවෙ." මම කිව්වා.

"ඒත් කොහොමද ඔයාල ඒක කරන්නෙ?" නතාෂ නැන්දා ඇහුවා. "ඔයාලට ඒකට කිකිළියක් ඕන කරනවා."

"නෑ, අපි කරන්නෙ කිකිළියක් නැතිව. අපි හැදුව ඉන්කියුබේටරයක්."

"ඉන්කියුබේටරයක්? දෙයියෝ සාක්කි! ඔයාල මොනවද ඉන්කියුබේටරයක් එක්ක කරන්නෙ කියල මම කැමතියි දැනගන්න."

"අපිට පුංචි කුකුළු පැටව් ඕන."

"මොකටද?"

"නිකම්, විනෝදෙට," මීෂ්ක කිව්වා. "කුකුළු පැටව් නැතුව පාළුයි. ඔයාල වගේ ගමේ අයට හැම දේම තියෙනව. කුකුළො, පාත්තයො, ඌරො, හරක්... ඒත් අපට මොකෙක්වත් නෑ."

"ඔව්, ඒත් අපි ඉන්නෙ ගමේනෙ. ඔයාලට නගරෙ හරක් හදන්න බැහැනෙ."

"හරක් බැරිව ඇති සමහර විට. ඒත් මොකෙක් හරි සතෙක් ඇතිකරන්න පුළුවන් ඇතිනෙ."

"නගරෙ බෑ, හරි කරදරයි." නතාෂ නැන්දා කිව්වා.

"අපෙ ෆ්ලැට් එකේ ඉන්නව කුරුල්ලො ඇතිකරන මනුස්සයෙක්," මීෂ්ක කිව්වා. "එයා ළඟ කුඩු ගොඩක් තියෙනවා, කුරුල්ලො ඉන්න. සිස්කින්ල, කැනරියො,* ගෝල්ඩ්ෆින්ච්ස්ල,** වෙන එකක් තියා ස්ටාර්ලිංස්ලත්"***

"ඔව්, ඒත් එයා උන්ව ඇතිකරන්නෙ කූඩු කරලනෙ. ඔයාල කුකුළු පැටව් හදන්නෙ කූඩු කරල නෙවෙයිනෙ, නේද?"

"නෑ. අපි උන්ව කුස්සියෙ තියාගන්නම්. අපි උන්ට අපූරු තැනක් හදල දෙන්නම්, ඔයා බයවෙන්න එපා. ඔයාට හම්බවෙන හොඳම බිත්තර ටික අපට දෙන්න. අලුත්ම අලුත් ඒව, නැත්නම් වැඩක් වෙන්නෙ නෑ."

"හරි හරි, ඔයාලට ඒව ලැබෙයි," නතාෂ නැන්දා කිව්වා. "මම දන්නව ඔයාලට ඕන ජාතිය. ඒව අලුත් කියන්නෙ, අලුත්ම අලුත්."

නතාෂ නැන්දා කුස්සියට ගිහින් ආපහු ආවෙ ලස්සන බිත්තර පහළොවක් එක්ක. හැම එකක්ම සිනිඳු, සුදු, එක තිතක්වත් නැති ඒව. ඕන කෙනෙකුට කියන්න පුළුවන් ඒව අලුත්ම අලුත් බව! එයා ඒව අපෙ කූඩෙට දාල වූල් සාලුවකින් ඒක වැහුව ඒව මගදි සීතල නොවෙන්න.

"එහෙනම්, සුබ ගමන් ඔයාලට. ඒ වගේම වාසනාවන්!" නතාෂ නැන්දා අපිව ගේට්ටුව ළඟට ඇරලවන ගමන් කිව්වා. එතකොට කළුවර වැටෙන්න පටන්අරන්. ඉතින් මීෂ්කයි මමයි ඉක්මන් කරල ස්ටේසමට ගියා.

අපි ගෙදරට යනකොට හුඟක් පරක්කු වෙලා. ඉතින් මගේ අම්ම මට හොඳවයින් එකක් කිව්වා. මීෂ්කත් එයාගෙ අම්මගෙන් අහගෙන තිබුණා. ඒත් අපි ඕව හිතට ගත්තෙ නෑ! අපි හිතුවෙ එදා රෑ පරක්කු වැඩි නිසා, බිත්තර රකින වැඩේ පස්සෙන්දට කල් දාන්න වෙච්ච එක ගැන.

---

* කහ පැහැති, ගී ගයන කුරුලු විශේෂයක්
** ෆින්ච් පවුලට අයත් කුරුලු විශේෂයක්
*** ඇමරිකාවේ වෙසෙන කුරුලු විශේෂයක්

ආරම්භය

ඊළඟ දවසෙ අපි ඉස්කෝලෙ ඇරිල ගෙදර ආ හැටියෙම, බිත්තර ටික ඉන්කියුබේටරෙන් තිව්වා. ඒකෙ ඇති වෙන්න ඉඩ තිබුණා. ටිකක් වැඩිපුරත් එක්ක.

අපි ඉන්කියුබේටරේ පියන වහලා, සිදුරට උෂ්ණත්වමානය දාලා, ලාම්පුව දාන්න හදනකොටම තමයි මීෂ්ක කිව්වෙ:

"අපි ඉස්සෙල්ලම ඔක්කොම හරියට කළා කියල සහතික කරගෙන ඉඳිමු. සමහර විට අපි ඉස්සෙල්ල ඉන්කියුබේටරේ රත් කරලා, පස්සෙ බිත්තර තියන්න ඕන ඇති?"

"අනේ මන්දා," මම කිව්වා. "අපි පොතේ තියෙන්නෙ කොහොමද කියල බලමු."

මීෂ්ක පොත එළියට අරන් කියවන්න ගත්තා. එයා හුඟ වෙලාවක් තිස්සෙ කියෙව්වා. ඊළඟට එයා කිව්වා:

"ඔයා දන්නවද, අපි තව පොඩ්ඩෙන් උන්ගෙ හුස්ම හිර කරනවා."

"කාගෙ හුස්ම හිර කරන්නද?"

"බිත්තරවල. ඒක ඔප්පු කරල තියෙනවා, ඒවට පණ තියෙනවා කියල."

"පණ?" මම පුදුමෙන් ඇහුවා.

"ඔව්, මේ බලන්න පොතේ තියෙන දේ: ඇසට පෙනෙන ජීවයක් නොමැති වුවද බිත්තර ජීවමාන වේ. එය තවමත් සැඟැවී ඇත. එනමුත් බිජුව උණුසුම් වූ විට, ජීවය පිබිදී කලලය ටිකෙන් ටික වැඩී අවසානයේ කුරුලු පැටවා බිහි වේ. සෑම ජීවියෙකු මෙන්ම බිජු ද ආශ්වාස-ප්‍රශ්වාස කරයි... දැක්කද? බිත්තරත් ඔයයි මායි වගේම හුස්ම ගන්නවා."

"පච," මම කිව්වා. "ඔයයි මායි හුස්ම ගන්නෙ අපේ කටවල් වලින්, ඒත් බිත්තර හුස්ම ගන්නෙ මොනවායින්ද?"

"අපි හුස්ම ගන්නෙ අපේ කටින් නෙවෙයි පෙණහලුවලින්. වාතය කටින් පෙණහලුවලට යනවා. ඒත් බිත්තර හුස්ම ගන්නෙ එයාලගෙ කටුවෙන්. කටුව හරහා වාතය යනවා, එහෙමයි එයාල හුස්ම ගන්නෙ."

"ඉතින් උන් ඕන තරමක් හුස්ම ගත්තුවාවෙ," මම කිව්වා. "මොකෝ අපි උන්ව නවත්තනවයැ?"

"ඒත් කොහොමද උන් පෙට්ටියක් ඇතුළෙ ඉඳගෙන හුස්ම ගන්නෙ? ඕනැම කෙනෙක් හුස්ම ගන්නකොට කාබන්ඩයොක්සයිඩ් පිට කරනවා. ඔයාව පෙට්ටියකට දාල වැහුවොත් ඔයා පිටකරන කාබන් ඩයොක්සයිඩ් වැඩි වෙලා, ටිකකින් හුස්ම හිරවෙනවා."

"මම මොකටද පෙට්ටියක හිර වෙන්නෙ? මට හුස්ම හිර කරගන්න ඕන නෑ," මම කිව්වා.

"ඉතින් බිත්තරවලටත් එහෙමයි. ඒත් දැන් අපි උන්ව පෙට්ටියකට දාලා වහලා."

"අපි මොකක්ද ඒකට කරන්නෙ?"

"අපිට වාතනය ඕන වෙනවා," මීෂ්ක කිව්වා. "හැම ඉන්කියුබේටරයකම වාතය තියෙනවා."

අපි බිත්තර එකක්වත් කැඩෙන්න නොදී පෙට්ටියෙන් එළියට අරන්, ඒව කුඩෙට දැම්මා. ඊළඟට මීෂ්ක බුරුමයක් අරගෙන ඇවිත් ඉන්කියුබේටරේ තැනින් තැන හිල් දෙක තුනක් විද්දා, කාබන්ඩයොක්සයිඩ් පිට කරන්න. ඒ වැඩේ ඉවර වුණාම අපි බිත්තර ටික දාලා, පෙට්ටිය පියනෙන් වැහුවා.

"මිනිත්තුවක් ඉන්න," මීෂ්ක කිව්වා. "අපි තවම දන්නෙ නෑ මොකක්ද ඉස්සෙල්ල කරන්නෙ කියල - ඉන්කියුබේටරේ රත් කරනවද, බිත්තර ටික දානවද?"

එයා ආපහු පොත බැලුවා.

"අපි ආපහු වරද්දගෙන," එයා ටික වෙලාවකින් කිව්වා. "ඒකෙ කියනවා, ඉන්කියුබේටරේ ඇතුළෙ තියෙන වාතය තෙත් වෙන්න ඕන කියලා. මොකද වාතය වියළි වුණොත් බිත්තරේ ඇතුළෙ තියෙන දියරෙ කටුව හරහා වාෂ්ප වෙලා, කලලය මැරෙන්න පුළුවන්. ඒකට අපි ඉන්කියුබේටරේ ඇතුළෙන් වතුර භාජන තියන්න ඕන. වතුර වාෂ්ප වෙලා වාතයෙ තෙතමනය ඇති කරනවා."

ඉතින් අපි බිත්තර ඔක්කොම ආපහු එළියට ගත්තා. අපි වතුර වීදුරු දෙකක් ඇතුළට දාන්න හැදුවා, ඒත් ඒව උස වැඩියි. ඉතින් පියන හරියට

වැහුණෙ නෑ. අපි ඊට වඩා පොඩි දෙයක් හෙවවත් කිසිම දෙයක් හම්බවුණේ නෑ. එතකොට මීෂ්කට මතක් වුණා, එයාගෙ පුංචි නංගි මායාට තිබුණු ලී වලින් හදපු සෙල්ලම් භාජන කට්ටලේ.

"අපි මායාගෙ භාජන වලින් කිහිපයක් ගත්තොත් මොකද වෙන්නෙ?" එයා ඇහුවා.

"නියම අදහස!" මම කිව්වා. "ගිහින් ඒවා අරන් එන්න."

මීෂ්ක මායාගෙ භාජන ටික හොයාගෙන, පුංචි ලී කෝප්ප හතරක් ගත්තා. ඒව නියම ගාණට තිබුණා. අපි ඒවට වතුර පුරවලා ඉන්කියුබේටරේ ඇතුළෙන් තිව්වා, මුල්ලකට එකක් වෙන්න. ඒත් අපි බිත්තර ආපහු දානකොට ඉඩ තිබුණෙ දොළහකට විතරයි. තුනක් ඉතිරි වුණා.

"කමක් නෑ," මීෂ්ක කිව්වා. "කුකුළු පැටව් දොළහක් ඇති වෙයි. අපට තව අය මොකටද? අපිට උන් හැමෝටම දෙන්න කෑම ගොඩකුත් ඕන වෙයි."

එතකොටම මායා ඇවිත්, එයාගෙ කෝප්ප ටික ඉන්කියුබේටරේ ඇතුළෙ තියෙනවා දැකලා බෙරිහන් දුන්නා.

"අහන්න," මම කිව්වා. "අපි ඒව ගත්තෙ තියාගන්න නෙවෙයි. දවස් විසි එකකින් ඔයාට ආපහු ඒව ලැබේවි. ඔයාට ඕන නම්, අපි ඒ වෙනුවට ඔයාට බිත්තර තුනක් දෙන්නම්."

"මට මොනවටද බිත්තර? ඒව හිස් නෙ."

"නෑ. ඒව හිස් නෑ. ඒවයෙ කහමදයි, සුදුමදයි අනිත් හැම දේමත් තියෙනව."

"ඒත් ඒවයෙ පැටව් නැහැ!"

"පැටව් ආවම, අපි ඔයාටත් එක්කෙනෙක්ව දෙන්නම්."

"ඇත්තටම?"

"ඔව් ඔව්. ඒත් දැන් අපිට වද නොදී යන්න. අපි ප්‍රශ්න ගොඩක පැටලිලා ඉන්නෙ. ඉස්සෙල්ල ඉන්කියුබේටරේ රත් කරල බිත්තර ටික දානවද, නැත්නම් බිත්තර දාලා ඉන්කියුබේටරේ රත් කරනවාද කියල හිතාගන්න බැරුව."

මීෂ්ක ආපහු පොත කියවල හොයාගත්ත, අපට ඒ දෙකෙන් ඕනම විදිහකට ඒක කරන්න පුළුවන් කියලා.

"හරි," මම කිව්වා. "ස්විච් එක දාල වැඩේ පටන්ගනිමු."

"මට ටිකක් බයයි," මීෂ්ක කිව්වා. "මම කියන්නම් වැඩක්. ඔයා ස්විච් එක දාන එක හොඳයි. මම හරි අවාසනාවන්තයි."

"මොකක් නිසාද ඔයා එහෙම හිතුවෙ?"

"මම අවාසනාවන්තයි, ඒකයි. මම අතගහපු කිසිම දෙයක් හරිගිහිල්ල නෑ."

"මාත් එහෙමමයි." මම කිව්වා. "මගෙත් හැම තිස්සෙම කලදසාව නරකයි."

අපි දෙන්නම, අපට ජීවිතේ සිද්ධවෙච්ච හැම දේම මතක් කරගත්තා. ඒවයින් ඔප්පු වුණා අපි දෙන්නම- හොඳටෝම අවාසනාවන්තයි කියලා.

"අපෙන් එකෙක් වත්, මේ විදියෙ වැඩක් පටන්ගන්න එකේ පලක් නැහැ." මීෂ්ක කිව්ව. "මොකෙක්වත් ඒකෙන් එන එකක් නෑ."

"අපි මායාගෙන් අහමු." මම කිව්වා. මීෂ්ක එයාගෙ නංගිට කතා කළා.

"මේ අහන්න මායා," මම ඇහුවා. "ඔයා වාසනාවන්තද?"

"ඕ.. ඔව්."

"ඔයා ජීවිතේදි මොකක් හරි වරද්දගෙන තියෙනවද?"

"කොහොමටවත් නෑ."

"හොඳයි! දැන් ඔයාට පෙට්ටියේ තියෙන ලාම්පුව පේනවද?"

"ඔව්."

"එහෙනම් ප්ලග් එක ගහන්න."

මායා, ඉන්කියුබේටරේ ළඟට ගිහින් ප්ලග් එක ගැහුවා.

"තව මොනවද?" එයා ඇහුවා.

"මුකුත් නෑ," මීෂ්ක කිව්වා. "දැන් අපට කරදර නොකර යන දිහාවක යන්න."

මායා අඩියට දෙකට යන්න ගියා. අපි ඉක්මනට පියන වහලා උෂ්ණත්වමානය දිහා බලන් ඉන්න පටන්ගත්තා. මුලදී රසදිය අංශක 64 ළඟ නැවතිලා තිබුණා. ඒත් ටිකකින් හෙමිහිට අංශක 68ට ආවා. ඊළඟට ඊට වඩා ටිකක් හයියෙන් අංශක 77 ළඟට ඇවිත්, අංශක 86ට එනකොට වේගෙ අඩු වුණා. පැය බාගෙකින් අංශක 95 ළඟට ගිහින් නැවතුණා. මම තව පොතක් ලාම්පුව යටින් තිව්වාම, රසදිය ආපහු නගින්න ගත්තා. ඒක අංශක 102 ළඟට ගිහින් තවත් ඉහළට යන්න ගත්තා.

"නවතිනවා!" මීෂ්ක කෑගැහුවා. "බලන්න! ඒක අංශක 104ට නැගලා. මේ පොත මහත වැඩියි."

මම ඒ පොත එළියට ඇදලා, ඊට වඩා හීනි එකක් දැම්මා. රසදිය පහළ බැස්සා. ඒක 102ට බැහැලා, තවත් අඩුවෙන්න ගත්තා.

"ඒක හීනි වැඩියි," මීෂ්ක කිව්වා. "ඔහොම ඉන්න, මම අභ්‍යාස පොතක් ගේන්නම්."

එයා දුවල අභ්‍යාස පොතක් ගෙනත්, ඒක ලාම්පුව යටින් තිව්වා. රසදිය ආයෙමත් උඩට නගින්න අරන් අංශක 102ට නැගල නැවතුණා. අපි උෂ්ණත්වමානෙට ඇස් අලවගෙන හිටියා. රසදිය එහෙමම තිබුණා.

"ඒයි," මීෂ්ක කෙඳිරුවා. "අපට දවස් විසි එකක්ම උෂ්ණත්වය එක ගාණකට තියාගන්න වෙනවා. අපට පුළුවන් වෙයි කියල හිතනවද?"

"දෙයියන්පල්ල අපට පුළුවන්." මම කිව්වා.

"අපට බැරි වුණොත්, අපේ වැඩේ වතුරෙ ගියා වෙනවා."

"දෙයියන්පල්ල අපි ඒක කරනවමයි! කව්ද කියන්නෙ අපට බෑ කියලා."

අපි දවසෙම ඉන්කියුබේටරේ ළඟින් ඉඳගෙන හිටියා. අපි ගෙදර වැඩ කළේත් කුස්සියෙදී, හැම තිස්සෙම උෂ්ණත්වමානෙට ඇහැ ගහගෙන. ඒක අංශක 102 ළඟම තිබුණා.

"ඔක්කොම ගාණට යනවා," මීෂ්ක පුරසාරම්බාන්න ගත්තා. "අපි ඒක ගාණට තියාගත්තොත්, අපිට අපේ කුකුළ පැටව් දවස් විසි එකකින් ලැබේවි. ටිකක් හිතන්න, සිනිඳු කුකුළ පැටව් දොළොස් දෙනෙක්! එයාල නම් නියම ජොලි පවුලක් වෙයි."

උෂ්ණත්වය පහළ බසියි

මම දන්නෙ නෑ අනිත් කොල්ලො ගැන. ඒත් මම නම් ආසයි ඉරිදා දවස්වල දවල් වෙනකල් නිදියන්න. ඉරිදාට ඉස්කෝලෙටවත් වෙන කොහේටවත් දුවන්න වෙන්නෙ නෑ. සතියකට වතාවයි කොල්ලෙකුට ඇඳට වෙලා ඉන්න පුළුවන්. මම කියන්නෙ ඒකෙ කිසි වරදක් නෑ කියලා, කව්රුහරි මගෙන් ඇහුවොත්. ඊළඟ දවසත් ඉරිදාවක්. ඒත් මොකක් හරි හේතුවක් නිසා මම වේලපහින්ම ඇහැරුණා. තවම ඉර පායල තිබුණෙ නැහැ. ඒත් ඒ වෙනකොටත් එළිය වැටිලා.

මම ආපහු හැරිල නිදාගන්න හදනකොටම තමයි මට අපේ ඉන්කියුබේටරේ මතක් වුණේ. මම ඇඳෙන් පැනලා, ඉක්මනට ඇඳගෙන මීෂ්කගෙ ගෙදරට දිව්වා. මීෂ්කමයි දොර ඇරියෙ.

"ෂ්..!" එයා පිම්බා. "ඔයා හැමෝම ඇහැරවයි. මොකක්ද උදේ පාන්දරම ඇවිල්ලා, ගෙදර ගිනි අරන් වගේ සීනුව ගහන එකේ තේරුම!"

එයා හිටියෙ නිදන ඇඳුම පිටින්. එයාගෙ කකුල්වල සපත්තු තිබුණෙත් නැහැ.

"ඒත් ඔයත් ඇහැරලා, නේද?"

"ඇහැරලා!" මීෂ්ක ගෙරෙව්වා. "තවම ඇඳට ගියෙත් නැහැ."

"ඇයි ඒ?"

"ඔක්කොම අර හොල්මන් ඉන්කියුබේටරේ හින්දා."

"මොනවහරි වුණාද?"

"පහත වැටෙන්න ගත්තා."

"ඒත් ඇයි ඒක පහත වැටෙන්නෙ? ඊයෙ නියමෙට ඝනකමට තිබුණෙ."

"ඉන්කියුබේටරේ නෙවෙයි මැට්ටො! මම කිව්වෙ උෂ්ණත්වය."

"ඒක අඩු වෙන්නෙ ඇයි?"

"මටත් ඒකම තමයි ප්‍රශ්නෙ. මම ඇඳට යන වෙලාවෙ හැම දේම හරි. ඒත් මට අපේ කුකුළු පැටව් ගැන හිත හිතා හුග වෙලාවක් යනකල්ම නින්ද ගියේ නෑ. ටිකකින් මම නැගිට්ටා, ඉන්කියුබේටරේ තත්ත්වෙ කොහොමද කියලා බලන්න. මම කුස්සියට දිව්වා, ඔයා විශ්වාස කරන්න, රසදිය අංශක 101ට බැහැලා! මම තව පොත් දෙකක් ඒක යටින් තියලා අංශක 102ට නගිනකම් බලා හිටියා. මට නින්ද නොගිය එක නොවෙන්න, අපේ බිත්තර සේරම අපතෙ යන්න තිබුණා. මම ආපහු ඇඳට යනව වෙනුවට ටිකක් බලා හිටිය මොනව වෙයිද කියලා. පැයක් ගියා- දෙකක් ගියා, උෂ්ණත්වය වෙනස් වුණේ නෑ. මට නිකම් ඉඳලා කම්මැලි හිතුණා. ඉතින් මම පොතක් අරගෙන කියවන්න ගත්තා. පොතට හිත ගිය නිසා මට උෂ්ණත්වමානෙ ගැන අමතක වුණා. ඉතින් මම ආපහු ඒක දිහා බලනකොට අංශක 101යි. තවත් අංශක එකක් බැහැලා! මම තවත් අභ්‍යාස පොතක් ලාම්පුව යටින් තිව්වම, උෂ්ණත්වය ආයෙ හරිගියා. ඔයා බලන්න දැන් ඒක ගාණට තියෙනවා. ඒත් කාටවත් කියන්න බෑ පස්සෙ මක් වෙයිද කියලා."

"ඔයා දැන් ඇඳට ගියොත් හොඳයි," මම කිව්වා. "මම මෙහේ ඉඳල ටිකකට ඒක බලාගන්නම්."

"දැන් ඇඳට ගිහින් පලක් තියනවයැ!" එයා කිව්වා. "දැන් ඉරත් පායලා."

මීෂ්කා සද්ද නැතුව කාමරේට ගිහින්, ඇඳුම් අරන් ඇවිත් අඳින්න ගත්තා. එයා කලිසමයි කමිසෙයි ඇඳගෙන, සපත්තුවල ලේස් ගැටගහගෙන, කව්ච්චියෙ හාන්සිවෙලා නිදාගත්තා.

"මම එයා ඇහැරවන්නෙ නැහැ," මම හිතුවා. "මිනිහෙකුට නිදාගන්නත් වෙලාවක් තියෙන්න එපායැ."

මම ඉන්කියුබේටරේ ළඟින් වාඩි වෙලා, උෂ්ණත්වමානය දිහා බලාගෙන හිටියා. ටිකකින් මට නිකම ඉන්න කම්මැලි හිතුණා. ඉතින් මම පක්ෂි පාලනය ගැන තියෙන පොත අරගෙන, ඉන්කියුබේටර් ගැන තිබිච්ච ටික කියවන්න ගත්තා. ඒකෙ තිබුණා බිත්තර එකම විධියකට තිබුණොත් කලලය බිත්තර කටුවෙ ඇතුළු පැත්තට ඇලෙන්න ඉඩ තියෙනවා, එතකොට කුකුළු පැටව් අංගවිකල හරි හොඳටෝම දුර්වල එවුන් හරි වෙන්න ඉඩ තියෙනවාය කියලා. කලලය කටුවට ඇලීම නවත්වන්න නම් බිත්තර පැය තුනෙන්

තුනට හරවන්න ඕනලු. මම ඉන්කියුබේටරේ ඇරලා, බිත්තර හරවන්න ගත්තා. ඔන්න එතකොටම මීෂ්ක ඇහැරුණා. මම ඉන්කියුබේටරේ ඇරල තියෙනව දකලා එයා කෑගහගෙන උඩ පැන්නාඃ

"මොකක්ද මිනිහො තමුසෙ කරන්නෙ!"

මම තව පොඩ්ඩෙන් එක බිත්තරයක් වට්ටනවා, බයවෙච්ච තරමට.

"මුකුත් නෑ," මම කිව්වජ.

"මොකක්ද තමුසෙ නැහැයි කියන්නෙ? මොකටද ඉන්කියුබේටරේ ඇරියෙ? මම තමුසෙට කිව්වෙ නැද්ද දවස් විසි එකක් ඉන්න ඕන කියලා. මට පේන්නෙ තමුසෙ හිතන්නෙ දවසෙන් කුකුළු පැටව් හැදෙනව කියලා."

"මම එහෙම දෙයක් නම් හිතුවෙවත් නෑ," මම කිව්වා. මම එයාට පහදල දෙන්න හැදුවා, පැය තුනෙන් තුනට බිත්තර හරවන්න ඕන බව. ඒත් එයා ඒක අහන්නෙ නැතිව යටි ගිරියෙන් බෙරිහන් දෙන්න ගත්තාඃ

"වහනව පියන! ඒක වහන්නයි මම තමුසෙට කියන්නෙ! මිනිහෙකුට මිනිත්තුවක් ඇලවෙන්න බැහැ. මම යන්තම් ඇහැ පියාගත්ත විතරයි තමුසෙ ඇවිත් ඉන්කියුබේටරේ ඇරලා."

"මම ඒව දිහා බැලුව නම් නෙවෙයි," මම කිව්වා.

එයා දුවල ඇවිත් ඉන්කියුබේටරේ පියන වැහුවා. ඒත් ඒ වෙනකොට මම බිත්තර ඔක්කොම හරවලා ඉවරයි. මීෂ්කගෙ සද්දෙට එයාගෙ අම්මයි තාත්තයි දෙන්නත් දුවගෙන ආවා.

"මොකක්ද මේ කරච්චලේ තේරුම?" එයාල ඇහුවා.

"මේ බූරු තඩිය ඉන්කියුබේටරේ ඇරියා," මීෂ්ක කිව්වා.

මම විස්තර කළා, බිත්තර හරවන්න ඕන, නැත්නම් කුකුළු පැටව් අංගවිකල වෙයි කියලා.

"කව්ද කිව්වෙ?" මිෂ්ක ඇහුවා. "ඇයි එහෙනම් කිකිළියො අංගවිකල පැටව් හදන්නෙ නැත්තෙ?"

"කිකිළියො හැම තිස්සෙම එයාලගෙ බිත්තර හරවනවා, උන් ඒව රකිනකොට." මීෂ්කගෙ අම්ම කිව්වා.

"කොහොමද මෝඩ කිකිළියෙක් දන්නෙ බිත්තර හරවන්න ඕන කියලා?" මීෂ්ක ඇහුවා.

"එයාල ඔයා හිතන තරම් මෝඩ නෑ," එයාගෙ අම්ම උත්තර දුන්නා.

මීෂ්ක මොහොතක් කල්පනා කළා.

"දැනුයි මම ඒ ගැන හිතන්න ගත්තෙ. උන් බිත්තර හරවනවා මමත් මගේ ඇස් දෙකෙන්ම දැකල තියෙනවා," එයා අන්තිමේදි කිව්වා.

"මම හැම තිස්සෙම හිතල තියෙනවා, ඇයි උන් උන්ගෙ නහයවල් වලින් ඒව තල්ලුකරන්නෙ කියලා."

මීෂ්කගෙ තාත්ත හිනා වුණා. "මෝඩ කොලුවා," එයා කිව්වා. "ඔයා කවදද නහයක් තියෙන කිකිළියක් දැකල තියෙන්නෙ?"

"හොට, මට වැරදුණා. ඒත් ඒක කිකිළිගෙ නහයනෙ!"

උෂ්ණත්වය ඉහළ නගියි

දහයට විතර උෂ්ණත්වමානයේ රසදිය අංශකයක් ඉහළ නැග්ගා, මොකක් හරි හේතුවක් නිසා. ඉතින් අපට පොතක් අයින්කරල ලාම්පුව පහත් කරන්න සිද්දවුණා.

"මට නම් මේක හිතාගන්නත් බෑ," මීෂ්ක අන්දමන්ද වෙලා කිව්වා. "ඊ තිස්සෙම උෂ්ණත්වය අඩු වුණා. මෙන්න දැන් ඒක වැඩිවෙනවා, විකාරයි."

අපට, දවල් කෑමට කලින් ආපහු ලාම්පුව පහත් කරන්න සිද්දවුණා. ආපහු උෂ්ණත්වය වැඩි වුණ නිසා. දවල් කෑමෙන් පස්සෙ, මීෂ්ක සෝපාවෙ දිගාවෙලා ආපහු නින්දට වැටුණා. මට තනියම ඉන්න කම්මැලි හිතුණා. ඉතින් මම මගෙ චිත්‍ර පොත ගෙනත්, මීෂ්ක නිදා ඉන්න විදිය බලාගෙන ඇන්දා. මිනිස්සු නිදන් ඉන්නව අඳින එක වඩා ලේසියි. මොකද එයාල නොසෙල්වී ඉන්න එකම අවස්ථාව ඒක නිසා.

මොහොතකට පස්සෙ කෝස්ත්‍ය දෙව්යත්කින් ආවා. එයා මීෂ්ක නිදාගෙන ඉන්නව දැකලා මෙහෙම ඇහුවාඃ "මොනවද එයාට වෙලා තියෙන්නෙ? නිදන ලෙඩේද?"

INCUBATOR
20

"නැහැ," මම කිව්වා. "එයා ඔය පොඩි නින්දක් දානව විතරයි."

කෝස්ත්‍ය ගිහින් මීෂ්කගෙ උරහිසෙන් අල්ලල හෙලෙව්වා.

"ඒයි, නැගිටින්න වෙලාව හරි!"

මීෂ්කා ඉද්ද ගැහුව වගේ නැගිට්ටා. "ඒයි, මොකක්? දැන් එළි වෙලාද?"

"එළිවෙලා!" කොස්ත්‍ය හිනා වුණා. "තව ටිකකින් හවස් වෙයි. නැගිටල එළියට එනවා සෙල්ලම් කරන්න. බලනවා, ඉර පායලා කුරුල්ලො සින්දු කියනවා."

"අපට සෙල්ලම් කරන්න වෙලාවක් නැහැ. අපට කරන්න වැඩ තියෙනවා!" මීෂ්ක කිව්වා.

"මොන වැඩක්ද?"

"හුගක් වැදගත් වැඩක්."

මීෂ්ක ඉන්කියුබේටරේ ළඟට ගිහිල්ලා, උෂ්ණත්වමානය දිහා බලලා බෙරිහන් දෙන්න ගත්තා.

"මොකක්ද ඕයි තමුසෙ කරන්නෙ! පොළේ ඉන්න එළුව වගේ? බලනව මොකක්ද වෙලා තියෙන්නෙ කියලා!"

මම උෂ්ණත්වමානය දිහා බැලුවා. ඒක ආයෙම අංශක 103ක් පෙන්නුවා. මීෂ්ක ඉක්මනට ලාම්පුව පහත් කළා.

"මම නැගිට්ටෙ නැත්නම් ඔයා ඒක අංශක 104ට වැඩි වෙනකල් ඉඳීවි සහතිකයි!" එයා කේන්තියෙන් පිපිරුවා.

"ඔයා හැම තිස්සෙම නිදාගන්නව නම් ඒක මගේ වැරැද්දක් නෙවෙයි," මම කිව්වා.

"මම රෑ තිස්සෙ නිදා නොගත්ත එක මගේ වැරැද්දක්ද?"

"ඒක මගේ වැරැද්දකුත් නෙවෙයි" මම කිව්වා.

කොස්ත්‍ය ඉන්කියුබේටරේ දැක්කා. "මොකක්ද මේ? තව වාෂ්ප එන්ජිමක්ද?" එයා ඇහුවා.

"මෝඩයෙක් වෙන්න එපා. ඒක වාෂ්ප එන්ජිමක් වගේද?"

"ඉතින්, ඒක මොකක්ද එහෙනම්?"

"හිතන්න!"

"හ්ම්!" කෝස්ත්‍යා ඔළුව කස කසා කිව්වා. "වාෂ්ප ටර්බයිනයක් වෙන්න ඇති."

"වැරදියි, ආපහු හිතන්න."

"හරි, එහෙනම් මොකක්හරි ජෙට් එන්ජිමක්."

මීෂ්කටයි මටයි බක බක ගාල හිනා.

"ඔයාට තව අවුරුදු සීයක් හිතුවත්, කවදාවත් ඒක නම් හිතාගන්න ලැබෙන එකක් නෑ!"

"ඉතින් ඒක මොකක්ද?"

"ඉන්කියුබේටරයක්."

"අහා, ඉන්කියුබේටරයක්. මට තේනවා, මොකටද ඒක?"

"ඔයා දන්නෙ නැද්ද ඉන්කියුබේටර් තියෙන්නෙ මොකටද කියලවත්?" මීෂ්ක කිව්වා. "ඒකට පුළුවන් කුකුළු පැටව් හදන්න."

"ඒක මොනවයින්ද උන්ව හදන්නෙ?"

මීෂ්ක අමනාපයෙන් නහයෙන් පිඹබා. "බිත්තරවලින් තමයි ගොන් තඩියො!"

"ඕ, බිත්තරවලින් නේන්නම්. ඒක කිකිළියක් වෙනුවට. මම ඒ ගැන ඔක්කොම දැනන් හිටියා. මම හිතුවෙ ඒකට කියන්නෙ 'කුකුළු කූඩුව' කියලා. ඉතින් කෝ බිත්තර ටික?"

"මෙහේ, මේ පෙට්ටිය ඇතුළෙ."

"අපි ඒවා බලමු."

"අපොයි බැහැ, හැමෝටම පෙන්නන්න ගියොත් අපට එක කුකුළු පැටියෙක් වත් ලැබෙන එකක් නෑ. කැමති නම්, අපි ඒව හරවන වෙලාව වෙනකල් ඉන්න පුළුවන්. අන්න එතකොට ඔයාට දකින්න ලැබෙයි."

"එතකොට කීය වෙයිද?"

මීෂ්කයි මමයි ඉක්මනට ගණන් හදල බැලුවා. උත්තරේ ආවෙ, ආපහු බිත්තර හරවන්න ඕන අටට කියලා. කොස්ත්‍ය කිව්වා එයා ඉන්නම කියලා. මීෂ්ක එයාගෙ චෙස් ලෑල්ල ගෙනාවා. ඉතින් අපි සෙල්ලම් කරන්න වාඩි වුණා. ඇත්තම කියනව නම් තුන් දෙනෙක් චෙස් සෙල්ලම් කරනකොට කිසි ජොලියක් නැහැ. මොකද ඇත්තටම සෙල්ලම් කරන්නෙ දෙන්නයි. අනිත් එක්කෙනා ඉඳගෙන උපදෙස් දෙනව විතරයි. අනික, ඒකෙ කිසි හොඳක් නැහැ. දිනුවොත් කියාවි ඒ උදව් කරපු නිසා කියල. එතකොට පැරදුණාම හිනාවෙනවා, කෙනෙක් උදව් කරද්දිත් දිනන්න බැහැ කියල. චෙස් කියන්නෙ වතාවකට දෙන්නෙක් විතරක් කරන්න ඕන සෙල්ලමක්, කවිරුවත් ඇඟිලි නොගහා.

අන්තිමේදි ඔරලෝසුවේ අට වැදුණා. මීෂ්ක ඉන්කියුබේටරේ ඇරලා බිත්තර හරවද්දි, කෝස්ත්‍ය එතැන ඉඳන් ගණන් කළා. දහය, එකොළහ... "බිත්තර එකොළහයි. ඒ කියන්නෙ ඔයාලට පැටව් එකොළහක් ලැබෙයි."

"එකොළහක්?" මීෂ්ක පුදුමෙන් ඇහුවා. ඔයාට වැරදිලා. එතන දොළහක් තිබුණා. යකාට ගියාවෙ, කව්රුහරි එකක් හොරකම් කරලා. මෙහෙමත් වස ලැජ්ජාවක්! මට පොඩ්ඩක් හාන්සි වෙන්න බැහැ, බිත්තරයක් නැති කරගන්නෙ නැතිව. ඔයා මක් කළාද?" එයා මගේ ඇඟට කඩාපැන්නා. "ඔයාට ඒව බලාගන්න තිබුණා නේද?"

"ඔව් මම බලා හිටිය. මම මෙතැනමයි හිටියෙ. අපි ඒව ආයෙමත් ගණන් කරමු. කෝස්ත්‍යා වරද්දගෙන වෙන්න ඇති."

මීෂ්ක ගණන් කළාම එයාට දහ තුනක් ආවා.

"මේ බලනවා!" එයා ගෙරෙව්වා. දැන් එතන වැඩිපුර එකක් තියෙනවා. කව්ද ඒක එතනින් තියල තියෙන්නෙ?"

ඊළඟට මම ගණන් කළාම හරියට දොළහක් ආවා.

"නියම ගණන් කාරයෝ!" මම කිව්වා. "දොළහටවත් ගැණගන්න බැහැ."

"අයියෝ දෙවියනේ," මීෂ්ක කෙඳිරිගෑවා. "මට දැන් ඔක්කොම පටලැවිලා. මට එක බිත්තරයක් ඉතිරි වෙලා තිබුණා හරවන්න, මට දැන් මතක නෑ ඒ මොන එකද කියලා."

එයා මතක් කරන්න හදනකොට මායා දුවගෙන ආවා. එයා කෙළින්ම ඉන්කියුබේටරේ ළඟට ගිහින්, ඒකෙ තිබුණ ලොකුම බිත්තරේ පෙන්නලා මෙහෙම කිව්වාඃ

"මගේ කුකුළු පැටියා තමයි මේක ඇතුළෙ ඉන්නෙ."

මීෂ්කටයි මටයි කේන්තිය නැගලා, එයා තල්ලුකරල දැම්මා. "ඔයා ආපහු වාතයක් වෙන්න ආවොත් ඔයාට එක පැටියෙක් වත් ලැබෙන එකක් නෑ." අපි එයාට කිව්වා. මායා අඬන්න ගත්තා.

"ඔයාල මගේ භාජන ටික ගත්තා. මට කැමති තරමක් බලන්න අයිතිය තියෙනවා."

"ආ, ඇත්තද? අපි ඒ ගැන සලකලා බලන්නම්." මීෂ්ක දොර තදින් වහගන්න ගමන් කිව්වා.

"දැන් අපි මොකද කරන්නෙ?" මම ඇහුවා. "අපිට ආපහු බිත්තර හරවන්න වෙයිද?"

"නැහැ, එහෙම නොකරන එක හොඳයි. නැත්නම් අපි උන් හිටපු පැත්තටම හරවාවි. එකක් තිබිච්ච විදියටම තිබුණාවෙ. අපි ඊළඟ වතාවෙ මීට වඩා පරිස්සම් වෙමු."

"ඔයාට බිත්තර ලකුණු කරන්නයි තිබුණෙ, හරවපු ඒවයි, නැති ඒවයි අඳුණගන්න පුළුවන් වෙන විදියට," කෝස්ත්‍ය යෝජනා කළා.

"කොහොමද?" මීෂ්ක ඇහුවා.

"ඒවයෙ කතිරයක් ගහන්න පුළුවන්."

"නෑ, මම ඒවයෙ අංක ගහන්නම්." මීෂ්ක පැන්සලක් අරගෙන බිත්තරවලට අංක එකේ ඉඳන් දොළහට අංක දැන්නා.

"ඊළඟ වතාවෙ අපි බිත්තර ආපහු හරවනකොට අංක පහළට යයි, ඉන් පස්සෙ ඒව ආපහු උඩට එයි. ආයෙ වරදින්න ඉඩක් නැහැ." මීෂ්ක එහෙම කියල ඉන්කියුබේටරේ පියනෙන් වැහුවා. කෝස්ත්‍ය යන්න හදනකොටම මීෂ්ක එයාට මෙහෙම කිව්වාඃ

"ඉස්කෝලෙ කාටවත් අපේ ඉන්කියුබේටරේ ගැන නම් කියන්න එපා."

"ඇයි එපා?"

"අනේ මන්ද.... ඒගොල්ලො අපට හිනා වේවි."

"මොකටද එයාල හිනාවෙන්නෙ? ඉන්කියුබේටරයක් කියන්නෙ හුගක්ම ප්‍රයෝජනවත් දෙයක්නෙ."

"ඒ වුණාට, ඔයා දන්නෙ නැතෑ කොල්ලන්ගෙ හැටි. උන් කියාවි අපි හරියට බිත්තර රකින කිකිළියො දෙන්නෙක් වගේය කියල. අනිත් අතට ඒක වැරදුණොත්, උන්ගෙන් අපට විසුමක් වෙන්නෙ නෑ."

"ඒත් ඇයි වරදින්නෙ?"

"මොනව හරි වෙන්න පුළුවන්. ඔයා හිතා ඉන්න තරම් ඒක ලේසි නෑ. සමහර විට, අපි වැරදියට කරනව වෙන්නත් පුළුවන්. ඒ නිසා මේ ගැන කට පියාගෙන ඉන්න."

"හරි හරි," කෝස්ත්‍ය කිව්වා. "මම මොනවත් නොකිය ඉන්නම්."

මායා රාජකාරියට එයි

"ඉතින් කොහොමද තත්ත්වෙ?" මම පහුවදා උදේ මීෂ්කව හම්බවුණාම ඇහුවා.

"වරදක් නැහැ. රෑ තිස්සෙම උෂ්ණත්වය අඩු වෙච්ච එක තමයි ප්‍රශ්නෙ."

"ඔයා මේ දන් කියන්න හදන්නෙ, ඔයා ඊයෙ රෑත් නිදාගත්තෙ නෑ කියලද?"

"නැහැ. දන් මම ඊට වඩා බුද්ධිමත්. මම එලාම් ඔරලෝසුව මගෙ කොට්ටෙ යටින් තියාගන්නවා. ඉතින් ඒක මාව පැය තුනෙන් තුනට ඇහැරවනවා."

"ඒත් ඇයි උෂ්ණත්වය අඩු වෙන්නෙ? ඒක දවාලෙදි නම් නැග්ගා." මම කිව්වා.

"මම දන්නවා හොරේ," මීෂ්ක කිව්වා. රෑ කාලෙ සීතලයි. ඉතින් ඉන්කියුබේටරේ වැඩියෙන් සිසිල් වෙනවා. ඒත් දවල් කාලෙට

රස්නෙ වැඩි වෙනවා. ඒ නිසයි උෂ්ණත්වය දවල්ට වැඩි වෙලා රෑට අඩු වෙන්නෙ."

"දැන් අපි මොකක්ද කරන්නෙ?" මම එයාගෙන් ඇහුවා. "කවිද අපි ඉස්කෝලෙ ගියාම ඉන්කියුබේටරේ බලාගන්නෙ?"

"සමහරවිට මායා කැමති වෙයි. අපි එයාගෙන් අහමු."

මීෂ්ක එයාගෙ නංගිට කතාකරල ඇහුවා, අපි ඉස්කෝලෙ ගියාම ඉන්කියුබේටරේ බලාගන්නවද කියලා.

"නැහැ. මට බැහැ," මායා කිව්වා. "ඊයෙ ඔයාල මාව කාමරෙන් එළියට තල්ලු කරලා, දැන් මගෙන් උදව් ඉල්ලන්න එනවා."

"මේ බලන්න," මම කිව්වා. "ඔයාට කුකුළු පැටව් මැරෙනවා දකින්න ඕන නැහැනේ. එහෙම නේද? අපි උන්ව බලාගත්තෙ නැතොත් මැරෙයි, ඔයාගෙ පැටියත් එක්ක! අපි අහන්නෙ අපි වෙනුවෙන් නෙවෙයි කුකුළු පැටව් වෙනුවෙන්?"

මම එහෙම දෙයක් එයාගෙ ඔළුවට දැම්මම එයාට බෑ කියන්න බැරි වුණා. "උෂ්ණත්වමානෙ දිහා බලන්න," මම කිව්වා. "රසදිය අංශක 102 ළඟම තියෙන්න ඕන. ඔයාට මතක තියේවිද?"

"ඔව්. මට මතක තියේවි."

මම රතුපාට පැන්සලක් අරන් නියම තැන ලකුණු කළා, හොඳටම පැහැදිලි වෙන්න.

"දැන් ඔයාට කිසිම දෙයක් පැටලෙන එකක් නැහැ." මම කිව්වා. "රසදිය යාන්තමින් හරි උඩට නැග්ග ගමන්ම, ඔයා ලාම්පුව යටින් එක පොතක් අයින් කරන්න. ලාම්පුව පහත් කළාම රසදියත් පහළ බහිනවා, තේරුණාද?"

"ඔව්, මට තේරුණා."

ඉන් පස්සෙ මම එයාට බිත්තර හරවන විදිය කියල දීල, එයාට කිව්වා ඔරලෝසුවෙ එකොළහ වැදුණ ගමන්ම බිත්තර හරවන්න ඕන බව. මායා වැඩේ අල්ලගත්තා. මම එයාට දීපු උපදෙස් එයා ලව්ව ආපහු කියෙව්වා, හැමදේම හරිහැටි තේරුම් අරගෙනද කියල බලන්න. ඊට පස්සෙ මීෂ්කයි මමයි ඉස්කෝලෙ ගියා.

"ඉතින් කොහොමද ඔයාලගෙ ඉන්කියුබේටරේ අලුත් තොරතුරු?" කෝස්ත්‍ය අපි පන්තියට ඇතුළුවෙච්ච ගමන්ම ඇහුවා.

"ෂ්..!" මීෂ්ක උරහිසට උඩින් කව්රුහරි එනවද කියල බලල පිප්පුවා.

"මම කොඳුරලානෙ කිව්වෙ."

"කොඳුරනවා!" මීෂ්ක ගෙරෙව්වා. "තමුසෙ යටිගිරියෙන් බෙරිහන් දුන්නෙ."

"හරි, වචනෙ තමයි රහස. ඒත් මම කියන්නෙ, මට අනිත් උන්ට කියන්න දෙනවකො?"

"ඔයා එහෙම කරනව නම්, ඔයා අපි බලන්න නැවිත් ඉන්න තරමට හොඳයි. ඔයා ඒක රහසක් විදියට තියාගන්න පොරොන්දු වෙලා, දූන් එනව මෙතන..."

"හරි, මම කට වහගෙන ඉන්නම්. මේ අහනවල, මට ආව අදහසක්. ජීව විද්‍යා පාඩමේදි මම මාරියා පෙත්රොව්නට ඔයාලගෙ ඉන්කියුබේටරේ ගැන කියන්නම්. එයා හුගක් සතුටු වෙයි."

"කරල බලනවා! ඔයා මාරියා පෙත්රොව්නට කිව්වොත් මුළු පන්තියම දැනගනීවි."

"හරි හරි, මම කට පියාගෙන ඉන්නම්. මම ඒ ගැන වචනයක්වත් පිට කරන්නෙ නෑ ඕං" කෝස්ත්‍ය කටත් අත් දෙකෙන් වහගෙන එතැනින් යන්න ගියා. ඒත් ඕන කෙනෙකුට තේරෙනවා එයා කාට හරි රහස පිටකරන්න මාන බලාගෙනයි ඉන්නෙ කියලා.

පාඩම පටන්ගත්තා. මීෂ්කට තත්පරයක් වත් බය නොවී ඉන්න බැහැ.

"මායා මොකක් හරි වරද්දගත්තොත් මොකද කරන්නෙ?"

"ඒත් එයාට මොනවද වරදින්න පුළුවන්?"

"එයා උෂ්ණත්වය බලන්න අමතක කරාවි."

"ඒත් මම එයාට තදින්ම අවවාද කළානෙ."

"එයාට ගෙදර ඉඳල එපාවෙලා සෙල්ලම් කරන්න එළියට ගියොත්?"

"එයා එහෙම නොකරන්න පොරොන්දු වුණා."

"එයා භාජන ටික ඉන්කියුබේටරෙන් එළියට ගත්තොත්?"

"එයා එහෙම කරන එකක් නැහැ."

"බල්බ් එක පිච්චිලා යන්න පුළුවන්. එතකොට අපි මොකද කරන්නෙ?"

ජීව විද්‍යාව පාඩමේදි මීෂ්කයි මමයි කොච්චර කතා කළාද කියනොත්, මාරියා පෙත්රොව්නා අපිව වෙන් කළා. මීෂ්ක වැහි වළාවක් වගේ කළු වෙලා, පන්ති කාමරේ අනිත් කෙළවරේ ඉඳන් මගෙ දිහා බලා හිටියා. ඒ මදිවට, තියෙන කරදර වැඩි කරන්නත් එක්ක කෝස්ත්‍ය එයාගෙ කටට අත ළං කරලා හයියෙන් කෙඳිරුවා, "ඒයි, මම මාරියා පෙත්රොව්නට ඔයාලගෙ ඉන්කියුබේටරේ ගැන කියන්නයි යන්නෙ."

මීෂ්ක පුටුව උඩ දඟල දඟල ආපහු පිප්පුවා. "කේලම්කාර ද්‍රෝහියා!"

ඒත් ඒ වෙනකොට කෝස්ත්‍ය අත උස්සල ඉවරයි.

"ඔව් කෝස්ත්‍යා?" මාරියා පෙත්රොව්න ඇහුවා.

මීෂ්ක කෝස්ත්‍ය දිහාට අත උරුක්කළා.

"මාරියා පෙත්රොව්න, ඉන්කියුබේටරයක් කියන්නෙ මොකක්ද?" කෝස්ත්‍ය අහංසක විදියට ඇහුවා.

මාරියා පෙත්රොව්න ඉන්කියුබේටරයක් කියන්නෙ මොකක්ද කියල විස්තර කරන්න ගත්තා. එයා කිව්ව විදියට ගොඩාක් ඉස්සර කාලෙ හිටපු මිනිස්සුත්, කිකිළියන් නැතිව බිත්තර රකින විදිය දැනගෙන ඉඳලා. අවුරුදු දෙදාහකට කලින් ඊජිප්තුව, චීනය වගේ රටවල පවා ඉන්කියුබේටර තිබුණලු. පුරා විද්‍යාඥයන්ට ඊජිප්තුවෙන් ඉන්කියුබේටර හම්බවෙලාත් තියෙනවා. ඇත්තටම ඒව වැඩිය ලොකුත් නෑ. ඒ වගේම කුකුළු පැටව් වැඩි දෙනෙක් හදලත් නෑ. අද කාලෙ තියෙන ඉන්කියුබේටර වලින් වතාවකට බිත්තර දහස් ගණනක් රකින්න පුළුවන්ලු.

"මම දන්න කොල්ලො දෙන්නෙක් තනියම ඉන්කියුබේටරයක් හැදුවා," කෝස්ත්‍ය කිව්වා. "එයාලට එක කුකුළු පැටියෙක් වත් ලැබේවි කියල ඔයා හිතනවද?"

"ඔයාලට ගෙදර හදපු ඉන්කියුබේටරේකින් බිත්තර රකින්න පුළුවන්," මාරියා පෙත්රොව්න උත්තර දුන්නා. "ඒත් ඒක මහ වදයක්. ගොවිපළවල

තියෙන ඉන්කියුබේටරවල හැම ජාතියෙම කොටස් තියනවා. උෂ්ණත්වය වගේම තෙතමනයත් පාලනය කරන්න. ඒත් ගෙදර හදපු ඉන්කියුබේටර පරිස්සමින් රැකබලාගන්න ඕන. ඔයාගෙ යාළුවො වගකීමක් ඇතුව ඒක පරිස්සමෙන් බලාගන්නව නම්, ඒක හරියාවි. ඒත් ඒ දෙන්න අපේ මීෂ්කයි කෝල්යයි වගේ උන්දල දෙන්නෙක් නම්, මම හිතන්නෑ ඒකෙන් මොකෙක්වත් ඒවි කියලා."

"ඇයි?" මීෂ්ක කඩා පැන්නා.

"ඔයාල පන්තියේදිත් කිසිම ගරු සරුවක් නැතිව නරක විදියට හැසිරෙන හන්දා." මාරියා පෙත්රොව්නා එහෙම කියල පාඩම කරන්න ගත්තා.

අපි එදා ඉස්කෝලෙ ඇරිල ගෙදර එන්න හදනකොටම වීත්ය සම්ර්නව් අපි දෙන්නව අල්ලගෙන කිව්වා, දූත් තරුණ සත්වවේදීන්ගෙ සංගමයේ වැඩ කරන්න තියෙන්නෙ අපේ වාරෙ කියලා.

"අම්මෝ, නැහැ, දූත් ඇත්තටම අපට බෑ." මීෂ්ක කිසි ඉවසිල්ලක් නැතිව කිව්වා. "අපට වෙලාවක් නැහැ."

"ඔයාලට කිසි දේකට වෙලාවක් නෑ. ඔයාල සංගමේට බැඳුණෙ මොකටද එන්න බැරිනම්? මේ වසන්තය වැඩ වැඩිම සෘතුව. අපට කුරුලු ගෙවල් හදන්න තියෙනවා."

"අපි කුරුලු ගෙවල් පස්සෙ හදන්නම්."

"ඒත් කුරුල්ලො ඉක්මනට ඒවි."

"නෑ, එයාල එහෙම නෑ."

"මොනවද ඔයා මේ කියන්නෙ? ඔයාල හිතාගෙන ඉන්නෙ කුරුල්ලො ඔයාල කරනකම් බලා ඉඳීවි කියලද?"

"එයාල ඉඳීවි පොඩ්ඩම පොඩ්ඩක්.." මීෂ්ක කිව්වා.

අපි ගෙදර දිව්වා. අපේ වාසනාවට හැම දේම හරියට තිබුණා. මායාත් ඉන්කියුබේටරේ ළඟ එයාගෙ සුපුරුදු තැන ඉඳගෙන හිටියා. අපි එයාට ස්තුති කරලා එයාව සෙල්ලම් කරන්න යැව්වා.

ඇබැද්දියක්

එදා ඉඳල පැය තුනෙන් තුනට බිත්තර හැරවිල්ලයි, උෂ්ණත්වය බැලිල්ලයි, වතුර වාෂ්ප වෙන තරමට ටැංකියටයි ලී බාජන වලටයි වතුර පිරවිල්ලයි අපේ ජීවිතේම කොටසක් වුණා. ඒක හිතන තරම් අමාරු වැඩක් නම් නෙවෙයි. ඒත් හැම තිස්සෙම ඇහැ ගහගෙන ඉන්න සිද්දවෙනවා, නැත්නම් මොකක්හරි ජංජාලයක් වෙන්න පුළුවන්. එක්කො හිටි හැටියෙම උෂ්ණත්වය නගින්න පුළුවන්. නැත්නම් බිත්තර හරවන්න අමතක වෙන්න පුළුවන්. හැම තිස්සෙම ඉන්කියුබේටරේ සිහියෙන්ම ඉන්න වෙනවා. මීෂ්කට තමයි අමාරුම හරිය ලැබුණෙ. එයාට රෑට බලාගන්න තියෙන නිසා, හරිහැටි නින්දක් ලැබුණෙ නෑ. දවල්ට එයා හිටියෙ සරත් කාලෙදි මැස්සෙක් ඉන්නව වගේ නිදිමතේ. නිතරම දවල් කෑමෙන් පස්සෙ එයා කුස්සියෙ තියෙන කච්චියෙ දිගා වෙලා පොඩ්ඩක් නිදාගත්තා. ඉතින් මම කළේ, මගෙ චිත්‍ර පොත අරගෙන, එයා නිදි අතරෙ එයාව අඳින එක.

දවස් පහකුයි රෑ පහකුයි ඔහොම ගත වුණා. හයවෙනි දවසෙදි මීෂ්කට ඉස්කෝලෙදි නින්දගියා, පාඩමක් අතරෙදි. ආයෙ කියන්න දෙයක් නෑ, නදේස්දා වික්ටරව්නා එයාට බැනලා, මුළු පන්තියම මීෂ්කට විහිළු කළා. මීෂ්කට ඒකට හරියට හිත රිදුණා. හැමෝම අනුන්ට හිනාවෙන්න කැමතියි, ඒත් කව්රුවත් අනුන් තමන්ට හිනාවෙනවට කැමති නැහැ.

ඊටත් හපන් දෙයක් වුණා, මම කොල්ලන්ට පෙන්නන්න මගේ චිත්‍ර ඉස්කෝලෙට ගෙනාව නිසා. එයාල දැක්ක ගමන්ම අනුමාන කළා මම එක එක විදියට -හාන්සිවෙලා, ඉඳගෙන, බාගෙට හිටගෙන- ඇඳල තියෙන්නෙ මීෂ්කව කියලා.

"ඔයා නම් මාර නිදිකුම්බෙක්." ලියෝෂා කුරොච්කින් මීෂ්කට කිව්වා.

"එයා ලෝක වාර්තාවටත් ගහවි!" සෙන්ය බොබ්රොව් එකතු කළා.

"මීයෙක් වගේ, විසිහතර පැයේම නිදාගෙන!"

චිත්‍ර අතින් අතට මාරු වුණා. හැමෝම විහිළු කරල හයියෙන් හිනා වුණා.

"ඔයා මොන එහෙකටද ඔයාගෙ චිත්‍ර මෙහාට ගෙනාවෙ?" මීෂ්ක මගේ ඇඟට කඩාපැන්නා.

"මම කොහොමද දන්නෙ එයාල ඒක ඔච්චර විහිළුවකට ගනීවි කියලා?"

"නෑ, ඔයා ඒක හිතලමයි කළේ. මුළු පන්තියටම මගේ ගානෙ හිනාවෙන්න පුළුවන් වෙන්න. හරිම යාළුවෙක් තමයි ඔයා නම්! මට ඔයත් එක්ක තව කිසිම ගනුදෙනුවක් නෑ."

"මීෂ්ක මම දිව්රන්නම් මම ඒක හිතල කළේ නෑ කියලා. සත්තයි මම කළේ නෑ. මෙහෙම දෙයක් වෙන බව දන්නව නම් මම ඔයාව අඳින්නෙවත් නෑ." මම එයාට කිව්වා.

ඒත් මීෂ්ක එදා දවසෙම මාත් එක්ක කතා කළේ නෑ. හවස් වුණාම මීෂ්ක මට මෙහෙම කිව්වා.

"ඔයා ඉන්කියුබේටරේ ඔයාගෙ ගෙදරට අරන් ගිහින් රෑ කීපයක් ඒක බලාගන්නව නම් වටිනවා, මං ගැන ගොබ්බ කාටූන් අඳිනවට වඩා."

"ඒකට කමක් නෑ." මම කිව්වා. "ඔයා දවස් පහක් බලාගත්තනේ. දැන් මගේ වාරෙ."

අපි ඉන්කියුබේටරේ මගේ ගෙදරට අරගෙන ගියා. එදා ඉඳල තමයි මගේ කරදර පටන්ගත්තෙ.

හැම රෑකම මම එලාම් ඔරලෝසුව කොට්ටෙ යටින් තියාගන්නවා මහ රෑ මැදියමේ මගෙ කනටම ඒක සද්ද වෙන විදියට. මම නැගිටල වැනි වැනි කුස්සියට ගිහින් උෂ්ණත්වය ගැන හොයලා, බිත්තර හරවලා ආපහු වැනි වැනි ඇඳට යනවා. මුලදී නම් මට නින්ද ගියේම නෑ. ඒත් මට යන්තම් නින්ද ගිය ගමන්ම එලාම් එක ආපහු ගුමු ගුමු ගාන්න ගන්නවා, මගෙ නින්ද කැඩුව එකට මට ඒක කෑලිවලට කඩන්න හිතෙනකල්ම.

හැම උදේකම මට ඇහැරෙන්නෙ ඇඳෙන් නැගිටින්නත් බැරි තරම් නිදිමතේ. බාගෙට නින්දෙන්, මම මගෙ ඇඳුම් දාගන්නවා. එක්කො මම කලිසමේ කකුල් දෙකට ඔළුව ඔබන්න හරි, කමිසෙ අත් වලින් කකුල් දාන්න හරි හදනවා. වතාවක් මම මගෙ බූට් සපත්තු දෙකත් වැරදි කකුල්වලට දාගෙන ගියා. කොල්ලො ඒක දැකල මට විහිළු කළා. ඉතින් මට පන්තියේදි ඒව මාරු කරගන්න සිද්දවුණා.

ඒත් නරකම ඇබැද්දිය වුණේ දහවෙනි රෑ. අනේ මන්ද මට එරලෝසුව වයින් කරන්න අමතක වෙලාද, නැත්නම් මට ඒක වදිනව ඇහුණෙ නැතුවද කියලා. කොහොම හරි, මම ඇඳට ගිහින් ආපහු නැගිට්ටෙ උදේ වෙලා. මම ඇස් අරිනකොට ඉර පායලා. මුලදී මට තේරුණේ නැහැ මොකක් වෙලාද කියල. එනකොටම මට මතක් වුණා මම එදා රෑ එක වතාවක් වත් ඇහැරුණේ නැහැ නේද කියල! මම ඇඳෙන් බිමට පැනල, ඉන්කියුබේටරේ ළඟට දිව්වා. උෂ්ණත්වමානෙ අංශක අනූ නවයක් පෙන්නුව. ඒ කියන්නෙ නියම ගාණට අංශක තුනක්ම අඩුවෙන්. මම ඉක්මනට අභ්‍යාස පොත් දෙකක් ලාම්පුව යටින් තිව්වා. ඒත් මගෙ යටි හිතින් මම දන්නවා, ඒකෙන් පලක් නැති බව. බිත්තර දැන් හොඳටෝම සීතල වෙලා ඇති. දවස් දහයක මහන්සිය වතුරෙ ගියා! කලලත් හොඳටම ලොකු වෙලා තියෙද්දි මම මුළු වැඩේම කෑවා.

මට කොයිතරම් තරහ ගියාද කිව්වොත්, මම මගේම ඔළුව කොනිත්තගත්තා. රසදිය ටිකෙන් ටික අංශක 102ට නැග්ගා. ඒ දිහා බලා ඉන්න ගමන් මම තනියම මෙහෙම හිතුවා,

"මේ උෂ්ණත්වය සාමාන්‍යයි. බිත්තර ඉස්සර වගේමයි. ඒත් ඒව ඇතුළෙන් මැරිලා. පැටව් එකෙක්වත් එන්නෙ නැහැ."

ඒත් සමහර විට මොකක්වත් වෙලා නැතිවත් ඇති. සමහර විට උන්ට මැරෙන්න තරම් වෙලාවක් ගියේ නැතිව ඇති. කොහොමද අපි හොයාගන්නෙ? එකම විදිය තමයි, දිගටම බිත්තර උණුසුම් කරගෙන යන එක. විසි එක්වෙනි දවසෙ පැටව් එළියට ආවෙ නැත්නම් උන් මැරිලා! ඒත් සමහර විට උන් මැරිලා නැතිව ඇති. ඒත් මට ඒක දැනගන්න දවස් එකොළහක්ම ඉන්න වෙනවා.

"මේ තමයි අපේ ප්‍රීතිමත් පවුලෙ අවසානය!" මම දුක් වුණා.

"කුකුළු පැටව් දොළොස් දෙනෙක් වෙනුවට එකෙක්වත් නැති වෙයි."

එනකොටම මිෂ්ක ආවා. එයා උෂ්ණත්වමානෙ දිහා බලලා, හරිම සතුටින් මෙහෙම කිව්වා.

"මාරයි! නියම උෂ්ණත්වය. ඔක්කොම ගාණට යනවා. දැන් රෑ වැඩ බලාගන්න මගේ වාරෙ."

"නෑ," මම කිව්වා. "මමම කරගෙන යනව නම් හොදයි. ඔයා මොනවටද බොරුවට දුක් විඳින්නෙ?"

"ඇයි බොරුවට වෙන්නෙ?"

"කුකුළු පැටව් ආවෙ නැතොත්?"

"ඉතින් එහෙම වුණත්, ඒක ඔයාට අමාරු වැඩ ඔක්කොම කරන්න හේතුවක් නෙවෙයි. අපි යාළුවොනෙ. ඉතින් අපි අපේ වැඩ කොටස කරන්න ඕන."

"මොනව කියන්නද කියල මට තේරුණේ නැහැ, මට ඇත්ත කියන්න ශක්තියක් තිබුණෙත් නැහැ, ඉතින් මම තීරණය කළා මුකුත්ම නොකියන්න. මම දන්නව ඒක මගෙ හොඳක් නෙවෙයි කියල. ඒත් මට කරන්න දෙයක් නැහැ.

පුරෝගාමීන්ගේ රැස්වීම

කෝස්ත්‍ය හැමදාම අපිව බලන්න ඇවිල්ලා, බිත්තර රැකිල්ල ගැන කොල්ලන්ට වාර්තා කළා. හැබැයි එයා ඒගොල්ලන්ට කිව්වෙ නැහැ ඉන්කියුබේටරේ හැදුවෙ මීෂ්කයි මමයි කියලා. එයා මවා පෑව, ඒ වෙන ඉස්කෝලෙක ළමයි දෙන්නෙක් කියලා.

"මම කැමතියි ඒ පිරිමි ළමයින්ව හම්බවෙන්න තියෙනව නම්." වීත්‍ය ස්මිර්නව් දවසක් කිව්ව.

"මොකටද?"

"එයාල ගැන අහන්න ආසා හිතෙනවා. අපට ඒ වගේ දෙතුන්දෙනෙක් එක්ක තරුණ සත්වවේදීන්ගෙ සංගමේ හොඳට කරගෙන යන්න තිබුණා. වැඩ ටික ගාණට තියේවි එහෙම වුණොත්. ඒත් අපේ මීෂ්කයි කෝල්යයි වගේ හාදයො එක්ක කිසි දෙයක් හරියකට කරන්න බැහැ. එයාලට කිසි දේකට ඕනැකමක් නැහැ. එයාල පැළ හිටවන්න උදව් කරන්නෙ නැහැ, දූන් එයාල කුරුලු ගෙවල් හදන්නෙත් නැහැ..."

"ඒ ළමයිත් පැළ හිටවන්නෙ නෑ," කෝස්ත්‍ය මීෂ්කටයි මටයි ඇහැක් ගහල කිව්වා. "ඒක ඉතින් වෙනම කාරණයක්. එයාලට ඒක නැතුවට කරන්න දේවල් තියෙනවා."

වීත්‍ය හීනෙකින්වත් හිතල තිබුණෙ නැහැ, කෝස්ත්‍ය එයාට කියපු ළමයි දෙන්න අපි දෙන්නාය කියලා. ඒ වගේම අපට බය වෙන්න හේතුත් ගොඩක් තිබුණා. ඉන්කියුබේටරේ හින්ද අපි අපේ පාඩම් වැඩත් අතපසු කරල, අපි දෙන්නම අංක ගණිතයට පහෙන් දෙකක් ගත්ත නිසා.

ඇලෙක්සැන්ඩර් යෙෆ්රේමෝවිච් මට ගැටලුවක් දුන්නා, කළු ලෑල්ලෙ විසඳන්න. මට ඒක කරගන්න බැරි වුණා. එයා මට ලකුණු දෙකක් දුන්නා. ඉන් පස්සෙ එයා මීෂ්කට කතා කරලා, එයාට ධන දෙකක් දුන්නා. ඇත්තටම අපට එහෙම වුණේ අපි ඒ පාඩම ඉගෙනගත්තෙ නැති නිසා. ඒත් අඩු ලකුණු ගන්න එකත් ඒ වගේම එපා කරපු දෙයක්.

"ඔයාට නම් ඒකෙ වැඩි දෙයක් නැහැ," මීෂ්ක කිව්වා. "ඔයාට ලැබුණෙ 2ක්. ඒත් මට 2ධන."

"ගොනෝ, 2ධන කියන්නෙ, 2ට වඩා වැඩියි." මම කිව්වා.

"කෙහෙල්මල! 2ට පස්සෙ තියෙන ධන ලකුණ, ඒක තුනක් කරනවද? නෑනෙ?"

"නැහැ, ඒත් දෙකම තමයි."

"එහෙම නම් මොකටද ධන ලකුණක්?"

"මන්දා."

"මම ඔයාට කියන්නම්, ධන ලකුණක් තියෙනකොට එයාල ඒක ඔයාට නිකම් දුන්න කියල හිතන්න හොඳ නැහැ. ඒක හරියට : 'මෙන්න ඔයාට අපූරු ධන ලකුණක්.' කියනව වගේ. එත් දෙක- දෙකමයි. ඒක තමයි දුක!"

"මොකද ඒ ගැන දුක?"

"මොකද ඒකෙන් ඔයා අමු ගොබ්බයෙක් බව පෙන්නන නිසා. එහෙම නැත්නම්, ඔයා කිසි දෙයක් නොදන්න බව පෙන්නන්න 2ක් හොඳටෝම ඇති. ඒත් ගොබ්බයෙකුට 2ධන ගත්තම එයාට හිතන්න බැහැ, එයාට අසාධාරණ විදියට සලකනව කියල. ඒත් මම නම් ගොබ්බයෙක් ගාණට

වැටෙන්න කැමති නැහැ. ඔයාට 2සෘණත් ගන්න පුළුවන්." එයා කියවගෙන ගියා. "මට නම් ඒකෙ කිසි පදනමක් පේන්නෙ නැහැ. දෙකේ තේරුම ඔයා කිසි දෙයක් දන්නෙ නෑ කියන එකයි. ඒත් කොහොමද 'දන්නෙ නැතුවටත්' වඩා, දන්න තරම අඩු වෙන්නෙ?"

"ඒක වෙන්න බැහැ," මම කිව්වා.

"ඒක තමයි මමත් කියන්නෙ!" මීෂ්ක කිව්වා. "දෙක සෘණ කියන්නෙ, ඔයා දන්නෙ නෑ විතරක් නෙවෙයි දැනගන්න ඕනෙ කමකුත් නෑ කියන එකයි. ඔයා පාඩම් වැඩ ටික කරල නැත්නම් ඔයාට 2ක් ලැබෙනවා, ඒත් ඔයා ලෝක ප්‍රසිද්ධ රස්තියාදු කාරයෙක් නම් දෙක සෘණ ලකුණක් දෙනවා ඔයාට ඒක දැනෙන්න. ඔයාට එකක් පවා ලැබෙන්න පුළුවන්. ඔයා දන්නවනෙ" එයා කියවාගෙන ගියා.

ඒත් එයාට ඊට වඩා දෙයක් ඒ ගැන කියන්න ලැබුණෙ නැහැ. ඇලෙක්සැන්ඩර් යෙෆ්රෙමෝවිච් අපිව වෙන් කළ නිසා.

අන්තිම විවේක කාලෙදි 'ෂේන්යා ස්ක්වෝර්ත්සොව් අපට මෙහෙම කිව්වා:

"ඉස්කෝලෙ ඉවර වුණාම පන්තියෙ නවතින්න. අපි මීටිමක් තියන්නයි යන්නෙ."

"අයියෝ, අපට නවතින්න බෑනෙ, අපට වෙලාවක් නැහැ." මීෂ්කයි මමයි කිව්වා.

"ඔයාලට නවතින්නම වෙනවා." 'ෂේන්යා කිව්වා. "මොකද අපි කතා කරන්න යන්නෙ ඔය දෙන්න ගැන."

"ඇයි අපි මක් කළාටද?"

"ඔයාලට ඒක මීටිමෙදි දැනගන්න ලැබේවි." ෂේන්යා කිව්වෙ එච්චරයි.

"මම කැමතියි ඒකට," මීෂ්ක කිව්වා. "අපි ලකුණු දෙකක් ගත්තාම, උන් ඒකටත් මීටිමක් තියන්න යනවා. එයා හිතන් ඉන්නෙ එයා සංගමේ සභාපති නිසා එයාට හැම දෙයක් ගැනම රැස්වීම් කැඳවන්න පුළුවන් කියලා. ඉන්නකො එයාටත් 2ක් ලැබෙනකල්. මම ආසයි එයා ඒක ගැනත් රැස්වීමක් කැඳවන හැටි බලන්න."

"එයාට දෙකක් ලැබෙන්නෙ නැහැ, එයා පාඩම් වැඩට දක්ෂයි." මම කිව්වා.

"ඔයා මොකටද එයාගෙ පැත්තම ගන්නෙ?"

"මම එයාගෙ පැත්ත ගත්ත එකක් නැහැ."

"යකාට ගියාවෙ, අපි දැන් නවතින්නම එපැයි," මීෂ්ක කෙඳිරිගෑවා.

"ඒකට කමක් නැහැ," මම කිව්වා. "මායා ඉන්කියුබේටරේ බලාගන්නවනෙ." අපි මීටිමට නැවතුණා.

"අද අපි කතා කරන්නෙ ලකුණු සහ හැසිරීම ගැන," ෂේන්යා ස්ක්වෝර්ත්සොව් පටන්ගත්තා. "මෑතකදි පිරිමි ළමයි කීප දෙනෙක් පන්තියේදි නරක විදියට හැසිරිලා තියෙනවා. දඟලල, දොඩව දොඩව, අනුන්ට බාධා කර කර. මීෂ්කයි කෝල්යයි තමයි නරකම වැරදිකාරයො දෙන්නා. එයාලව කීප වතාවක්ම වෙන් කරලත් තියෙනවා, කතා කරල අහුවෙලා. මේ වැඩේ හරියන්නෙ නෑ. ඒක කොහෙත්ම හොඳ නෑ. ඊටත් හපන් ඒ දෙන්නම ලකුණු 2 වෙන්න ගත්තු එක."

"අපි දෙන්නටම එහෙම දෙයක් ලැබුණෙ නැහැ. මට ලැබුණෙ 2ධන," මීෂ්ක කිව්වා.

"ඒකෙ කිසි වෙනසක් නෑ," ෂේන්ය කිව්වා. "ඔයාල අනිත් විෂයයන් වලටත් අඩු ලකුණු අරන් තියෙනවා."

"අපට වෙන දෙකවල් ලැබිල නැහැ, මට රුසියානු භාෂා පාඩමටත් ලැබුණෙ තුනයි." මීෂ්ක කිව්වා.

"එයාට ලැබුණෙ තුන ඍණ," වාන්ය ලොස්කින් කිව්වා.

"ඔයා පැනල දෙන්නෙ නැතිව ඉන්නවා," මීෂ්ක කිව්වා.

"මොනවද ඔයා කියන්නෙ? මේක පුරෝගාමීන්ගෙ රැස්වීමක්. මට කැමති දෙයක් කියන්න අයිතිය තියෙනව."

"ඔයා ඉස්සරවෙලා අවසර ගන්න ඕන."

"හරි එහෙනම්, මට අවසරයි. කොල්ලනේ, ඔයාල මගෙන් අහනව නම්, ඒ ගොල්ලන්ට අඩු ලකුණු ලැබිල තියෙන්නෙ, එයාල ගෙදර වැඩත්

නොකරන්නෙ මොකක් හරි හේතුවක් නිසා. එයාලට ඒ හේතුව කියන්න අරින්න."

"ඒක හරි. අපට කියන්න, අපි අහගනිමු ඒක." ෂේන්ය කිව්වා.

"ඒකට කිසිම හේතුවක් නෑ." මීෂ්කා කිව්වා.

"මම දන්නවා ඒ මොකක්ද කියලා," ලියෝෂා කුරොච්කින් කිව්වා. "එයාල හැම වෙලාවෙම පන්තියෙදි කතා කරනවා, ගුරුවරයට ඇහුම්කන් නොදී. ඒ වගේම එයාල ගෙදර වැඩ කරන්නෙත් නෑ. මම හිතන්නෙ ඒගොල්ලන්ව ආපහු වෙන් කරන්න වෙනවා සදහටම, එයාලට කයිවාරු ගහන්න බැරි වෙන්න."

"ඔයාලට අපිව වෙන් කරන්න බැහැ," මීෂ්කා කිව්වා. "අපි යාළුවො. ඔයාලට යාළුවන්ව වෙන් කරන්න බැහැ, හරිද?"

"යාළුවො වුණා කියල වෙන්නෙ කරදරයක් විතර නම්, ඒක තමයි කරන්න තියෙන හොඳම දේ." සෙන්ය බොබ්රොව් කිව්වා.

ඒ වෙලාවෙ කෝස්ත්ය අපි වෙනුවෙන් නැගිට්ටා.

"කව්රුහරි අහල තියෙනවද යාළුකමකින් කාට හරි කරදරයක් වෙනව කියලා?"

"එයාලගෙ යාළුකමෙන් නම් එහෙම වෙනවා, එයාල හැම දේකදිම එකිනෙකාව කොපි කරන නිසා. එක්කෙනෙක් කතා කළොත් අනිත් කෙනත් කතා කරනවා. එක්කෙනෙකුට වැඩ කරන්න ඕනෙ නැත්නම්, අනිත් කෙනාටත් ඕනෙ නැහැ. එක්කෙනෙක් ලකුණු දෙකක් ගත්තොත්, අනිත් එක්කෙනත් ලකුණු දෙකක් ගන්නවා. නැහැ, එයාල වෙන් කරන්න වෙනවමයි." වීත්ය ස්මිර්නව් කිව්වා.

"මිනිත්තුවක් ඉන්නකො, කෝස්ත්ය කිව්වා. "අපට හැම තිස්සෙම එයාලව වෙන් කරන්න නම් පුළුවන්. ඒත් ඉස්සරවෙලා බලමු එයාලට උදව් කරන්න පුළුවන්ද කියලා, එයාලට පාඩම් වැඩ කරන්න වෙලාවක් නැත්නම්?"

"මොනවද ඔයා මේ කියන්නෙ? වෙලාවක් නැත්නම්?"

"හරි, හිතන්න එයාල හුඟක් වැදගත් දෙයක් කරනවා කියලා."

සෙන්ය බොබ්රව් හිනා වුණා. "හුඟක් වැදගත් දෙයක්? ඒක මොකක් වෙන්න පුළුවන්ද?"

"එයාල ඉන්කියුබේටරයක් හදනව නම්?"

"ඉන්කියුබේටරයක්?" සෙන්ය ආපහු හිනා වුණා.

"ඔව්. ඉන්කියුබේටරයක්. හිතා ඉන්නෙ ඒක ලේසියි කියලද? ඔයාල දන්නවද එයාල රෑ තිස්සෙ නිදිමරාගෙන උෂ්ණත්වය බලන බව? ඔයාල දන්නවද දවස පුරාම එයාල වෙන මහන්සිය? ඉතින් අපි මෙතන ඉඳන් ඒගොල්ලන්ට බනිනවා. ඔයාල දන්නවද..."

"මේ අබිරහස මොකක්ද කියල මම දැනගන්න කැමතියි." ෂේන්ය කිව්වෙ ටිකක් තරහෙන්. "එයාලා ඇත්තටම ඉන්කියුබේටරයක් හදලද?"

"ඔව්." කෝස්ත්ය කිව්වා.

"ඒ දෙන්න ගිහින්, ඔයා අපිට කිව්ව පිරිමි ළමයි දෙන්නව කොපි කරලා." වීත්ය කිව්වා.

"නෑ," කෝස්ත්ය කිව්වා. "එයාල කාව වත් කොපි කළේ නැහැ. එයාල තමයි මම ඔයාලට කිව්ව කොල්ලො දෙන්නා."

"මොනවා?!"

"ඒක ඇත්ත."

"ඒත්, ඔයා කිව්වෙ එයාල වෙන ඉස්කෝලෙක කියල?"

"මම ඒක කිව්වෙ ජොලියට"

හැමෝම මීෂ්කවයි මාවයි වටකරගත්තා.

"එහෙනම් ඔයාල තනියම ඉන්කියුබේටරයක් හදලා! "

ඊළඟට වීත්ය ස්මිර්නව් කිව්වා :

"මෙහෙමත් ලැජ්ජාවක්. නියම සත්වවේදියො ඒ වගේ වැඩ කරන්නෙ නැහැ. ඉන්කියුබේටරයක් හදලා, ඒ ගැන කට වහගෙන ඉන්නවා! ඔයාලට

නිකමටවත් හිතුණෙ නැද්ද අපිත් එහෙම දෙයක් ගැන උනන්දු වෙයි කියලා? ඇයි ඔයාල ඒක රහසක් හැටියට තියාගත්තෙ?"

"අපි හිතුවා ඔයාල අපට හිනාවේවි කියලා." අපි කිව්වා.

"අපි මොකටද හිනා වෙන්නෙ? මොකක්ද ඒකෙ තියෙන විහිළුව? වෙන එකක් තියා, අපිට ඔයාලට උදව් කරන්න පවා තිබුණා. අපට මාරුවෙන් මාරුවට උෂ්ණත්වය බලන්න පුළුවන්. ඒකෙන් ඔයාලට වාසියි වගේම පාඩම් වැඩ කරන්නත් වෙලාව ලැබේවි."

"කොල්ලනේ," වඩික් සයිට්සෙව් කිව්වා. "අපි ඔක්කොම ගිහින් එයාලගෙ ඉන්කියුබේටරේ වැඩේට උදව් කරමු."

"ඒක හොඳයි!" ඒ හැමෝම කෑගැහුවා.

වීත්ය කිව්වා, දවල් කෑමෙන් පස්සෙ එයා අපිව හම්බවෙන්න ආවම, අපි කාලසටහනක් ඇඳල හැමෝටම ඉන්කියුබේටරේ බලාගන්න වාරයක් වෙන් කරමු කියල.

ඒකෙන් රැස්වීම ඉවර වුණා.

ස්වේච්ඡා උදව්කරුවෝ

දවල් කෑමෙන් පස්සෙ, මුළු සත්වවේදීන්ගෙ සංගමේම අපේ කුස්සියට රැස් වුණා. අපි එයාලට අපේ ඉන්කියුබේටරේ පෙන්නල ඒක රත් කරන විධියයි, අපි උෂ්ණත්වය පරීක්ෂා කරන විධියයි, සමාන කාල පරිච්ඡේදවලදී බිත්තර හරවපු විධියයි විස්තර කළා. ඊට පස්සෙ අපි කාලසටහන හදන්න ඉඳගත්තා. ඒත් ඉස්සරවෙලාම වීත්ය සම්ර්නව් කිව්ව විධියට අපි නීති මාලාවක් හැදුවා, රාජකාරිය කරන අයට. හැමදාම ඉස්කෝලෙන් පස්සෙ, පිරිමි ළමයි දෙන්නෙක් ඉන්කියුබේටරේ බලාගන්න ආවාම, මීෂ්කයි මමයි එයාලට කරන්න ඕන දේ කියල දීලා, දවසටම ඉන්කියුබේටරේ එයාලට භාර දෙන්න ඕන. එයාලත් දවල් කෑම කන්න යන්නයි, ගෙදරවැඩ කරන්නයි විවේකයක් ගන්න ඕන. මීෂ්කයි මමයි ගෙදර වැඩ නොකර ඉන්කියුබේටරේටම ඇලිල ඉන්නවද කියල බලන එකත් එයාලගෙ රාජකාරියෙම කොටසක්.

ඉන් පස්සෙ වීත්ය කාලසටහන ඇන්දා. හැමෝටම තමන්ගෙ රාජකාරිය තියෙන දවස බලාගන්න අපි ඒක බිත්තියේ එල්ලුවා.

"ඇයි ඒකෙ අපේ නම් නැත්තෙ?" මීෂ්ක ඇහුවා. "අපිව පැත්තකට දමන්නද හදන්නෙ?"

"ඇයි ඊ කාලෙ?" වීත්ය කිව්වා. "ඔයාලට ඊ වැඩ ටික බෙදාගන්න වෙනවා."

ඉන් පස්සෙ 'ෂේන්ය කොල්ලො ඔක්කොම ගෙදර යැව්වා. "අද වැඩ කරන දෙන්න හැර හැමෝටම යන්න පුළුවන්. එයා කිව්ව. "හැමෝම මෙතන ලැගල ඉන්න එකේ තේරුමක් නැහැ."

හැමෝම යන්න ගියා, ෂේන්යයි, වීත්යයි, මීෂ්කයි, මායි ඉතුරු කරලා.

"ඔයාලත් යන්න," ෂේන්ය අපි තනි වුණාම කිව්වා.

"අපි කොහෙ යන්නද?"

"ගිහින් ඔයාලගෙ පාඩම් වැඩ ටික කරන්න."

"ඒත් මෙතන මොකක් හරි වැරැද්දක් වුණොත්?"

"මොනවත් වරදින්නෙ නැහැ. මොනව හරි වුණොත් මම ඔයාලට කතා කරන්නම්."

"හොඳයි, ඒක නම් අමතක කරන්න එපා."

ඉතින් මීෂ්කටයි මටයි වාඩි වෙලා ගෙදර වැඩ කරන්න සිද්ධ වුණා. අපි ව්‍යාකරණයි, භූගෝලෙයි, එක ගණිත ගැටලුවකුයි කළා. එතන ගැටලු දෙකක් තිබුණා, එත් අනිත් එක හුඟක් අමාරුයි. ඉතින් අපි ඒක පැත්තකින් තියල, කුස්සියෙ සිද්ධවෙන්නෙ මොකක්ද කියල බලන්න ගියා.

"ඔයාල මොකද මෙහේ කරන්නෙ? ෂේන්ය අපි ආවම ඇහුවා. "ඔයාලට කිව්වෙ නැද්ද ඔයාලගෙ ගෙදර වැඩ ටික ඉවර කරන්න කියලා?"

"අපි ඒව කරලත් ඉවරයි."

"ඇත්තද? කෝ බලමු ඔයාලගෙ ලියන පොත් දිහා."

"ඒයි, මේ මොකක්ද මේ?" මීෂ්ක කිව්වා. "පරීක්ෂණයක් වත්ද?"

"අපි මේ ගැන හොයන්න භාරගෙන තියෙනවා, ඉතින් අපි ඔයාල ගැන වගකියන්න ඕන, තේරුණාද?"

අපි අපේ ලියන පොත් අරගෙන ආවා.

"ඒත් ඔයාල හදල තියෙන්නෙ එක ගාණයි. එතන දෙකක් තියෙනවා."

"අපි අනිත් එක පස්සෙ කරන්නම්."

"නෑ, ඔයාල ඒක දැන්ම කරන්න ඕන. කල් දැම්මොත් අමතක වේවි. ඊට පස්සෙ ඔයාල හෙට ඉස්කෝලෙට ඒවි කිසිම දෙයක් නොකර."

"අපි එක ගාණක් හැදුවනෙ, නැද්ද?"

"එකක් විතරක් මදි," ෂේන්ය තදින්ම කිව්වා. "ඔයාල දන්නවනෙ කියමනක් : වැඩ කළොත් ජය ලැබේ කියල."

ඉතින් අපට සිද්ධ වුණා ආපහු ගිහිල්ල ගැටලුවත් එක්ක වද වෙන්න. අපි හැදුවා, හැදුවා ඒත් ඒක හරිගියේ නැහැ. අපි ඒකට පැයක්ම ගත කළා. ඉන් පස්සෙ අපි ආපහු කුස්සියට ගියා.

"එක එන්නෙ නැහැ," මීෂ්ක කිව්ව. "අපි හැම දේම හරියට කළා. ඒත් අපට එන උත්තරේ පොත පිටිපස්සෙ තියන එක නෙවෙයි. අච්චුගහනකොට වෙච්ච වැරදීමක් වෙන්න ඕන."

"හරියට හරි, ඉතින් බැනපල්ල පොතට!" ෂේන්ය කිව්වා.

"ඒක වුණේ පොත පිටිපස්සෙ තියෙන උත්තරේ වැරදි බව දැනගන්න කලින්."

"විකාර!" ෂේන්ය කිව්වා. "අපි බලමු."

එයා අපිත් එක්ක කාමරේට ඇවිත්, අපි කරපු වැඩ ටික දිහා බැලුවා. එයත් ගැටලුව විසඳන්න හැදුවා හැදුවා, හැමදේම හරි, ඒත් උත්තරේ නම් ආවෙ නැහැ.

"ඒකනේ මම ඔයාට කිව්වෙ!" මීෂ්ක සතුටින් කිව්වා.

ඒත් ෂේන්ය කිව්වා, එතන මොකක්හරි වැරැද්දක් තියෙන්නම ඕන, ඒක හොයාගන්නකම්ම අතඇරින්නෙ නැහැයි කියල. එයා ගාණ මුල ඉඳල අගටම පරීක්ෂා කරල, අන්තිමේදි වැරැද්ද හොයාගත්තා.

"හා....! මේ තියෙන්නෙ ඒක," එයා කිව්වා. "හත් වරක් හත කීයද, ආ?"

"හතළිස් නවයයි, වෙන මොකක්ද?"

"ඔව්. ඒත් බලන්න ඔයාලට හම්බවෙලා තියෙන උත්තරේ, විසි එකයි!"

එයා වැරැද්ද හැදුවාම, හැම දේම හරි ගියා.

"මේ සේරම ඔයාලගෙ නොසැලකිල්ල." එයා එහෙම කියලා, ආපහු ඉන්කියුබේටරේ ළඟට ගියා.

අපි ගැටලුව පොතේ හදාගෙන ආපහු කුස්සියට ගියා.

"අපි ඉවරයි" අපි කිව්වා.

"හොඳයි, දැන් ඔයාලට ඇවිදින්න එළියට යන්න පුළුවන්. පිරිසිදු හුළං පොදක් වදින එක ඔයාලටත් හොඳයි."

බෑ කියලත් පලක් නැහැ, ඉතින් මීෂ්කයි මමයි එළියට ගියා. එදා හොඳට ඉර පායපු දවසක්. වත්තෙ හිටපු පිරිමි ළමයි වොලිබෝල් සෙල්ලම් කර කර හිටියෙ. ඉතින් අපිත් ඒකට එකතු වුණා. ඊට පස්සෙ අපි කෝස්ත්ය දෙව්යාත්කින්ගෙ ගෙදර ගියා. අපි එහේ ඉන්න අතරෙදි, වදික් සයිත්සෙව්ත් ආව. ඉතින් අපි හතර දෙනාම 'ලොටෝ'යි තවත් ලෝකෙ නැති සෙල්ලම් ගොඩකුයි කළා, හවස් වෙනකල්ම. අපි ගෙදර යනකොටත් හොඳටම පරක්කු වෙලා තිබුණෙ. අපි කෙළින්ම කුස්සියට ගියාම දැක්ක ෂේන්යයි වීත්යයි එක්ක වාන්ය ලොස්කිනුත් ඉන්නවා. එයා කිව්වා, අද රෑ වැඩ බාරගන්න අවසර දෙන්න කියල එයාගෙ අම්මට බල කළා කියලා.

"ඒයි, මේ මොකක්ද!" මීෂ්ක කිව්වා. "මටයි කෝල්යටයි කිසිම අවස්ථාවක් ලැබෙන එකක් නෑ, මෙහෙම ගියොත්! වාන්ය අද රෑ වැඩ ටික බාරගනියි. එතකොට හෙට තව මොකෙක්හරි අවසරේ ගනියි. නෑ, මට ඒකට නම් එකඟවෙන්න බැහැ."

"හරි," වීත්ය කිව්වා. "මම ඔයාලවත් කාලසටහනට දාගන්නම්. එතකොට ඔයාලටත් අනිත් අයට වගේම වැඩ කරන්න වෙලාවක් ලැබේවි."

ඉතින් එයා අපිව ලැයිස්තුවෙ අන්තිමට දැම්මා. මීෂ්කයි මායි අපේ වාරෙ එන්නෙ කවදටද කියල බැලුවාම, ඒක ආවෙ හොඳම දවසට. විසි එක් වෙනි දවස. කුකුළු පැටව් එළියට එන්න ඕන එදාට.!

අවසාන සූදානම

දැන් අන්තිමට මීෂ්කටයි මටයි හිත සැහැල්ලු කරගන්න ලැබුණා. ඇත්තම කියනවනම් අපිට යාන්තම්වත් දුකක් නැහැ, ඉන්කියුබේටරේ අපට මහ වදයක් වෙලා තිබුණ නිසා. අපි රෑ දවල් දෙකේම ඒකටම බැඳිලයි හිටියෙ. ඒ වගේම අපට මොනවහරි අමතක වෙයි කියන බයට ඒකමයි ඔළුවෙ තියාගෙන හිටියෙ. දැන් හැම දේම අපි නැතුවත් ගාණට යනවා.

අපි තරුණ සත්වවේදීන්ගෙ සංගමේ අපට තියෙන වැඩ කොටස කරන්න ගත්තා. අපි කුරුලු ගෙවල් දෙකක් හදලා, ඒවා අපේ වත්තෙ එල්ලුවා. ඉස්කෝලෙ වත්තෙත් ගසුයි, මලුයි හිටෙව්වා. එත් වැදගත්ම දේ තමයි, අපට පාඩම් වැඩ කරන්න ඕන තරම් වෙලාව ලැබුණු එක. මීෂ්කගෙයි මගෙයි අම්මලා, අපි වැඩියෙන් ලකුණු ගන්නවා දැක්කම කොල්ලො අපට උදව් කරන එක ගැන සතුටු වුණා.

තරුණ සත්වවේදීන්ගෙ සංගමේ ආපහු රැස්වුණාම, මාරියා පෙත්රොව්නා කුකුළු පැටව් එන දවසට ලෑස්තිවෙන හැටි කියල දුන්නා. එයා අපට උපදෙස් දුන්නා, උන්ට කන්න කොළ ජාතියක් ඕන වෙන නිසා තණකොළ ටිකක් පැළකරන්න කියලා. එයා කිව්වා, ඕට්ස් තමයි පැළකරන්න හොඳම දේ, මොකද ඒව ගුණයි වගේම ඉක්මනට වැවෙනවා කියලා.

"දැන් අපි කොහෙන්ද පැළකරන්න ඕට්ස් ගන්නෙ?"

"අපට කුරුලු පොළ පැත්තෙ යන්න වෙනවා," වාන්ය ලොස්කින් කිව්වා. "ඒගොල්ල එහෙ හැම ජාතියේම කුරුලු කෑම විකුණනවා.

ඉස්කෝලෙන් පස්සෙ වාන්යයි, ෂේන්යයි කුරුලු පොළට ගියා. පැය දෙකකට පස්සෙ එයාල ආවෙ සාක්කු පිරෙන්න ඕට්ස් ඇටයි, කියන්න දිග කතාවකුයි අරගෙන.

"කුරුලු පොළේ ඕට්ස් තිබුණෙම නැහැ, අපි හැම තැනටම ගිහින් එක එක දේවල් බැලුවා -කංසා, මීලට්, බර්ඩොක් ඇට- ඕට්ස් ඇට හැර හැම දෙයක්ම. අපිට හිතුණා අපට හිස් අතින් තමයි එන්න වෙන්නෙ කියලා. ඒත් අපි හිතුවා ආපහු එන්න කලින් හාවො බලන්න යන්න. අපි හාවො බලන අතරෙ දැක්කා, අශ්වයෙක් මල්ලකින් ඕට්ස් කනවා. ඉතින් අපි ටිකක් ඉල්ලුවා."

"කාගෙන්ද ඔයාල ඇහුවෙ, අශ්වයගෙන්ද?" මිෂ්ක පුදුමෙන් ඇහුවා.

"මෝඩ වෙන්න එපා. අපි ඇහුවෙ උගෙ අයිතිකාරයගෙන්. ඇත්තම කියනව නම්, අර හාවුන්ව පොළට ගෙනාව ගොවියා. එයා හරි හොඳ මනුස්සයෙක්. එයා අපෙන් ඇහුවා, අපට ඕට්ස් ඕන මොනවටද කියලා. ඉතින් අපි කිව්වම අපට ඒව ඕන කුකුළු පැටවුන්ට දෙන්න කියලා, එයා කිව්වා, කුකුළු පැටවුන්ට ඕට්ස් කන්න දෙන්නෙ නැහැ කියලා. අපි එයාට පැහැදිලි කළාම, අපට අංකුර වලටයි ඒව ඕන කියලා, එයා අපට ඕන තරමක් ගන්න කිව්වා. ඉතින් අපි සාක්කු පුරවගත්තා."

අපි ඉක්මනට වැඩට බැහැලා, මිටි පෙට්ටි දෙකක් හැදුවා. අපි ඒව පස්වලින් පුරවලා, වතුර දාලා ඒව මඩ කළා. ඊළඟට අපි පසට ඕට්ස් හලලා, ආපහු ඒව හොඳහැටි මිශ්‍ර කරලා ඇට ටික හොඳට උණුසුම් වෙන්න පෙට්ටි දෙක උඳුන යටින් තිව්වා.

මාරියා පෙත්රොව්නා අපට කියල තිබුණා, ගස් වල ඇටත් කුරුළු කිත්තර වගේම පණ ඇති දේවල් බව. ඒවය ඇටේ ඇතුළෙ හැංගිල තිබිලා, ඒකට උණුසුම් තෙත පස් තියෙන තැනක් ලැබුණාම ඒක වැඩෙන්න ගන්නවලු. පණ තියෙන ඕනැම දෙයක් වගේම ඇටත් මැරෙන්න පුළුවන්. මැරිච්ච ඇට පැළවෙන්නෙ නැහැ.

අපි හුඟක් බයෙන් හිටියෙ අපේ ඇට 'මැරිච්ච' ඒව වෙන්න පුළුවන් කියලා. ඉතින් හැමතිස්සෙම පෙට්ටිවලට එබි එබී බැලුවා ඒව පැළවෙලාද කියලා. දවස් දෙකක් ගිහිල්ලත් කිසිම සලකුණක් තිබුණෙ නැහැ. තුන්වෙනි දවසෙදි අපි දැක්කා, පෙට්ටිවල තිබුණ පස් තැනින් තැනින් ඉරි තැළිල ටිකක් එහ මෙහෙ වෙලා තියෙනවා.

"මේ මොකද?" මිෂ්ක තරහෙන් පිපිරි පිපිරී ඇහුවා. "කව්රුහරි පෙට්ටි ඇදල තියෙනවා!"

"එහෙම දෙයක් නෙවෙයි," සෙන්ය බොබ්රොව් එක්ක රාජකාරිය කරපු ලියොෂ කුරොච්කින් කිව්වා.

"එහෙනම් අහවල් දෙයක් නිසාද මේ පස පැළිල තියෙන්නෙ?" මිෂ්ක බෙරිහන් දුන්නා. "නමුසෙල ඒකට ඇඟිලිගහන්න ඇති ඇට බලන්න."

"අපි නම් මොකකවත් ඇඟිලි ගැහුවෙ නැහැ," සෙන්ය තදින්ම කිව්වා.

මම පස් කැටයක් උස්සලා ඒක යටින් තිබුණු ඇටේ අරගෙන බැලුවා. ඒක පැළිලා සුදුපාට මුලක් ඇවිල්ල තිබුණා. මීළඟට සුදු පාට මුලක් තිබුණු ඇටයක් අරන්, ඒක හුඟක් වෙලා පරීක්ෂා කළා.

"මම දන්නව වෙලා තියෙන දේ!" එයා කෑගැහුවා. "එයාලම තමයි පස පළල තියෙන්නෙ!"

"කව්ද?"

"ඇට. එයාල දූන් ඇහැරිලා පස දිගේ උඩට එනවා. බලන්න පස පැළිල තියෙන විදිය. ඒවට පස් යට තව ඉඩ නැහැ."

මීෂ්ක දිව්වා, ඇට පැළවෙන හැටි බලන්න කොල්ලන්ව එක්ක එන්න. ලියෝෂයි, සෙන්යයි මමයි තවත් ඇට කීපයක්ම පසෙන් එළියට ගත්තා. ඒ හැම එකක්ම පැළවෙලා. ඉක්මනින්ම කොල්ලො ඇවිත් රොක් වුණා. හැමෝටම ඕන වුණේ ඇට බලාගන්න.

"බලන්න," වීත්ය ස්මිර්නව් කිව්වා. "ඇට පිපිරිල, ඕවිස් ඒවයින් එළියට එනව, හරියට කුකුළු පැටව් වගේ."

"ඇත්තටම," මීෂ්ක කිව්වා. "ඕවිස් ඇට වලටත් කුකුළු පැටවුන්ට වගේම පණ තියෙනවා. වෙනස, ඒව ලොකුවෙලත් එක තැනම තියෙන එක. ඒත් අපේ කුකුළු පැටව් ඉපදුණාම එයාල දුව දුවා තිව් බිව් ගගා කෑම ඉල්ලාවි. ඔයාල බලන්නකො කොච්චර ජොලි පවුලක්ද අපට ලැබෙන්න යන්නෙ කියලා!"

අමාරුම දවස

එකතුවෙලා වැඩ කරන එක විනෝදයක් වුණා වගේම කාලයත් ඉක්මනට ගෙවිල ගියා. අන්තිමේදි විසි එක් වෙනි දවසත් ආවා. ඒක සිකුරාදාවක්. අපි පැටවුන්ගෙ උප්පත්තියට ඕන කරන හැම දේම ලෑස්ති කළා. මඩුවෙන් ලොකු හැළියක් අරන් ඒකෙ ෆෙල්ට් රෙදි ඇතිරුවා, අලුත උපන් කුකුළු පැටවුන්ව උණුසුම් කරන බඳුනක් හදන්න. දැන් ඒක උණුවතුර භාජනයකට උඩින් තියෙනවා, පළමුවැනි කුකුළු පැටිය උපදිනකල් බලාගෙන.

මීෂ්කටයි මටයි ඕන වුණා කලින් දවසෙ රෑත් ඇහැරිලා ඉන්න. ඒත් වඩික් සර්විසෙව් එදා රෑ වැඩ බාරගන්න අවසර දෙන්න එයාගෙ අම්ම කැමති කරගෙන තිබුණා. ඉතින් එයා අපි එතන ඉන්න එක ඉවසුවෙ නෑ.

"මම රාජකාරිය කරන වෙලාවට ඔයාල මෙතැන ඉන්න ඕන නැහැ." එයා කිව්වා.

"දැන් ඔයාල නිදාගන්න යන්න"

"ඒත් කුකුළු පැටව් රෑම ඉපදුණොත්?" අපි ඇහුවා.

"ඉතින් මොකෝ? පැටියෙක් ඉපදුණු ගමන්ම මම ඌව භාජනේට හළන්නම්."

"ඔයා ඌව හළන්න නම් හිතන්න එපා!" මම කිව්වා, මර බයෙන්. ඔයා කුකුළු පැටව් ගැන හුඟක් මෘදු වෙන්න ඕන."

"බය වෙන්න එපා මම මෘදු වෙන්නම්. දැන් ඔයාල හොඳ ළමයි වගේ ඇඳට යන්න. හෙට ඩියුටිය ඔයාලට බව අමතක කරන්න එපා. ඉතින් ඔයාල රෑට හොඳහැටි නිදාගන්න එක හොඳයි."

"හරි," මීෂ්ක කැමති වුණා. "ඒත් පැටව් එළියට එන්න ගත්තොත් අපට කතාකරන එක විතරක් කරන්න. අපි ඒකට හුඟ දවසක් බලා හිටියා."

වදික් පොරොන්දු වුණා.

අපි ඇඳට ගියා. ඒත් මට හුඟ වෙලාවක් යනකල් නිදාගන්න බැරි වුණා, කුකුළු පැටව් ගැනමයි හිතෙන්නෙ. ඊළඟ දවසෙ මම පාන්දරින්ම ඇහැරිලා කෙළින්ම දිව්වෙ මීෂ්කලාගෙ ගෙදරට. එයත් ඇහැරිලා, ඉන්කියුබේටරේ ළඟ ඉඳගෙන බිත්තර පරීක්ෂා කර කර හිටියා.

"තවම කිසිම ලකුණක් පෙනුණෙ නැහැ."

"වෙලපහ වැඩියි, ජේන විදියට." වදික් කිව්වා.

වදික් ඉක්මනටම ගෙදර ගියා, දූන් රෑ ගෙවිල අපේ වාරෙ ආව නිසා. එයා ගියාම, මීෂ්ක හිතුවා බිත්තර ඔක්කොම ආපහු මුල ඉඳල පරීක්ෂා කරල බලන්න. අපි ඒව හරව හරවා, ඇතුළෙ ඉන්න කුකුළු පැටිය උගෙ හොටෙන් හදපු වූටි හිලක් වත් තියෙනවද කියල හෙව්වා. ඒත් එක කටුවක වත්, ඉරිතැලීමක් වගේ දෙයක් වත් තිබුණෙ නෑ. අපි ඉන්කියුබේටරේ වහල, හුඟ වෙලාවක් කතා නොකර හිටියා.

"අපි එකක් කඩලා, ඇතුළෙ පැටියෙක් ඉන්නවාද නැද්ද කියල බැලුවොත්?" මම යෝජනා කළා.

"නෑ, ඒක නම් කරන්නම එපා. දූන්ම කල් වැඩියි," මීෂ්ක කිව්වා. කුකුළු පැටිය තවම හුස්ම ගන්නෙ උගෙ හමෙන් මිස පෙණහලුවලින් නෙවෙයි." මීෂ්ක කිව්වා. ඌ පෙණහලුවලින් හුස්මගන්න පටන්ගත්තු ගමන්ම ඌ තනියම කටුව කඩාවි. අපි ඒක කල්තියා කැඩුවොත් පැටිය මැරේවි."

"ඒත් උන්ට ඒක ඇතුළෙදිත් පණ තියෙන්න ඕන," මම කිව්වා. "සමහර විට උන් ඇතුළෙ හෙලවෙන සද්දෙ ඇහේවි හොඳට අහගෙන හිටියොත්?"

මීෂ්ක ඉන්කියුබේටරෙන් බිත්තරයක් එළියට අරන් එයාගෙ කන ළඟින් තියාගත්ත. මාත් නැවිල මගේ කනත් ඒකට තිව්වා.

"සද්ද නොකර ඉන්නවකෝ!" මීෂ්ක ගෙරෙව්වා. "කොහොමද මට මොකක්වත් ඇහෙන්නෙ, තමුසෙ මගෙ කනට පිඹිනකොට!"

මම මගෙ හුස්ම හිර කරගත්තා. එතන කොයිතරම් නිශ්ශබ්දයිද කිව්වොත්, මේසෙ උඩ තියන ඔරලෝසුවෙ ටිකි ටිකිය පවා ඇහෙන තරමට නිශ්ශබ්දයි. හිටි හැටියෙම සීනුව වැදුණා. මීෂ්ක ගැස්සිලා ගිය පාර, තව පොඩ්ඩෙන් බිත්තරෙත් වට්ටනවා. මම දිව්වා දොර අරින්න. ඒ වීන්යා. එයාට දැනගන්න ඕන වෙලා තිබුණෙ කුකුළු පැටව් එළියට එන්න පටන්ගෙනද කියලා.

"නෑ," මීෂ්ක කිව්වා. "තවම උදේ වැඩියි."

"හරි, මම ඉස්කෝලෙ යන්න කලින් ආපහු එන්නම්." විජය කිව්වා.

එයා ගියාම මීෂ්ක බිත්තරේ ආපහු අරගෙන, ඒක එයාගෙ කනේ තියාගත්තා. එයා ඇසුත් වහගෙන ඒ විදියටම ඇහුම්කන් දීගෙන හිටියා.

"මට නම් කිසිම දෙයක් ඇහෙන්නෙ නැහැ," එයා අන්තිමේදි කිව්වා. මාත් බිත්තරේ අරගෙන ඇහුම්කන් දුන්නා. ඒත් කිසිම සද්දයක් නැහැ.

"කලලය මැරිලාවත්ද?" මම ඇහුවා. "අපි අනිත් ඒවත් අරන් බැලුවොත් හොඳයි."

අපි බිත්තර එකින් එක අරගෙන, හැම එකකටම කන් දුන්නා. ඒත් එකක්වත් පණ තියෙන ලකුණක් පෙන්නුවෙ නෑ.

"එවුන් හැමෝම මැරිල වෙන්න පුළුවන්ද, බෑනෙ?" මීෂ්ක කිව්වා.

"අඩුම ගානෙ එකෙකුට වත් පණ තියෙන්න එපැයි."

ආපහු සීනුව වැදුණා. මේ පාර සෙන්ය බොබ්රොව්.

"ඔයා මොකද උදේ පාන්දරම මෙහේ කරන්නෙ?"

"මම ආවෙ කුකුළු පැටවුන්ට කොහොමද කියල දැනගන්න."

"උන් තාම ආවෙ නෑ," මීෂ්ක කිව්වා. "තවම කාලෙ ඇවිත් නැහැ."

ඊළඟට සෙරියෝස ආවා.

"ඉතින් පැටියෙක් හෙම ලැබුණද?"

"ඔයාලට නම් කිසි ඉවසිල්ලක් නෑ," මීෂ්ක කිව්වා. "ඔයාලට කුකුළු පැටව් පාන්දරම උපදින්න ඕන! තව ඕන තරම් කල් තියෙනවා."

සෙරියෝසයි සෙන්යයි ටිකක් ඉඳගෙන ඉඳල යන්න ගියා. මීෂ්කයි මමයි ආපහු බිත්තරවලට ඇහුම්කන් දෙන්න ගත්තා.

"නෑ, මේකෙ ඇති පලක් නැහැ," එයා දුකෙන් කිව්වා. "මට මෙලෝ දෙයක් ඇහෙන්නෙ නැහැ."

"උන් අපිව ගොනාට අන්දවන්න, හෙලවෙන්නෙ නැතිව ඉන්නව වත්ද?" මම ඇහුවා.

"එහෙම කරන්නෙ අහවල් දේකටද? හරිනම් උන් මේ වෙනකොට කටුව පුපුරවගෙන එළියට එන්න ඕන."

ඊළඟට යූරා ෆිලිපොවිනුයි, ස්ටසික් ලෙව්ෂිනුයි ආවා. එයාලට පස්සෙ වාන්ය ලොස්කින්. ඒගොල්ල දිගටම එක්කෙනා පස්සෙ එක්කෙනා එන්න ගත්තා. අපි ඉස්කෝලෙ යන්න ඕන වෙලාව එනකොට ඒක පෙනුණෙ සභා රැස්වීමක් වගේ. අපි මායාට කතාකරල, අපි නැති වෙලාවෙ පැටව් ඉපදුණොත් කරන්න ඕන දේ කියලා, අනිත් අයත් එක්ක ඉස්කෝලෙට පිටත් වුණා.

මම නම් දන්නෙ නැහැ, අපි කොහොම ඒ දවස ගෙව්වාද කියලා. ඒ තමයි අපේ ජීවිතේ අමාරුම දවස. අපිට දැනුණෙ, හරියට කව්රුහරි හැම පාඩමක්ම වෙනදට වඩා දහ ගුණයක් විතර දික්වෙන්න කාලෙ අද්දනව කියලා. අපි හොඳටම බය වුණා, අපි ඉස්කෝලෙ ඉන්න අතරෙ බිත්තර පුපුරාවි, එතකොට මායාට තනියම වැඩේ කරගන්න බැරි වේවි කියලා. අන්තිම පාඩම තමයි එපාම කරපු එක. අපි හිතුවෙ ඒක ඉවර වෙන්නෙම නැති වෙයි කියලා. ඒක කොච්චර දිගද කිව්වොත් අපි හිතන්න ගත්තා අපට සීනුව ඇහිල නැතිවද කියලත්. ඊළඟට අපි හිතුවා සීනුව වැඩ කරන්නෙ නැතිව ගිහින් කියලා. නැත්නම් දූන්ය නැන්දා -ඉස්කෝලෙ බලාගන්න කෙනා- අන්තිම සීනුව ගහන්න අමතක වෙලා ගෙදර ගිහින් ඇති, ඉතින් අපට උදේ වෙනකල්ම පන්තියෙ ඉඳගෙන ඉන්න වේවි කියලා. මුළු පන්තියම නොයිවසිල්ලෙන් කැලඹිලා තිබුණෙ.

හැමෝම ෂේන්ය ස්ක්වෝර්ත්සොව්ට පුංචි තුණ්ඩු කැලි යැව්වා, වෙලාව අහලා. ඒත් කරුමෙට ෂේන්ය එදා ඔරලෝසුව ගෙදර දාල ඇවිල්ලා. පන්තිය කොච්චර ඝෝෂාකාරී වුණාද කිව්වොත් ඇලෙක්සැන්ඩර් යෙෆ්‍රෙමොවිච්ට කීප වතාවක්ම නවතින්න වුණා, නිශ්ශබ්ද වෙන්න කියන්න. ඒත් සද්දෙ දිගටම තිබුණා. අන්තිමේදි මීෂ්ක අත ඉස්සුවා පාඩම ඉවරයි වෙන්න ඕන කියලා කියන්න. ඒත් ඒ මොහොතෙම සීනුව වැදිලා, හැමෝම ඉද්ද ගැහුව වගේ නැගිටලා දොර ළඟට දිව්වා. ඇලෙක්සැන්ඩර් යෙෆ්‍රෙමොවිච් අපි හැමෝම ආපහු ඉන්දවල කිව්වා, ගුරුවරය පන්තියෙන් එළියට යනකල් කාටවත් මේසෙන් නැගිටින්න බැහැ කියල. ඊළඟට එයා මීෂ්ක දිහාට හැරුණා.

"ඔයාට මගෙන් මොනවහරි අහන්න ඕන වුණාද?"

"නෑ, මට ඕන වුණේ පාඩම ඉවරයි කියල කියන්න."

"ඒත් ඔයා සීනුව වදින්න කලින්ම අත ඉස්සුවෙ?"

"මම හිතුව සීනුව කැඩිල ඇති කියල."

ඇලෙක්සැන්ඩර් යෙෆ්‍රෙමොවිච් එයාගෙ ඔළුව වනලා, නාම ලේඛනෙත් අරගෙන කාමරෙන් පිට වුණා. කොල්ලො කොරිඩෝව දිගේ දුවලා, පඩිපෙළෙනුත් පහළට දිව්වා. පිටවෙන තැන තදබදයක් තිබුණා. ඒත් මමයි මීෂ්කයි කොහොමහරි ඉඩ පාදගත්තා. අපි පාර දිගේ කලබලෙන් දිව්වා, අනිත් අයත් අපේ පස්සෙන් අරන්.

මිනිත්තු පහකට පස්සෙ අපි ගෙදර. මාය ඉන්කියුබේටරේ ළඟ ඉඳගෙන එයාගෙ බෝනික්කා-සිනේඩට අලුත් ගවුමක් මහ මහ හිටියා.

"මොනවහරි වුණාද?" අපි ඇහුවා.

"මුකුත්ම නෑ."

"ඔයා අන්තිමට ඉන්කියුබේටරේ බලල කොච්චර කල්ද?"

"හුඟක් කල්- මම අන්තිමට බිත්තර හරවද්දි."

මීෂ්ක ඉන්කියුබේටරේ ළඟට ගියා. කොල්ලො හැමෝම ඇඟිලි තුඩු වලින් හිටගෙන බෙලි දික්කරගෙන එතැනට රොක් වුණා. වාන්යා ලොස්කින්, වැඩිය හොඳින් බලන්න කියල පුටුවකට නැගලා ඇදගෙන වැටිලා. ලියෝෂ කුරොච්කින්වත් තව පොඩ්ඩෙන් වට්ටනවා. ඒත් මීෂ්කට පියන ඇරගන්න බැරි වුණා. එයා බලන්න බය වුණා.

"ඉක්මනට, ඕක ඇරල දානවා! මොකද පරක්කු?" කව්දෝ කිව්වා.

අන්තිමේදි මීෂ්ක පියන ඉස්සුවා. බිත්තර ටික කලින් තිබුණ වගේම තිබුණා. සුදු ලොකු පබළු ඇට වගේ.

මීෂ්ක ටික වෙලාවක් මොනවත් නොකියා හිටියා. ඊළඟට එයා ඒ හැම එකක්ම එකින් එක පරිස්සමෙන් හරවල බැලුවා.

"එක ඉරිතැලීමක් වත් නෑ!" එයා දුකෙන් කිව්වා.

කාගෙද වැරැද්ද

කොල්ලො ටික සද්දයක් නැතිව බලා හිටියා.

"සමහරවිට එයාල උපදින්නෙම නැති වෙයි," සෙන්ය බොබ්රොව් කිව්වා. "මොනවද ඔයාල හිතන්නෙ, ආ?"

මීෂ්ක එයාගෙ උරහිස අකුළගත්තා.

"මම කොහොමද දන්නෙ? මම කිකිළියෙක් නෙවෙයි! මම මොනවද බිත්තර ගැන දන්නෙ?"

හැමෝම එක සැරේ කතා කරන්න ගත්තා. සමහරු කිව්වා උන් කීයටවත් උපදින එකක් නෑ කියලා. තව සමහරු කිව්වා තවම වෙන්න පුළුවන් කියලා. අනිත් අය කිව්වා, එහෙම වෙන්නත් පුළුවන්-නොවෙන්නත් පුළුවන් කියලා. අන්තිමේදි වීත්ය ස්මිර්නව් රණ්ඩුව නැවැත්තුවා.

"ඒක හරියටම කියන්න වේලාසන වැඩියි," එයා කිව්වා. "තවම දවස ඉවර නැහැ. අපිට කලින් වගේම කරගෙන යන්නයි තියෙන්නෙ. දැන්, අද රාජකාරිය කරන දෙන්න හැර හැමෝටම යන්න පුළුවන්."

කොල්ලො ආපහු ගෙවල්වල ගියා. මීෂ්කයි මායි තනි වුණා. අපි ආපහු බිත්තර අරගෙන බැලුවා. ඒක පැළීමක් වත් නැද්ද කියලා. ඒත් කිසිම දෙයක් නැහැ. මීෂ්ක පියන වැහුවා.

"කමක් නෑ, මට මොකද මක් වුණත්! ඇත්තම කිව්වොත් තවම බයවෙන්න කල් වැඩියි. අපි හවස් වෙනකල් ඉඳල, එතකොට වත් මොනවත් නොවුණොත් අපට බයවෙන්න පටන්ගන්න පුළුවන්."

අපි බය නොවී ඉන්න හිතලා, සන්සුන් වෙන්න හිත හදාගත්තා. ඒත් ඒක කියන තරම් ලේසි වුණේ නෑ. අපි කොයිතරම් උත්සාහ කළත් බය නොවී ඉන්න බැරි වෙලා මිනිත්තු දහයෙන් දහයට ඉන්කියුබේටරේට එබුණා. අනිත් කොල්ලනුත් බය වෙලා, විස්තර දැනගන්න එන්න පටන් ගත්තා. හැමෝටම තිබුණෙ එකම ප්‍රශ්නෙ: "ඉතින්, මොකක්ද තත්වෙ?"

ටිකකින් මීෂ්ක උත්තර දෙන එක නතරකරලා උරහිස් අකුළගන්න එක විතරක් කළා. ඒත් එයාට නිතරම ඒක කරන්න වෙච්ච නිසා එදා දවස ඉවර වෙද්දි එයාගෙ උරහිස් දෙක කන්දෙක ගාවටම වක ගැහුණා.

හැන්දෑව ගෙවිල යද්දි කොල්ලො එන එක නැවතුණා. වීත්ය තමයි අන්තිමට ආවෙ. එයා හුඟ වෙලාවක් අපිත් එක්ක වාඩිවෙලා හිටියා.

"ඔයාල ගණන් බැලුව වැරදිද?" එයා ඇහුවා.

අපි ආපහු ගණන් හදල බැලුවා. ඒත් ඒකෙ කිසිම වැරැද්දක් නැහැ. මේ තමයි විසි එක්වෙනි දවස. ඒකත් දැන් ඉවර වෙන්න යනවා. ඒත් කුකුළු පැටව් නෑ.

"ගණන්ගන්න එපා," වීත්යා අපිව සනසන්න කිව්වා. "අපි උදේ වෙනකල් ඉඳිමු. එයාල මහ රෑ උපදින්න පුළුවන්."

මම එදා රෑ මීෂ්කලාගෙ ගෙදර නවතිනවට මගේ අම්මව කැමති කරවගත්තා. අපි හිතාගත්තා මුළු රෑම ඇහැරිලා බලා ඉන්න. අපි හුඟ වෙලාවක් ඉන්කියුබේටරේ ළඟට වෙලා සද්දයක් නැතුව හිටියා. අපට කතාකරන්නවත් දෙයක් තිබුණෙ නෑ. අපට හීන මවන්නවත් බැරි වුණා, අපේ බලාපොරොත්තු සුන් වෙච්ච නිසා. ඉක්මනටම පාරෙ ට්‍රෑම් කාර් දුවන එක නැවතිලා. වටපිටාව හොඳටම නිශ්ශබ්ද වුණා. ජනේලෙන් පිට තිබිච්ච වීදි ලාම්පුවත් නිවිල ගියා. මම ගිහින් සෝපාවෙ හාන්සි වුණා. මීෂ්ක ඉඳගෙන නිදි කිරා වැටුණා. එයා පුටුවෙන් වැටෙන්නත් ගියා. ඒ ගමන සෝපාවට ඇවිත් මගේ ළඟින් හාන්සි වුණා. ඉන් පස්සෙ අපිට නින්ද ගියා.

අපි ඇහැරෙනකොට එළි වෙලා. හැම දේම තිබුණ විදියමයි. බිත්තර තාමත් ඉන්කියුබේටරේ පතුලෙ තිබුණා, එක පැළීමක් වත්, ඇතුළෙන් සද්දයක්වත් නැතිව.

කොල්ලො හැමෝම හොඳටම කලකිරිලයි හිටියෙ.

"මොකක්ද වෙන්න ඇත්තෙ?" එයාල ඇහුවා. "අපි උපදෙස් හැම එකක්ම හරියට පිළිපැද්දනෙ, නැද්ද?"

"අනේ මන්ද," මීෂ්ක කිව්ව, උරහිස් හකුළගන්න ගමන්.

මම විතරයි දැනගෙන හිටියෙ මොකද වුණේ කියලා. ආයෙ දෙකක් නෑ, මට නින්ද ගිය වෙලාවෙ කලල ටික මැරිලා. උෂ්ණත්වය පහළ බැහැලා උන් සීතලේ ගල්ගැහිලා. උන්ගෙ ජීවිතේ හරිහැටි පටන්ගන්නත් කලින් මැරිලා.

මට අනිත් අය ඉස්සරහදි මම වැරදිකාරයෙක් වගේ දැනුණා. එයාලට මේ හැම කරදරයක්ම වෙන කවිරුවත් නිසා නෙවෙයි මම නිසා! එත් මට ඒක එයාලට ඒ වෙලාවෙම කියාගන්න බැරි වුණා. මම හිතාගත්තා, මේ මුළු සිද්ධියම අමතක වෙලා, එයාලට කුකුළ් පැටව් නැති වුණ එක ගැන ඇතිවෙච්ච දුක තුනී වුණ දවසක කියන්න.

අපි හැමෝම එදා ඉස්කෝලෙ හිටියෙ හරි දුකෙන්. කොල්ලො හැමෝම අපි දිහා බැලුවෙ, කවුරුහරි කෙනෙක් ගැන වැලපෙනකොට බලනව වගේ අනුකම්පාවෙන්. ඒ වගේම සෙන්ය බොබ්රොව් අපිට 'කුකුළ් රාළල' කියන්න හිතුවම- පුරුද්දට වගේ, අනිත් අය එයාගෙ ඇඟට කඩාපැනල කිව්වා, එයා තමන් ගැනම ලැජ්ජා වෙන්න ඕන කියලා. මීෂ්කටයි මටයි හරිම අසහනයක් දැනුණා.

"මට හිතෙනව, එයාල අපට බැන්න නම් හොඳයි කියලා!" මීෂ්ක කිව්වා.

"මොකටද එයාල එහෙම කරන්නෙ?"

"මේකයි, බලන්නකො එයාල අපි වෙනුවෙන් මහන්සි වුණ තරම. එයාලට තරහගන්න හැම අයිතියක්ම තියෙනවා."

ඉස්කෝලෙන් පස්සෙ, කොල්ලන්ගෙන් එක්කෙනෙක් දෙන්නෙක් ආවා. ඊත් ඉක්මනින්ම එයාලත් එන එක නැවතුණා, වතාවක් දෙකක් ආපු කෝස්ත්ය දෙව්යත්කින් හැර. එයා තමයි තවමත් බලාපොරොත්තු කඩ කර නොගත්තු එකම එක්කෙනා.

"බලන්න," මීෂ්ක මට කිව්වා. "දැන් කොල්ලො හැමෝම අපි එක්ක තරහ වෙලා. මොකටද එයාල එහෙම වෙන්නෙ? මම දැනගන්න කැමතියි! ඕන කෙනෙකුගෙ අතින් වැරැද්දක් වෙන්න පුළුවන්."

"එත් ඔයාමනේ කිව්වෙ, ඒගොල්ලන්ට තරහ ගන්න සාධාරණ අයිතියක් තියෙනව කියලා?"

"ඔව්, තියෙනවා," මීෂ්ක නුරුස්සන විදියට කිව්වා. "ඔයාටත් තියෙනවා, ඒක මගේ වැරැද්ද, මම දන්නවා."

"එක කොහොමද ඔයාගෙ වැරැද්ද වෙන්නෙ? කව්රුවත් ඔයාට කිසිම දේකට බැන්නෙ නෑ. ඒ වගේම ඒක කොහොමටවත් ඔයාගෙ වැරැද්ද නෙවෙයි." මම කිව්වා.

"නෑ, එහෙම තමයි! ඒත් ඔයාට ඒකට මාත් එක්ක කේන්ති යන එකක් නෑනෙ, නේද?"

"මම මොකටද එහෙම වෙන්නෙ?"

"මොකද මම කිසිම වැඩකට නැති මිනිහෙක් නිසා. ඒ මගෙ අවාසනාව. මම අතගහන කිසි දෙයක් හරියන්නෙ නැහැ."

"ඇත්ත ඒක නෙවෙයි, මමයි හැම දේම අවුල් කරන්නෙ." මම කිව්වා. "ඒ ඔක්කොම මගේ වැරැද්ද!"

"නෑ, ඔයාගෙ නෙවෙයි, ඒක මගේ වැරැද්ද. මමයි කුකුළු පැටවුන්ව මැරුවෙ!"

"ඔයා කොහොමද උන් මැරුවා වෙන්නෙ?"

"මම ඔයාට කියන්නම්, ඔයා තරහ ගන්නෙ නෑ කියල විතරක් පොරොන්දු වෙනවද?" මීෂ්ක කිව්වා. "දවසක් උදේ පාන්දර මට නින්ද ගියා. මම ඇහැරිලා උෂ්ණත්වමානය දිහා බලනකොට ඒක 104ට නැගලා. මම ඉක්මනට පියන ඇරල බිත්තර සීතල වෙන්න ඇරියා, ඒත් මම හිතන්නෙ එතකොට මම පරක්කු වුණා වැඩියි."

"ඒ කවදද?"

"දවස් පහකට කලින්."

මීෂ්ක හොඳටම ලැජ්ජාවෙනුයි, දුකෙනුයි හිටියෙ.

"ඒත් ඔයාට බය වෙන්න කාරියක් නෑ," මම එයාට කිව්වා.

"බිත්තර නරක් වුණේ ඊට හුගක් කලින්."

"මොකට කලින්ද?"

"ඔයා නිදියගන්න කලින්."

"කව්ද ඒව නරක් කළේ?"

"මමයි කළේ."

"ඔයා? ඒ කොහොමද?"

"මමත් වැඩිපුර නිදාගත්තා, රස්නෙ අඩු වුණා. බිත්තර නරක් වුණා."

"කවදද ඕක වුණේ?"

"දහවෙනි දවසෙ."

"ඇයි ඔයා එහෙනම් කලින් මොකුත් නොකිව්වෙ?"

"මම ඇත්ත කියන්න බය වුණා. මම හිතුවා, බාගදා කුකුළු පැටව් මැරිල නැතිව ඇති කියලා. ඒත් දැන් මම දන්නව එහෙම වෙලා තියෙන බව."

"ඉතින් ඔයා අර කොල්ලන්ගෙ මහන්සිය, නිකම් වැඩක් නැති දේකට වතුරෙ යන්න ඇරියා," මීෂ්ක මගෙ දිහා තදින් බලාගෙන කිව්වා. "ඔයා ඇත්ත කියන්න බය නිසා."

"මේකයි, මම හිතුව බාගදා ඒකෙන් ප්‍රශ්නයක් වෙන එකක් නෑ කියලා. කොල්ලො ඒක දිගින් දිගටම ගෙනියන්න හිතාවි. නැත්නම් අපට දැනගන්න බැරි වෙන්න තිබුණා කුකුළු පැටව් මැරිලද නැද්ද කියලා."

"අහා, එහෙම කරයිද එයාලා!" මීෂ්ක තරහෙන් කිව්වා. "කොහොමහරි ඔයා කෙලින්ම ඇත්තම කිව්ව නම්, අපි හැමෝටම එකතු වෙලා තීරණයක් ගන්න තිබුණා, ඔයා හැමෝම වෙනුවෙන් තීරණ ගන්නවා වෙනුවට."

"මෙහෙ බලනව," මම කිව්වා, "අහවල් දේකටද ඔයා මට කෑගහන්නෙ? ඇයි එහෙනම් ඔයා ඇත්ත නොකිව්වෙ? ඔයත් වැඩිපුර නිදාගත්ත, නැද්ද හොඳයි?"

"ඔව්. මම කළා," මීෂ්ක පසුතැවීගෙන කිව්වා. "මම නම් ඌරෙක්ම තමයි. ඔයාට මගෙ නහය කොනිත්තන්න පුළුවන්, ඕන නම්."

"මට එහෙම, කරන්න උවමනාවක් නැහැ. එත් ඔයා ඒක කොල්ලන්ට නොකියා ඉන්න වගබලාගන්න," මම කිව්වා.

"හෙට මම එයාලට ඒක කියනවා. ඔයා ගැන නෙවෙයි, මම ගැන. හැමෝම දැනගත්තාවෙ මම මොන ඌරෙක්ද කියලා. ඒක මට හොඳ දඬුවමක් වෙයි."

"හරි, එහෙනම් මමත් ඇත්ත කියනවා," මම කිව්වා.

"නෑ, ඔයා නොකර ඉන්න තරමට හොඳයි."

"ඇයි නැත්තෙ?"

"මෙකයි, ඔයා උන්ගෙ හැටි දන්නවනෙ. එයාල හැම තිස්සෙම අපිට හිනා වෙනවනෙ, අපි හැමදේම එකට කරන නිසා. අපි එකට ඉස්කෝලෙ යනවා, එකට පාඩම් කරනවා විතරක් නෙවෙයි, එකටම අඩු ලකුණුත් ගන්නවා. ඉතින් උන් කියාවි අපි දෙන්නම අපේ වාරවලදී එකටම වැඩියෙන් නිදියගෙන කියලා."

"උන් කියන දෙයක් කියපුවාවෙ," මම කිව්වා. "ඇරත් මට පුළුවන්ද උන් ඔයාට හිනා වෙනකල් බලා ඉන්න?"

කඩ වුණු බලාපොරොත්තු

ඒ දුක්බර දවසත් ඉවරවෙන්න ළං වෙලා ආපහු හැන්දෑ වුණා. කුස්සියෙ තත්ත්වෙ වෙනස් නොවී තිබුණා: ඉන්කියුබේටරේ උණුසුම්, ලාම්පුව තවම පත්තුවෙනවා. ඒත් අපේ බලාපොරොත්තු ඔක්කොම මැරිලා. මීෂ්ක සද්දයක් නැතිව අතේ තියන බිත්තරේ දිහා බලා හිටියා. අපිට හිතාගන්න බැරි වුණා, ඒක කඩන්නද- නැත්නම් තව ටිකක් ඉවසගෙන ඉන්නද කියලා. හිටි හැටියෙම මීෂ්ක මගෙ දිහා ඇසුත් ලොකු කරගෙන බලා ඉන්න ගත්තා. මම හිතුවෙ එයා මගෙ පිටිපස්සෙ අවතාරයක් වත් දැක්ක කියලා. ඉතින් මම ඉක්මනට පිටිපස්ස හැරුණා. ඒත් එතැන කිසි දෙයක් තිබුණෙ නැහැ. මම ආපහු මීෂ්ක දිහාට හැරුණා.

"බලනව," එයා බැරැණ්ඩි කටහඬකින් කිව්වා, බිත්තරේ තිබුණු අත දික්කරන ගමන්.

මුලදි නම් මම කිසිම දෙයක් දැක්කෙ නෑ, ඒත් ඊළඟට මම දැක්කා එක තැනක පුංචි පැළීමක් වගෙ දෙයක් තියෙනවා.

"ඔයා ඒක මොකක හරි වැද්දුවද?"

මීෂ්ක එයාගෙ ඔළුව හෙලෙව්වා.

"එහෙනම්, එහෙනම්... කුකුළු පැටියද ඒක කළේ?"

මීෂ්ක ඔළුව වැනුවා.

මම පරිස්සමෙන් කැඩිච්ච කටුවෙ කෑල්ලක් මගෙ නියපොත්තෙන් උස්සලා, පුංචි හිලක් හැදුවා. ඒ මොහොතෙම පුංචි කහපාට හොටක් හිලෙන් එළියට ඇවිත්, ආයෙ අන්තරස්දාන වුණා.

අපි කොච්චර අන්දමන්ද වුණාද කිව්වොත්, අපිට කතා කරගන්නත් බැරි වෙලා, සතුටින් එකිනෙකාව බදාගත්තා.

"හුරේ! වැඩේ හරි!" මීෂ්ක එහෙම කෑගහල හයියෙන් හිනාවෙන්න ගත්තා. "දැන් අපි කොහාටද දුවන්නෙ? අපි කොහාටද ඉස්සෙල්ලම යන්නෙ?"

"මිනිත්තුවක් ඉන්න!" මම කිව්වා. "මොකක්ද මේ කුලප්පුව? කොහේද ඔයා යන්නෙ?"

"අපිට කොල්ලන්ට ගිහින් කියන්න තියෙනවා!" එයා දොර ළඟට දිව්වා.

"ඉන්න!" මම කිව්වා. "බිත්තරේ ආපහු තියල ඉන්න. ඔයා ඒකත් අරන් යන්නද හදන්නෙ?"

මීෂ්ක ආපහු ඇවිත් බිත්තරේ ඉන්කියුබේටරේට දැම්මා. ඒ මොහොතෙම කෝස්ත්‍ය ආවා.

"අපට දැනටමත් කුකුළ පැටියෙක් ඉන්නවා!" මීෂ්ක කෑගැහුවා.

"ඔයා පච ගහනව!"

"දෙයියම්පල්ලා!"

"කෝ එහෙනම්?"

මීෂ්ක ඉන්කියුබේටරේ පියන ඇරියම, කෝස්ත්‍ය ඇතුළට එබිල බැලුවා.

"කෝ කුකුළ පැටියා? මට නම් පේන්නෙ බිත්තර විතරයි."

මීෂ්කට අමතක වෙලා, පිපිරිලා තිබුණ බිත්තරේ තිව්ව තැන. දැන් එයාට ඒක හොයාගන්න බැහැ. අන්තිමේදී එයා ඒක හොයාගෙන හරිම සතුටින් කෝස්ත්‍යට පෙන්නුවා.

කෝස්ත්‍ය සතුටින් කෑගැහුවා. "බලන්න, ඒක අස්සෙන් ඇත්තටම කුකුළ හොටක් එළියට එනවා."

"දෙයියන්පල්ල ඒක ඇත්ත තමයි. ඔයා හිතුවෙ ඒක ඇස්බැන්දුමක්, නැත්නම් මොකක් කියලද?"

"ඉන්න කොල්ලනේ. ඔයාල ඔය බිත්තරේ තියන් ඉන්න. මම ගිහින් අනිත් උන්ව එක්ක එනකල්." කෝස්ත්ය කිව්වා.

"ඒක හරි, ගිහින් ඒගොල්ලන්ව එක්කන් එන්න. එයාල විශ්වාස කළේ නැහැ එක පැටියෙක්වත් ලැබෙයි කියල. මුළු හැන්දෑ ජාමෙටම කව්රුවත් ආවෙ නැහැ."

"එතන තමයි ඔයාල වරද්දගෙන තියෙන්නෙ. ඒ හැමෝම අපේ ගෙදර ඉන්නවා. එයාල තවමත් කුකුළු පැටව් ගැන විශ්වාස කරනවා. ඒත් එයාල ඔයාලට කරදර කරන්න බයයි. ඉතින් එයාල අලුත් තත්ත්වය මොකක්ද කියල හොයන්න මාව එව්වා."

"මොකටද එයාල බය වෙන්නෙ?"

"මෙකයි, එයාල දනගෙන හිටියා ඔයාල ඒ ගැන කොච්චර දුකෙන්ද ඇත්තෙ කියලා. ඉතින් එයාලට මේ පැත්තට එන්න ඕන වුණේ නැහැ."

කෝස්ත්ය එළියට ගියාම, අපිට ඇහුණා එයා පඩිපෙළ දිගේ දුවන සද්දෙ, වතාවකට පඩි තුනක් වෙන්න!"

"දෙයියෝ සාක්කි!" මීෂ්ක කෑගැහුවා. "මම තවම අම්මට කිව්වෙ නැහැ!"

එයා එයාගෙ අම්මට කියන්න දිව්ව අතරෙ, මම බිත්තරේ අරන් දිව්වා මගෙ අම්මට පෙන්නන්න.

අම්ම ඒක දිහා බලල, මට කිව්ව දුවල ගිහින් ඒක ආපහු ඉන්කියුබේටරෙන් තියන්න, නැත්නම් ඒක සීතල වෙලා, කුකුළු පැටවුන්ට සීතල හැදෙන්න පුළුවන් කියල.

මම ආපහු මීෂ්කගෙ ගෙදරට දිව්වම මම දැක්කා, එයා කුස්සිය මැද්දෙ කුලප්පු වෙලා ඉන්නවයි, එයාගෙ අම්මයි තාත්තයි හිටගෙන එයාව හිනා වෙනවයි. මාව දැක්ක ගමන්ම මීෂ්ක මගෙ ඇඟට කඩා පැන්නාඃ

"ඔයා දැක්කද මම කොහේද අර බිත්තරේ තිව්වෙ කියලා? මම මුළු ඉන්කියුබේටරේම අනිත් පැත්ත පෙරලල වත් මට ඒක හොයාගන්න බැරි වුණා."

"මොන බිත්තරේද?"

"ඔයා දන්නවනෙ... අර කුකුළු පැටිය ඉන්න එක!"

"මෙන්න ඒක," මම කිව්වා.

මීෂ්ක, මගේ අතේ බිත්තරේ තියෙනව දැකල තව ඩිංගෙන් කලන්තෙ දානවා.

"ගොන් බූරුවා! මොකක්ද ඔයා බිත්තරේ අරන් දූවල කළේ!"

"සද්දෙ නවත්තන්න," මීෂ්කගෙ අම්ම කිව්වා. "මේ මුළු ගාලගෝට්ටියම බිත්තරේකට!"

"ඒත් අම්මෙ, ඒක සාමාන්‍ය බිත්තරයක් නෙවෙයි, බලන්න ඒක දිහා!"

මීෂ්කගෙ අම්ම බිත්තරේ අරගෙන, අර හිලෙන් පේන චූටි හොට දිහා බැලුවා.

"හ්ම්," එයා හිනාවෙලා කිව්වා "විශිෂ්ටයි!"

"ඒකෙ කිසිම විශිෂ්ටත්වයක් නෑ," මීෂ්ක හරි බැරෑරුම් පෙනුමක් ආරූඪ කරගෙන කිව්වා. "ඒක ස්වභාවික සංසිද්ධියක්."

"ඔයත් ස්වභාවික සංසිද්ධියක්," මීෂ්කගෙ තාත්තා හිනා වුණා. "කුකුළු පැටියගෙ නම් විශිෂ්ට දෙයක් නෑ තමයි. විශිෂ්ට වෙන්නෙ ඌ ඔයගොල්ලන්ගෙ ඉන්කියුබේටරෙන් ඉපදිච්ච එක. මමත් පිළිගන්න ඕන, මමත් ඒකෙන් මොකෙක්වත් ඒවි කියල නොහිතපු බව."

"ඇයි ඔයා එහෙම නම් කලින් මොනවත් නොකිව්වෙ?"

"ඒ මොකටද? මම ඔයාල බිත්තර රකින්න කාලෙ ගතකරනවාට කැමතියිනෙ, පාරෙ දූවනවට වඩා."

ඒ මොහොතෙ මායා කුස්සියට ආවා. එයාට කුකුළු පැටියෙක් ගැන ඇහෙනකොටත් එයා හිටියෙ ඇඳේ. ඒකයි එයා කලබලේට ගවුම ඉස්සරහ පස්සට ඇඳගෙන, කකුල්වලට මේස් නැතිව සපත්තු දාගෙන හිටියෙ. අපි එයාට මිනිත්තුවක් දෙකක් බිත්තරේ අල්ලන් ඉන්න ඉඩ දුන්නා. එයා බිත්තරේ හිලට ඇහැ තිච්ච විතරයි, කුකුළු පැටිය හොට එළියට දැම්මා.

මායා බෙරිහන් දුන්නා "එයා මට කොටන්න හැදුවා!"

"ඔයා- නරක කුකුළ පැටිය ඔයා! කටුවෙන් එළියට ඇවිල්ල වත් නැතිව එනව මෙතන රණ්ඩුවට."

"ඔයා අලුත ඉපදිච්ච කුකුළ පැටියෙකුට ඔහොම කෑගහන්න හොඳ නැහැ!" මීෂ්ක කිව්වා. "ඔයා උෟව බය කරනවා." එයා බිත්තරේ අරන් ඒක ආපහු ඉන්කියුබේටරෙන් තිව්වා.

ඒ මොහොතෙ පඩිපෙළ පැත්තෙන් දුවන කකුල්වල සද්දයක් ආවා. ඉක්මනින්ම කුස්සිය කොල්ලන්ගෙන් පිරුණා. බිත්තරේ ආපහු එළියට අරන් හැමෝටම පේන්නන්න සිද්ධවුණා. හැමෝටම ඕන වුණා හිලෙන් එබිල පැටියව දකින්න.

"කොල්ලනේ," මීෂ්ක කෑගැහුවා. අපිට ආපහු බිත්තරේ දෙනවලා. අපිට ඒක ඉන්කියුබේටරෙන් තියන්න ඕන. නැත්නම් කුකුළ පැටියට සීතල හැදෙයි."

ඒත් කවුරුවත් එයාව ගණන්ගත්තෙ නෑ. අපිට බලෙන්ම බිත්තරේ ආපහු ගන්න සිද්ධවුණා.

"අනිත් බිත්තරවල තවම පිපිරිලි නැද්ද?" විත්ය ඇහුවා. අපි අනික් බිත්තරත් පිරික්සලා බැලුවා. ඒත් තව පැළීම් තිබුණෙ නැහැ.

"නෑ, අංක පහ තමයි එකම එක. අනිත් ඒව පිපිරිලා නැහැ," මීෂ්ක කිව්වා.

"සමහර විට ඒව පස්සෙ පුපුරයි." කොල්ලො කිව්වා.

"ඒකට කමක් නැහැ," මීෂ්ක කිව්වා. එක පැටියෙක් විතරක් ඉපදුණත් මට සතුටක්. එතකොට මොනව වුණත් අපේ මහන්සිය වතුරෙ ගියා නෙවෙයිනෙ!"

"අපි කටුව කඩල පැටියව එළියට ගන්න ඕන නැද්ද?" සෙන්ය බොබ්රොව් ඇහුවා. "එයාට හරි අපහසු ඇති එතන ඉන්න එක."

"අපොයි නැහැ," මීෂ්ක කිව්වා. "කටුවට අත තියන්නවත් හොඳ නැහැ. පැටියගෙ හම තවම හරි තුනියි. ඉතින් උෟට රිදෙන්න පුළුවන්."

කොල්ලො හැමෝම ටිකක් වෙලා ඉඳලා යන්න ගියා. හැමෝටම ඕන වුණා එතන නතරවෙලා කුකුළ පැටිය කටුවෙන් එළියට එන හැටි බලන්න.

ඒත් ඒ වෙනකොටත් පරක්කු වැඩියි. ඉතින් එයාලට ගෙවල්වල යන්න වුණා.

"කමක් නෑ," මීෂ්ක කිව්වා. "මේ එකම පැටිය නෙවෙයිනෙ, ඔයාල බලන්නකො, අනිත් උනුත් ඉක්මනට එන්න ගනීවි."

කොල්ලො ගියාට පස්සෙ මීෂ්ක ආපහු බිත්තර පරීක්ෂා කරල, තවත් පැළීමක් හොයාගත්තා.

"බලන්න," එයා කෑගැහුවා. "අංක එකොළහත් පිපිරෙන්නයි යන්නෙ!"

මම බැලුවා, ඔව්, ඇත්ත තමයි. අංක එකොළහ කියල ලියල තිබුණ බිත්තරෙත් පිපිරීමක් තිබුණා.

"අපරාදෙ කොල්ලො ටික ගියේ," මම කිව්වා. "දැන් උන්ගෙ පස්සෙ දුවන්නත් පරක්කු වැඩියිනෙ."

"ඔව්, එහෙමත් අපරාධයක්!" මීෂ්ක කෙඳිරුවා. "ඒත් කමක් නෑ, හෙට එයාල පැටව් ඉපදිලා ඉන්නව දකීවි."

අපි ඉන්කියුබේටරේ ළඟින් ඉඳගත්තා සන්තෝසෙන් ඉපිලී ඉපිලී.

"ඔයයි මමයි නම් ඇත්තටම වාසනාවන්තයි," මීෂ්ක කිව්වා. "මම හිතන්නෙ මේ ලෝකෙ අපි තරම් වාසනාවන්ත අය ටිකදෙනයි ඉන්නෙ."

රෑ වුණා. හැමෝම ඇඳට ගිහින් හුඟක් කල්. ඒත් මීෂ්කටයි මටයි පොඩ්ඩක් වත් නිදිමත නැහැ. කාලෙ ඉක්මනට ගෙවිල ගියා. පාන්දර දෙකට විතර තවත් බිත්තර දෙකක් පිපිරුණා: අංක 8යි, 10යි. අපි ඊළඟ වතාවෙ ඉන්කියුබේටරේට එබිල බලනකොට, ලොකු පුදුමයක් අපි එනතුරු බලා හිටියා. බිත්තර අතරෙ හිටියා අලුත උපන් කුකුළු පැටියෙක්! ඌ වැටි වැටී හිටගන්න හද හදා හිටියෙ. මට සන්තෝසෙට හුස්මත් හිර වුණා.

මම කුකුළු පැටියව අතට ගත්තා. ඌ තවම තෙතයි. පිහාටු වෙනුවට උගෙ රෝසපාට පිට පුරාම අපිළිවෙළට තිබුණෙ කහපාට පෙඳ.

මීෂ්ක උණුසුම් කරන බඳුනෙ පියන ඇරියාම මම ඌව ඇතුළට දාලා, යටින් තියෙන භාජනේට උණුවතුර එකතු කළා, පැටියව උණුසුම් කරන්න.

"එතන හරි උණුසුම්. ඌ ඉක්මනට වේළිලා, ලස්සනට ලොම් පිරිල ඉඳීවි." මීෂ්ක කිව්වා.

එයා බිත්තර කටු කෑලි දෙක ඉන්කියුබේටරෙන් එළියට ගත්තා. "අච්චර යෝධ පැටියෙක් මේ තරම් පොඩි කටුවකට හරියන එක නම් ලෝක පුදුමයක්!"

ඇත්තටම කුකුළු පැටිය යෝධයෙක් වගේ තමයි පෙනුණෙ, කටුවත් එක්ක බැලුවාම. ඒත් ඇත්තටම ඌ ඒක ඇතුළෙමයි ගුලිගැහිල හිටියෙ, කකුලුත් එයාගෙ ඇඟ යටට දාගෙන, ඔළුවත් නවාගෙන. ඒත් අපූරුවට දැන් ඌ කෙළින් වෙලා හිටියෙ උගෙ බෙල්ලත් උස්සගෙන.

මිෂ්ක කැඩුණු කටුව දිහා බලා ඉන්න ගමන් තමයි, හදිසියෙම බෙරිහන් දුන්නෙ:

"බලනවා, මේ වැරදි පැටියා!"

"මොනවද ඔයා කියන්නෙ, වැරදි පැටියා?"

"මේ පළවෙනි එකා නෙවෙයි! ඉස්සෙල්ලම කටුව කැඩුවෙ අංක 5. මේ අංක එකොළහ"

සහතිකවම කටුවෙ ලියල තිබුණෙ අංක 11. අපි ඉන්කියුබේටරේට එබුණා. අංක 5, අපි ඌව තියපු තැනටම වෙලා හිටියා.

"මොකක්ද ඌට වෙලා තියෙන්නෙ? මම ඇහුවා. "ඌ තමයි ඉස්සරවෙලාම කටුව කැඩුවෙ. ඒත් දැන් ඌ එළියට එන්නෙ නෑ!"

"ඌ තවම තනියෙන් කටුව කඩාගන්න දුර්වල වැඩි ඇති," මිෂ්ක කිව්වා. "ඌට ටිකක් ඉන්න අරිමු, බාගදා ටිකකින් ඌ ශක්තිමත් වේවි."

අපේ වැරැද්ද

අපි කොච්චර කාර්යබහුල වෙලා හිටියද කිව්වොත් අපිට උදේ වෙච්ච බව වත් දැනුණෙ නෑ, ජනේලෙ ළඟ ඉර පායල තියෙනව දකිනකල්. ලස්සන ඉරු රැස් කුස්සියේ බිම සෙල්ලම් කළා, කාමරේ තවත් දීප්තිමත් කරලා.

"ඔයා බලන්නකො, කොල්ලො ඉක්මනටම එන්න ගනීවි." මිෂ්ක කිව්වා. "ඒගොල්ලන්ට ඉස්පාසුවක් නැතිව යාවි."

ඒ වචන ටික එයාගෙ කටින් පිටවුණා විතරයි, එයින් දෙන්නෙක් ආවා- ෂේන්යයි, කෝස්ත්යයි.

"ප්‍රාතිහාර්යයක් දකින්න කැමතිද?" උණුසුම් කරන බඳුනෙන් අලුත උපන් කුකුළු පැටියව එළියට ගන්න ගමන් මීෂ්ක කෑගැහුවා :

"මෙන්න! සොබාදහමේ හාස්කමක්."

කොල්ලො කතාවක් නැතිව කුකුළු පැටිය දිහා බැලුවා.

"තවත් බිත්තර තුනක් පුපුරලා," මීෂ්ක කයිවාරු ගැහුවා. "බලනවල, අංක 5, 8 සහ 3."

කුකුළු පැටිය සීතලට කොහෙත්ම කැමති වුණේ නෑ. අපි ඌව අතට ගත්තාම, ඌ නලියන්න ගත්තා. ඒත් ආයෙම උණුසුම් කරන බඳුනෙන් තිව්ව ගමන්ම ඌ සන්සුන් වුණා.

"ඔයාල උන්ට කන්න දුන්නද?" කෝස්ත්ය ඇහුවා.

"නැහැ," මීෂ්ක කිව්වා. තවම කල් වැඩියි. උන්ට කන්න දෙන්නෙ ඉපදුණුදාට පස්සෙන්ද."

"මම හිතන්නෙ, ඔයාල මුළු රෑම නිදාගන්න නැතිව ඇති?' ෂෙන්ය කිව්වා.

"නෑ අපිට වැඩ හුගක් තිබුණා."

"එහෙනම් අපි ටිකක් මේ‍ා බලාගන්නම්. ඔයාල ගිහින් පොඩි නින්දක් දාන්න." කෝස්ත්ය යෝජනා කළා.

"හොඳයි, ඒත් තව කුකුළු පැටියෙක් ඉපදුණොත් අපිව ඇහැරවන්න පොරොන්දු වෙන්න."

"නැතුව."

මීෂ්කයි මමයි කව්ච්චියෙ දිගාවෙලා නින්දට වැටුණා. ඇත්තම කියනවනම් මම හුග වෙලාවක් තිස්සෙ නිදිමතින් තමයි හිටියෙ. කොල්ලො අපිව ඇහැරෙව්වා, දහයට විතර.

"ඇවිත් බලනවල ප්‍රාතිහාර්යය අංක 2!" කෝස්ත්ය කෑගැහුවා.

"ප්‍රාතිහාර්යය අංක මොකක්?" මම කෙඳිරිගෑවා, බාගෙට නිදිමතේ. මම වටපිට බලනකොට දැක්කා, මුළු කුස්සියම කොල්ලන්ගෙන් පිරිල තියෙනවා.

"මෙන්න ඒක!" එයාල කෑගහලා, උණුසුම්කරන බඳුනට අත දික්කළා.

මීෂ්කයි මමයි බිමට පැනල, බඳුන ළඟට දුවල ගියා. එතකොට එතැන දෙන්නෙක්ම ඉන්නවා. එකෙක් ලොම් පිරිච්ච, රවුම්, බිත්තර කුඩු වගේ කහපාටයි. ඇත්තටම රූප සුන්දරියක්!

"මාරයි නේද ඌ!" මම කිව්වා. "ඇයි පළවෙනි එකා අච්චර හඩු පාට?"

කොල්ලො හිනා වුණා. "ඒකා තමයි පළවෙනි එකා!"

"මොකාද?"

"මහත එකා."

"නෑ, ඌ නෙවෙයි. ඌ අර වැහැරිච්ච එකා."

"වැහැරිච්ච එකා තවම ඉපදුණා විතරයි. පළවෙනිය හොඳට වේලිච්ච හන්දයි ඌ ලොම් පිරිල පේන්නෙ."

"අපූරු වැඩක් නෙවෙයිද ඒක!" මම කිව්වා. "එතකොට දෙවෙනි එකාත් ලොම් පිරිල ඉඳීවිද, ඌ වේළුණාම?"

"නැත්නම්."

"ඌ අංක කීයද?" මීෂ්ක ඇහුවා.

කොල්ලො අන්දමන්ද වුණා.

"මම හිතුවෙ හැම බිත්තරේටම අංකයක් තියෙන බව ඔයාල දන්නව ඇති කියල." මීෂ්ක කිව්වා.

"නෑ, අපි අංකයක් ගැන නම් හෙව්වෙ නෑ," කෝස්ත්‍ය කිව්වා.

"අපිට ඒක කටුවෙන් හොයන්න පුළුවන්." මම කිව්වා. "කටුව තවම ඇත්තෙ ඇතුළෙ."

මීෂ්ක ඉන්කියුබේටරේට එබිල බෙරිහන් දුන්නා:

"මෙන්නෝ! ඒකෙ තවත් අලුත් පැටව් දෙන්නෙක් ඉන්නෝ..!"

හැමෝම ඉන්කියුබේටරේ ළඟට දිව්වා. මිෂ්ක පරිස්සමෙන් තවත් කුකුළු පැටව් දෙන්නෙක් අරන් අපිට පෙන්නුවා.

"මේ ඉන්නෙ උන්, රාජාලියෝ!" මිෂ්ක ආඩම්බරෙන් කිව්වා. අපි උන්වත් අනිත් දෙන්නත් එක්ක උණුසුම් කරන බඳුනෙත් තිව්වා. දැන් අපිට කුකුළු පැටව් හතරදෙනයි. උන් උණුසුමට ගුළිගැහුණා.

මිෂ්ක කැඩිච්ච කටු ටික ඉන්කියුබේටරෙන් එළියට අරන් අංක පෙව්වා.

"අංක 4, 8 සහ 10," එයා කිව්වා. "ඒත් මොකා මොකාද?"

"ඇත්තටම ඔයාලට දන්නම් කියන්න බෑ, උන් මොකෙන්ද ඉපදිලා තියෙන්නෙ කියලා." කොල්ලො හිනා වුණා. "අංක ඔක්කොම කවලම් වෙලා!"

"අංක 5 තවම ඉන්කියුබේටරේ!" මම කිව්වා.

"ඔව්මයි," මිෂ්ක කෑගැහුවා. "ඌට මක් වෙලාද? බාගදා ඌ මැරිල වත්ද?"

අපි අංක 5 එළියට අරගෙන, සිදුර තව පොඩ්ඩක් පළල් කළා. කුකුළු පැටියා සද්දයක් නැතිව ඒක ඇතුළෙ හිටියා. ඌ උගෙ ඔළුව හෙලෙව්වා.

"හුරේ! ඌට පණ තියෙනවා!" අපි කෑගහල ඌව ආපහු ඉන්කියුබේටරේ ඇතුළෙන් තිව්වා.

මිෂ්ක ඉතිරිවෙලා තිබුණ බිත්තර ආපහු සෝදිසි කරලා, තවත් පැළීමක් සොයාගත්තා, නොම්මර තුනේ. කොල්ලො අප්පුඩි ගැහුවා. හැම දේම අන්තිමේදි යස අපූරුවට සිද්දවෙනවා!

ටිකකින් මායා ආවා. අපි එයාට කුකුළු පැටවුන්ව පෙන්නුවා.

"මෙයා මගේ!" එයා ලොම් පිරුණු එකා ඩැහැගන්න හදන ගමන් කිව්වා.

"මිනිත්තුවක් ඉන්න," මම කිව්වා. "ඌව ඩැහැගන්න එපා. ඌට ටිකක් ඔය උණුසුම්කරන භාජනේට වෙලා ඉන්න වෙනවා. නැත්නම් ඌට සීතල හැදේවි."

"කමක් නෑ, මම ඌව පස්සෙ ගන්නම්. ඒත් ලෝම ගොඩාක් තියෙන එකා තමයි මගේ. මට කෙට්ටු එකෙක්ව නම් එපා."

ඒ ඉරිදාවක්. එදා ඉස්කෝලෙ නොතිබුණ හින්දා කොල්ලො මුළු දවසම ගත කළේ අපේ කුස්සියේ. මීෂ්කයි මායි, වැඩේ ගෞරවේ ලැබිල, ඉන්කියුබේටරේ ළඟ ඉඳගෙන හිටියා. දකුණු පැත්තෙ උඳුන ළඟ, අලුත උපන් කුකුළු පැටව් ඉන්න උණුසුම් බඳුන. උඳුනෙ උණුවතුර භාජනේ. ජනෙල් පඩියෙ දනටමත් කොළපාට වෙච්ච ඕට්ස් තියෙන පෙට්ටි. කොල්ලො හිනා වුණා, විහිළු කරගත්තා, හැම ජාතියෙම ලස්සන කතන්දරත් කියාගත්තා.

"ඔයාල හොයාගත්තද එයාල එන්න හිටපු දවසෙ ආවෙ නැත්තෙ ඇයි කියල?" එක කොල්ලෙක් ඇහුවා. "ඔයාල හිටියෙ උන් සිකුරාද එනකම්."

"මට හිතාගන්න බෑ මොනව වුණාද කියලා," මීෂ්ක උත්තර දුන්නා. "පොතේ තියෙන්නෙ උන් ඉපදෙන්නෙ විසි එක්වෙනි දවසෙ කියලා. ඒත් මේ විසි තුන. බාගදා පොත ලියපු මිනිස්සුන්ට වැරැද්දක් වෙලා ඇති."

"කව්රුහරි වැරැද්දක් කළා නම්, ඒ ඔයාල." ලියෝෂ කුරොච්කි කිව්වා. "කවදද ඔයාල බිත්තර ඉන්කියුබේටරේට දැම්මෙ?"

"තුන්වෙනිදා. එදා සෙනසුරාදාවක්. මට ඒක හොඳට මතකයි, පහුවෙනිද ඉරිද හන්දා"

"මෙ අහනවා," ෂේන්ය ස්ක්වෝර්ත්සොව් කිව්වා. "ඔතන වැරැද්දක් තියෙනවා! ඔයාල බිත්තර තිව්වෙ සෙනසුරාදා. එතකොට විසි එක්වෙනි දවසත් සෙනසුරාදා."

"එයා හරි," වීත්ය ස්මිර්නව් කිව්වා. "ඔයාල පටන්ගත්තෙ සෙනසුරාදා නම්, විසි එක්වෙනි දවසත් සෙනසුරාදා දවසක්. සතියකට දවස් හතක් තියෙනවා, එතකොට දවස් විසි එකක් කියන්නෙ හරියටම සති තුනයි."

"තුන්වරක් හත විසි එකයි!" සෙන්ය බොබ්රොව් හිනාවුණා. "මොනව නැතත් එහෙම තමයි චක්කරේ තියෙන්නෙත්."

"මම දන්න චක්කරයක් නම් නෑ, ඒත් එහෙම තමයි මම ඒක ගණන් කළේ." මීෂ්ක තරහෙන් කිව්වා.

"කොහොමද ඔයා ගණන් කළේ?"

"මම ඔයාලට කියන්නම්කො," මීෂ්ක ඇඟිලි ගැණ ගැණ කිව්වා.

"තුන්වැනිද පළවෙනි දවස, 4 වෙනිද දෙවෙනි දවස, 5 වෙනිද තුන්වැනි දවස ..." එයා සිකුරාද වෙනකල් ගණන් කරල දවස් විසි එකක් ගැන්න. සෙන්ය අන්දමන්ද වුණා.

"ඒක නම් විකාරයි. චක්කරේ කියන්නෙ, විසි එක්වැනිද එන්නෙ සෙනසුරාද කියලා. ඒත් ඔයා ඔයාගෙ ඇඟිලි ගැන්නම ඒක එන්නෙ සිකුරාදා."

"ආපහු අපට පෙන්නන්නකො ඔයා ගණන් හදපු විදිය." ෂේන්ය කිව්වා.

"බලන්න, " මීෂ්ක ආපහු ඇඟිලි නවාගන්න ගමන් කිව්වා. "තුන්වැනිද -සෙනසුරාදා පළවෙනි දවස, ඉරිදා -හතරවෙනිද දෙවැනි දවස .."

"මිනිත්තුවක් ඉන්න, ඔයා වැරදියි! ඔයා තුන්වැනිදා පටන්ගත්ත නම්, ඔයාට ඒ දවස ගණන් කරන්න බෑ."

"ඇයි?"

"මොකද ඒ දවස එතකොට ඉවරවෙලා නැති නිසා. ඒක ඉවරවෙන්නෙ නෑ හතරවෙනිද වෙනකල්. ඒ කියන්නෙ ඔයා ගණන් කරන්න ඕන හතරවෙනිද ඉඳලා."

එතකොටම මීෂ්කටයි මටයි ඒක තෙරුම් ගියා. මීෂ්ක අලුත් විධියට ගණන් කරල බැලුවාම ඒක හරි ගියා."

"ඔව් ඇත්ත," එයා කිව්වා. "ඊයෙ තමයි විසි එක්වෙනිදා."

"එහෙනම් හැම දේම වෙන්න ඕන විධියට වෙලා," මම කිව්වා. "අපි ඉන්කියුබේටරේට් බිත්තර දැම්මෙත් සෙනසුරාද හැන්දෑවෙ. පළවෙනි පැටියා මතු වුණෙත් සෙනසුරාද හැන්දෑවෙ. හරියටම දවස් විසි එකකට පස්සෙ."

"ඔන්න බලන්න, ඔයාලට කොච්චර කරදර අඩුකරගන්න පුළුවන්ද කියලා, හරියට ගණන් කරන්න දන්නව නම්," වාන්ය ලොස්කින් කිව්වා.

හැමෝම හිනා වුණා.

"ඔව්," මීෂ්ක කිව්වා. "අපි ඒ ගොන් වැඩේ නොකළා නම්, අපිට බොරු බයෙනුයි කරදර ගොඩකිනුයි නිදහස් වෙන්න තිබුණා."

උපන් දිනය

ඒ දවස අවසානෙදි කුකුළු පැටව් දහයක්ම අපේ උණුසුම් බඳුන ඇතුළෙ හිටියා. අන්තිමට ආවෙ අංක 5. එයාට කිසිම ඕනෑකමක් තිබුණෙ නැහැ එළියට එන්න. ඉතින් අපිට බිත්තරේ මුදුන කඩන්න වුණා, ඌව එළියට ගන්න. අපි ඒක කළේ නැත්නම් ඌ දනුත් එතැනම ඉඳීවි. එයා අනිත් පැටවුන්ට වඩා පොඩියි වගේම දුර්වලයි, එච්චර කාලයක් කටුව ඇතුළෙ හිටපු නිසා.

හැන්දෑ වෙද්දි බිත්තර දෙකයි ඉන්කියුබේටරේ ඇතුළෙ ඉතිරිවෙලා තිබුණෙ. ඒව තනිවෙලා, තවම එක පැළුමක් වත් නැතිව හරිම දුක හිතෙන විදියට තිබුණා. අපි ඉන්කියුබේටරේ ලාම්පුවත් නිවන්නෙ නැතිව තිව්වා. ඒත් ඒව රෑ වත් පිපිරුවෙ නෑ. අලුත ඉපදුණු පැටව් හැමෝම රෑ කාලෙ උණුසුම් බඳුන ඇතුළෙ සනීපෙන් ගත කළා. අද උදේ උන්ව බිමින් තිව්වා. කිව් බව් ගාන කහපාට ලොම් බෝල ගොඩක් වගේ. උන්, උන්ගෙ චූටි ඇස් ගහ ගහ සැර එළියෙන් ඈතට වුණා. සමහරු උන්ගෙ චූටි කකුල්වලින් අගේට හිටගත්තා. ඒත් අනිත් උන් තවම බකලයි. සමහරු දුවන්න පවා හැදුවා. ඒත් උන් ඒකට එච්චර දක්ෂ වුණේ නැහැ. සමහර වෙලාවට උන් පොළොවෙ තිබුණ පුංචි පැල්ලම් වලටයි බිම තිබ්බච දිලිසෙන ඇණ වලටයි කෙටුවා.

"අර බලන්න, උන්ට බඩගිනියි!" මීෂ්ක කෑගැහුවා.

අපි ඉක්මනට බිත්තරයක් තම්බලා, ඒක හොඳහැටි කෑලිවලට කඩලා බිමින් තිව්වා. ඒත් කුකුළු පැටවුන්ට ඒකට මොනව කරන්නද කියලා තේරුණේ නැහැ. අපි උන්ට අපේ අත්වලින් කවන්න හැදුවා.

"කනවල මෝඩයිනේ," අපි කිව්වා. ඒත් කුකුළු පැටව් කෑම දිහා බැලුවෙ වත් නෑ. එතකොටම මීෂ්කගෙ අම්ම කුස්සියට ආවා.

"උන් බිත්තර පොඩ්ඩක් වත් කන්නෙ නෑ අම්මෙ," මීෂ්ක කිව්වා.

"ඔයාල උන්ට උගන්නන්න ඕන."

"කොහොමද? අපි උන්ට කන්න කියල කිව්වා. ඒත් උන් අපි කියන දේ අහන්නෙ නෑ."

"ඒක නෙවෙයි කුකුළු පැටවුන්ට උගන්නන විදිය. ඔයාල පොළොවට ඇඟිල්ලෙන් තට්ටු කරන්න ඕන."

මීෂ්ක කුකුළු පැටව් ළඟින් ඉඳගෙන, බිත්තර කෑලි ළඟ බිමට තට්ටු කළා. කුකුළු පැටව්, ඇඟිල්ල කෑමවලට කොටනව දැකලා, එයාලත් ඒකම කරන්න ගත්තා. මිනිත්තු කීපෙකින් උන් මුළු බිත්තරේම කාලා ඉවර කළා. ඊළඟට අපි එතනින් වතුර දාපු පීරිසියක් තිව්වම උන් ඒකත් බීල දැම්මා. ඒක නම් එයාලට උගන්න ඕන වුණේ නැහැ. ඊළඟට උන් ගුළි ගැහුණම අපි උන්ව උණුසුම් කරන බඳුනට දැම්මා, උණුසුම් වෙන්න.

මාරියා පෙත්රොව්න පන්තියට ආවම, අපි හැමෝම දිව්ව එයාව හම්බවෙලා අපේ කුකුළු පැටව් ඉපදිච්ච ආරංචිය කියන්න. එයා හුඟාක් සතුටු වුණා.

"එහෙනම් මේ ඔයාලගෙ කුකුළු පැටවුන්ගෙ උපන් දිනේ," එයා කිව්වා. "මම ඔයාලට සුබ පතනවා."

අපි හැමෝම හිනා වුණා. එතකොට විත්ය සම්ර්නව් කිව්වා:

"අපි උන්ට උපන්දින සාදයක් දාන්න ඕන. අපි අද ඒක තියමු."

හැමෝම ඒ අදහසට කැමති වුණා.

"ඔව්, තියමු තියමු. මරියා පෙත්රොව්නා, ඔයා අපේ කුකුළු පැටවුන්ගෙ උපන්දින උත්සවේට එනවද?"

"ස්තුතියි, මම කැමැත්තෙන්ම එන්නම්." මාරියා පෙත්රොව්නා හිනාවෙවී කිව්වා. "මම උන්ට තෑග්ගකුත් ගේන්නම්"

"අපි හැමෝමු උන්ට තෑගි ගේන්න ඕන." කොල්ලො කෑගැහුවා. ඉස්කෝලෙ ඇරිලා ගෙදර ආවම මීෂ්කයි මමයි ඉවසිලි නැතිව හිටියෙ අමුත්තො එනකල්. අපි ආසාවෙ මැරි මැරී හිටියෙ අපෙ කුකුළු පැටවුන්ට මොනවගේ තෑගි ලැබේවිද කියල දැනගන්න.

සෙන්ය බොබ්රොව් ඉස්සෙල්ලම ආව මල් පොකුරකුත් අරන්.

"ඕක මොකටද?" මීෂ්ක ඇහුවා.

"කුකුළු පැටවුන්ට. ඒක මගේ තෑග්ග."

"කවද කුකුළු පැටවුන්ට මල් දෙන්නෙ? උන්ට ඒව කන්න පුළුවනෑ, බැහෙ?"

"උන්ට ඒව කන්න ඕනෑ නෑ. එයාලට ඒව බලන්නයි සුවඳ විඳින්නයි පුළුවන්."

"මාර අදහසක්! හරියට උන් කලින් මල් දැකල නැතිව වගේ."

"ඔව්, නෑ තමයි. මට ඒව දාන්න බුජමක් දෙන්නකො. ඔයාලට පෙනේවි ඒව කොච්චර ලස්සනද කියලා.

අපි බුජමක් අරන් මල් ටික වතුරෙ දැම්මා. ඊළඟට ආවෙ සෙරියෝසයි වදිකුයි. ඒ දෙන්නම ස්නෝඩ්‍රොප් මල් පොකුරු ගෙනාවා.

"මේ මොකද හැමෝම මල් ගේන්න තියාගත්තෙ?" මීෂ්ක රවාගෙන කිව්වා.

"ඔයා අපේ තෑගිවලට කැමති නැද්ද?" වදික් ඇහුවා, දුකෙන් වගේ. "තෑගි අශ්වයගෙ කටේ දත් ගණින්න හොඳ නැහැ."

අපි එයාලගෙ මලුත් වතුර බුජමට දැම්මා.

ඊළඟට වාන්ය ලොස්කින් ආවා, ඕට් කිලෝ බාගෙකුත් අරන්. මීෂ්ක සැකෙන් බැලුවා. "මම හිතන්නෙ උන් ඕව කන්නෙ නැති වෙයි."

"ඔයාලට උත්සාහ කරන්න පුළුවන්." වාන්ය කිව්වා.

"නෑ, අපි මාරියා පෙත්‍රොව්නගෙන්ම අහන එක හොඳයි."

ඒ මොහොතෙම මාරියා පෙත්‍රොව්න ආවා. එයා අරන් ආව පත්තරේකින් ඔතපු දෙයක්. බලනකොට ඒක කිරි වගේ දෙයක් දාපු බෝතලයක්. "කිරි!" මීෂ්ක කෑගැහුවා. "අපි හිතුවෙ වත් නෑ උන්ට කිරි දෙන්න."

"මේව බටර් කිරි," මාරියා පෙත්‍රොව්න කිව්වා. "ඒව තමයි උන්ට මුල් දවස් ටිකට ඕන වෙන්නෙ. ඔයාලට තේරේවි උන් ඒවට කොයිතරම් කැමති වෙයිද කියලා."

අපි කුකුළු පැටවුන්ව එළියට අරන්, බටර් කිරි ටික පීරිසියකට වත් කරල ඒක උන්ට දුන්නා. එයාල ඒක උගුරට දෙකට බීල දැම්මා.

"ඒක තමයි මට නම්, කුකුළු පැටවුන්ට හොඳ තෑග්ගක් කියල කියන්න පුළුවන්." මීෂ්ක සතුටින් කිව්වා. "ඔයාල දැනගෙන ඉන්න ඕන, මොකක්ද කුකුළු පැටවුන්ගෙ උත්දිනේකට ගේන්න ඕන කියලා."

එක්කෙනෙකුට පස්සෙ එක්කෙනෙක් වෙන්න අමුත්තො එන්න ගත්තා. වීත්යයි ෂේන්යයි මීලට් ගෙනාව. ඊළඟට ලියෝෂ කුරොච්කින් දුවගෙන ආව බබාලගෙ ගිගිරියකුත් අරගෙන.

"මට හිතාගන්න බැරි වුණා මොනව ගේන්නද කියලා. මම මෙහෙට එද්දි, මග තිබුණු සාප්පුවක මේ ගිගිරි තියෙනව දැක්කා. ඉතින් මම එකක් ගත්තා."

"අපූරු අදහසක්, මම ඒක කියන්නම ඕන." මීෂ්ක ඇනුම්පදේට වගේ කිව්වා. "කුකුළ පැටියෙකුට දෙන්න හොඳම තෑග්ග!"

මම කොහොමද දන්නෙ මොනවද ගේන්න ඕන කියලා? ඇරත්, ඔයාල දන්නෙ නැති වුණාට උන් ඒකට කැමති වෙන්නත් පුළුවන්."

එයා කුකුළ පැටව් ළඟට දුවල ගිහින් උන්ගෙ ඔළුවලට උඩින් ගිගිරිය හෙලෙව්වා. උන් බටර් කිරිවලට කොටන එක නවත්තලා උන්ගෙ ඔළු ඉස්සුවා, අහන් ඉන්න.

"අර බලන්න!" ලියෝෂ සන්තෝසෙන් ඉපිලීගෙන කෑගැහුවා. "උන් කැමතියි ඒකට."

හැමෝම හිනා වුණා. "හරි" මීෂ්ක කිව්වා. "දැන් උන්ට පාඩුවෙ කන්න අරින්න."

මම මාරියා පෙත්රොව්නගෙන් ඇහුවා, උන්ට ඕට්ස් කන්න දෙන්න පුළුවන්ද කියල. එයා කිව්ව, උන් ඕනම ඇට ජාතියක් ඉච්චම කනව කියල.

"කොහොමද ඒව උයන්නෙ?" මීෂ්කට දැනගන්න ඕන වුණා.

"ඔයාල කැඳ හදන විදියටම තමයි," මාරියා පෙත්රොව්න කිව්වා. මීෂ්කටයි මටයි ඕන වුණා එවේලෙම කැඳ හදන්න ගන්න. ඒත් එතකොටම තවත් අමුත්තෙක් ආවා- කෝස්ත්ය දෙව්යත්කින්.

"ඔයා තෑග්ගක් ගෙනාවද?" කොල්ලො ටික ඇහුවා.

"ඔව්, මම ගෙනාවා," කෝස්ත්ය පස්තෑල දෙකක් එයාගෙ සාක්කුවෙන් එළියට අදින ගමන් කිව්වා.

"මොන විකාර තෑග්ගක්ද?" කොල්ලො හිනා වුණා.

"ඕනම උපන්දින සාදෙක පස්තැල තියෙනවනෙ, නැද්ද?" කෝස්ත්ය කිව්වා.

"මොනවද ඒවයෙ ඇතුළෙ තියෙන්නෙ?" මිෂ්ක සැකෙන් ඇහුවා.

"බත්"

"බත්?" මිෂ්ක කෑගැහුවා.

එයා පස්තැල දෙක කෝස්ත්යගෙ අත්වලින් උදුරගෙන, බත් ටික ඒවයින් හලන්න ගත්තා.

"ඒයි, මොනවද ඔයා කරන්නෙ!" කෝස්ත්ය කෑගැහුවා. "ඔයාට මාව විශ්වාස නැද්ද?"

ඒත් මිෂ්ක උත්තර දුන්නෙ නෑ. එයා බත් ටික ඔක්කොම පීරිසියකට හලලා, ඒක කුකුළු පැටවුන්ගෙ ඉස්සරහින් තිව්වා. උන් හනික ඒකට කොටන්න ගත්තා.

හැමෝම කුකුළු පැටවුන්ට තෑගි ගෙනත් තියෙනව මායා දැක්කාම, එයා එයාගෙ කාමරේට ගිහින්, රතු පීත්ත පටියක් ගෙනල්ලා, ඒක පුංචි තීරුවලට කපලා, හැම කුකුළු පැටියගෙම බෙල්ල වටේට බෝ එකක් දැම්මා. අපි මල් දාපු බුජම කුකුළු පැටව් ළඟ බිමින් තිව්වා. ඉතින් මලුයි, පීත්ත පටියි, බටර් කිරියි, බතුයි, අලුත් වතුර දාපු පීරිසියි එක්ක ඒක ඇත්තටම උපන්දින සාදයක් වගේ පේන්න ගත්තා. කෝස්ත්යට ඕන වුණා උන්ට තණකොළ කවන්න. ඒත් මාරියා පෙත්රොව්න කිව්වා උන් කොළ කන්න පොඩි වැඩියි, අපි හෙට විතර වෙනකල් ඉන්න එක හොඳයි කියලා.

කුකුළු පැටවුන්ට ඇති වෙනකල් කන්න බොන්න ලැබුණාම, අපි උන්ගෙ පීත්ත පටි ගළවල උන්ව ආයෙමත් උණුසුම් කරන බඳුනට දැම්මා. මාරියා පෙත්රොව්න අපිට අවවාද කළා කුස්සියෙන් කෑල්ලක් උන්ට වෙන් කරලා, උන්ට උණුසුම් වෙන්න උණුවතුර භාජනයක් තියන්න කියලා.

"හොඳම දේ තමයි උන්ව ගමට අරන් යන එක. මේ ගෙවල් ඇතුළෙ ඉඳල උන් ලෙඩවෙලා මැරෙන්න පුළුවන්. උන්ට පිරිසිදු වාතය ඕන කරනවා." මාරියා පෙත්රොව්න කිව්වා.

අපි එයාට අපේ ඉන්කියුබේටරෙයි, ඒක ඇතුළෙ තවම තියෙන බිත්තර දෙකයි පෙන්නුවා.

"මම හිතන්නෙ ඒව තවත් පිපිරෙන එකක් නැති වෙයි," මාරියා පෙත්රොව්නා කිව්වා. "ඒත් කමක් නෑ, ඔයාල ඒක හොඳට කරල තියෙනවා."

"ඒ මේගොල්ලො අපට උදව් කරපු හන්දා," මීෂ්කා කිව්වා. "අපිට ඒක තනියම කරන්න බැරිවෙන්න තිබුණා."

"මම බයේ හිටියෙ ඒකෙන් වැඩක් වෙන එකක් නෑ කියලා, මට නින්ද ගිහින් උෂ්ණත්වය අඩුවෙච්ච නිසා." මම කිව්වා.

"එයාලට තරක් නොවී ටිකක් සීතල වෙන්න පුළුවන්," මාරියා පෙත්රොව්නා කිව්වා. "ඇරත් කිකිළි හැම තිස්සෙම බිත්තර උඩ ඉඳගෙන ඉන්නෙ නෑ, එයා දවසකට වතාවක් ඒව නොවඩ යනව මොනව හරි කන්න. ඉන්කියුබේටර් බිත්තරත් දවසකට පැයක් සීතල කරනව, කලලය සාමාන්‍ය විදියට වැඩෙන්න අරින්න. ඒව ඕනවට වඩා රත් වෙන එක තමයි වඩා නරක."

"මම වතාවක් ඒව රත් කළා," මීෂ්කා කිව්වා. "උෂ්ණත්වෙ අංශක 104ට නැග්ගා."

"ලොකු දෙයක් වෙන්න කලින් ඔයා ඒක දකින්න ඇති," මාරියා පෙත්රොව්නා කිව්වා. "ඒත් උෂ්ණත්වය හුඟක් වෙලා වැඩියෙන් තිබුණ නම්, බිත්තර ඇත්තටම නරක් වෙන්න ඉඩ තිබුණා."

එදා හවස, අපි ඉතුරුවෙලා තිබුණ බිත්තර දෙක කඩල බැලුවා. ඒ දෙකේම තිබුණෙ වර්ධනය නොවුණු කලල දෙකක්. ජීවිතේ නැවතිලා. කුකුළු පැටව් උපදින්නත් කලින් මැරිලා. සමහර විට, ඒ වැඩිපුර රත්වීමේ ප්‍රතිඵලයක් වෙන්න ඇති.

අපි ලාම්පුව නිවල දැම්මා : ඒක දවස් විසි තුනක්ම පත්තුවෙලා තිබුණා. උෂ්ණත්වමානෙ රසදිය ටිකෙන් ටික පහළ බැස්සා. ඉන්කියුබේටරේ සිසිල් වුණා. ඒත් උඳුන ළඟ බඳුනෙ ඉන්නවා අපේ ප්‍රීතිමත් පවුල, ලොම් පිරුණු පුංචි කුකුළු පැටව් දහ දෙනා!

ආපහු ගමට

අපේ පුංචි පවුල හරිම සතුටින් ජීවත් වුණා. එක ළඟින් ඉන්නකල් උන් කිසිම අවුලක් නැතිව හිටියා. ඒත් එකෙක් අනිත් එවුන්ගෙන් ටිකක් එහාට ගියොත් ඌ ඉවසිල්ලක් නැතිව කිචි බිචි ගගා උගෙ සහෝදරයො හොය හොයා දුවනවා. අනිත් අයව හොයාගන්නකල්ම එයා සන්සුන් වෙන්නෙ නෑ.

මායාට මුල ඉඳලම ඕන වුණා එයාගෙ පැටියව අරන් යන්න. ඒත් අපි ඉඩ දුන්නෙ නෑ. පස්සෙ දවසක, එයාට තවත් ඉවසන්න බෑ කියල කුකුළු පැටියව එයාගෙ කාමරේට ගෙනිච්ච. පැය බාගෙකට පස්සෙ එයා ආපහු ආවෙ අඬ අඬා:

"මට ඒක දරාගන්න බෑ. ඌ අඬනව ඇහුණම මගෙ පපුව පැළෙන්න යනවා. මම හිතුවා ඌ ටිකකින් ඒකට පුරුදු වෙයි කියලා. ඒත් ඌ දුක හිතෙන විදියට අඬනකොට මට ඉවසන්න බෑ!"

එයා ඌව බිමින් තිව්ව හැටියෙම ඌ කෙළින්ම අනිත් පැටව් ළඟට ගිහිල්ල ගුළිගැහුණා.

අපි කුස්සියෙ මුල්ලක වැටක් ගහල උන්ට වෙන් කළා. පොළොවට ඉටිරෙද්දක් එලල, ඒක උඩින් උණුවතුර දාපු යකඩ හැළියක් තිව්වා. අපි හැළිය කොට්ටෙකින් වැහුවා, ඒක ඉක්මනින් සීතල වෙන එක නවත්වන්න. කුකුළු පැටව් කොට්ටෙ යටින් යකඩ හැළිය වටේට රොක් වෙලා කිකිළි අම්මගෙ තටු අතරෙ ඉන්නවා වගේ සනීපෙට හිටියා. උණුවතුර දාපු භාජනේ කිකිළිගෙ තැන ගත්තා.

ඉඳල හිටල අපි උන්ව මිදුලට අරන් ගියා. ඒත් එතන උන්ට භයානක වැඩියි: දඬාවතේ යන බල්ලො බළල්ලු ඒ හරියෙ රෝන්දෙ ගහන නිසා. ඉතින් උන් වැඩිහරියක්ම කාලෙ ගත කළේ ගේ ඇතුළෙ. අපි හරි බයකින් හිටියෙ උන්ට පිරිසිදු වාතාශ්‍රය ලැබෙනව මදි කියලා.

එක පැටියෙක් ගැන තමයි අපි වැඩියෙන්ම බය වුණේ. ඌ අනිත් අයට වැඩිය පොඩියි වගේම ක්‍රියාශීලී ගතියත් අඩුයි. එයා ටිකක් කල්පනාකාරී පැටියෙක්. ඌ අනිත් අයත් එක්ක දුව පනිනව වෙනුවට එක තැන ඉඳගෙන හිටිය වගේම, කෑවෙත් හරි ටිකයි. ඌ තමයි අංක 5, අන්තිමට ඉපදිච්ච පැටියා.

"ඇත්තටම අපි උන්ව ගමට අරන් යන්න ඕන," මීෂ්ක කිව්වා. "මට බයයි උන් ලෙඩ වෙයි කියලා."

ඒත් අපිට උන්ගෙන් වෙන් වෙන එක දරාගන්න බැරි වුණා. ඉතින් අපි දවසින් දවස ඒ ගමන කල්දාන්න ගත්තා.

දවසක් මීෂ්කයි මමයි වෙනද වගේම කුකුළු පැටවුන්ට කෑම දාන්න ආවා. ඒ වෙනකොට උන් අපිව අඳුනගෙන තිබුණෙ. ඉතින් උන් උණුසුම් භාජනේ යටින් දුවගෙන ආවා අපිව හම්බවෙන්න. අපි උන්ට මිලට් කැඳ පිඟානක් ගෙනාවා. ඉතින් උන් එකිනෙකාව තල්ලු කර කර, අනිත් අයගෙ ඔළු වලට උඩින් පැනල ඉස්සරවෙන්න හදහදා ඒක කන්න ගත්තා. එකෙක් උගෙ කකුල්වලින් පිඟාන උඩට පවා නැග්ගා.

"කෝ අංක 5?" මීෂ්ක ඇහුවා.

අංක 5 සාමාන්‍යයෙන් අනිත් උන්ගෙ පස්සෙන් වැටුණා. ඌ දුර්වලම එකා වෙච්ච නිසා, ඌ නිතරම පැත්තකට විසි වුණා. ඉතින් අපිට ඌට වෙනම කවන්න සිද්ධ වුණා. සමහර වෙලාවට නම් ඌ මොනවත් කෑවෙ නෑ, ඒත් හැමතිස්සෙම අනිත් උනුත් එක්ක දුවගෙන ආව, තනිවෙන්න අකමැති නිසා. ඒත් ඒ වෙලාවෙ නම් උගෙ ලකුණක්වත් තිබුණෙ නෑ. අපි කුකුළු පැටව් ගණන් කරල බැලුවමත් එකෙක් අඩුයි.

"ඌ හැළිය පිටිපස්සෙ හැංගිලා ඇතිද?" මම ඇහුවා. මම හැළිය පිටිපස්සට එබුණාම, ඌ බිම හාන්සිවෙලා හිටියා. මම හිතුවෙ ඌ පොඩි විවේකයක් ගන්නව ඇති කියලා. මම අත දික්කරලා ඌ අහුලගත්තා. උගේ ඇඟ සීතල වෙලා. ඔළුව උගේ හීන් බෙල්ලෙ එල්ලි එල්ලි තිබුණා. අංක 5 මැරිලා!

අපි ඌ දිහා බලා හිටිය, කොච්චර දුකෙන්ද කිව්වොත් අපිට කතා කරගන්නත් බැරි වුණා.

"ඒක අපේම වැරැද්ද!" මීෂ්ක අන්තිමේදී කිව්වා. අපිට උන්ව ගමට අරන් යන්න තිබුණා. එහේදී ඌ පිරිසිදු වාතය ලැබිල ශක්තිමත් වෙන්න තිබුණා."

අපි ඌ මිදුලෙ දෙහි ගහ යට වළදැම්මා. ඊළඟ දවසෙ අපි අනිත් උන්ව කූඩෙක දාගෙන ගමට යන්න පිටත් වුණා. කොල්ලො හැමෝම ආවා අපි යනවා බලන්න.

මායා හොඳටෝම ඇඬුවා, එයාගෙ කුකුළු පැටියට සමුගැනීමෙ හාදුව දෙද්දි. එයාට හුඟක් ඕන කරල තිබුණා ඌව තියාගන්න, ඒත් එයා බය වුණා, ඌට උගේ පුංචි සහෝදරයො නැතිව පාළු වෙයි කියලා. ඉතින් එයා අපිට ඌවත් ගමට අරගෙන යන්න කැමැත්ත දුන්නා.

අපි කූඩෙ සාලුවකින් වහගෙන ස්ටේසමට ගියා. කුකුළු පැටව් කූඩෙ ඇතුළෙ උණුසුමට සනීපෙන් හිටියා.

උන් කලබලයක් නැතිව එකිනෙකාට හෙමිහිට කිචි බිචි ගගා හිටියා. මගියො කුකුළු පැටවුන්ගෙ කිචි බිචිය ඇහුණාම අපි දිහා උනන්දුවෙන් බලලා කූඩෙ තියෙන දේ අනුමාන කළා.

"ඉතින් මගෙ පොඩි කුරුලු ගොවි උන්නැහෙලා, තව බිත්තර ටිකක් ඉල්ලගන්න වෙන්න ඇති මං හිතන්නෙ?" නතාෂ නැන්ද අපි දැකල හිනා වුණා.

"නෑ," මීෂ්ක කිව්වා. "අපි ඒ වෙනුවට ඔයාට කුකුළු පැටව් ටිකක් ගෙනාවා." නතාෂ නැන්දා කූඩෙට එබුණා.

"දෙයියො සාක්කි!" එයා කෑගැහුවා. "කොයි ලෝකෙන්ද ඔයාල මේ කුකුළු පැටවුන්ව ගත්තෙ?"

"අපි උන්ව ඉන්කියුබේටරෙන් හැදුවෙ."

"ඔයාල විහිළු කරනවා. ඔයාල උන්ව කඩේකින් ගන්න ඇති."

"නෑ නතාෂ නැන්දේ, මතකද ඔයා මාසෙකට කලින් අපට දීපු බිත්තර ටික? ඉතින් දැන් අපි ඒ ටික ආපහු ඔයාට ගෙනාවා. ඒත් දැන් ඒව කුකුළු පැටව්."

"දෙවියන්ට ඔප්පු වෙච්චාවෙ!" නතාෂ නැන්දා කෑගැහුවා. "ඔයාලට ලොකු වුණාම කුකුළු ගොවියො වෙන්න ඕන වෙයි මම හිතන්නෙ."

"අපි තවම දන්නෙ නෑ," මීෂ්ක කිව්වා.

"ඒත් ඔයාලට කුකුළු පැටවුන්ගෙන් වෙන් වෙන්න දුක නැද්ද?"

"අපිට දුකයි හොඳටම," මීෂ්ක උත්තර දුන්නා. "ඒත් බලන්නකො, නගරෙ ඉන්න එක උන්ට හොඳ නැහැ. මෙහෙ වාතයත් අලුත්, පිරිසිදුයි. ඒ වගේම උන්ට දුව පනින්නත් මෙහේ ඉඩ තියෙනවා. උන් ලොකු වෙලා

අපූරු කුරුල්ලො වෙයි. කිකිළියො ඔයාට බිත්තර දෙයි, කුකුළො හඬලයි... එක පැටියෙක් මැරිලා අපි ඌව දෙහි ගහ යට වළදැම්මා."

"අසරණ දරුවෝ" නතාෂ නැන්දා කිව්වෙ, අපි දෙන්නගෙ කර වටේ අත් දෙක දාන ගමන්.

"ඒත් කමක් නෑ, ඒකට කරන්න දෙයක් නැහැනෙ. අනිත් හැමෝම අගේට ඉන්නවනෙ."

අපි කුකුළු පැටවුන්ව කූඩුවෙන් එළියට අරන් උන් ඉර එළියෙ සෙල්ලම් කරනව බලා හිටියා. නතාෂ නැන්ද කිව්වා, එයාට එයාගෙ කිකිළි හඬලනව ඇහුණ කියලා. ඉතින් මිෂ්කයි මායි එයත් එක්ක මඩුවට දිව්වා ඌව බලන්න. එයා ලැගගෙන හිටියා, හැම පැත්තෙන්ම පිදුරු එළියට පැනපු කූඩෙක. එයා අපි දිහා තදින් බැලුවා. හරියට අපි එයාගෙ බිත්තර අරන් යන්න ඇවිත් කියල හිතුව වගේ.

"ඒක හොඳයි," මිෂ්ක කිව්වා. "දැන් අපේ කුකුළු පැටවුන්ට සෙල්ලම් කරන්න යාළුවො ලැබෙයි. උන්ට හොඳට විනෝදවෙන්න පුළුවන්."

අපි මුළු දවසම ගමේ ගතකළා. අපි කැලෑවෙයි, ගඟ පැත්තෙයි, කුඹුරුවලයි ඇවිදින්න ගියා. අපි කලින් වතාවෙ එද්දි වසන්තයෙ මුල් කාලෙ නිසා කුඹුරු පාළුවට තිබුණෙ. ඒ කාලෙ ට්‍රැක්ටර් කුඹුරුවල පස් පෙරළනවා. ඒත් දැන් කුඹුරු කොළපාට අංකුර වලින් වැහිලා. ජේන තෙක් මානෙ කොළපාට කලාලයක් එලුව වගේ.

කැලෑව හරිම අපූරුයි. හැම ජාතියේම කුරුමිණියොයි අනිත් කෘමි සත්තුයි තණකොළ අස්සෙ ගැවසුණා. සමනල්ලු හැම තැනකම පියාඹද්දි හැම ගහකම ඉඳන් කුරුල්ලො සින්දු කිව්වා. එහේ කොච්චර ලස්සනද කිව්වොත් අපට ගෙදර යන්න කිසිම ඕනැකමක් තිබුණෙ නෑ. අපි තීරණය කළා, ගිම්හානෙදි මෙහේ ඇවිල්ල ගං ඉවුරෙ කූඩාරමක් ගහගෙන රොබින්සන් කෲසෝ වගේ ජීවත් වෙන්න.

ඒත් අන්තිමේදි අපට යන්න වෙලාව ආවා. අපි ආපහු නතාෂ නැන්දලාගෙ ගෙදරට ගියා, යන්නම් කියන්න. එයා අපි දෙන්නටම කෝච්චියේදි කන්න කේක් කෑල්ල වෙන්න දීල, ගිම්හාන නිවාඩුවට එහේ එන්න පොරොන්දු කරවගත්තා. පිටත්වෙන්න කලින් අපි මිදුලට ගියා අන්තිම වතාවට කුකුළු

පැටවුන්ව බලන්න. උන් එතකොටත් ගෙදර ඉන්නව වගේ එහාට පුරුදු වෙලා, සතුටින් කිචි බිචි ගගා ගස් අස්සෙයි පඳුරු අස්සෙයි දුව දුවා හිටියා. ඒත් උන් එකිනෙකාට ළංවෙලා කිචි බිචි ගගා හිටියෙ, එකෙක් තණකොළ බිස්සෙ අතරමං වුණොත් ඌට ලේසියෙන් අනිත් උන්ව හොයාගන්න පුළුවන් වෙන්න.

"ආයුබෝවන් ප්‍රීතිමත් පවුලට!" මීෂ්ක කිව්වා. "ඉර එළියයි පිරිසිදු වාතයයි සතුටින් විඳලා, ලොකුවෙලා ශක්තිමත් අපූරු කුරුල්ලො වෙන්න... හැම තිස්සෙම එකට ඉන්න, මතක තියාගන්න ඔයාල එකම අම්මගෙ දරුවෝ. ආ.. මම කියන්න හැදුවෙ, එකම ඉන්කියුබේටරේ. ඔයාල සාමාන්‍ය බිත්තර විදියට හිටියෙ දුවන්නවත් කතාකරන්න වත් බැරුව. ආ.. මම කිව්වෙ අර කිචි බිචි ගාන්න... ඒ වගේම අපිවත් අමතක කරන්න එපා. මොකද අපි තමයි හැදුවෙ ඉන්කියුබේටරේ. ඒ කියන්නෙ අපි නැත්නම් ඔයාල මෙතන ඉන්නෙවත්, ජීවිතයක් ලැබීම කොයිතරම් අපූරුයිද කියල දැනගන්නෙවත් නෑ!"

එච්චරයි.

ISBN 978-955-0230-12-9

මිල රු. 500/-

PRINTED BY : WIJESOORIYA ENTERPRISES. *Commercial Printing & Packaging*
No - 350/2, Hibutana Road, Mulleriyawa. +94 112 157 587, +94 718 039 869